# පහන් කණුව
# ධර්ම දේශනා

දෙළොස් වන වෙළුම

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

ප්‍රකාශනය
කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
2017

# ධර්ම දානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 2017 ජූලි

සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලු ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළ කිරීම් සපුරා තහනම්ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස නැවත පළ කිරීමට කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය වෙත විමසීම් යොමු කරන්න. ධර්ම ග්‍රන්ථ සහ දේශනා සඳහා පිවිසෙන්න

www.seeingthroughthenet.net

ISBN 978-955-3962-69-0

විමසීම්

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
කිරිල්ලවලවත්ත, දම්මුල්ල, කරඳන.
දුරකථනය: 0777127454
knssb@seeingthroughthenet.net

මුද්‍රණය

කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
දුරකථනය: 0114870333

## ධර්ම දානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

කතු හිමියන්ගේ දහම් පොත් ලබාගත හැකි ස්ථාන:

1. සුනිල් විජේසිංහ මහතා – 39/10, ශාන්ත රීටා පාර, ගල්කිස්ස.
2. හේමමාලා ජයසිංහ මහත්මිය
   29/8, පැඟිරිවත්ත මාවත, මිරිහාන, නුගේගොඩ.
3. චන්දන විජේරත්න මහතා
   23/79A, 1 වන පටුමග, ධර්මපාල පෙදෙස, තලවතුගොඩ.
4. ඩබ්ලිව්. ඒ. ඊසාන් උචින්ද මහතා – 25, කඩ වීදිය, දේවාලේගම.
5. එස්. ඒ. ලයනල් මහතා
   140/19, රුහුණුසිරි උද්‍යානය, හක්මන පාර, මාතර.
6. සිරිමා විජේරත්න මහත්මිය – 15, ඇලපාත, රත්නපුර.
7. ඒ. ජී. සරත් චන්ද්‍රරත්න මහතා
   'සමන්', ඇරැවුල හංදිය, කන්ඩලම පාර, දඹුල්ල.
8. ජේ. ඒ. ඩී. ජයමාන්න මහතා
   ජයමාන්න වත්ත, ලබුයාය, කුරුණෑගල පාර, කුලියාපිටිය.
9. මහාචාර්ය කේ. එම්. විජේරත්න, දන්ත විද්‍යා පීඨය,
   පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.
10. වෛද්‍ය පී. වීරසිංහ මහතා
    බණ්ඩාර බුලංකුලම, ලංකාරාම පාර, අනුරාධපුර.
11. ආර්. ඒ. චන්දි රණසිංහ මහත්මිය
    ස්ටුඩියෝ 'චායා', රෝහල හන්දිය, පොළොන්නරුව.
12. නේරා විජේසුන්දර මහත්මිය
    ඉළුක්පිටිය බෙහෙත් ශාලාව, ඉළුක්පිටිය, ගැටහැත්ත.
13. ඩී. සී. ඒ. නිශ්ශංක මහතා – 91A, වුඩ්වර්ඩ් පාර, ගාල්ල.
14. පියදස සමරකෝන් මහතා
    සුදුවැලි පැලැස්ස, කිරින්ද, තිස්සමහාරාමය.

www.seeingthroughthenet.net
www.facebook.com/seeingthrough

සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියොදපනං
එතං බුද්ධානසාසනං

- බුද්ධ වග්ග, ධම්ම පදය

හැම පවින් වැළැකුම
කුසල් වෙතටම එළැඹුම
සිත පිරිසිදු කැරුම
සස්න මෙයමැයි හැම බුදුන්ගෙම

# පටුන


හැඳින්වීම vi

ප්‍රකාශක නිවේදනය viii

අමා ගඟ ix

56. 'අචිරං වතයං කායො' (පහන් කණුව 70) 1

57. 'පණ්ණා වීසති වස්සානි' (පහන් කණුව 89) 27

58. 'නත්ථි කොචි භවො නිච්චො' (පහන් කණුව 141) 53

59. 'ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං' (පහන් කණුව 172) 81

60. 'මනුජස්ස පමත්තචාරිනො' (පහන් කණුව 177) 105

# හැඳින්වීම

දහම් දන හැමදන්ම　　　පරදයි
දහම්රස හැම රසම　　　පරදයි
දම් ඇලුම හැම ඇලුම්　　　පරදයි
නිවන් සුව හැමදුක්ම　　　පරදයි

අනුත්තර ධර්මරාජයාණන් වහන්සේගේ ධර්මවිජයට අරමුණුවූයේ දෙව් මිනිසුන්ගේ චිත්ත සන්තානයයි. අනාදිමත් කාලයක් තුළ මෝහයෙන් මුළාවී සසර දුක් ගින්නෙන් දැවෙමින් සිටින ලෝ සතුන්ගේ සිත් සතන් දහම් අමා දහරින් සිසිල් කර අමා මහ නිවනින් නිවා සුවපත් කිරීම ඒ මහා කාරුණිකයාණන් වහන්සේගේ ධර්මවිජය පරමාර්ථය විය. දුක් ගිනි වඩන දිග්විජය වෙනුවට දුක් ගිනි නිවන ධර්මවිජයක් බුදුපියාණන් වහන්සේ ලෝකයාට හඳුන්වා දුන්හ.

ධර්මදානය අන් හැම දනයකටම වඩා උතුම් වන්නේ සිතකට වැටෙන දහම් පදයකින් පූර්ණ ජීවිත පරිවර්තනයක් පවා සිදුවිය හැකි බැවිනි. බාහිර වස්තු දනයෙන් සැළසෙන තාවකාලික සහනය මෙන් නොව, එය සනාතන සැනසුමකට මඟ හෙළිකරයි. මොහොතකට දිවගට දැනී-නොදැනී යන ආමිස රසය මෙන් නොව, නිරාමිස දහම් රසය අසහනය දුරුකොට සිත් සනහන ගැඹුරු අර්ථ රසයකි. සසර වඩන ගේහසිත ඇලුම් මෙන් නොව, ලොවුතුරු දහමට ඇති ඇල්ම සසර ගමන කෙටිකරයි. තණ්හා පිපාසය සන්හිඳුවන අමා මහ නිවන සියලු සසර දුක් නිවාරණය කරයි. 'නිවනේ නිවීම' පොත් පෙළෙන් අප දියත් කළ ධර්මදාන වැඩ පිළිවෙළෙහි දෙවැනි අදියර වශයෙන් මේ 'පහන් කණුව ධර්ම දේශනා' පොත් පෙළ එළි දකී. මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි යෝගාවචර සඟපිරිස හමුවේ අප විසින් දේශනා කරන්නට යෙදුන දෙසුම් 33 ක් රැගත් යටකී පොත් පෙළට වඩා සරල අන්දමින්. ජන ජීවිතයේ එදිනෙදා ගැටළුවලට එල්ල කොට දෙසන ලද බැවින් මෙම ධර්මදේශනා මාලාව බොහෝ දෙනෙකුට වැඩදයක වනු ඇතැයි සිතමු. සසරදුක් ලියලවන විවිධ විෂම දෘෂ්ටි මතවාදයන්ගෙන් ගැවසීගත් පොත් පත් සඟරා 'සහරාවක' අතරමංව සිටින වත්මන් පාඨක සමාජයට මේ තුළින් ලොවුතුරු මඟට යම් 'තරු සළකුණක්' හෝ ලැබෙතොත් අප දැරූ උත්සාහය සඵල වූ ලෙස සළකමු.

'ආනුපුබ්බී කථා' නම් වූ අනුපිළිවෙළ කථාමාර්ගයක් අනුගමනය කරමින් දහම් දෙසූ බුදු පියාණෝ එවැනිම 'අනුපිළිවෙළ කථාවක්' ධර්මදේශකයින්ට අනුදැන වදාළහ. දාන කථාව, සීල කථාව, සග්ග කථාව, කාමයන්ගේ ආදීනව හා නෙක්ඛම්මයෙහි ආනිසංස ඒ අනුපිළිවෙළ කථාවට අයත්වේ. ඒ සියල්ල තුළින් සකස් වූ, මෘදුවූ, පුබුදුවූ. පහන්වූ

සිතට චතුරාර්‍ය්‍යසත්‍ය දේශනාව මැනවින් විෂය වේ. දේශනා විලාස වශයෙන් සලකන කල, බුද්ධ දේශනාවෙහි ඉස්මතුව පෙනෙන ආදර්ශවත් අංග සතරක්ද ඇත. එනම්, උපමා, නිදර්ශන, ආදියෙන් ධර්ම කරුණු සන්දර්ශනය කිරීම (සන්දස්සෙති) සිත් කාවදින අන්දමින් එත්තු ගන්වාලීම (සමාදපෙති) ඒවා ප්‍රතිපත්තියට නැංවීමෙහිලා උත්සාහවත් කිරීම (සමුත්තෙජෙති) සහ අසන්නන්ගේ සිත්සතන් ප්‍රසාදයට පත්කිරීමයි (සම්පහංසෙති).

ධර්මපදයෙන් තෝරාගත් ගාථා මාතෘකා කොටගෙන පැවැත්වෙන මෙම දෙසුම් පෙළෙහිදීද හැකිතාක් දුරට ඉහත සඳහන් මූලධර්ම අනුගමනය කිරීමට තැත් දැරුවෙමු. බුද්ධෝත්පාද කාලයක ලැබිය හැකි අග්‍රඵලය වන අර්හත් ඵලයෙන්ම දේශනාවක් කුළුගැන්වීමට උනන්දු වීමු. වෙනත් සුලභ ලෞකික පරමාර්ථ තුළ අසන්නන් සිරකොට නොතබා, බුදුපියාණන් වහන්සේ වදාළ අප්‍රමාද පදය සිහිගන්වමින් සංසාර විමුක්තිය දෙසටම ඔවුන් යොමු කරවීම අපගේ පරම අධ්‍යාශය විය. 'පහන් කණුවෙන්' විහිදෙන මෙම ධර්මාලෝකයෙන් ලෝකයාට නිවන් මඟ හෙළි පෙහෙළි වේවා!

දෙස් විදෙස් වැසි සැදැහැවත් පරිත්‍යාගශීලී විශාල පිරිසකගේ නොමසුරු ආධාරයෙන් 'අමා ගඟ' දිනෙන් දින පුළුල් වෙමින් ගලායයි. එයින් ජනිත පුණ්‍ය ශක්තිය ඔවුන්හට පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිස උපනිශ්‍රය සම්පතක්ම වේවා! පටිගත කළ 'පහන් කණුව' දෙසුම් පිටපත් කරදීමේ සහ සෝදුපත් බැලීමේ කාර්‍ය්‍යයන්ට සහාය වන පින්වත් සිරිමා විජේරත්න, කුසුමා විලේගොඩ, දිල්රුක්ෂි වීරරත්න ගීතාංජලී සමන් දෙලගේ සහ ලිලියන් රත්නායක යන මහත්මීන්ටත්, අපගේ පොතපත ශෝභන ලෙස මුද්‍රණය කරදෙන කොලිටි ප්‍රින්ටර්ස් සමාගමේ සී. ජයසෝම මහතා ඇතුළු සැමටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

'චිරං තිට්ඨතු ලොකස්මිං - සම්මාසම්බුද්ධ සාසනං'

මෙයට,
සසුන් ලැදි
කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන
කිරිල්ලවල වත්ත, දම්මුල්ල
කරඳන
(2560) 2016 ජූනි

# කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
# ප්‍රකාශක නිවේදනය

'කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය' පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන් වහන්සේ විසින් සම්පාදිත සියලුම ධර්ම ග්‍රන්ථ හා දේශිත ධර්ම දේශනා පිරිසිදු ධර්ම දානයක් වශයෙන්ම ධර්ම පිපාසිත ලෝකයාහට ප්‍රදානය කිරීමේ උන්වහන්සේගේ අභිමතාර්ථය ඉටු කිරීමට ඇප කැප වී සිටියි. මේ අනුව ධර්ම ග්‍රන්ථ මුද්‍රණය සහ බෙදාහැරීම පිළිබඳ කාර්යභාරයත්, ධර්ම දේශනා සංයුක්ත තැටිගත කිරීම සහ www.seeingthroughthenet.net වෙබ් අඩවිය, www.facebook.com/seeingthrough සමාජ ජාල අඩවිය පවත්වා ගෙන යාමත් කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරයේ වගකීම වනු ඇත.

දෙස් විදෙස් වැසි ධර්මකාමී පාඨක ශ්‍රාවක විශාල පිරිසක් වෙනුවෙන් ක්‍රියාත්මක වන මෙම පුළුල් ධර්ම දාන වැඩ පිළිවෙලට දායකවීමට කැමති පින්වතුන් හට පහත සඳහන් බැංකු ගිණුමට තම ආධාර මුදල් යොමුකිරීමට අවස්ථාව ඇත.

මෙම ධර්ම දාන වැඩපිළිවෙලට ආධාර එවීම පිළිබඳ සියලු විමසීම්:

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
කිරිල්ලවල වත්ත, දම්මුල්ල, කරඳන.
දුරකථන අංක: 0777127454
ඊමේල් ලිපිනය: knssb@seeingthroughthenet.net

ආධාර මුදල් යොමු කිරීම:

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය (K.N.S.S.B)
ගිණුම් අංක: 007060000241
සම්පත් බැංකුව, SWIFT: BSAMLKLX
ශාඛා අංකය: 070
ශාඛාව: ආර්. ජී. සේනානායක මාවත, කොළඹ - 07.

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන් බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ 'උතුරට' හැරැවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා 'එද-වේල' සඳහා වත් වියපැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මගට නැමී ගත්හ. ලොවී-ලොවුතුරු මල් පල නෙළා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

'ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය' නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙළ සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ 'උතුරට' හැරවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. 'නිවනේ නිවීම' පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී 'පහන් කණුව ධර්මදේශනා' පොත් පෙළෙහි 'බර පැන' දැරීමටත්, දෙස්-විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත-පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. 'දෙන දේ පිරිසිදුවම දීමේ' අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම 'නැවත මුද්‍රණ' පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

'පොත් අලෙවිය' පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන 'දහම් පඬුර' තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහාගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් 'ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට' උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

"සබ්බදානං ධම්මදානං ජිනාති"

මෙයට,
සසුන් ලැදි
කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම.
2000 ජුනි 05 (2544 පොසොන්)

**පහන් කණුව ධර්ම දේශනා**

**12 – වෙළුම**

ප්‍රථම මුද්‍රණය

පිටපත් 1000 කින් යුත් මෙම ප්‍රථම මුද්‍රණය පාඨකයින් අතට පත් කරන පහත පුණ්‍යානුමෝදනාවේ සඳහන් ධර්මදානයට ලැදි පින්වත් පිරිසට, එම ධර්මදානමය කුසලය පරම ශාන්ත උතුම් නිර්වාණාවබෝධය පිණිස උපනිශ්‍රය සම්පතක්ම වේවායි පතමු.

– අනුශාසක

(2561) 2017 මැයි

**පුණ්‍යානුමෝදනාව**

මෙම ධර්මදානමය කුසලයෙන් අපගේ දෙමාපියන්ට, ගුරුවරුන්ට, දරුවන්ට, සියළුම ඥාතීන්ට සහ අප සැමටද චතුරාර්‍ය සත්‍යය අවබෝධ කර ගැනීම තුලින් අති උතුම්වූ නිර්වාණය ලබා ගැනීම පිණිසම මෙම පින හේතු වාසනා වේවායි ප්‍රාර්ථනා කරමු.

වසන්ති පොතුපිටිය යුවල සහ දරුවන් - ගම්පහ

ලක්ෂමන් ධර්මදාස සහ දරුවන් - ඉඹුල්ගොඩ

බන්දු බාලසූරිය යුවල - ගම්පහ

චම්පිකා, හේමන්ත යුවල සහ දරුවන් - ගම්පහ

සමන්ති බාලසූරිය - ගම්පහ

# 56 වන දේශනය

# 56 වන දේශනය
(පහන් කණුව ධර්ම දේශනා අංක 70)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

අචිරං වතයං කායො - පඨවිං අධිසෙස්සති
ඡුද්දො අපෙත විඤ්ඤාණො - නිරත්ථංව කලිඞ්ගරං

සැදැහැවත් පින්වතුනි,

මහා කාරුණික බුදුපියාණන් වහන්සේ අවවාදයෙන් වගේම ආදර්ශයෙනුත් ගිලන් උපස්ථානයේ වටිනාකම ලෝකයාට පහදා දුන්නා. ගිලන් අවස්ථාව කෙනකු අසරණ වෙන අවස්ථාවක්. දයාව, කරුණාව, අනුකම්පාව පෙරදැරි කරගෙන ඒ අවස්ථාවට පිහිට වීම උතුම් සත් පුරුෂ ගුණයක්. ඒ වගේම අනිත් අතට බලනකොට, ගිලන් බව තුළින් කෙනකුට පුළුවන් මේ පංචස්කන්ධයේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ස්වභාවය හරි හැටියට තේරුම් ගන්න. ඒකට උපකාර වෙන්නෙ අවස්ථානුකූල ධර්මෝපදේශයයි. බුදුපියාණන් වහන්සේ මෙන්න මේ දෙයාකාරයෙන්ම ගිලන් උපස්ථානය කළ හැටි පෙන්නුම් කෙරෙන වටිනා කථාන්තරයක් තමයි අද අපි මාතෘකා කළ ගාථාවට නිදාන කථාව හැටියට දක්වල තිබෙන්නෙ.

සැවැත් නුවර එක්තරා ශ්‍රද්ධාවන්ත තරුණයෙක් ශාසනයේ මහණවෙලා උපසම්පදා වුනා. තිස්ස තෙරුන් නමින් හැඳින්වුනා. මේ තිස්ස හාමුදුරුවන්ට කල් යාමේදී බරපතල ආබාධයක් ඇති වුනා. පොඩි බිබිලි හැටියට ශරීරයේ කුෂ්ට වගේ මතුවෙලා ඒවා ක්‍රම ක්‍රමයෙන් ලොකු විසප්පුවෙලා, ලොකු ගෙඩි බවට පත්වෙලා ඒවා බිඳිලා ලේ සැරව ගලන්න පටන් ගත්තා. මුළු ශරීරයේම තැනින් තැන සිදුරු ගැහුණා. ඒ වගේම සිවුරු, අඳන ආදිය ලේ සැරවවලින් බෙරි වුනා. එහෙම පිටින්ම තෙත් වුනා. අන්තිමට උපස්ථායක සංඝයා වහන්සේලාටත් උපස්ථාන කර ගන්න බැරි තරම් තත්ත්වයකට පත් වුනාම අසරණව මේ හාමුදුරුවෝ වැතිරිලා සිටිනවා, කාගෙවත් උපස්ථානයක් නැතුව.

ඒ අවස්ථාවේදී බුදුපියාණන් වහන්සේ මහා කරුණා සමාපත්තියට සම වැදිලා ලෝකය බලා වදාරණකොට උන්වහන්සේට මේ හාමුදුරුවන් පෙනී ගියා. මේ තිස්ස තෙරුන් වහන්සේ ඒ වෙනකොට හැඳින්වුනේ පූතිගත්ත තිස්ස නමින්. ශරීරය කුණු වෙච්ච

නිසා පූතිගත්ත තිස්ස කියන නමකුත් පට බැඳුණා. එතකොට මේ පූතිගත්ත තිස්ස ස්වාමීන් වහන්සේව පෙනී ගියා බුදුපියාණන් වහන්සේගේ මහා කරුණා සමාපත්ති ඥානයට. උන්වහන්සේ තේරුම් ගත්තා මේ අසරණව සිටින තිස්සනමට රහත්වෙන්න උපනිශ්‍රය සම්පත්තිය තියෙනවා. නමුත් මේ දැන් තියෙන තත්ත්වයෙ හැටියට අමාරුයි. මංවත් උපකාර නූනොත් ඒ අවස්ථාව ගිලිහිල යනවා කියලා තේරුම් අරගෙන බුදුපියාණන් වහන්සේ වැඩම කළා ඒ විහාරයට. වැඩම කරල පළමුවෙන්ම ඒ භික්ෂුව ළඟට ගියා නොවෙයි. ගිනිහල් ගෙට ගිහිල්ලා නාන්න පැන් උණු කරන පැන්පහසුවෙන භාජනය හෝදලා ඒකට වතුර වත් කරල, ලිප උඩ තියල, වතුර උණු වෙන කල් ගිනිහල් ගෙයිම වැඩ සිටියා. ඊළඟට වතුර උණු වුනාට පස්සෙ, බුදුපියාණන් වහන්සේ අර භික්ෂූන් වහන්සේ වැතිර හිටිය ඒ ඇඳ ළඟට ගිහිල්ලා ඇඳේ එක කොනක් ඉස්සුවා. ඇඳට කොන් දෙකක් තියන නිසා ඉතින් අනිත් සංඝයා වහන්සේලත් තේරුම් ගත්ත දැන් ඉතින් මේ බුදුපියාණන් වහන්සේ සූදනම් වෙන්නෙ මේ භික්ෂුවට උපස්ථාන කරන්නයි කියල. සංඝයා වහන්සේලා 'ස්වාමීනි ඒක අපි කරන්නම්' කියලා ඇඳ උස්සගෙන ගියා ගිනිහල් ගෙට. ඊළඟට බුදුපියාණන් වහන්සේ ඒ සංඝයා වහන්සේලත් උපකාර කරගෙන පළමුවෙන්ම අර භික්ෂුවගේ සිවුර සෝදලා අව්වේ දන්න සැලැස්සුවා. ඊළඟට ඒ භික්ෂූන් වහන්සේලා උපකාර කරගෙන බුදුපියාණන් වහන්සේ පැන් වත් කරනවා. ඒ භික්ෂූන් වහන්සේලා සෝදනවා. ඔය විදියට නැව්වා. ඊළඟට පැන් පහසු කරල අවසානයේදී, ඒ වෙනකොට සිවුර වේලිලා තිබුණා. ඒක අන්දවලා අඳනයත් හේදුවා. ඒ විදියටම උණු වතුරෙන් හෝදලා ඒක අව්වේ දැම්මා. ටික වේලාවකින් ඒක වේලුනාට පස්සේ අඳනයත් ඇන්දුවා. දැන් ඉතින් මේ තිස්ස තෙරුන් වහන්සේට බොහොම පහසුවක් කාලෙකට පස්සෙ මේ පැන් පහසුවෙලා, කයටත් සැහැල්ලුවක් දැනුනා. සිතටත් සැනසිල්ලක් දැනුනා. ඒ අඳනය ඇඳගෙන සිවුර පොරවාගෙන ඇඳේ දැන් ඉතින් හාන්සිවෙලා ඉන්නවා. ඒ ඉස්මත්තෙ හිස පැත්තෙන් හිටගෙන බුදුපියාණන් වහන්සේ ඔන්න ඔය අවස්ථාවේදී තමයි අපි අර මාතෘකා කළ ගාථාව දේශනා කොට වදාළේ.

> අචිරං වතයං කායො - පඨවිං අධිසෙස්සති
> ඡුද්ධො අපෙත විඤ්ඤාණො - නිරත්ථංව කලිඞ්ගරං

'වැඩිකල් නොයා දී ම විඤ්ඤාණය ඉවත් වූ මෙ කය ඉවත දමන ලදුව, වැඩකට නැති දඬු කඩක් වගේ පොළොවෙහි වැතිර

ගන්නේය' කියන අදහසයි ඒ ගාථාව තුළ තියෙන්නෙ. ඒ ගාථාව අහල අර පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ සිවුපිළිසිඹියාපත් රහත් තත්ත්වයට පත් වුනා. අනෙකුත් සංඝයා වහන්සේලාත් බොහෝ දෙනෙක් නොයෙකුත් මාර්ගඵල ආදියට පැමිණියා. ඉතින් ඊළඟට ඒ රහත් වීමත් එක්කම මේ පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ පිරිනිවන් පෑවා. එහෙම සිද්ධි වෙනවා. ධර්මාවබෝධයත් එක්කම ජීවිතයත් කෙළවර වෙන අවස්ථාවල්. නමුත් අර සංඝයා වහන්සේලා ඒ කිසිවක් දන්නෙ නෑ. බුදුපියාණන් වහන්සේ, මේ පිරිනිවන් පෑව - එහෙම නැත්නම් අපවත් වුන හැටියට පෙනෙන මේ පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේගේ ශරීරය ආදහනය කරවලා ඒ ධාතුවලින් චෛත්‍යයක් බන්දවන්න සැලැස්සුවා.

සංඝයා වහන්සේලා ඇහුවා 'මේ පූතිගත්ත තිස්ස හාමුදුරුවො කොහෙද උපන්නෙ?' කියලා. අන්න ඒ අවස්ථාවෙ තමයි බුදුපියාණන් වහන්සේ වදාළේ, 'මහණෙනි, මේ පූතිගත්ත තිස්ස රහත්වෙලා පිරිනිවන් පෑව' කියල. එතකොට මේ සංඝයා වහන්සේලා අහනවා 'ස්වාමීනි, මේ තරම් රහත්වෙන්න හේතු සම්පත්තිය තිබුණා නම් ඇයි මේ විදියට ශරීරය කුණු වුනේ? මේ විදියට බිබිලි දාලා සැරව වැගිරෙන මේ විදියෙ තත්ත්වයකට පත් වුණේ?' ඊළඟට එපමණක් නොවෙයි මේ තිස්ස තෙරුන් වහන්සේගේ ඇට පවා බිඳුණා. අන්තිම කාලයේ දී ඇටත් බිඳිලා ශරීරය ඉතාමත්ම භයානක අන්දමින් දිරාපත්වෙලයි තිබුනෙ. 'මේ ඇට බිඳෙන්න හේතුව මොකද? රහත් වෙන්න හේතුව මොකද?' කියල සංඝයා වහන්සේලා ඒ පිළිබඳව විමසුවාම අන්න ඒ අවස්ථාවෙ බුදුපියාණන් වහන්සේ ඒකට අතීත කර්මය පෙන්වමින් වදාළා, "මේ හැම එකක්ම මේ තිස්ස තෙරුන් අතීතයේ කළ කර්මයෙ විපාකයි". ඒ ප්‍රවෘත්තිය හැටියට දක්වන්නෙ මෙහෙමයි.

කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේ මේ පූතිගත්ත තිස්ස තෙරුන් කුරුලු වැද්දෙක්ව හිටියා. රස්සාව කුරුල්ලන් අල්ලලා පොහොසත් අයට එහෙම විකිණීම. ඒ කුරුල්ලන්ගෙන් විකුණලා ඉතුරු වෙච්ච අය ඊළඟ දවසට තබා ගන්න ඕන නිසා උන් මරල තිබ්බොත් මස් නරක් වෙනවා, කුණු වෙනවා කියන හැඟීමෙන් ඒ කුරුල්ලන්ගේ අඬු කඩලා - කකුල් කඩලා පියාපත් ගලවලා උන් පණ පිටින්ම තියා ගත්ත, ඊළඟ දවසට විකුණන්න. ඒ වගේම මරලා ඒවා ආහාරයටත් ගත්තා. එතකොට ඒකයි ඒ අකුසල කර්මය. ඊළඟට, ඒ වගේම කොහොම නමුත් ඒ විදියෙ ජීවිතයක් ගෙව්වට මොකද එක් අවස්ථාවක තමන්ගේ ගෙදරට පිණ්ඩපාතෙ වැඩිය රහතන් වහන්සේ

නමකට බොහොම භක්තියෙන් යුක්තව දානය පූජා කරල, පිණ්ඩපාතය පූජා කරල, ප්‍රාර්ථනා කළා, 'ස්වාමීන් වහන්සේ ලබා ගත්තු ධර්මය මටත් ලැබේවා' කියලා. උන්වහන්සේත් 'එසේම වේවා' කියල අනුමෝදන් කළා. අන්න ඒ කුසල ආනිසංසය රහත් වීමට උපනිශ්‍රය වුනා කියල බුදුපියාණන් වහන්සේ වදාළා.

එතකොට ඕකයි කථාව. මේ කථාන්තරය කීප අතකින්ම අපට ආදර්ශවත්. පළමුවෙන්ම අර බුදුපියාණන් වහන්සේ කළ ඒ ගිලන් උපස්ථානය ගැන අපි හිත යොදන්ට ඕන. දැන් මෙතන බුදුපියාණන් වහන්සේගේ මහා කරුණා සමාපත්ති ඥානයට මේ පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ පෙනී ගියේ ගිලන් බව නිසාම නොවෙයි. ඒ මහා කරුණා සමාපත්ති ඥානයට කෙනෙක් හසුවෙන්නෙ බොහෝ විට මේ සංසාර දුකෙන් මිදෙන්න සුදුසුකම් ඇති නිසයි. දැන් මෙතෙන්දිත් ගිලන් බව නිසාම පමණක් නොවෙයි. රහත් වෙන්නත් උපනිශ්‍රය සම්පත්තිය තියෙන නිසයි, ඒ විදියට පෙනී ගියේ. එබඳු අවස්ථාවල බුදුපියාණන් වහන්සේ බොහෝ විට තමන් වහන්සේම තනියම වැඩම කරනවා ඒ ස්ථානයට. දැන් මෙතෙන්දිත් බුදුපියාණන් වහන්සේ යටත් පිරිසෙයින් ආනන්ද හාමුදුරුවන්වත් එකතු කර ගන්නෙ නැතිව එතනට වැඩම කරලා ඉස්සෙල්ලම ගිනිහල් ගෙට ගිහිල්ලා, නියම උපස්ථායකුගේ ආකාරයෙන්ම භාජනය හෝදලා පැන් ලිපේ තියලා උණු කරලා ඒ ඔක්කොම කරලා තමයි ලෙඩාගෙ ඇඳ ළඟට ගියේ. ඊළඟට එපමණක් නොවෙයි ඒ උපස්ථානය කළ ආකාරය පවා අපට වුනත් ආදර්ශයට ගන්න වටිනවා. රෝගියකුට උපස්ථාන කරන ආකාරය. අර ඒ ස්වාමීන් වහන්සේගේ සිවුර ඉස්සෙල්ලා හෝදලා ඒක වේලෙන්න ඇරලා ඊළඟට පැන් පහසු කරලා අවසානයේ අඳනයත් හෝදලා ඔය විදියට ක්‍රමානුකූලව, ඉතාමත්ම ක්‍රමානුකූලව, ඒ උපස්ථානය කළා. ඊළඟට අවසාන වශයෙන් බුදුපියාණන් වහන්සේ ඒ භික්ෂූන් වහන්සේට ධර්මයෙන් උපස්ථාන කළා. ඒ ධර්මයෙන් උපස්ථාන කරලා **මුළු මහත් සංසාර රෝගයම නිවාරණය කළා.**

අන්න එතකොට බොහොම වටිනා කථාවක් මේ වගේම බුදුපියාණන් වහන්සේ ගිලන් උපස්ථානය කළ මීට තරමක් දුරට සමාන සිද්ධියක් විනය පිටකයේ සඳහන් වෙනවා. අපි ඒ කථාවත් මේකට එකතු කරලා ගනිමු, කාරණා කීපයක් නිසා. එක්තරා භික්ෂූන් වහන්සේ නමකට තද බල උදරාබාධයක් බඩේ අමාරුවක් හැදිලා, තමන්ගේම මළ මුත්‍රයේ ගැලිලා බිම වැටිලා, අසරණ තත්ත්වයට පත්වෙලා හිටියා. කිසිම භික්ෂූන් වහන්සේ නමක් ඒ භික්ෂුවට උපස්ථාන කරන්න ගියෙත් නැහැ. අන්න ඒ අසරණව සිටින අවස්ථාවෙ බුදුපියාණන් වහන්සේ

ආනන්ද ස්වාමීන් වහන්සේත් එක්ක සේනාසන චාරිකාවේ වැඩම කරන අතරේ - සේනාසන චාරිකාවේ කියල කියන්නෙ බුදුපියාණන් වහන්සේ විටින් විට සංඝයා වහන්සේලා කොහොමද ජීවත් වෙන්නෙ කියල බලන්න වගේ විහාරයෙන් විහාරයට වැඩම කරනවා. අන්න ඒ විදියට වැඩම කරන අතර ආනන්ද ස්වාමීන් වහන්සේත් එක්ක අර භික්ෂුව හිටිය තැනට ගිහිල්ලා ආනන්ද ස්වාමීන් වහන්සේට බුදුපියාණන් වහන්සේ වදාළා, 'ආනන්ද, ගිහිල්ලා වතුර අරන් එන්න, පැන් අරන් එන්න, අපි මේ භික්ෂුව නාවමු' කියලා. ඊළඟට ආනන්ද ස්වාමීන් වහන්සේ පැන් ගෙනාවා. බුදුපියාණන් වහන්සේ පැන් වත් කළා. ආනන්ද ස්වාමීන් වහන්සේ නැව්වා ඇඟ අතුල්ලලා. නාවලා ඉවරවෙලා ඊළඟට බුදුපියාණන් වහන්සේ හිස පැත්තෙන් එසෙව්වා. ආනන්ද ස්වාමීන් වහන්සේ පා පැත්තෙන් එසෙව්වා. ඔසවල ඇඳේ හාන්සි කෙරෙව්වා. මේ භික්ෂුවගෙන් ඇහුවා 'මොකද මහණ උපස්ථාන කරන්නෙ නැත්තෙ අනිත් අය?' කියලා. මේ භික්ෂූන් වහන්සේ කියනවා 'ස්වාමීනි, මම අනිත් භික්ෂූන් වහන්සේට උපස්ථාන උපකාර කරන්නෙ නැති නිසා ඒ භික්ෂූන් වහන්සේලත් මට සලකන්නෙ නෑ' කියලා. එතකොට මේක අනුව බුදුපියාණන් වහන්සේ අර සංඝයා වහන්සේලා රැස් කරලා ඇහුවා 'මහණෙනි, අහවල් විහාරයේ ඉන්නවද ගිලන් භික්ෂුවක්?' කියල. 'එසේය ස්වාමීනි.' 'ඒ භික්ෂුවට උපස්ථායකයෙක් ඉන්නවද?' 'නැත ස්වාමීනි.' 'මොකද ඒ උපස්ථායකයෙක් නැත්තෙ?' කියල ඇහුවහම 'ඒ භික්ෂුව අපටත් උපස්ථාන කරන්නෙ නෑ. උපකාර කරන්නෙත් නෑ. ඒක නිසා අපිත් උපකාර කරන්නෙ නෑ' කිව්වා. අන්න ඒ අවසථාවේ බුදුපියාණන් වහන්සේ සංඝයා වහන්සේලාට වදාළා 'මහණෙනි, නුඹලාට උපසථාන කරන්න අම්මල තාත්තල මෙතන නෑ. නුඹලා ඔවුනොවුන්ට උපස්ථාන නොකරනවා නම් නුඹලාට කවුද උපස්ථාන කරන්න වෙන ඉන්නෙ?' ඊළඟට ඔන්න එක්තරා ගැඹුරු අර්ථයක් ඇති පාඨයක් බුදුපියාණන් වහන්සේ වදාළා, ඒ පාඨය මේ කාලයේ නොයෙකුත් ආකාරයට තෝරනවා. ඒක පාලි භාෂාවෙන් සඳහන් වෙන්නෙ -

'යො භික්ඛවෙ මං උපට්ඨහෙය්‍ය සො ගිලානං උපට්ඨහෙය්‍ය' කියල.

'මහණෙනි, යමෙක් මට උපස්ථාන කරන්නේද හෙතෙම ගිලනාට උපස්ථාන කරන්නේය' කියල. ඒ පාඨය සමහර කෙනෙක් තෝරන්නේ ගිලනකුට උපස්ථාන කිරීම බුදුපියාණන් වහන්සේට උපස්ථාන කිරීම හා සමානය කියලයි. නමුත් අපට කියන්න වෙන්නේ ඒ විදියෙ දෙයක් බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළා නම් අර වාක්‍යය

ඊට වඩා වෙනස්වයි ප්‍රකාශ කරන්න තිබුනේ, එහෙම නම් කියන්න තිබුනේ 'යමෙක් ගිලනාට උපස්ථාන කරයිද, හෙතෙම මට උපස්ථාන කරයි' කියල. අපි ඒකට හේතුව වශයෙන් දක්වන්නේ එක්තරා ප්‍රකට ධර්මෝපදේශයක් තිබෙනවා ධර්මයේ සඳහන්වෙලා,

'යො ධම්මං පසසති සො මං පසසති' කියලා.

'යමෙක් ධර්මය දකීද, හේ මා දකී.' යම් කෙනෙක් ධර්මය දකිනවා නම් ඒ තැනැත්තා බුදුරජාණන් වහන්සේ දැක්ක හා සමානයි. අන්න ඒ වාක්‍ය ක්‍රමය අනුව, න්‍යාය අනුව, අපි ගත්තොත් මේ අවස්ථාවේදී කිව යුතුව තිබුනේ 'යමෙක් ගිලනාට උපස්ථාන කරයිද, හෙතෙම මට උපස්ථාන කරයි' කියල, අර අපි කිව්ව මුල් අර්ථය නම්. නමුත් මෙතන බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරන්නෙ යමෙක් මට උපස්ථාන කරන්නේද? - කරන්නේ නම් - හෙතෙම ගිලනාටද උපස්ථාන කරන්නේය කියලයි. දැන් මේක තවත් පැත්තකින් සමහර කෙනෙක් තෝරනවා. මෙතනින් අදහස් කරලා තියෙන්නෙ බුදුරජාණන් වහන්සේට උපස්ථාන කිරීම හා කවදාවත් සමාන කරන්න බැරිය කියල ගිලනාට උපස්ථාන කිරීම. ගිහි පැවිදි ගිලනකුට උපස්ථාන කිරීම බුද්ධෝපස්ථානය තරම් ආනිසංස සම්පන්න එකක් නොවේය. මෙතෙන්දි අදහස් කළේ, බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළේ, මගේ අවවාදය පිළිගැනීම් වශයෙන් මට උපස්ථාන කරන්නේ නම් ගිලනාට උපස්ථාන කරන්නේය කියලයි. ඒ විදියටත් තෝරනවා. නමුත් ඒ අමුතුවෙන් වචනත් දලයි එහෙම තෝරන්නේ.

අපි ටිකක් නැවතිල්ලෙ කල්පනා කරල බැලුවොත් මේ කථාව අර පූතිගත්ත තිස්ස ස්වාමීන් වහන්සේගේ කථාන්තරයත් එක්ක සංසන්දනය කරලා අපට මේකෙ, මේ බුද්ධ වචනයෙ, නියම අර්ථය මතුකර ගන්න පුළුවන් වේවි. දැන් අර පූතිගත්ත තිස්ස ස්වාමීන් වහන්සේගේ කථාන්තරයේ අපට පෙනුනේ ඒ අර රහත් වෙන්න උපනිශ්‍රය සම්පත්තිය තිබුන නිසාත්, මහා කරුණා සමාපත්ති ඥානයට පෙනී ගිය නිසාත්, බුදුපියාණන් වහන්සේ එතෙන්දි තනිවම වැඩම කරල - උපස්ථායකයෙක් එක්කවත් නොවෙයි. තනිවම වැඩම කරල ඒ ගිලන් උපස්ථායක කටයුතු ආරම්භ කළා. නමුත් මෙතෙන්දි තියෙන්නේ බුදුපියාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේත් එක්ක සේනාසන චාරිකාවේ වඩින අතරේ, මේ සේනාසන චාරිකාව කියලා කියන්නේ පින්වතුනි, අර දක්ෂ පාලකයකු, දක්ෂ ගුරුවරයකු විසින් කළ යුතු එක්තරා දෙයක්. ඒක එක්තරා වටිනා චාරිත්‍රයක්. ඒ කියන්නෙ තමන්ගේ ගෝලයො කොහොමද වැඩ කටයුතු කරගෙන ඉන්නෙ

කියන එක බලන්න. දැන් ඔය හදිසි කඩා පැනීම් වශයෙන් සමහර දෙපාර්තමේන්තුවලත් ප්‍රතිසංවිධාන කරනකොට කරන්නෙ. අන්න ඒ වගේ මෙතන බුදුපියාණන් වහන්සේගේත් චාරිත්‍රයක් තිබුනා නොදන්වාම හෙම්හිට විහාරයෙන් විහාරයට වැඩම කරනවා. එතකොට ඒ ඒ තැන්වලදී සංඝයා වහන්සේලාගේ අඩුපාඩුකම් දැක්කහම ඒවට ඒ අනුව අවවාද කරන්න පුළුවන්. අන්න ඒ වගේ අවස්ථාවක් මෙතන තියෙන්නේ. ඉතිං මෙතන තියෙන්නේ බුදුපියාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේත් එක්ක වැඩම කරල අර භික්ෂූන් වහන්සේට ආනන්ද ස්වාමීන් වහන්සේගේ උදව්වත් ඇතිව උපස්ථාන කළා. කරලා ඉවරවෙලයි ඇවිල්ල අර විදියට අවවාද කළේ.

අපි ඒක අනුව කල්පනා කරල බැලුවොත් මෙන්න මෙහෙමයි ගන්න වෙන්නේ. දැන් මෙතන බුදුපියාණන් වහන්සේ අර ප්‍රකාශ කළ කාරණය අනුව පේනවා, මේ ශාසනයේ මවුපියන් නැති නිසා සංඝයා වහන්සේලා ඔවුනොවුන්ට උපස්ථාන කළ යුතු බව. එපමණක් නොවෙයි මේ ශාසනයේ තියෙනවා උපාධ්‍යාය-සද්ධිවිහාරික, ආචාර්ය-අන්තේවාසික කියල ගුරු ගෝල යුගල දෙකක්. බුදුපියාණන් වහන්සේ මේ සංඝයා වහන්සේලා අතර මනා පැවැත්ම සඳහා හරියාකාර මේ සංඝ සංස්ථාව ක්‍රියාත්මක වීම සඳහා ගුරු ගෝල මට්ටම් දෙකක්. එහෙම නැත්නම් යුගල දෙකක් දක්වල තිබෙනවා. උපාධ්‍යායයන් වහන්සේගේ ගෝලයා සද්ධිවිහාරික, ඊළඟට ආචාර්යයන් වහන්සේගේ ගෝලයා අන්තේවාසික. **මෙන්න මේ දෙගොල්ල අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව දක්වල තිබෙන්නේ පියාත් පුතාත් අතර සම්බන්ධතාවක් හැටියට.** ඒ විදියට බුදුපියාණන් වහන්සේ පනවා වදාරළ තිබෙන්නේ. එපමණක් නොවෙයි සහෝදර හැඟීමකින් යුක්තව සබ්‍රහ්මචාරීන් වහන්සේලාත් ඔවුනොවුන්ට උපකාර විය යුතු බව, උපස්ථාන කළ යුතු බව බුදුපියාණන් වහන්සේ කොතෙකුත් ප්‍රකාශ කරල තිබෙනවා. එතකොට යම් ආකාරයකින් ඒ අය ඒ වගකීම ඉටු කරන්නේ නැත්නම් මොකක්ද සිද්ධ වෙන්නෙ? බුදුපියාණන් වහන්සේගෙ දරුවො මේ ඔක්කොම - ශාක්‍ය පුත්‍ර ශ්‍රමණයන්. එතකොට මේ දරුවො ඒ විදියට හැසිරෙන්නෙ නැත්නම් බුදුපියාණන් වහන්සේටම සේනාසනයෙන් සේනාසනයට යමින්, විහාරයෙන් විහාරයට යමින් තමන් වහන්සේගේ උපස්ථායකයාත් උපකාර කරගෙන ගිලන් උපස්ථානය කරමින් යන්න සිද්ධ වෙනවා. අන්න ඒකයි බුදුපියාණන් වහන්සේ මෙතෙන්දි වදාළේ **'යමෙක් මට උපස්ථාන කරන්නේ නම් ගිලනාට ද උපස්ථාන කරන්නේය'** කියල. ඒ විදියට කල්පනා කරල බලනකොට මේ ගිලන් උපස්ථානය - **මෙතන කියවෙන කාරණය අනුව බලනකොට ගිලන්**

**උපස්ථානය බුද්ධෝපස්ථානයේම කොටසක්.** බුදුරජාණන් වහන්සේට කරන උපස්ථානයේම කොටසක්. ඒ මිසක් බුදුරජාණන් වහන්සේට උපස්ථාන කිරීමත් ගිහි පැවිදි ගිලනකුට වෙදහෙදකම්වලින් උපස්ථාන කිරීමත් එක හා සමානය කියල නම් ගන්න බැහැ.

කොහොම හෝ වේවා එතකොට මේක තුළින් අපට පේනව බුදුපියාණන් වහන්සේ ගිලන් උපස්ථානයට දුන්න තැන. එපමණක් නොවෙයි බුදුපියාණන් වහන්සේ විනය පිටකයේ යම් යම් නීති පණවන අවස්ථාවල නොයෙකුත් සහන සළසා දුන්න ගිලනට, 'ගිලානසස අනාපතති' කියල. ඔන්න යම්කිසි නීතියක් පණවල ඉවරවෙලා ගිලන ගැන කල්පනා කරල 'ගිලන් භික්ෂුවට එහි ඇවැතක් නැත' කියල ඇවැත්වලින් නිදහස් කරනවා. තවත් නොයෙකුත් ආකාරයෙන් බුදුපියාණන් වහන්සේ ගිලන් උපස්ථානය පිළිබඳව විනය පිටකයේ හෙම දක්වල තිබෙනව. එක් අවස්ථාවක බුදුපියාණන් වහන්සේ පෙන්නුම් කරනවා නියම ගිලන් උපස්ථායකයෙක් - එහෙම නැත්නම් **ගිලන් උපස්ථායකයකුගේ සුදුසුකම්** පහක් දක්වනවා. නියම ගිලන් උපස්ථායකයකුගේ පළමුවෙනි සුදුසුකම මොකක්ද? ඒ ලෙඩාට ඕන කරන බෙහෙත් සකස් කරල දෙන්න පුළුවන්කම තිබෙන්න ඕන. බෙහෙත් යෙදීම පළමුවෙනි කාරණය. දෙවෙනි සුදුසුකම ඒ ලෙඩාට සප්පාය අසප්පාය - සප්පාය කියන වචනය යොදන්නෙ යමෙකුට හිතකර කියන එකයි. හිතකර දේවල් සුදුසු දේවල්. එතකොට ලෙඩාට සප්පාය දේවල්, අසප්පාය දේවල් ඒ කාරණා තේරුම් ගන්න ඕන. ඒ වගේම අසප්පාය දේවල් ඉවත් කරල ලෙඩාට සප්පාය හිතකර දේවල් කිට්ටු කරන්නත් හැකියාව තිබෙන්න ඕන. ඊළඟට තුන් වෙනුවට දක්වන සුදුසුකම මොකක්ද? ඒ ලෙඩාගෙන් කිසියම් ලාභාපේක්ෂාවක් ලෙඩාට ලැබෙන ආහාර ටික ගන්නවත්, එහෙම නැත්නම් ලෙඩාගෙන් මිල මුදල්වලින් යම්කිසි ලාභයක් ප්‍රයෝජනයක් ලබා ගැනීමේ අපේක්ෂාවක්වත් - එහෙම අපේක්ෂාවක් නැතිව මෛත්‍රී සිතින් උපස්ථානය කරන්න ඕන. ඒකයි. ඊළඟ කාරණය. හතරවෙනි කාරණය ඒ ලෙඩාගෙ මළ මුත්‍ර, කෙල ආදිය, කෙල සෙම් සොටු වමන ආදිය, ඒවා ඉවත් කරන්න පුළුවන්කම තියෙන්න ඕන. පිළිකුලක් නැතිව ඒවා අතපත ගාන්න පුළුවන්කම තියෙන්න ඕන. පස්වෙනි කාරණය, විටින් විට අර ලෙඩාගේ හිත ධෛර්යවත් වෙන ආකාරයට ධර්මානුකූලව ධර්ම කථාවක් කරන්නත් හැකියාව තිබෙන්න ඕන, ධර්මයෙන් උපස්ථාන කරන්න. ඉතින් මේ හැම එකක්ම අර බුදුපියාණන් වහන්සේ ආදර්ශයෙනුත් පෙන්නුවා. අන්න එතකොට අපි හිතා ගන්න ඕන

බුදුපියාණන් වහන්සේ අවවාදයෙන් වගේම ආදර්ශයෙනුත් මේ ගිලන් උපස්ථානය ලෝකයාට පහදා දුන්න බව.

ඒ වගේම අනෙක් පැත්තට දක්වනවා අර හොඳ ගිලන් උපස්ථායකයකුගේ ගුණාංග කිව්ව වගේ **හොඳ ගිලනකුගේ ඒ කියන්නේ පහසුවෙන් උපස්ථානය කළ හැකි රෝගියකුගේ ලක්ෂණත්**, එහෙම නැත්නම් ගතිගුණත්, දක්වල තිබෙනවා. හොඳ කීකරු රෝගියෙක් නම් ඒ රෝගියා පිළිබඳව මෙහෙමයි දක්වෙන්නේ. ඒ රෝගියා දැනගන්න ඕන තමන්ට හිතකර දේ. හිතකර දේවල්වලට අනුව පවතින්න ඕන. 'සප්පාය කාරී' කියල කියනවා. ලෙඩේට ගැලපෙන ආකාරයට පවතින්න හැකියාව තියෙන්න ඕන. නැත්නම් උපස්ථායකයට හේ කර ගන්න බැරි වෙනවා. එතකොට ඒ විධියට පැවතීම තියෙන්න ඕන, තමන්ගේ ලෙඩේට ගැලපෙන ආකාරයට. දෙවෙනි කාරණය ඒ අර දෙන බෙහෙත් ආදී සප්පාය දේවල් පිළිබඳවත් ඒවයේ නියම ප්‍රමාණයත් දැනගන්න ඕන. මේක හොඳ ගුණ දෙයක් කියලා ඒක වැඩිපුර අනුභව කළොත් එහෙම, වැළඳුවොත් එහෙම, ඊළඟට ලෙඩක් හැදෙනවා. ඒකත් දැනගන්න ඕන. තමන් තමන්ට සප්පාය හිතකර දේවලත් ගත යුතු ප්‍රමාණය දැනගන්න ඕන. ඒක ලෙඩාට අයිති දෙයක්. තුන්වෙනි කාරණය ඒ දෙන බෙහෙත් ක්‍රමානුකූලව නිසි ආකාරයට පාවිච්චි කරන්න ඕන. බෙහෙත් ප්‍රතික්ෂේප කරන්නෙ නැතුව දිගට පාවිච්චි කරන්න ඕනෑ. හතරවෙනි කාරණය, තමන්ගේ උපස්ථායකයාට තමන්ගේ රෝගයේ තත්ත්වය නිවැරදිව තත්වූ පරිදි ඇති හැටියට ප්‍රකාශ කරන්න ඕන. ලෙඩේ දැන් හොඳ වෙනවද? වැඩි වෙනවද? දැන් සනීපද? ඒ හැම එකක්ම උපස්ථායකට පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕන. පස්වෙනි කාරණය බරපතල වේදනාවක් උනත් කෑ කෝ ගහන්නෙ නැතුව විඳ දරා ගන්න පුළුවන් ශක්තියක් තියෙන්න ඕන. ඔය විදියට බුදුපියාණන් වහන්සේ නියම ගිලන් උපස්ථායකයකුගේ ගුණාංගත් ඒ වගේම උපස්ථානයට පහසුවෙන රෝගියකු තුළ තිබිය යුතු පැවතුම් ආදියත් ඒ විදියට දක්වා වදාරළ තිබෙනවා.

ඒ වගේම මේ පින්වතුන් අහල තියනව බුදුපියාණන් වහන්සේම ධර්මයෙන් උපස්ථාන කළ අවස්ථාවල්. දැන් මේ පින්වතුන් අහල ඇති සමහර විට මුගලන් මහ රහතන් වහන්සේට, ඊළඟට මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට එහෙම අර බොජ්ඣංග පිරිත, ඒ ඉතාමත්ම දැඩි ගිලන් අවස්ථාවලදී බුදුපියාණන් වහන්සේම වැඩම කරල බොජ්ඣංග ධර්ම හත ප්‍රකාශ කළා. ඒක අහල ඉවර වෙනකොටම ඒ

ස්වාමීන්වහන්සේලාගේ ලෙඩත් සුව වුනා කියල කියවෙනවා. ඒ වගේම තවත් ඉතාමත්ම ප්‍රකට සූත්‍රයක් තමයි ගිරිමානන්ද සූත්‍රය. ගිරිමානන්ද සූත්‍රය බුදුපියාණන් වහන්සේ දේශනා කළේ ආනන්ද ස්වාමීන් වහන්සේ ඇවිල්ල බුදුපියාණන් වහන්සේට ප්‍රකාශ කළා, ගිරිමානන්ද ස්වාමීන් වහන්සේ බොහොම බරපතල ලෙස අසනීපව ඉන්නවා කියලා. බුදුපියාණන් වහන්සේ ඒ අවසථාවේ 'මම නොගියට කමක් නෑ. මෙන්න මේ සූත්‍රය දේශනා කළාම ලෙඩ හොඳ වෙයි.' කිව්වා. ඒ සූත්‍රය තුළ තියෙන්නෙ **දස සඤ්ඤා නමින් භාවනා මාතෘකා දහයක්, භාවනාව පිළිබඳව. ශරීරයේ රෝග තත්ත්ව - ඒවා පිළිබඳව හිත දියුණු වෙන විදියේ පුදුම විදියේ සූත්‍රයක් දේශනා කළා.** එතනත් ගිලන් උපස්ථානය. ඒකෙන් පේනවා එතකොට අපට ගිලනකුට උපස්ථානය කිරීම අර දොස්තරලට පවරලා කයින් පමණක් උපස්ථානය කිරීම නොවෙයි බුදුපියාණන් වහන්සේ අනුමත කරන්නෙ. **හිත තනන්න, හිත නිරෝගී කරන්න. හැකි නම් නිවන් දක්වාම හිත ගෙනැල්ලා සංසාර රෝගය නැති කරන්න පුළුවන් විදියට උපස්ථාන කරන්නත් පුළුවන් වෙන්න ඕන**, ගිලන් උපස්ථානයෙ ගැඹුරුම අංශය. ඉතින් ඔය විදියට කාරණා රාශියක් ඔය කතාන්තර තුළින් අපට මතු කරගන්න පුළුවන්. ඊට අමතරව දැන් අපි වෙන පැත්තකට හැරෙමු.

දැන් ඊළඟට මෙන්න මේ පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේගෙන් අපට ඉගෙන ගන්න තියෙන පාඩම මොකක්ද, උන්වහන්සේත් අපට පාඩමක් උගන්නලයි පිරිනිවන් පෑවේ. මොකක්ද පාඩම, අර ශරීරය කුණු වුණා. මොකද කුණු වුණේ? කාශ්‍යප බුද්ධ කාලයේදී කුරුලු වැද්දෙක් හැටියට තමන්ගෙ පාරිභෝගිකයන්ට කුණු නොවූ මස්, අලුත් මස් සැපයීමේ ව්‍යාපාරික චේතනාව උඩ අර අසරණ සතුන්ගෙ අඬු කඩල පියාපත් ගලවල රැයක් තබා ගත්තා. මේ මොකද අර මස් ටික කුණු වෙනවට බයේ. ඔය බරපතල පාප කර්මයේ විපාකයයි එතකොට පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේට පල දුන්නෙ. දැන් මේ අවසථාවේ මේ පින්වතුන් සමාදන් වුන ආජීව අෂ්ටමක ශීලයෙත් තිබෙනවා මේ පින්වතුන් අහල ඇති ශ්‍රද්ධාවන්ත ගිහියකු විසින් නොකළ යුතු දිවි පැවතුම්. එහෙම නැත්නම් රක්ෂාවල් හැටියට දක්වනව මාංශ වෙළඳම, සතුන් මසට ඇති කිරීම, අන්න ඒ ආජීවය තමයි ඒ පූතිගත්ත තිස්ස ස්වාමීන් වහන්සේත් කළේ. එතකොට ඒ කර්මයේ විපාකයයි උන් වහන්සේට ඒ අවසාන ජීවිතයේදීත් විපාක දුන්නෙ. එතකොට අපිත් කල්පනා කරන්න ඕන. අපි ධනය රැස් කිරීමේ අදහසින් ඒ විදියෙ දේවල්වලට යොමු වුනොත් පාරිභෝගිකයන්ට අලුත් මස් සැපයීමේ අදහසින් අර විදියට කෲර වධ හිංසා සතුන්ට පැමිණෙව්වොත් **සත්ත්ව හිංසාවේ පැහැදිලි කර්ම විපාකය**

තමයි ආබාධ බහුල බව, ලෙඩ රෝග බහුල බව. අපි හැම දෙනෙක්ම කල්පනා කරන්න ඕන අපට මේ ඇතිවෙන ආබාධවලින් රාශියක්ම සමහර විට සියල්ලම මේ දීර්ඝ සංසාරේ දී අපි නොයෙකුත් ආකාරයෙන් කළ සත්ත්ව වධ හිංසාවල විපාක කියලා. එතකොට අපි මේවායින් පාඩම් ඉගෙන ගන්න ඕන. ඒ තුළින් අපට පේනවා මේ කර්ම විපාකයේ බලගතු කම. අපි මේවායින් පලා යන්න කොච්චර උත්සාහ ගත්තත් අපට මොන ආකාරයකින් නමුත් ඒව විඳවන්න සිද්ධ වෙනවා. ඒක නිසාම අර අනාථ තත්ත්වයකට පත්වෙලා ලේ සැරව ගලලා මහ භයානක අන්දමින් අන්තිමට ඇටත් කුඩු වුණා කියලා කියනවා. දැන් මේ කාලෙත් නා නා විධ රෝග තියනවා. අපි ඒවාට හේතු දන්නෙ නෑ. නමුත් නියම හේතුව ඔය කර්ම හේතුවයි කියල අපට හිතාගන්න පුළුවන් මේක ආශ්‍රයෙන්. ඔන්න ඔය විදියෙ තත්ත්වයක් මේ සංසාරෙ තියෙනවා. ඒක නිසා ඇත්ත වශයෙන්ම මේ සංසාරය භයානක තැනක්. ඇතැම් කෙනෙක් ඒ විදියෙ ජීවිකාවන්ට පෙළඹෙන්නෙ තමන්ගෙ ජීවත්වීම පිළිබඳ ප්‍රශ්නය නිසයි. ජීවත්වීම කියල කියන්නෙ මොකක්ද පින්වතුනි? මේ ශරීර කූඩුව තව කලක් පවත්වා ගැනීමයි. තවත් කෙනෙක් එය සාමාන්‍යයෙන් පවත්වා ගැනීම පමණක් නොවෙයි මේක පුෂ්ටිමත් කර ගැනීම, ශක්තිමත් කර ගැනීම - ඒක සඳහායි ඔය මාංශ භක්ෂණය ආදියෙහි යෙදෙන්නෙ. මාංශ ජනක ධාතු වැඩියෙන්ම අඩංගු කොතනද කියන එක මේ පින්වතුන් දන්නවා. එතකොට ඒවා ලබා ගැනීමේ චේතනාවෙනුයි ඒවාට යොමුවෙන්නෙ. ඒවා කවදාහරි ගෙවන්න සිද්ධ වෙනවා. ඒ හැම එකක්ම කරන මේ ශරීරයේ තත්ත්වයයි, මේ ශරීරයේ කතාන්තරයයි අර කෙටි ගාථාවෙන් බුදුපියාණන් වහන්සේ දේශනා කළේ. ඒ දැන් අපි මාතෘකා කළ ගාථාවයි. ඒ ගාථාවම ප්‍රමාණවත් වුනා පූතිගත්ත තිස්ස ස්වාමීන් වහන්සේට අර්හත්වය සාක්ෂාත් කරන්න. ඒ ගාථාව අපි නැවතත් මතක්කර ගනිමු.

'අචිරං වතයං කායො - පඨවිං අධිසෙස්සති
ඡුද්දො අපෙත විඤ්ඤාණො - නිරත්ථංව කලිඞ්ගරං'

'වැඩිකල් නොයාදීම විඤ්ඤාණය ඉවත් වූ මෙ කය මේ ශරීර කූඩුව අතහැර දමන ලදුව, කැලේ වීසි කරල දාල තියෙන එකක් වගේ වැඩකට නැති දඬු කඩක් මෙන් පොළොවෙහි වැතිර ගන්නේය' කියන එකයි. ඉතින් මේක අර පූතිගත්ත තිස්ස ස්වාමීන් වහන්සේට ඉතාමත්ම ප්‍රත්‍යක්ෂ කාරණයක් වුනා. අර විදියට ලේ සැරව ගලලා, ඇට බිඳිලා, හරියට වනේ දිරා ගිය වේයන් කාපු දඬු කඩක් වගේ මේ ශරීරය තිබුණු අවස්ථාවේදියි බුදුපියාණන් වහන්සේ ඒ ගාථාව වදාළේ. ඇයි බුදුපියාණන් වහන්සේ ඒ විදියට ප්‍රකාශ කළේ? අපි මේ දීර්ඝ සංසාරයේ ගමන් කරන්නේ අපේ මේ ශරීරයට තියෙන ඇල්ම නිසයි.

මේ ශරීරය හැඩ වැඩ කරන්න, තරබාරු කරගන්න, ශක්තිමත් කරගන්න, අපි නොයෙකුත් විදියේ උපක්‍රම - ධර්මයෙන් නොවෙයි අධර්මයෙන් බොහෝ විට - උපක්‍රම යොදනවා. මේ ඔක්කොම කරන්නේ මේ ශරීර කූඩුව සඳහායි. නමුත් යම්කිසි අවස්ථාවක් එනවා මේ ශරීරයෙන් විඤ්ඤාණය ඉවත් වෙනවා. විඤ්ඤාණය ඉවත්වෙලත් ඒක එතනින් කෙළවර වෙන්නේ නෑ. ඒක ඊළඟට තවත් ශරීර කූඩුවක් අල්ල ගන්නවා. ඒ ශරීර කූඩුවේ තත්ත්වය තීරණය වෙන්නෙ තමන්ගේම අතීත කර්මය අනුවයි. මේ පූතිගත්ත තිස්ස ස්වාමීන් වහන්සෙගෙ නම් සංසාරය එතනින් කෙළවර වුනා. සාමාන්‍ය කෙනකුගේ අර විදියට කර්ම වේගයත් ගෙවලා ඊළඟට ගිහිල්ල උපදින්නෙ තවත් ඒ විදියෙම තැනක වෙන්න පුළුවන්. ඒ විදියෙ භයානක තත්ත්වයක් තියෙනවා. එතකොට ධර්මානුකූලව අපි කල්පනා කරනවා නම් අපේ පරමාර්ථය විය යුත්තේ මේ ශරීර කූඩුව පවත්වා ගැනීම නම් මොකටද පවත්වා ගන්නේ? අර බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළ ජීවිතය පිළිබඳ, විශ්වය පිළිබඳ, සත්‍යතාව වන **අනිත්‍ය, දුඃඛ, අනාත්ම කියන ත්‍රිලක්ෂණය වටහා ගැනීමේ පරමාර්ථයෙනුයි අපි මේ ශරීරයක් පවත්වා ගත යුත්තේ.** එතකොට ත්‍රිලක්ෂණය තේරුම් ගැනීමටයි ඒ අවබෝධය ලබා ගැනීමටයි මේ ශරිර කූඩුව පවත්වා ගන්නෙ. එහෙම නැත්නම් දැන් ඔය සොහොනක වීසි කරන ලද ශරීරයක් දිහා බැලුවහම මේ පින්වතුන්ට හිතා ගන්න පුළුවන් - අතීතයේ නම් බොහෝ විට මේ කාලෙ වගේ නොවෙයි අමු සොහොනක් කියලා එකක් තිබුණා. අමු සොහොන්වලයි ගිහිල්ලා මේ මිනී දමන්නෙ. අමු සොහොනක දමාපු මිනියක් දවසකින් දෙකකින් හොඳටම ඉදිමෙනවා. පුෂ්ටිමත් වෙන්න පුළුවන් ඉහළම මට්ටමට පුෂ්ටිමත් වෙනවා, දවස් දෙක තුනක් යනකොට. ඊළඟට නිල්පාට වෙනව. ඊළඟට මේක පැසවලා පුපුරලා ගලා ගෙන ගිහිල්ලා අන්තිමට අර සමත් ඉවත්වෙලා ඇට ගොඩ විතරක් ඉතිරි වෙනව දවස් ගණනක් යනකොට. ඔන්න ඔය විදියට ශරීරය පිළිබඳ ඉතිහාස කථාව ඕකයි.

මේක සාමාන්‍ය ලෝකයාට අමාරුවෙන් හිතලා හිතට ද ගත්තොත් මිසක් සාමාන්‍යයෙන් වැටහෙන්නෙ නෑ. හිතන්න පෙළඹෙන්නෙත් නෑ. නමුත් අපි මේව හිතන්නෙ මොකටද? මේවා තුළින් බුදුපියාණන් වහන්සේ පෙන්නුම් කරන්නෙ අපි **මේ සංසාරෙන් ගැලවෙන්න බලාපොරොත්තු වෙනව නම් මෙන්න මේ ශරීර කූඩුවට ඇති ඇල්ම අපි නැති කරන්න ඕන.** මේ ශරීර කූඩුව කියල අපි ව්‍යවහාර කරනවා. මේක තවත් විදියකින් අපි හිතනවා නම් ගිරවෙක් එහෙම නැත්නම් කුරුල්ලෙක් ඉන්න කූඩුවක් කියල ගත්තත් කමක් නෑ. **මේ ශරීර කූඩුවට ඇල්ම ඇති තාක් අපි මේ කූඩුවෙන් හිත ඉවත් වුණත් ගිහිල්ල වෙනත් කූඩුවකට ඇතුල් වෙනවා.** අන්න ඒ විදියෙ

තත්ත්වයක් මේ සංසාරෙ තිබෙනවා. ඒක නිසා බුදුපියාණන් වහන්සේ දක්වන්නේ ක්‍රමානුකූලව අනිත්‍ය, දුඃඛ, අනාත්ම කියන ඒ ත්‍රිලක්ෂණය එක්කො භාවනාමය වශයෙන් වැඩීම තුළින්, භාවනාමය වැඩීම කියල කියන්නෙ ඇත්ත වශයෙන්ම මේකට උපකාර කරගන්න ඕනෙ තමන්ගේම ශරීරයයි. පූතිගත්ත තිස්ස ස්වාමීන් වහන්සේට නම් මේක පහසුවෙන්ම වැටහුණේ ශරීරයත් ඒ තත්ත්වයටම පත්වෙලා තිබෙන නිසයි. නමුත් ඇතැම් කෙනකුට මේක ඒ තත්ත්වයට පත්වුනත් වැටහීම එන්නෙ නෑ. අපි ඒ තත්ත්වයට පත්වෙනකන් ඉන්නෙ නැතුව බුදුපියාණන් වහන්සේ දක්වා වදාළ ධර්මෝපදේශ අනුව ඊට අවශ්‍ය නිසි භාවනා - අසුභ භාවනා විශේෂයෙන්ම ඔය සොහොනක ශරීරයට යන කල දසාව, ඊළඟට දෙතිස් කුණප කොට්ඨාස, මේවා පිළිබඳව බුදුපියාණන් වහන්සේ මෙනෙහි කරන්න කියල තියෙන්නෙ මේ ශරීරය පිළිබඳව ඇල්ම අත හැරීමයි. බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරල තිබෙනවා මේ පංචස්කන්ධය පිළිබඳව ඇල්ම ඉවත් කරන තාක් මේ සංසාරෙන් මිදීමක් ලැබෙන්නෙ නෑ කියල.

ඉතින් වඩාත්ම ඇහැට පෙනෙන දේ තමයි රූපය, රූපසකන්ධය. මේ රූපයේ ඇති දුක් ස්වභාවය, දුක් දෙන ස්වභාවය, ඒක එකොළොස් ආකාරයකින් බුදුපියාණන් වහන්සේ දක්වල තිබෙනවා. 'අනිච්චතො, දුක්ඛතො, රොගතො, ගණ්ඩතො, සල්ලතො. අඝතො, ආබාධතො, පරතො, පලොකතො, සුඤ්ඤතො, අනත්තතො' කියල. මේ ශරීරය දිහා බැලිය යුතු ආකාරය අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, රෝගයක් වශයෙන්, ගඩක් වශයෙන්, හරියට පිළිකාවක් වගේ දෙයක් කියල, එහෙම නැත්නම් මේ මහ කරදර සමූහයක් හැටියට, ආබාධයක් හැටියට, අනුන්ට අයිති දෙයක් හැටියට, හිස් දෙයක් හැටියට, අනාත්ම දෙයක් හැටියට, බිඳී යන ස්වභාවය ඇති දෙයක් හැටියට, ඔය විදියට නොයෙකුත් ආකාරයෙන් මේ ශරීරය දිහා බලන්න කියල බුදුපියාණන් වහන්සේ වදාරලා තියෙන්නේ මොකද? **මේ සසර කලකිරීම නිවනට උපකාර වෙන නිසයි.** එතකොට මේ රූපස්කන්ධය පිළිබඳව පමණක් නොවෙයි. වේදනා ස්කන්ධය - මේවායේ මේ එක වේදනාවක් කොයි තරම් සැප වේදනාවක් වුනත් මොහොතකින් ඒක ඊළඟට වෙන පැත්තකට හැරෙනවා. එහෙම නැත්නම් සමහර විට සැප වේදනාවම දුකක් හැටියට මතුවෙලා එනවා. සැප හැටියට හිතා ගත්ත ප්‍රියයන් හා එක්වීම, ඊළඟට ප්‍රිය විප්‍රයෝග වශයෙන් දුකක් බවට පත් වෙනවා. ඔන්න ඔය විදියෙ තත්ත්වයක් තිබෙන්නේ. ඒක නිසා තමයි බුදුපියාණන් වහන්සේ වදාළෙ මේ ශරිර කූඩුව ගැන පළමුවෙන්ම මේකේ ඇති අනිත්‍ය ස්වභාවය, දුක් ස්වභාවය, අර කියාපු විදියට රෝගයක් ආබාධයක් හැටියට. ඒ විදියට කල්පනා කරන්න, ඒ විදියට දැකීමට පුරුදු වෙන්න කියලා. ඒක තුළින් තමයි ඉස්සෙල්ලම අනිත්‍යතාව තුළින් - ඊළඟට මේකෙ දුක් ස්වභාවය, අනාත්ම

ස්වභාවය, ඒ වටහා ගැනීම තුළින් තමයි කෙනකුට පංචස්කන්ධය පිළිබඳව එහෙම නැත්නම් නාම රූප ධර්මයන් පිළිබඳව කලකිරීම ඇති කරගන්න පුළුවන් වන්නෙ. යම් ප්‍රමාණයකට මේකෙ යථා තත්ත්වය තේරුම් ගන්නව නම් ඒ ප්‍රමාණයට කලකිරීම ඇති වෙනවා. යම් ප්‍රමාණයකට කලකිරීම ඇති වෙනවා නම් - සසර කලකිරීම ඇති වෙනව නම්, ඒ ප්‍රමාණයට නිවනට ළං වෙනවා. එතකොට නිවන කියල කියන්නෙ මෙන්න මේ දීර්ඝ කාලයක් කර්මානුරූපව පහළවෙන මේ භවය - එහෙම නැත්නම් ඒ ඒ තැන්වල ගිහිල්ලා ඉපදීම - ඉපදීමත් එක්කම කෙනකුට හිමිවෙන ජාති, ජරා, ව්‍යාධි, මරණ කියල කියන මෙන්න මේ දුක්වලින් - ගැලවීමයි, මේ නිවන කියන්නේ. වෙන අමුතු සදකාලික ස්වර්ගයක් නොවෙයි.

අන්න එතකොට අපි මේ බුද්ධ ධර්මය අනුව කල්පනා කරන්න ඕන බුදුපියාණන් වහන්සේ වදාළ ඒ දුඃඛ සත්‍යය - 'දුක්ඛං පරිඤ්ඤෙය්‍යං' කියලයි බුදුපියාණන් වහන්සේ වදාළේ. ලෝකය දුකයි කියල සාමාන්‍ය ලෝකයා කතා කරන්නෙ දුකේ ඉතාමත්ම සුළු කොටසක් ගැන. බුදුපියාණන් වහන්සේ දුක පිරිසිඳ දැන ගන්නයි කියල, හරියාකාරව තේරුම් ගන්නයි කියල කියන්නෙ මේක සියයට සියයක්ම මේ මුළු මහත් පැවැත්මම දුකක් කියන ඒ අවබෝධය කරා යන්නෙයි කියන එකයි. ඒක ඇත්ත වශයෙන්ම සාමාන්‍ය ලෝකයාට වැටහෙන්නෙ නෑ. අර කුඩා දරුවෙක් මොහොතකට අඬමින් ඉඳල හිනාවෙන්න වගේ මේ ලෝකයාත් කොයිතරම් දුකකට පත් වුනත් ප්‍රිය විප්‍රයෝග දුඃඛ, ලෙඩ දුක් ආදී කොයි දුකකට පත් වුනත් ඊළඟට ඩිංගක් සනීප වුන හැටියේ අර ඔක්කොම මතක නෑ. ආයෙත් අර අවිද්‍යාව තුළින් භවයේ ගැලෙනවා. ඔන්න ඔය විදියෙ තත්ත්වයක් සංසාරයේ තිබෙන්නෙ. අන්න ඒක නිසා මේක උත්සාහයෙන් මතු කර ගත යුතු දෙයක්. **බුදුපියාණන් වහන්සේ දක්වන මේ භාවනා මනසිකාරය කියන එක උත්සාහයෙන් මතු කර ගත යුතු දෙයක්**, එහෙම නැත්නම් මේක අවිද්‍යාව වශයෙන් යටපත් වෙනවා. යටපත් වෙන්න, යටපත් වෙන්න, දීර්ඝ කාලයක් සංසාරයේ ගමන් කරන්න වෙනවා. ඒක නිසා ඒකට ඕන කරන නිමිති කමටහන් ආදිය බුදුපියාණන් වහන්සේ මතු කරල දීල තිබෙනවා. ඉතින් මේ දුක හරියාකාරව තේරෙනකොට ඒ එක්කම තේරෙන්න ඕන ඒකෙ යට තිබෙන තණ්හාව. යම් ප්‍රමාණයකට යම් දුකක් ඇති වෙනවා නම් ඒකෙ යට අවශ්‍යයෙන්ම තණ්හාව ඒ එක්කම තිබෙනවා. යම් කිසි කෙනකුගේ මරණය නිසා අපි වැළපෙනවා නම් ඒකෙ යට තිබෙන්නෙ ඒ පුද්ගලයාට තිබෙන තණ්හාව, ආශාව. අන්න ඒ විදියට තමයි වස්තුව නැති වීමෙන් අපි දුක් වෙන්නෙ. ඒ වස්තුවට තියෙන තණ්හාව නිසයි. ඔන්න ඔය ධර්මතාව අපේ ශරීරය පිළිබඳවත් එහෙමයි. අපේ ශරීරය පිළිබඳව මේ දැඩි ඇල්ම තියෙනතාක් අපි

මරණයෙන් වත් මේ ශරීරයෙන් ඉවත් වෙන්න කැමති නෑ. ඊළඟට ඒක නිසාම තමයි අර ඒ වෙනුවට වෙන කුඩුවක් මවා ගන්නෙ. අපි බලාපොරොත්තු වුනාට අපට ඕන විදියට නෙවෙයි කුඩුව මැවෙන්නෙ. තමන් කරන ලද කර්මය අනුවයි. ඔන්න ඔය විදියෙ තත්ත්වයක් මේ සංසාරෙ තිබෙනවා. ඒක නිසා තමයි බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළ අර ධර්මෝපදේශයයි, මෙතන ඉතාමත්ම වටිනාම ගිලන් උපස්ථානය වෙන්නෙ. බුදුපියාණන් වහන්සේ ඒ පූතිගත්ත තිස්ස ස්වාමීන් වහන්සේට කළ අර අනිත් බාහිර ගිලන් උපස්ථානයට වඩා වැදගත් වෙනවා ඒ ගාථාව තුළින් දුන්න ධර්මෝපදේශය. ඒ තුළින් තමයි උන්වහන්සේට සියලු සසර දුක් කෙළවර කර ගන්න පුළුවන් වුනේ.

දැන් ඒ වගේම අපි සත්ත්ව ලෝකය දිහා බැලුවහම ඊටත් වඩා භයානක දුක් සහිත තත්ත්ව, සංසාරයේ විවිධ භව තිබෙන බව බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරලා තිබෙනවා. මනුෂ්‍ය ආත්ම භාවය කියන එකේ, මේ මිනිසා තුළ තියෙන මේ හිත, මේක ඉතාමත්ම වටිනා දෙයක්. මේ වටිනා හිත අපි කොයි විදියටද පාවිච්චි කරන්නේ? විශේෂයෙන්ම මේ යුගයේ අපි සමහර විට මේ හිත, වෙන ලෝකයේ දේවල්වලට වෙන ලෝකවල් කරා යන්න, මේ අපේ තණ්හාව මගින් ඉදිරිපත් කෙරෙන ඉලක්ක සම්පූර්ණ කර ගන්න, ඒවාටයි හිත යොදවා ගන්නේ. නමුත් බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. අනන්ත කාලයක් මේ සංසාරෙ ගමන් කරලා තිබෙනවා. යමෙකුට **කරන්න තිබෙනවා නම් තියෙන්නේ මෙන්න මේ සංසාර ගමන නතර කර ගැනීමයි**. ඒකටයි බුදුපියාණන් වහන්සේ ආර්ය අෂ්ටාංගික මාර්ගය දක්වලා තිබෙන්නෙ. අපේ මේ දැක්ම හරි ආකාර කෙලින් කර ගන්න ඕන. අපේ මේ දෘෂ්ටිය කෙලින් කර ගන්න ඕන, ධර්මානුකූලව. ලෝකයා තුළ තියෙන්නේ එහෙම පිටින්ම භවය වඩන දෘෂ්ටියක්. එහෙම පිටින්ම මේ භවය තුළම හැසිරෙන භවය වඩන විදියේ සුඛෝපභෝගී ලෝකයා අනුව යන දෘෂ්ටියක්. බොහෝ විට බෞද්ධයන් තුළ පවා තිබෙන්නෙ. නමුත් බුදුපියාණන් වහන්සේ මතක් කරලා දෙනවා අන්න සසර කලකිරීමට උපකාර වන විදියේ අර අසුභ භාවනා - ඒ වගේම අනිත්‍ය, දුඃඛ, අනාත්ම ආදී ත්‍රිලක්ෂණය නිතර සිහිපත් කිරීම තුළින් කෙනකුට නිවනට ළං විය හැකි බව.

මේ ධර්මෝපදේශය තමයි කෙනකුට දෙන්න පුළුවන් උසස්ම ගිලන් උපස්ථානය. අපේ හිතවත් කෙනෙක් ගිලන්වෙලා ඉන්න අවස්ථාවක අන්න අර බුදුපියාණන් වහන්සේ පෙන්වල දුන්න ආකාරයට මේ ජීවිතයේ යථා තත්ත්වය, ශරීරයේ යථා තත්ත්වය

අවබෝධ කරලා දෙන්ට ඕන. ඒකම තමයි අර ගිරිමානන්ද සූත්‍රයේ බුදුපියාණන් වහන්සේ එතන හැංගුවේ නෑ. බුදුපියාණන් වහන්සේ එතන මේ ශරීරය තුළ තියෙන රෝග ලේඛනයක් දැක්වූවා. ගිලනකුට රෝග ලේඛනයක් අහන් ඉඳීමෙන් සුව වෙන්නේ කොහොමද කියලා සමහර කෙනකුට සැක හිතෙන්න පුළුවන්. නමුත් **බුදුපියාණන් වහන්සේගේ ප්‍රතිකාර ක්‍රමය මොකක්ද, ගිලනාට යථාර්ථයට හිත ගෙන ඒමට උදව් දීමයි.** ඒ යථාර්ථයට හිත ගෙන ඒම තුළින් අර දුකෙන් ඇතිවන පීඩාව ඉවත් කර ගන්න පුළුවන් වෙනවා. මේ ශරීරයේ තත්ත්වය මේකයි කියලා අවබෝධය ඇති කෙනාට අපි හිතමු දැන් ඒ ගිරිමානන්ද සූත්‍රයේ රෝග ලේඛනයක් තියෙනවා. ඒක අහනකොට කෙනකුට ටිකකට හිතෙන්න පුළුවන් මේ රෝග සමූහයෙන් කීයෙන් කීයක්ද මට තියෙන්නෙ. මට එපමණකින් වත් සැනසීම තියෙනවා. නමුත් ශරීරයේ සවභාවය නම් මේක එකම රෝග කූඩුවක් කියලා ඒ වෙලාවේ කල්පනා කරන්න පුළුවන්. එපමණක් නොවෙයි ඒ ලේඛනය අවසාන වන්නේ, අවසාන වන ලෙඩ කීපය ගැන හිතලා බලනකොට මුළු මහත් ශරීරයම ලෙඩ කූඩුවක් කියන එක ඔප්පු වෙනවා. එතන අවසාන වශයෙන් දැක්වෙන්නේ 'සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො' කියලයි. මේ ශරීරයේ අවම වශයෙන් තිබෙන ලෙඩ (6) හයක් එතන දක්වනවා. සීතල දැනෙනවා, උෂ්ණය දැනෙනවා, කුසගින්න දැනෙනවා, පිපාසය දැනෙනවා, කුසගින්නත් පිපාසයත් නිසා අනිවාර්යයෙන්ම මළ මුත්‍ර පහ කිරීම කරන්න සිද්ධ වෙනවා. රෝගාබාධ අඩු දීර්ඝායුෂක මනුෂ්‍යයින් ඉන්න කාල සීමාවල පවා ඔය රෝග හය තුබුණ බව පොත පතේ සඳහන් වෙනවා.

ඕක අනුව අපි කල්පනා කරන්න ඕන එතකොට මේ ශරීරය කියලා කියන්නේ මේක දෙවියන්ගේ මහ පුදුම අමුතු නිපැයුමක් නොවෙයි. නිරෝගී තත්ත්වය මේ ශරීරයට අයිති දෙයක්. රෝගය කියන එක ආගන්තුකව ආපු දෙයක් කියලයි ලෝකයේ බොහෝ දෙනා කල්පනා කරන්නේ. රෝගය කියන එක බාහිරව ආපු දෙයක් කියලයි. නමුත් බුදුපියාණන් වහන්සේ දක්වන්නේ මේක රෝග කූඩුවක්. **මේකෙ ස්වභාවය රෝගී බවයි. නිරෝගි කියන එක එහෙම පිටින්ම ඇති කර ගත්තු මාන්නයක් පමණයි.** ඒක තමයි බුදුපියාණන් වහන්සේ අර නකුල පිතා ගෘහපති කියන එක්තරා උපාසකයකුට ප්‍රකාශ කරන්නෙ. ඒ ගිලන් අවස්ථාවේ බුදුපියාණන් වහන්සේ දුන්න අවවාදය - 'ආතුර කායස්ස මෙ සතො චිත්තං අනාතුරං භවිස්සති' අන්න ඒ විදියට හිතන්නෙයි කියලා. 'මේ මගේ කය ලෙඩ වුනත් හිත ලෙඩ කරගන්නේ නෑ' කියල. එහෙම හිතන්නෙයි කියලා අවවාද කළේ මොකද?

බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා 'යම් කිසි කෙනෙක් මේ ශරීර කූඩුවේ හැටියට එක මොහොතක් වත් නිරෝගි බව අනුව මාන්නයක් ඇති කර ගන්නවා නම් ඊට වැඩිය මෝඩ කමක් නෑ' කියල. එතකොට **අපි මේ නිරෝගී බව කියල කියන එක අර රෝගය හැංගුන අවසථාවක් පමණයි. නිරෝගී බව කියන එකයි ආගන්තුක. රෝගයයි අපට අයිති.** එහෙම හිතා ගන්ට ඕන. එතකොට අන්න ඒ විදියට කල්පනා කරනකොට අපේ මේ ශරීර කූඩුව ගැන ඇති ඇල්ම අඩු වෙනවා. **මේ කූඩුවට ඇති ඇල්ම ඉවත් කරන තාක් අපි මේ සංසාරයේම යනවා.** ඒකයි බුදුපියාණන් වහන්සේ එහෙම වදාළෙ. මේක සර්වාශුභවාදයක් හැටියට ඇතැම් කෙනෙක් හිතනවා. ඒ විදියෙ දෙයක් නොවෙයි. මේක අවශ්‍යයෙන්ම කළ යුතු දෙයක් නිසයි බුදුපියාණන් වහන්සේ දක්වන්නේ. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියන ඒවා පිළිබඳව කලකිරීම, එහෙම නැත්නම් නාම රූප ධර්ම හැටියට දක්වන ඒ තමා කියල හිතාගන්න ඒ පුද්ගලයා පිළිබඳව තිබෙන සංඥව, ඒකෙ ඇති අනිත්‍ය, දුඃඛ, අනාත්ම සවභාවය තේරුම් නොගන්න තාක් මේ සංසාරයෙන් මිදෙන්න බෑ කියලා. ඒක නිසා ඒක අවබෝධ කර ගැනීමටයි අපේ උත්සාහය විය යුත්තේ. අපි මේ ශීල සමාධි ප්‍රඥ වඩන්නේ, දන, සීල, භාවනා ආදී මුළු මහත් බෞද්ධ ප්‍රතිපදවේම ඉලක්කය මේ සංසාරයෙන් මිදීමයි.

බුදු කෙනෙක් පහළ වෙනකොටත් ලෝකෙ අන්‍යාගමිකයින්ට පවා මේ සසරින් මිදීමේ ඉලක්කය තිබුණා. යම් ආකාරයකින් ඔවුන් ගත්තු මාර්ගය, ඔවුන්ගේ දෘෂ්ටිය වැරදියි. නමුත් ඔවුන්ට තේරුණා ඒ ඒ ප්‍රමාණයෙන්, මොකද, විශේෂයෙන්ම ඒ කාලයේ හිටියා තාපසයින් එහෙම අභිඥලාභී අය. අභිඥලාභී කියල කියන්නේ පින්වතුනි, බුදුරජාණන් වහන්සේ පහළ වෙන්න කලිනුත් නොයෙකුත් තාපසවරුන් හිටියා, ධ්‍යාන භාවනා වඩල සමථ අංශයෙන් ඉහළටම ගිහිල්ලා. අර ආලාර කාලාම, උද්දකරාමපුත්ත ආදීන් ගැන කියවෙන්න වගේ. ඒ අයට අභිඥ බලයෙන් තමන්ගේ අතීත ජාති පෙනුනා. අතීතයේ ඒ ජීවිත, දිවි පැවතුම් ආදිය පෙනුනා. ඒවා පෙනුනා නම් ඒ වගේම මේ සංසාරයේ දුක් ස්වභාවයත් අවශ්‍යයෙන්ම පෙනිය යුතුයි. ඒ නිසා තමයි ඒ හැම කෙනෙක්ම මේ සසරින් මිදීම ප්‍රාර්ථනා කළේ. නමුත් ප්‍රාර්ථනා කළාට මොකද? ඒකට ඕන කරන මූලිකම උපන්‍යාසය එහෙම නැත්නම් මේ බුදුපියාණන් වහන්සේ දක්වා වදාළ අනාත්ම සංඥව, අනාත්මය කියන අදහස ඒ අයට ඇතිවුනේ නෑ. ඒක නිසා මෙයින් මිදෙනවා කියලා හිතා ගත්තෙ යම්කිසි සදකාලික භවයක්, එහෙම නැත්නම් බ්‍රහ්ම ලෝකයක්, ඒ විදියෙ තැනක ගිහිල්ල ඉපදීමයි.

ඒකයි ඒ අයගේ පරමාර්ථය හැටියට තිබුනෙ. බුදුපියාණන් වහන්සේ විතරක් පෙන්නුවා මේ සංසාර රෝගය සම්පූර්ණයෙන්ම සියයට සියයක්ම නැති කරන තුරු මේකෙ ටිකක් හරි ඉතුරු වුනොත් දිගට දිගට යනවා කියලා. ඒක කොයි තරම්ද කියතොත් එක් අවසථාවක බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළා මහණෙනි, ඉතා සුලු ප්‍රමාණයේ අසුචි ටිකක් වුනත් ගඳ ගහන්න වගේ මම භවය එක මොහොතකටවත් වර්ණනා කරන්නේ නෑ කියලා. ඉතාම සුලු ප්‍රමාණයක අසුචි වුනත් ගඳ ගහන්න වගේ **මේ භවය, බ්‍රහ්ම ලෝකත් ඇතුළු මුලු මහත් භවයම ගඳ ගහනවා, එහෙම නැත්නම් දුකෙන් ගඳ ගහනවා කියන එකයි බුද්ධ වචනය.** ඒක හිතෙනකොට කෙනකුට භය හිතෙනවා. මොකද ඒ තරමට සත්ත්වයා තුළ භව රාගය දැඩියි. දුක නැති කර ගන්ට ඕන. නමුත් ඒ නැති කර ගන්නව කියල හිතන්නේ තවත් දුක් ගොඩක් බද ගැනීම පමණයි. ඉතින් ඔන්න මේක හරියට අර රෝහලක තත්ත්වයක් වගෙයි. මුලු මහත් පැවැත්මම රෝහලක් කියලා ගන්න පුළුවන්. ඒ අතින් බලනකොට මේ සංසාරෙ පැවැත්ම තුළ විවිධ ජාතිවල උත්පත්තිය ලබලා, ඒ හැම එකකම අර ජරා, ව්‍යාධි, මරණ, ආදියට මුහුණ දෙන්නට සිද්ධ වෙනවා. ඔය තත්ත්වය නිසයි බුදුපියාණන් වහන්සේ දක්වා වදාළේ යම් කෙනකුට සසර කලකිරීම ඇති කර ගන්නා තාක් මේ සසරින් මිදෙන්න බෑ කියලා.

එතකොට ඒ අවසථාව අර විදියට පූතිගත්ත තිස්ස තෙරුන්ට ඇතිවුනා වගෙයි. මේවා එහෙම පිටින්ම දිරා පත්වෙලා ලේ සැරවවලින් වැහිලා. ඒ වගේ අවසථාව වෙනකොට සමහර විට හිත සන්සුන් කර ගන්න බැරි වෙන්න පුළුවන්. දැන් අර බුදුපියාණන් වහන්සේ අච්චර උපස්ථාන කළේ පූතිගත්ත තිස්ස ස්වාමීන් වහන්සේට තව දවසක් ජීවත් කරන්න හිතාගෙන නොවෙයි. බුදු ඇසට පෙනුනා මා මේ අවසථාවේ ඉදිරිපත් වුනේ නැත්නම් අර රහත් වෙන්න තිබුනු අවසථාව ගිලිහෙන්න යන බව. **එතකොට අච්චර උපස්ථාන කළේ පූතිගත්ත තිස්ස ස්වාමීන් වහන්සේ තව කාලයක් ජීවත් කරන්න නෙවෙයි. මේ සංසාර රෝගය සුව කරලා උන්වහන්සේට අර්හත්වයෙන් ඒ නිරෝගී බව ලබා දීමටයි** කියලා අපි හිතා ගන්ට ඕන. අන්න ඒ විදියෙ සංකල්පනාවක් අපි මේ ධර්ම කථාව තුළින් මතු කර ගන්නට ඕන. දැන් වගේ සමාජයේ සමාජ ධර්ම ඉතාමත්ම පරිහානියට පත්වෙන යුගයක ගිලන් උපස්ථානය කියන එකෙත් ඉක්මනින්ම වටිනාකම නැතිවෙලා යනවා. අපට ඒක ගෙදර දොරවල්වල මව් පිය දූ දරුවන් අතර සම්බන්ධතාව තුළිනුත් හෙළි වෙනවා. එපමණක් නොවෙයි රෝහල් ආදියෙත් ඒ මනුෂ්‍යයින්ගේ

දයාව අනුකම්පාව කරුණාව නැති වෙනකොට ශරීර කූඩුවේ නියම තත්ත්වය පිළිබඳ අවබෝධය අඩු වෙනකොට, එක්තරා සරුව පිත්තල පැවැත්මකට යොමු වෙනකොට, මෙන්න **මේ ගිලන් උපස්ථානය අවශ්‍යයෙන්ම කෙනකු අන්‍යෝන්‍ය වශයෙන් කළ යුතු දෙයක් බව පවා අමතක වෙනවා.** එතකොට බුදුපියාණන් වහන්සේ අන්න වටිනා මූල ධර්ම මතු කරල දුන්නා. නියම ගිලන් උපස්ථායකයා කවුද? අර විදියට ලාභ අපේක්ෂාවකින් තොරව මෛත්‍රී කරුණාවකින් යුක්තව ලෙඩාගේ රෝගය සුව කිරීමේ අදහසින් ලෙඩාට යහපත සැලසීමේ අදහසින්ම ඒ වගේම ධර්මෝපදේශ ආදියෙන් හිතත් සනසමින් ලෙඩාට සුවය ලබා දීමේ ඒකාන්ත අදහස ඇතිව උපස්ථාන කරන තැනැත්තයි. අනික් පැත්තට රෝගියාත් උපස්ථායකයාට කරදර නොවිය යුතු ආකාරයෙන් පැවතිය යුතු හැටිත් බුදුපියාණන් වහන්සේ දක්වා වදාළා. ඔය විදියට විනය පිටකයේ නොයෙකුත් ආකාරයෙන් කෙනකුගේ සාමාන්‍ය ජීවිතයටත්, කොටින්ම මේ ධර්ම මාර්ගයේ යාම සඳහා නිරෝගීව ජීවත්වීමට උපකාර වන නොයෙකුත් උපදෙස් බුදුපියාණන් වහන්සේ දක්වල තිබෙනවා දක්ෂ වෛද්‍යවරයෙකු හැටියට. මොකද ඒකට හේතුව? **බුදුපියාණන් වහන්සේම ප්‍රකාශ කරනවා, මේ අපේ හිත දියුණු කර ගැනීමට කයත් උපකාර කර ගන්ට ඕන බව. නිරෝගි බවත් අවශ්‍යයි. 'ආරෝග්‍ය පරමා ලාභා' කියල කියන්නේ ඒකයි.**

'ආරෝග්‍ය පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං' ආදී ඒ විදියේ ධම්ම පද මේ පින්වතුන් අහල තිබෙනවා. ඒ තුළින් අපි කල්පනා කරන්න ඕන. කොයි තරම් ලාභ තිබුණත් තමන්ගේ නිරෝගි බව නැත්නම් ඒකෙ පාඩුව පේන නිසයි බුදුපියාණන් වහන්සේ 'ආරෝග්‍ය පරමා ලාභා' කියල ප්‍රකාශ කළේ. ලාභවලින් ඉහළම එක නිරෝගී බවයි. ඒ අදහසින්ම තමයි 'සන්තුට්ඨී පරමං ධනං' කියල කිව්වෙ. කොයි තරම් වස්තු සම්භාර තිබුණත්, කෝටි ගණන් තිබුණත් හිත ඇතුළත සතුට සැනසීම නැත්නම්, ඒ තැනැත්තා අන්ත දුගියෙක්. අන්න ඒ අනුව ඒ විදියට කල්පනා කරන්න ඕන. ආරෝග්‍ය පරමා ලාභා සන්තුට්ඨී පරමං ධනං, 'විස්සාස පරමා ඤාතී' ඒ වගේම තමන්ට කොයි තරම් නෑයො හිටියත් තමන්ට විශ්වාස නැත්නම් ඒ අය සතුරො වගෙයි. විශ්වාසය ඇති කෙනා තමන්ගේ නෑයා වගෙයි. මේවා ඉතාම ගැඹුරු ධර්ම. ඉතින් මේ හැම එකක්ම කල්පනා කරලා අන්තිමට තමයි බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළේ,

නිබ්බානං පරමං සුඛං

'නිබ්බානං පරමං සුඛං' පරම සුඛය ඉහළම සැපත නිවනයි. මොකද ඉහළම සැපත නිවනයි කියලා කියන්නේ. **මුලු මහත් සංසාර පැවැත්මම දුකක්.** ඒක අංග සම්පූර්ණ සමීකරණයක් බවයි බුදුපියාණන් වහන්සේ දක්වා වදුරන්නේ. මේ මනුෂ්‍ය ලෝක පමණක් නොවෙයි. අර දැන් කියාපු ආකාරයට බ්‍රහ්ම ලෝකවල පවා, ඒවායේ ඉතාම සියුම් දුක් ස්වභාවයක් තිබෙන්නේ. අපේ මේ ගොරෝසු දුක් ස්වභාවය නිසා අපට අර සියුම් දුක් ස්වභාවය තේරෙන්නේ නෑ. මේ දුක් ස්වභාව තුන බුදුපියාණන් වහන්සේ දක්වලා තිබෙනවා. '**දුක්ඛ දුක්ඛතා, විපරිණාම දුක්ඛතා, සංඛාර දුක්ඛතා**' කියලා. 'දුක්ඛ දුක්ඛතා' කියලා කියන්නේ අපි ඔය අමු අමුවෙම දුක හැටියට සලකන දේවල්, රෝග පීඩා, තව නොයෙකුත් අලාභ හානි ආදිය අපි එදිනෙදා ජීවිතයේ දුක හැටියට සලකන ඒ ගොරෝසු ඕළාරික දුක් සමූහය, ඒකට දුක්ඛ දුක්ඛතා කියනව, තනිකර දුක්. ඒවා නම් කවුරුත් යම් යම් ප්‍රමාණයකට තේරුම් ගෙන තිබෙනවා. ඊළඟට තිබෙනවා තව දුක් වර්ගයක්. ඒකට කියන්නේ 'විපරිණාම දුක්ඛතා'. සමහරුන්ට ලොකු ධනයක් ලැබුනහම, මේක ඉතින් ලැබුණු ලොකුම සැපතක් හැටියට හිතා ගන්නවා. ඒ ධනය නැතිවුනු හැටියේ විනාශ වුන හැටියේ, ගින්නට ගිනිබත් වුනු හැටියේ, අර දරුවා මොකක් හරි අනතුරකින් හරි, ලෙඩ රෝගයකින් හරි නැතිවුන හැටියේ ඔන්න තේරුම් ගන්නවා විපරිණාම දුක්ඛතා. ඒ තිබුණ තත්ත්වය නැතිවුණා නේද? වෙනස් වුනා නේද? ඒවා අනිත්‍ය නේද? ඒක තුළින් අර දුකට පත් වෙනවා. ඔන්න විපරිණාම දුක්ඛතා. එතකොට දුක්ඛ දුක්ඛතා කියන්නේ කොටින්ම දුක් වේදනාව ආශ්‍රිතව පවතින දේ. විපරිණාම දුක්ඛතා කියලා කියන්නේ සැප වේදනාව, මොහොතකට සැප වේදනාව හැටියට තියෙනවා. ඒක දුකට පෙරලෙනවා. දැන් අපි එක පැත්තකට හැරිලා ඉන්නවා ටික වේලාවක්. කවුරුවත් කිව්වොත් 'මේ විධියටම ඉඳගෙන ඉන්නෙයි පැයක්' කියලා ලෝකයේ ඉතාමත්ම සැපවත් ආසනයේවත් ඉන්න බෑ පැයක් නොසෙල්වී. අන්න ඒ විදියට අපි ඉරියව් මාරු කිරීමෙන් දුක වහ ගන්නවා. ඉරියව් මාරු කිරීම තුළින් අන්න අර විපරිණාමය හංගගන්නවා. ඉතින් කොටින්ම කියතොත් විපරිණාම දුක්ඛතා දෙවෙනි මට්ටමයි. ඊටත් වඩා සියුම් මට්ටමක් තියෙනවා. ඒක භාවනාමය මනසට වැටහෙන එකක්. ඒකට තමයි 'සංඛාර දුක්ඛතා' කියලා කියන්නේ.

සංස්කාර කියන වචනය ඉතාමත්ම පුලුල් වචනයක්. යෝගාවචර පින්වතුන්ට ඒක සමහර විට හුරු වෙන්න පුලුවන්. කෙටියෙන් කියනවා නම් **මුලු මහත් ජීවිත පැවැත්ම තුළ තියෙන්නේ**

**සකස් කිරීම් ගොඩක්, සූදනම් වීම් ගොඩක් කියලා කියන්න පුලුවන්.** මේ කායික වශයෙනුත් සූදනම් වීම් ගොඩක්. වාචසික වශයෙනුත් සූදනම් වීම් ගොඩක්. දැන් මට මේ ධර්ම දේශනාව සඳහා ඒත් සෑහෙන වෙහෙසක් ගන්ට ඕන, ඉඳ හිටලා මේ ශබ්දය අඩු වුනාම ශබ්ද විකාශනය නැති වුනාම. මගේ විකාශනය වත් පාවිච්චි කරන්න වෙනවා. මේකත් මහා දුකක්. ඉතින් කොහොම නමුත් ඒ දුක් අවබෝධ කර දීමටයි මේ වචන ටික කියන්නේ. එතකොට ඒ විදියට බලනකොට මේ සංඛාර වගේම අපේ මේ හිතිවිලි හිත තුළ ඇතිවන සිතිවිලි, හැම එකක්ම දුකක් හැටියට බුදුපියාණන් වහන්සේ දක්වලා තියෙනවා. ඒක තමයි සංඛාර. මේ සිත තුළ ඇති විතර්ක සමූහය, අපි මේ සැපයි කියලා හිතන දේවල්. අපි හිතමු දැන් මහා ධනවන්ත කෙනකුට යම්කිසි ප්‍රශ්නයක් ආවා. හෙට උදෑසන වෙනකොට මේ ප්‍රශ්නෙ විසඳුවෙ නැත්නම් මුළු මහත් ව්‍යාපාරයම විනාශයි. ඔය විදියෙ ප්‍රශ්නයක් ආවහම මුළු රෑ නොනිදා කල්පනා කරනවා. අන්න ඒ අවස්ථාවේ අර විතර්කවල හිතිවිලිවල, තියන දුක් ස්වභාවය තේරෙනවා. ඔන්න ටිකක් තේරුම් ගන්න පුළුවන් සංස්කාරවල දුක් ස්වභාවය.

ඕක අනුව තමයි බුදුපියාණන් වහන්සේ 'සබ්බ සංඛාර සමථ' කියලා මේ නිවන පිළිබඳව හඳුන්වන්නේ. මේ සිත තුළ නිරන්තරයෙන් කෙරෙන මේ සකස් කිරීම, මේ සකස් කිරීමට කර්මත් අයිතියි. ඒ කර්මවල තිබෙනවා පින් පව් කියලා දෙකක්. මේ පින්වතුන් දන්නවා. සාමාන්‍ය ලෝකයා පව් කරන්න එපා පින් රැස් කරමු කියල කියනවා. මේක වරදවලා වටහා ගන්න එපා. මේවා අන්තයට ගන්න එපා. නමුත් ගැඹුරින් කල්පනා කරලා බැලුවොත් **මේ සංසාර පැවැත්ම ගැන කල්පනා කරලා බලනකොට පින් රැස් කලත්, පව් රැස් කලත්, සංසාරය වැඩෙනවා.** ඒක උපමාවට දක්වලා තියෙන්නෙ පොත්වල. අපි හිතමු මරන්න එළ දෙනක් ගෙනියනවා. මේ එළ දෙන ගෙනියන පාරේ එක තැනක ඇල් වතුර දෙනවා. තව තැනක උණු වතුර දෙනවා. ඉතින් මේ උණු වතුර බිව්වත්, ඇල් වතුර බිව්වත්, අර එළ දෙන මරණය කරා ඒකාන්තයෙන්ම යනවා. අන්න ඒ උපමාව අනුවයි ගන්න තියෙන්නේ. අපි පින් කලත්, පව් කලත්, මේ පැවැත්මේ මේ සියල්ල අතහැරලා අපට යන්න සිද්ද වෙනවා. දිව්‍ය ආත්ම භාවය වුනත් එපමණයි. කොච්චර කල්ප ගණන් හිටියත් ඒ චුත වෙන වෙලාවෙ දුකට පත් වෙනවා. ඔන්න ඔය විදියෙ තත්ත්වයක්. මැරුණා හෝ චුත වුනා හෝ ඉන් ඉගිලී යන අවස්ථාවෙ දුකට පත් වෙනවා. ඒක නිසා බුදුපියාණන් වහන්සේ වදාළේ මෙන්න මේ තණ්හාව නැතිකර ගැනීමටයි. අපේ උත්සාහය තිබිය යුත්තේ ඒකටයි. **තණ්හාවත් අවිද්‍යාවත් එකතුවෙලයි**

**මේ සංස්කාර රැස් කිරීමට අපව පොළඹවන්නේ.** සමහර සංස්කාර අපට රැස් නො කර බෑ. මධ්‍යම ප්‍රතිපදාව කියන්නේ ඒකයි. ඒකයි අපි කියන්නේ මේක අනුව අන්තගාමීව 'අපි පිනුත් අත හරිමු. කුසලුත් අත හරිමු. භාවනාවත් අතහරිමු' කියලා එහෙම ගන්න නරකයි. නමුත් ක්‍රමානුකූල අනුපූර්ව ප්‍රතිපදාවක් බුදුපියාණන් වහන්සේ දක්වලා තිබෙනවා. අර පාපකාරී බව, පව්වලට නැඹුරු බව ඉවත් කරලා, අපි හිත කුසල් පැත්තට, පින් පැත්තට නැඹුරු කරන්න ඕන. ඒ නැඹුරු කිරීම තුළිනුයි යටත් පිරිසෙයින් දැන් අර පින් ශක්තිය නිසා, දානයක් දීපු පින නිසා වෙන්න පුළුවන්, පූතිගත්ත තිස්ස ස්වාමීන් වහන්සේට බුදුරජාණන් වහන්සේගෙන් අවසාන අවස්ථාවේ උපස්ථානය ලැබුනේ. ඒ උපස්ථානය වත් ලැබුනෙ නැත්නම් අර දානමය පිනේ ආනිසංසයෙන් පූතිගත්ත තිස්ස ස්වාමීන් වහන්සේ ආයිත් සංසාරයටම වැටෙනවා.

ඒක අනුව අපි කල්පනා කරන්න ඕන. අපි පවින් ඉවත්වෙලා පින් කරන්න ඕන. නමුත් පින්වල ඇලී සිටින්න නරකයි. ඒකෙ ප්‍රායෝගික අර්ථය තේරුම් ගන්න ඕන. මේ පින තුළින් අපි මේ කරන්නේ අපේ සිත උසස් තත්ත්වයකට පත්කර ගැනීමයි. මොකක්ද උසස් තත්ත්වය කියලා කියන්නේ. දැන් අකුසල් කියන ජාතිය - ලෝභ, දෝස, මෝහ තුනෙන් පැන නගින දේවල්. කුසල් කියන ජාතිය - අලෝභ, අදෝස, අමෝහ තුනෙන්. කුසලයක් කරන හැම අවස්ථාවකම සුලු වශයෙන් හෝ ලෝභයෙන් ඉවත් වෙනවා. ද්වේශයෙන් ඉවත් වෙනවා. මෝහයෙන් ඉවත් වෙනවා. ඒකයි අපට උපකාර වෙන්නේ. මොකද? අපේ නිවන කියලා කියන්නේ සම්පූර්ණයෙන්ම ලෝභයෙනුත්, ද්වේශයෙනුත්, මෝහයෙනුත් ඉවත් වුන අවස්ථාවයි. ඒ පැත්තට හැරිලයි එතකොට අපි කුසල් ගමන යන්නේ. නිවන් පැත්තට හැරිලයි. අකුසල් ගමන යන්නේ අනෙක් පැත්තට. සංසාරෙ පැත්තට හැරිලයි. ඒක නිසා අපට කුසල් උපකාර වෙනවා. නමුත් ඒකත් සංස්කාර වේගයක්. යම් අවස්ථාවක ඒකෙනුත් මිදෙන්න තරම් අපි ශක්ති සම්පන්න වෙන්න ඕන. ඒකට උපකාර වෙන්නේ මේවායේ අනිත්‍ය ස්වභාවය සළකලා මේවායේ දුක් ස්වභාවය සළකලා, අනාත්ම ස්වභාවය සළකලා ගැඹුරින් ක්‍රම ක්‍රමයෙන් මේ හැම එකකින්ම හිත මුදා ගැනීමට, පංචස්කන්ධයෙන් හිත මුදා ගැනීමට තරම් තත්ත්වයකට භාවනාවෙන් අපේ හිත ගෙන ඒමයි. අන්න ඒ විදියට එතකොට මෙතන මේ නිවන් දක්වාම යන ධර්ම කාරණා රාශියක් මේ ධර්ම කථාව තුළින් මේ පින්වතුන්ට මතු කර ගන්න පුළුවන් වුණා. ගිලන් උපස්ථානය කියන එක මේ සමාජයේ සමාජ ධර්මයක් හැටියට

බලනකොට ඒකටත් අදාළ දේවල් තිබෙනවා. නමුත් ඒ එක්කම අපි කල්පනා කරන්න ඕන. අපේ ඥාතියා, හිතෛෂියා ආදීන් ලෙඩ වුනු අවස්ථාවෙ ධර්මයෙනුත් උපස්ථාන කරන්න පුරුදු වෙන්න ඕන. මොකද මේ සංසාර රෝගය, මේක තමයි භයානකම රෝගය. මේකෙන් මිදෙන්න උපකාර කිරීම තමයි ඇත්ත වශයෙන්ම නියම ගිලන් උපස්ථානය.

අන්න ඒ විදියට කල්පනා කරගෙන දැන් පැයක් පමණ වෙලා මේ පින්වත් පිරිස ආජීව අෂ්ටමක ශීලයේ නැත්නම් ඊටත් වඩා උසස් ශීලයක පිහිටලා මේ අවස්ථාවේ ධර්මදේශනාවකට සවන් දුන්නා. අපි අර නිතර මතක් කරන ආකාරයට ධර්ම ශ්‍රවණ ආනිසංස හැටියට අපි සළකන්නෙ සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා කියල කියන නිවනට උපකාර වෙන ඉන්ද්‍රිය ධර්ම, බල ධර්ම වඩා වර්ධනය කර ගැනීමට උපකාර වෙන සිතුම් පැතුම් මේ පැයක් තුළ ඇතිකර ගැනීමයි. ඒ ඇතිකර ගත්තු ඒ පුණ්‍ය ශක්තිය තුළින් මේ පින්වත් පිරිසට හැකිතාක් ඉක්මනින් තම තමන්ගේ බණ භාවනා දියුණු කරගෙන කල්‍යාණ මිත්‍ර ආශ්‍රය තුළින් සෝවාන්, සකදාගාමි, අනාගාමි, අර්හත් කියන මාර්ග ඵල ප්‍රතිවේධයෙන් උතුම් වූ අමා මහ නිවනින් මේ සියලු සංසාර රෝගයෙන් මිදීමේ ශක්තිය බලය ලැබේවා! කියලා ප්‍රාර්ථනා කර ගන්න.

ඒ වගේම අවීචියේ සිට අකනිට්ඨාව දක්වා මේ ධර්ම ශ්‍රවණමය ධර්ම දේශනාමය කුසල් අනුමෝදන් වීමට බලාපොරොත්තු වන සත්ත්වයින් ඇත්නම්, ඒ හැම කෙනෙක්මත්, අපේ ඥාතීනුත් ඇතුළු හැම කෙනෙක්මත් මේ පින් අනුමෝදන් වීම තුළින්, හැකිතාක් ඉක්මනින් මේ ජාති ජරා ව්‍යාධි මරණ ආදී සියලු සංසාර දුකෙන් අත් මිදී අමා මහ නිවනින් සැනසෙත්වා! කියන කාරුණික චේතනාවත් ඇති කරගෙන මේ විදියට ගාථා කියලා පින් පමුණුවන්න.

'එත්තාවතා ච අම්හෙහි...'

# 57 වන දේශනය

## 57 වන දේශනය

(පහන් කණුව ධර්ම දේශනා අංක 89)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

පණ්ණ වීසති වස්සානි භගවන්තං උපට්ඨහිං
මෙත්තේන කාය කම්මේන ඡායාව අනපායිනී
පණ්ණ වීසති වස්සානි භගවන්තං උපට්ඨහිං
මෙත්තේන වචී කම්මේන ඡායාව අනපායිනී
පණ්ණ වීසති වස්සානි භගවන්තං උපට්ඨහිං
මෙත්තේන මනො කම්මේන ඡායාව අනපායිනී

සැදැහැවත් පින්වතුනි,

ලෝකයේ පහළ වුන ශ්‍රේෂ්ඨතම කල්‍යාණ මිත්‍රයාණන් වහන්සේ ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේයි. ඒ භාග්‍යවතුන් වහන්සේ නිරන්තරයෙන් ඇසුරු කරමින් උපස්ථාන කරන්න ලැබීම ඉතාම විශාල භාග්‍යයක්. මේ බුද්ධ ශාසනයේ ඒ භාග්‍යය හිමිවුණේ ආනන්ද ස්වාමීන් වහන්සේටයි. අවුරුදු විස්සක් පමණ යනතුරු බුදුපියාණන් වහන්සේට නිත්‍ය උපස්ථායකයෙක් හිටියේ නැහැ. නාගසමාල, සාගත, මේඝිය, උපවාන, නාගිත ආදී ඒ භික්ෂූන් වහන්සේලා විටින් විට බුදුපියාණන් වහන්සේට උපස්ථාන කළ බව සඳහන් වෙනවා. ඒ සංඝයා වහන්සේලාගෙන් ඇතැම් භික්ෂූන් වහන්සේලා බුදුපියාණන් වහන්සේට අකීකරුව හිතුමතේට ක්‍රියා කළ බවත් සඳහන් වෙනවා.

එක් අවස්ථාවක නාගසමාල කියන භික්ෂුව බුදුපියාණන් වහන්සේ එක්ක දීර්ඝ මාර්ගයක වඩිනා අතරේ පාත්‍ර සිවුරු අරගෙන එක මං සන්ධියකට පැමිණිලා, බුදුරජාණන් වහන්සේට කියනවා, 'භාග්‍යවතුන් වහන්ස, මේකයි මාර්ගය. අපි මේ මාර්ගයෙන් යමු' කියලා. බුදුපියාණන් වහන්සෙ කියනවා, 'නෑ නාගසමාල, මේකයි මාර්ගය. අපි මේ මාර්ගයෙන් යමු' කියලා. දෙවැනි වරටත් අර නාගසමාල භික්ෂුව කියනවා 'නෑ නෑ භාග්‍යවතුන් වහන්ස, මේකයි මාර්ගය'. බුදුරජාණන් වහන්සේ ඒක ප්‍රතික්ෂේප කළා. ඔය විදියට තුන්වරක්ම බුදුරජාණන් වහන්සේ පෙන්නා දුන්නු මාර්ගය වෙනුවට

නාගසමාල භික්ෂුව අර මාර්ගයම පෙන්වමින්, අන්තිමේදී පාත්‍ර, සිවුරු එතනම තියල, ඔන්න භාග්‍යවතුන් වහන්ස, පාත්‍ර, සිවුරු කියලා තමන්ට රුචිවුන මාර්ගයේ ගියා. ඒ ගියාට වැඩිදුර යන්න ඉඩක් ලැබුණේ නැහැ. හොරු කඩා පැනලා, පාත්‍රයත් බිඳලා, සිවුරුත් පළලා, ඒ භික්ෂූන් වහන්සේට ගහලා අන්තිමට ඒ භික්ෂුවට බුදුරජාණන් වහන්සේ ළඟට ආයෙත් එන්න සිද්ධවුනා.

ඒ වගේම තවත් සිද්ධියක් සඳහන් වෙනවා. මේඝිය කියන භික්ෂූන් වහන්සේ බුදුරජාණන් වහන්සේත් එක්ක පිණ්ඩපාතයේ වැඩම කළ අවස්ථාවක, එක්තරා රමණීය අඹ වනයක් දැකලා ඒකට ගිහිල්ලා භාවනා කරන්න හිතිලා, බුදුරජාණන් වහන්සේ මේඝිය, වෙන උපස්ථායක භික්ෂුවක් එනතෙක් ඉන්න කියද්දිත් 'භාග්‍යවතුන් වහන්සේට නම් ආයෙත් අමුතුවෙන් භාවනා කරන්න දෙයක් නැහැ, මටයි භාවනා කරන්න තියෙන්නේ' කියලා අකීකරුව ඒ අඹ වනයට වැඩම කළා. නමුත් හිත එකලස් කරගන්න බැරුව ඇවිල්ලා බුදුරජාණන් වහන්සේ ළඟට කාරණය කියන්න සිද්ධ වුනා. මෙන්න මේ වගේ සිද්ධි නිසා එක් අවස්ථාවක බුදුපියාණන් වහන්සේ සංඝයා වහන්සේලා රැස්ව සිටින වෙලාවක ප්‍රකාශ කළා 'මහණෙනි, දැන් මම මහල්ලෙක්. මට උපස්ථාන කිරීම් වශයෙන් එන ඒ සංඝයා වහන්සේලා ඇතැම් කෙනෙක් මේ මාර්ගය යැයි කියල කියද්දිත් තමන්ට කැමති මාර්ගයේ යනවා, පාත්‍ර සිවුරු බිම තබලා. එමනිසා මට නිත්‍ය උපස්ථායකයෙක් පත්කර ගැනීම හොඳයි' කියලා ඒ අදහස ප්‍රකාශ කළාම ඒ මුලු මහත් සංඝ පිරිස තුළම ලොකු ධර්ම සංවේගයක් ඇතිවුණා.

සාරිපුත්ත මහ රහතන් වහන්සේ නැගිටලා බුදුපියාණන් වහන්සේට ප්‍රකාශ කරනවා, 'භාග්‍යවතුන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නම් කියලා. බුදුපියාණන් වහන්සේ ඒක ප්‍රතික්ෂේප කළා. ඒ වගේම මුගලන් මහ රහතන් වහන්සේ ඇතුළු අනෙකුත් මහ ශ්‍රාවකයන් වහන්සේලාත් තනි තනිව ඉදිරිපත් වුනා. බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළා. ආනන්ද ස්වාමීන් වහන්සේ විතරක් නිශ්ශබ්දව සිටිනවා. අනෙක් සංඝයා වහන්සේලා කිව්වා 'ඇයි? ආනන්ද, ආයුෂ්මතුන් උපස්ථානයට අවස්ථාව ඉල්ලන්න' කියලා. ආනන්ද ස්වාමීන් වහන්සේ කියනවා 'ඉල්ලලා ලබාගන්නා තනතුරෙන්

ඇති වැඩය මොකක්ද? මා සුදුසු නම් භාග්‍යවතුන් වහන්සේම කියනවා ඇති' කියල. එතකොට බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළා 'මහණෙනි, ආනන්දට අමුතුවෙන් උත්සාහ කරන්න දෙයක් නැහැ. ආනන්ද දැනගෙනම මට උපස්ථාන කරයි' කියල. මේ අවස්ථාවේ ආනන්ද ස්වාමීන් වහන්සේ නැගිටලා බුදුපියාණන් වහන්සේට ප්‍රකාශ කරනවා, 'භාග්‍යවතුන් වහන්ස, මෙන්න මේ කාරණා අට පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ මට වර අටක් වශයෙන් මේ කාරණා වලට අවසර දෙතොත් මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නම්' කියලා. මොනවද ඒ කාරණා?

වර අටක් හැටියට හැඳින්වූවාට පළමුවෙන් දක්වන කාරණා හතර ප්‍රතික්ෂේප හතරක්. මොනවද ඒ. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන ප්‍රණීත චීවර ඒ කියන්නෙ හොඳ සිවුරු භාග්‍යවතුන් වහන්සේ මට දෙන්නෙ නැත්නම් මම උපස්ථාන කරනවා. ඒ වගේම දෙවෙනි කාරණය භාග්‍යවතුන් වහන්සේට ලැබෙන හොඳ ප්‍රණීත පිණ්ඩපාත මට දෙන්නෙ නැත්නම් මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරනවා. භාග්‍යවතුන් වහන්සේගේ ගන්ධ කුටියේ ඒ එක්කම ඒ සමඟම වැඩ වාසය කරන්න ඒ වරප්‍රසාදය මට දෙන්නෙ නැත්නම් මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරනවා. ඒ වගේම භාග්‍යවතුන් වහන්සේට ලැබෙන දන ආරාධනා නිමන්ත්‍රණ වලට භාග්‍යවතුන් වහන්සේ මා රැගෙන යන්නෙ නැත්නම් මම උපස්ථාන කරනවා. ඒ විදියේ ප්‍රතික්ෂේප කාරණා හතරක්.

ඒවායේ අදහස මොකක්ද? දැන් කෙනෙක් කියන්න පුළුවන් ඔවැනි වරප්‍රසාද ලැබෙනවා නම් කාටද බැරි භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්න කියලා. එහෙම අපවාද ලැබෙන්න ඉඩ තියෙනවා. භාග්‍යවතුන් වහන්සේගෙන් සිවුරු පිරිකර පිණ්ඩපාත ආදිය ලැබෙනවා නම් කාටද ඕක බැරි කියලා කියන්න පුළුවන්. ඒකයි ප්‍රතික්ෂේප කළොත් මම උපස්ථාන කරනවා කියල කිව්වේ.

ඊළඟට තවත් කාරණා හතරක් ප්‍රකාශ කළා භාග්‍යවතුන් වහන්සේගෙන්. ඒවා ආයාචනා හැටියට, ඉල්ලීම් හැටියට. භාග්‍යවතුන් වහන්සේ වෙනුවෙන් මා භාරගන්නා දන ආරාධනා වලට භාග්‍යවතුන් වහන්සේ වැඩම කරනවා නම්, ඊළඟට දෙවෙනි කාරණය ඈතින් මෑතින් භාග්‍යවතුන් වහන්සේ සොයාගෙන එන අයට භාග්‍යවතුන්

වහන්සේ මුණ ගැසීමට හමුකරවීමට මට අවස්ථාව සලසා දෙනවා නම්, ඒවගේම මට යම්කිසි සැකයක් ඇතිවූ අවස්ථාවක භාග්‍යවතුන් වහන්සේ ළඟට ඇවිල්ලා ධර්ම සාකච්ඡාවකින් මගේ සැකය නිරාකරණය කර ගැනීමට භාග්‍යවතුන් වහන්සේ අවසර දෙනවා නම්, ඒවගේම භාග්‍යවතුන් වහන්සේ මා හමුවේ නැතිව වෙන අයට දේශනා කළ ධර්මය හැම එකක්ම නැවත මා හමුවේ ඒ ධර්මය ප්‍රකාශ කරනවා නම්, මම කැමතියි උපස්ථාන කරන්න කියල.

ඒ ආයාචනා හතර, ඒක තුළ තිබෙන්නෙ අර බුදුපියාණන් වහන්සේගේ ධර්මය ලබා ගැනීමෙන් ඒ ධර්ම භාණ්ඩාගාරික බහුශ්‍රැත තත්ත්වය ලබා ගැනීමේ අදහසත්. ඒ වගේම බුදුපියාණන් වහන්සේ මෙච්චර ළඟින් ඇසුරු කරලත් මෙතරම් දෙයක් කරගන්න බෑ කියන ඒ අපවාදය නැතිකර ගැනීමටත්.

එතකොට මේ වර අටටම බුදුපියාණන් වහන්සේ එකඟ වුනා. ඉතින් එකඟ වෙලා එදා ඉඳලා ආනන්ද ස්වාමීන් වහන්සේ බුදුපියාණන් වහන්සේට පුදුම විදියේ ජීවිත පරිත්‍යාගයකින් කැපවීමකින් ලැදිකමකින් උපස්ථාන කරන්න පටන් ගත්තා. දැහැටි, පැන් ආදිය සැපයීම්, පා පිරිමැදීම්, පිට පිරිමැදීම්, රෝගී අවස්ථාවල උපස්ථාන කිරීම්, දහවල් කාලය තුළ බුදුපියාණන් වහන්සේ ඇසුරෙහිම ඒ විදියටම උපස්ථාන කරමින් සිටිනවා. රාත්‍රි කාලයේ පන්දමක් දල්වාගෙන ඒ ගන්ධ කුටිය වටේ නම වරක් ගමන් කළ බව සඳහන් වෙනවා. භාග්‍යවතුන් වහන්සේ හදිසියේ යම්කිසි කාරණයකට කථා කළොත් ඒකට පිළිතුරු දීමට සූදානම් වීම් වශයෙන්.

ඔය විදියට නොයෙකුත් ආකාරයෙන් බුදුපියාණන් වහන්සේට පුදුම අන්දමින් මෛත්‍රීමය විදියට මෛත්‍රී කාය කර්ම, වාග් කර්ම, මනෝ කර්ම පැවැත්වුවා. දැන් මේ ගාථාවෙදි කියවුනෙත් ඇත්ත වශයෙන්ම ඒ කාරණයමයි. ආනන්ද ස්වාමීන් වහන්සේ තමන් වහන්සේගේ ඒ ජීවිත කථාන්තරය අළලා දේශනා කර වදාළ හැටියට සඳහන් වෙන ථෙර ගාථාවල කියවෙන ගාථා තුනකුයි අපි මේ මාතෘකා වශයෙන් තැබුවෙ. ඒවායෙ කියවෙන්නෙත් ඒ කාරණයයි.

> පණ්ණවීසති වස්සානි භගවන්තං උපට්ඨහිං
> මෙත්තෙන කාය කම්මෙන ඡායාව අනපායිනී

අවුරුදු විසි පහක්ම මම භාග්‍යවතුන් වහන්සේට මෛත්‍රීමය කාය කර්මයෙන් උපස්ථාන කළා අතහැර නොයන සෙවණැල්ල මෙන්. ඒ විදියටම වාග් කර්මයෙන්, මනෝ කර්මයෙන්. ඒ කියන කාරණා තුනයි ඒ ගාථාවල කියැවෙන්නේ.

ඉතින් මේ විදියට පුදුම විදියේ කැපවීමකින් උපස්ථාන කරන අතරේ බුදුපියාණන් වහන්සේ සමඟ නොයෙකුත් විදියේ, නොයෙකුත් අවස්ථාවල ධර්ම සාකච්ඡා කරමින් බුදුරජාණන් වහන්සේ වෙනත් පිරිස් වලට දේශනා කළ ධර්මය ඇවිල්ලා ප්‍රකාශ කරන අවස්ථාවේ ඒවා හොඳින් ධාරණය කර ගැනීමෙන් මේ ආකාරයෙන් පුදුම විදියේ ධර්ම භාණ්ඩාගාර තත්ත්වයක්, බහුශ්‍රැත තත්ත්වයක් ආනන්ද ස්වාමීන් වහන්සේ ලබා ගත්තා.

මේ කාරණා හැම එකක්ම සලකල බුදුපියාණන් වහන්සේ එක්තරා අවස්ථාවක සංඝයා වහන්සේලා මැද ආනන්ද ස්වාමීන් වහන්සේට තනතුරු 5ක් හැටියට දුන්නා කාරණා පහකින්ම අග්‍රස්ථානය. 'මගේ ශ්‍රාවක **බහුශ්‍රැත** භික්ෂූන් අතර ආනන්ද අග්‍රයි. එවගේම '**සතිමන්ත**' කියලා කියන්නේ හොඳ ධාරණ ශක්තිය, ශ්‍රැති ශක්තිය ඇති සංඝයා වහන්සේලා අතර ආනන්ද අග්‍රයි. ඊළඟට **ගතිමන්ත** කියලා කියන්නේ හොඳ වැටහීම්, බුද්ධිය ඇති, ඒ කියෙන්නේ එක ධර්ම කොට්ඨාසයක් තුළින් තව දේවල් වෙන දේවල් එකතු කරල ඇඳල ධර්ම දේශනාවක් දේශනා කරන්න පුලුවන් පුදුම විදියේ වැටහීම් ශක්තියක් ඇති ගතිමන්ත භික්ෂූන් වහන්සේලා අතර අග්‍රයි. ඊළඟට '**ධිති මන්ත**' කියලා කියන ධෛර්‍ය ශක්තිය කියලා කියන්නේ තමන් ගත්තු අධිෂ්ඨානයේ පිහිටලා ඕනෑම බාධකයක් මධ්‍යයේ ඒ කටයුත්ත සාර්ථක කර ගැනීමෙ ශක්තිය ඇති ධිතිමන්ත භික්ෂූන් වහන්සේලා අතර අග්‍රයි. ඒ වගේම අවසාන වශයෙන් කියනවා '**උපස්ථායක**' භික්ෂූන් අතර මේ ආනන්ද අග්‍රයි. ඔය විදියට කාරණා පහකින්ම අග්‍රස්ථානය දී වදාළා.

ඒ වගේම මහා පරිනිර්වාණ සූත්‍රයේ සඳහන් වෙනවා බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණ මංචකයේ සිටින අවස්ථාවේදී ආනන්ද ස්වාමීන් වහන්සේට බුදුරජාණන් වහන්සේ කෙරෙහි තිබුණු ලැදිකම ස්නේහය කොතරම්ද කියතොත් - ඒ වන විට සෝවාන් බව විතරයි ලබා තිබුණේ. ඒ නිසා ආනන්ද ස්වාමීන් වහන්සේ විහාරයට

ඇතුල් වන දොර අගුලේ එල්ලිලා අඬමින් වැළපෙමින් මෙන්න මේ විදියට කිවුවා කියලා සඳහන් වෙනවා. 'මම තවම සෝවාන් තත්ත්වයේ විතරයි. සේඛ තත්ත්වය කියල කියන්නේ. සේඛ තත්ත්වය විතරයි මම තවම ලබල තියෙන්නේ. මට තව ඉදිරියට රහත් වීම සඳහා හුඟාක් වැඩ කරන්න තියෙනවා. මට අනුකම්පා වූ මගේ ශාස්තෲන් වහන්සේ දැන් පිරිනිවන් පාන්න ලෑස්ති වෙලා ඉන්නවා' කියල ශෝකයෙන් වැළපී සිටින අවස්ථාවේ බුදුපියාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේ ගෙන්වලා සැනසීම් වශයෙන් ප්‍රකාශ කරනවා, 'ආනන්ද, අඬන්න එපා. වැළපෙන්න එපා. ඇයි මා කලින්ම කියල තියෙනව නේද ලෝකයේ යමක් හේතු ප්‍රත්‍යයෙන් ඇතිවෙනවා නම්, හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇතිවන ස්වභාවය ඇති දෙයක් ලෝකයේ තිබෙනවා නම් ඒ හැම එකක්ම දිරායන බව. දිරාපත් වන බව. ඒවගේම සියලු ප්‍රියමනාප අයගෙන් වෙන්වීමක්, වෙනස් වීමක්, වියෝවීමක් තිබෙන බව මම කලින්ම ප්‍රකාශ කරල තිබෙනව නේද?'

එහෙම කියලා ඊළඟට ආනන්ද ස්වාමීන් වහන්සේ පිළිබඳව ප්‍රශංසාත්මකව ප්‍රකාශ කරනවා, 'ආනන්ද, ඔබ දීර්ඝ කාලයක් තථාගතයන් වහන්සේට හිත සුව පතමින් දෙහිතකින් තොරව අප්‍රමාණ වශයෙන් මෛත්‍රීමය කාය කර්මයෙන් උපස්ථාන කරල තියෙනවා. ඒවගේම මෛත්‍රීමය වාග් කර්මයෙන් උපස්ථාන කරල තියෙනවා. ඒවගේම මෛත්‍රීමය මනෝ කර්මයෙන් උපස්ථාන කරල තියෙනවා. ඔබ බොහොම පින් කළ කෙනෙක්. ඒක නිසා තව උත්සාහ කරන්න. ඉක්මනින්ම රහත් වන්න පුළුවන්' කියලා බුදුපියාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේව අස්වැසුවා.

ඉතින් ඔය විදියට බුදුපියාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේට ප්‍රශංසා කරලා තවදුරටත් වදාරනවා 'ආනන්ද, අතීතයේ යම්තාක් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේලා වැඩ විසුවා නම් ඒ හැම දෙනාටම මේ මට ආනන්ද වගේම උපස්ථායක භික්ෂූන් හිටියා. ඒවගේම අනාගතයේ යම්තාක් සම්මා සම්බුදුරජාණන් වහන්සේලා පහල වෙනවා නම්, ඒ බුදුරජාණන් වහන්සේලාටත් ආනන්ද වගේම උපස්ථායකයින් සිටිනවා' කියලා. ඒ විදියට ඒක ධර්මතාවක් හැටියට දක්වූවා. බුදුපියාණන් වහන්සේට උපස්ථාන කිරීම ඒ විදියට පෙරුම් පුරල ලබාගත යුතු තත්ත්වයක් හැටියට.

ඊළඟට ඒවගේම තවදුරටත් ප්‍රකාශ කරනවා, 'මහණෙනි, ආනන්ද පණ්ඩිතයි. ආනන්ද දන්නවා මේ වෙලාව භික්ෂූන්ට තථාගතයන් වහන්සේ දැකීමේ අවස්ථාවයි. මේ වෙලාව භික්ෂුණීන්ට සුදුසු අවස්ථාවයි. මේ වෙලාව උපාසකයින්ට, උපාසිකාවන්ට දැකීමට සුදුසු අවස්ථාවයි. මේ රාජරාජ මහාමාත්‍යාදීන්ට, තීර්ථකයන්ට, තීර්ථකශ්‍රාවකයින්ට තථාගතයන් වහන්සේව දැකීමට සුදුසු අවස්ථාවයි ආදි වශයෙන් ඒවා පිළිබඳ හොඳ අවබෝධයක් පණ්ඩිත බවක් ආනන්ද තුළ තිබෙනවා' කියලා.

ඊළඟට ඒවගේම බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ආනන්ද තුළ තිබෙනවා ආශ්චර්ය අද්භූත ධර්ම හතරක්. මොනවද ඒ. යම් භික්ෂු පිරිසක් ආනන්ද හමුවට එනවා නම් ඒ දර්ශනයෙන්මත් ඒ භික්ෂු පිරිස පැහැදෙනවා. ඊළඟට ආනන්ද යම් ධර්ම කොට්ඨාසයක් ඒ භික්ෂු පිරිසට දේශනා කරනවා නම් එයිනුත් ඉතාමත්ම සතුටට පත්වෙනවා, එයින් තෘප්තිමත් නොවී සිටියදීම ආනන්ද නිශ්ශබ්ද වෙනවා. ඒ කියන්නේ එපා වෙනකම් දේශනා කරන්නේ නැහැ. තෘප්තිමත් නොවී සිටියදීම ආනන්ද නිශ්ශබ්ද වෙනවා. ඒ වාගේම භික්ෂුණී පිරිස, උපාසක පිරිස, උපාසිකා පිරිස මේ සිව්වනක් පිරිස පිළිබඳවමත් අන්න අර විදියෙ තත්ත්වයක් තිබෙනවා කියල තමයි එතන ආශ්චර්ය අද්භූත ධර්ම හතරක් හැටියට බුදුපියාණන් වහන්සේ දක්වන්නේ.

ඒක ඊළඟට සමාන කරනවා උපමා වශයෙන්. මෙන්න මේ කියන ආශ්චර්ය අද්භූත ධර්ම ධර්ම හතරට සමාන ධර්ම හතරක් චක්‍රවර්තී රජ කෙනකු තුළත් තිබෙනව. යම් ක්ෂත්‍රිය පිරිසක්, රජදරු පිරිසක්, සක්විති රජකු හමුවට එනවා නම්, ඒ දර්ශනයෙන්ම සතුටට පත් වෙනවා. සක්විති රජු ඒ ක්ෂත්‍රිය පිරිසට, රජදරු පිරිසට යමක් ප්‍රකාශ කරනවා නම් එයින්මත් සතුටු වෙනවා. ඊළඟට එම ප්‍රකාශයෙන් තෘප්තිමත් නොවී සිටියදීම සක්විති රජු නිශ්ශබ්ද වෙනවා. ඒ රජදරුවන් වගේම ගෘහපති පිරිසත් ඊළඟට ශ්‍රමණ පිරිසත් ආදී වශයෙන් ඒ එන හැම පිරිසම සක්විති රජුගේ දර්ශනයෙන් මත් සතුටු වෙනවා. යමක් ප්‍රකාශ කරනවා නම් එයිනුත් සතුටු වෙනවා. ඔය විදියට බුදුපියාණන් වහන්සේ සක්විති රජකු තුළ තිබෙන ආශ්චර්ය

අද්භූත ධර්ම වලට සමාන කරමින් ආනන්ද ස්වාමීන් වහන්සේට ප්‍රශංසා කළා.

ඊළඟට ඒ වාගේම බුදුපියාණන් වහන්සේ බොහොම අවස්ථාවල් වල ආනන්ද ස්වාමීන් වහන්සේගේ බහුශ්‍රැත භාවය පිළිබඳව, ඒවාගේම උන්වහන්සේගේ පණ්ඩිත ස්වභාවය මහාප්‍රාඥ ස්වභාවය පිළිබඳව වර්ණනා කර වදාළා.

ඒ වාගේම අවස්ථාව සැලසුවා ආනන්ද ස්වාමීන් වහන්සේට උන්වහන්සේගේ ශක්තීන් මතුකර ගැනීමට. එක් අවස්ථාවක් තමයි - බොහෝ විට ඒ වගේ සිද්ධීන් සඳහන් වෙනවා. බුදුපියාණන් වහන්සේ සංඝයා වහන්සේලාට යම්කිසි කෙටි දේශනයක් පවත්වලා, ප්‍රහේලිකා ස්වරූපයේ යම්කිසි වාක්‍යයක් ප්‍රකාශ කරලා නැගිටලා විහාරයට වැඩම කරනවා. එතකොට සංඝයාවහන්සේලා ඒ දේශනාව හරියට සවිස්තරව දැනගන්න බලාපොරොත්තුවෙන් එහි අර්ථ විවරණයක් ලබාගන්න ආනන්ද ස්වාමීන් වහන්සේ ළඟට ගිහින් ඇවිටිලි කරනවා. භාග්‍යවතුන් වහන්සේත් අනෙකුත් සබ්‍රහ්මචාරීන්වහන්සේලාත් මේ ආනන්ද ආයුෂ්මතුන් වහන්සේට බොහෝ විට ප්‍රශංසා කරල තියෙනවා, මේ විදියෙ කෙටි දේශනයක් සවිස්තරව දක්වීමට ශක්තියක් තියෙනවා කියලා. එමනිසා අපිට මේක සවිස්තරව ප්‍රකාශ කරන්න කියලා. නමුත් ආනන්ද ස්වාමීන් වහන්සේ බොහොම නිහතමානීව උපමාවකින් කියනවා, 'යම්කිසි කෙනෙක් හර ඇති ලීයක් සොයමින් යන අතරේ හොඳ හරවත් ගසක් දැකල ඒ ගසේ මුලත්, කඳත් අතහැරලා අතුරිකිලි වල හරය සොයන්නා වගේ ඒ ධර්ම ස්වාමී වූ භාග්‍යවතුන් වහන්සේ මුණ ගැසී හමුවෙලා භාග්‍යවතුන් වහන්සේගෙන් විවරණය ලබාගන්න තිබෙද්දිත් ඇයි මගෙන් අහන්නෙ' කියල. නමුත් ඒ සංඝයා වහන්සේලා නැවත නැවතත් ප්‍රකාශ කළාම ආනන්ද ස්වාමීන් වහන්සේ ඒ ධර්ම කොටඨාශයට විවරණයක් දෙනවා. ඊළඟට දීල ඉවර වෙලා කියනවා 'මේකයි මට වැටහෙන්නේ. ගිහිල්ලා ඕනෑ නම් භාග්‍යවතුන් වහන්සේගෙනුත් මේක අහලා ස්ථිර කරගන්න' කියලා. ඊළඟට ඒ සංඝයා වහන්සේලා ඒ ධර්ම කොට්ඨාසය බුදුපියාණන් වහන්සේට ප්‍රකාශ කළාම බුදුපියාණන් වහන්සේ 'සාධු සාධු' කියල ඒක අනුමත කරලා, 'මහණෙනි, මගෙන් ඇහුවත් මට කියන්න

තියෙන්නෙත් එච්චරයි', කියල ඒක සම්මත කරනවා. ඒක අනුමත කරනවා.

ඔය විදියට ආනන්ද ස්වාමීන් වහන්සේගේ දක්ෂතාව මතු කරන්න බුදුපියාණන් වහන්සේ නොයෙකුත් උපාය මාර්ග ඉදිරිපත් කළා. විශේෂයෙන්ම සඳහන් වෙනවා එක්තරා අවස්ථාවක කපිලවස්තු පුරයේ ශාක්‍යයින් එක්තරා රැස්වීම් ශාලාවක් - සම්මන්ත්‍රණ ශාලාවක් හදලා අලුතින් එය පරිභෝග කිරීම සඳහා බුදුරජාණන් වහන්සේට ආරාධනා කළා. බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාත් සමග ආනන්ද ස්වාමීන් වහන්සේත් සමග එහි වැඩම කරලා, රාත්‍රියේ වැඩි කාලයක්ම ඒ ශාක්‍ය පිරිසට ධර්ම දේශනා කරලා, ඊළඟට ආනන්ද ස්වාමීන් වහන්සේට කියනවා, “ආනන්ද, මේ ශාක්‍ය පිරිසට ශෛක්‍ෂ ප්‍රතිපදාව - සේඛ ප්‍රතිපදාව කියල කියන්නේ සෝවාන් වුණ කෙනෙක් ඉදිරියට හික්මිය යුතු ආකාරය - මේ සේඛ ප්‍රතිපදාව පිළිබඳව ධර්ම විස්තරයක් කරන්න මේ ශාක්‍ය පිරිසට. මගේ පිට ටිකක් රිදෙනවා. මම පිට දිග ඇරගන්නම්” කියලා, බුදුරජාණන් වහන්සේ ඒ ශාලාවේම සඟල සිවුර සිවුපටක් කරල එළලා සයනය කළා. සැතපුනේ නෑ. සයනය කළා. ආනන්ද ස්වාමීන් වහන්සේ දීර්ඝ ධර්ම දේශනාවක් පැවැත්වුවා ඒ කියාපු මාතෘකාව උඩ. ඒක අහල බුදුපියාණන් වහන්සේ 'සාධු සාධු' කියමින් පින් අනුමෝදන් කළා ආනන්ද ස්වාමීන් වහන්සේගේ දක්ෂතාව පිළිබඳව.

ඒ වගේම තවත් සඳහන් වෙනවා සැරියුත් ස්වාමීන් වහන්සේගෙන් ලැබුන ප්‍රශංසාවන්. එක් අවස්ථාවක ආනන්ද ස්වාමීන් වහන්සේ ගිහිල්ල සැරියුත් ස්වාමීන් වහන්සේගෙන් අහනවා, 'ඇවැත්නි, සාරිපුත්‍ර, කෙතෙකින්ද යම්කිසි භික්ෂුවක් නො ඇසූ ධර්ම කොට්ඨාසයක් ඇසූවකු වන්නෙ? ඒවගේම අසන ලද ධර්ම කොට්ඨාසයක් අමතක නොකරන්නේ. ඊළඟට තමන්ගේ හිතට යන්තමින් වැටහුණු ඒ ධර්ම කොට්ඨාසයක් නැවත නැවත මතුකර ගන්නේ. ඒවගේම නොදන්නා දෙයක් දැන ගන්නේ? කියලා. ඔය ප්‍රශ්න හතරක් සැරියුත් ස්වාමීන් වහන්සේගෙන් ඇහුවාම සැරියුත් ස්වාමීන් වහන්සේ කියනවා 'ආයුෂ්මත් ආනන්ද බහුශ්‍රැතයි. මේකට පිළිතුර ආයුෂ්මත් ආනන්දටම වැටහේවා! කියල. ඊළඟට ආනන්ද ස්වාමීන් වහන්සේ මෙන්න මෙහෙමයි මට වැටහෙන්නෙ කියල ඒ ඒ කාරණය

සැරියුත් ස්වාමීන් වහන්සේට සවිස්තරව ප්‍රකාශ කළාට පස්සෙ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනවා, "මේක ආශ්චර්යයක් අද්භූත කාරණයක්. මේ ආනන්ද ආයුෂ්මතුන් තමා තුළම තිබෙන ගුණ ධර්ම හයකුයි මෙතන මේ ප්‍රකාශ කළේ මේ දේශනාව තුළින්" කියලා.

ඊළඟට සැරියුත් ස්වාමීන් වහන්සේ කියනවා ආයුෂ්මත් ආනන්ද බුදුපියාණන් වහන්සේගේ ශාස්තෘ ශාසනය වශයෙන් හැඳින්වෙන ධර්මය සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල කියන අංග නාමයකින් යුත් ඒ බුද්ධ වචනය සවිස්තරව හදාරණවා. ඉගෙන ගන්නවා. ඒ පළමු කාරණයයි. ඒ වගේම ඒ බුද්ධ වචනය සවිස්තරව අනුන්ට දේශනා කරනවා. ඒ දෙවෙනි කාරණයයි. තුන්වෙනි කාරණය ඒ බුද්ධ වචනය අනිත් අයට උගන්වනවා. හතරවන කාරණය ඒ බුද්ධ වචනය ඒ ධර්ම කොට්ඨාස සවිස්තරව සජ්ඣායනා කරනවා. පස්වන කාරණය ඒ විවිධ ධර්ම කොට්ඨාස නැවත නැවත සිතින් පිරික්සා බලමින් මෙනෙහි කරමින් ඒ ධර්ම කොටස් වල හිත පවත්වනවා. හයවන කාරණය ආයුෂ්මත් ආනන්දගේ සිරිතක් තියෙනවා යම් ආරාමයක යම් ආවාසයක බහුශ්‍රැත ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා සිටිනවා නම් ඒ විහාර වලට ආරාමවලට ගිහිල්ලා වස්වැසලා උන්වහන්සේලාගෙන් තමන්ට නොතේරෙන දේ පිළිබඳව අහනවා. ස්වාමීනි මෙහි අර්ථය කොහොමද? මේක මොකක්ද? කියල අසන සිරිත තිබෙනවා. අසා දැන ගන්නවා. මේ විදියට ආනන්ද ස්වාමීන් වහන්සේගේ බහුශ්‍රැත බවේ රහස සැරියුත් ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරල එතනත් බොහොම ප්‍රශංසා විදියට වචන පාවිච්චි කරනවා.

මේක තුළින් අපට පෙනෙනවා ආනන්ද ස්වාමීන් වහන්සේ මේ බුද්ධ ශාසනයේ ධර්ම භාණ්ඩාගාරික හැටියට අර උපස්ථායක තනතුරත් එක්කම ඒ බුදුපියාණන් වහන්සේගේ ඇසුරේ පුදුම විදියේ ප්‍රයෝජනයක් ගත්තා. ආනන්ද ස්වාමීන් වහන්සේ අර විදියට බුදුපියාණන් වහන්සේගේ ගඳ කිළියේ, ගන්ධ කුටියේ වාසය කිරීමට අකමැති වුනත් උන්වහන්සේගේ හදවත බුදුගුණයට ගඳකිළියක් කරගත් බව පේනවා. ඒවගේම උන්වහන්සේගේ චිත්ත සන්තානයේ ධර්ම භාණ්ඩාගාරයක් පැවැත්වුවා පශ්චිම ජනතාව සඳහා. අප සඳහා කියල හිතාගන්ට ඕන. ධර්ම භාණ්ඩාගාරයක් තමන්ගේ චිත්ත සන්තානයේ

ඇතිකර ගැනීම සඳහා ලොකු උත්සාහයක් ආනන්ද ස්වාමීන් වහන්සේ යෙදූ බවක් පේනවා.

ඉතින් මෙන්න මේ නිසා තමයි සම්බුද්ධ පරිනිර්වාණයෙන් තුන් මාසයකට පස්සෙ මහාකාශ්‍යප මහ රහතන් වහන්සේ ඒ බුද්ධ වචනය ආරක්‍ෂා කර ගැනීම පරමාර්ථය කරගෙන ධර්ම සංගායනාවක් පැවැත්වීමට සූදනම් වෙද්දී, ඒකට පන්සියයක් රහතන් වහන්සේලායි සහභාගී විය යුත්තේ, නමුත් රහතන් වහන්සේලා හාරසිය අනූනම (499) නමක් තෝරා ගත්තා. එකක් ඉතිරි කර ගත්තේ මොකද? එක ආසනයක් ඉතිරි කළේ ආනන්ද ස්වාමීන් වහන්සේ ඒ වෙනකොට සෝවාන් වෙලා පමණයි. රහත් නොවුණ නිසා. එක්තරා උභතෝකෝටික තත්ත්වයක් ප්‍රශ්නයක් පැන නැගුනා. රහතන් වහන්සේලාමයි සහභාගි විය යුත්තේ. නමුත් ආනන්ද ස්වාමීන් වහන්සේ නැතුව බෑ. ඇතුවත් බෑ නැතුවත් බෑ. ඇතුව බෑ රහත් නොවුණ නිසා. නැතුව බැහැ බුද්ධ වචනය සම්පූර්ණයෙන්ම ආනන්ද ස්වාමීන් වහන්සේ සිතේ දරාගෙන සිටින නිසා. එබඳු අවස්ථාවක ආනන්ද ස්වාමීන් වහන්සේට ලොකු අභියෝගයක් වගේ ඇතිවුනා මේ ශාසනය වෙනුවෙන්. ඊළඟ දවසේ, හෙට දවසේයි සංගායනාව තියෙන්නේ. ඒක නිසා දැඩි **වීයඁයකින්** භාවනා කරල මේ තත්ත්වය ලබාගන්න ඕනෑ කියල. ඒ බලාපොරොත්තුව - අධිෂ්ඨානය - ඇතිව ආනන්ද ස්වාමීන් වහන්සේ එතන කියවෙනවා දවසේ වැඩි කාලයක්ම කායගතාසතියෙන් වාසය කරල අන්තිමේදී රාත්‍රි කාලයේදී සැතපෙන්න සූදනම් වන අතරේ පා පොළොවෙන් ඉස්සිලා හිස සයනයට පැමිණීමට කලින් ඒ අතරතුර, ඉරියවු හතරෙන් තොරව අර්හත්වය ලබා ගත්තා. එතකොට ඒ විදියට ආනන්ද ස්වාමීන් වහන්සේ තමන්ගේ සතිමත් ධිතිමත් ඒ ශක්තිය උපකාර කරගෙන ශාසනයට පිහිටවීමක් වශයෙන් ඒ අවස්ථාවේ අර්හත්වය ලබාගත්තා. ඒ තුළින් අපට පෙනෙන්නේ ආනන්ද ස්වාමීන් වහන්සේගේ ශාසනික කැපවීම.

උන්වහන්සේ තුළින් අපට ගතයුතු ආදර්ශ රාශියක් තිබෙනවා. බුදුපියාණන් වහන්සේට උපස්ථාන කරන කෙනකුට පහසුවෙන්ම පුළුවන් උන්වහන්සේට ලැබෙන ලාභ සත්කාර, පුදපූජා ඒවා පරිහරණය කරන්න. නමුත් ආනන්ද ස්වාමීන් වහන්සේ ඉල්ලා සිටිය

වරයෙන් කියවෙන්නේ කුමක්ද? භාග්‍යවතුන් වහන්සේට ලැබෙන සිවුරු පිරිකර, ප්‍රණීත පිණ්ඩපාත ආදිය මට දෙන්නේ නැතිනම් පමණක් මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරනවා කියලා.

ඒ තුළින් ඉතා වටිනා ආදර්ශයක් ලෝකයාට දෙනවා. බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරල තියෙනවා ඉතාමත්ම වටිනා පාඨයක් සංඝයා වහන්සේලාට.

'ධම්ම දයාද භික්ඛවෙ භවථ මා ආමිස දයාද' 'මහණෙනි, මාගේ ධර්මයට දයාද වන්න, ආමිසයට - ඒ සිවුරු පිරිකර ආදී ආමිසයට දයාද නොවන්න. මා අනුකම්පාවෙන් ඔබලාගෙන් බලාපොරොත්තු වන්නේ මේකයි' කියලා බුදුපියාණන් වහන්සේ එක්තරා දේශනාවකදී ප්‍රකාශ කළා. ඊළඟට ඒක සවිස්තරව බුදුපියාණන් වහන්සේ මේ විදියටයි හඳුන්වන්නේ. ඔන්න මම දනය වළඳලා ඉවර වෙලා යම්කිසි පිණ්ඩපාත කොටසක් ඉතිරි වෙලා තියෙනවා. ඒ අවස්ථාවේ ඒ පිණ්ඩපාත කොටස මට පුළුවන් එක්කෝ තණකොළ නැති තැනක පොළවේ වීසිකරල දමන්න. එහෙම නැතිනම් සතුන් නැති වතුරේ ගිල්වා දමන්න. එහෙම තියෙන අවස්ථාවේ කුස ගින්නෙන් පීඩා විඳින භික්ෂූන් වහන්සේලා දෙනමක්, ඒ දෙනමට මම මෙන්න මෙහෙම ප්‍රකාශ කරනවා. 'මහණෙනි, මා දනය වළඳලා ඉවරයි. දැන් මේ ඉතිරිවෙලා තියෙනවා පිණ්ඩපාතය ටිකක්. මේක කවුරුවත් වැළඳුවෙ නැත්නම් මම මේක වීසිකරන්නයි ඉන්නෙ, කැමති නම් වළඳන්න' කියලා. එතකොට එක භික්ෂුවක් හිතනවා මෙන්න මේ විදියට 'දැන් මේ භාග්‍යවතුන් වහන්සේ වළඳපු පිණ්ඩපාතය කොටසක් ඉතිරිව තිබෙනවා. දැන් මා ඒක වැළඳුවෙ නැත්නම් භාග්‍යවතුන් වහන්සේ ඒක විසිකරනවා. ඒ වුනාට භාග්‍යවතුන් වහන්සේ මෙන්න මෙහෙම දෙයක් දේශනා කරල තියෙනවා.

'ධම්ම දයාද භික්ඛවෙ භවථ මා ආමිස දයාද'

'මහණෙනි, ධර්මයට දයාද වන්න, ආමිසයට දයාද නොවන්න' කියල. එතකොට ඒ බුද්ධ වචනය සිහිපත් කරලා මේ භික්ෂුව ඒ පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කරල ඒ දවස කුසගින්නෙන්ම ගතකරනවා. ගතකරන්න හිතා ගන්නවා. අධිෂ්ඨාන කරගන්නවා. අනික් භික්ෂුව කල්පනා කරනවා දැන් මේ භාග්‍යවතුන් වහන්සේ වළඳලා අවසන් වූ

පිණ්ඩපාත ඉතිරි කොටස මම දන් වැළඳුවෙ නැත්නම් භාග්‍යවතුන් වහන්සේ මේ පිණ්ඩපාත කොටස විසිකරනවා. ඒක නිසා මම මේ පිණ්ඩපාත කොටස වළඳලා අද කුසගින්න ඉවත් කරගෙන මේ විදියට දවස ගතකරන්න ඕන හොඳින් කියලා. එහෙම හිතලා ඒ පිණ්ඩපාතය වළඳනවා. අන්තිමේදී බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා, 'මහණෙනි, මේ දෙනම අතරින් අර දෙවන භික්ෂුව මා ඉවත් කරන පිණ්ඩපාත කොටස වලඳලා කුසගිනි ඉවත් කරගත් නමුත් කලින් කියාපු භික්ෂුවමයි මා වඩාත් පූජ්‍ය හැටියට ප්‍රශංසනීය හැටියට සලකන්නේ. මොකද ඒ භික්ෂුවගේ පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කරලා එද දවස කුසගින්නේ ගත කිරීම ඒ භික්ෂුවට අනාගතයේ තමා තුළ තිබෙන ඒ උතුම් ගුණධර්ම අල්පෙච්ඡතා, සන්තුට්ඨිතා, සුභරතා ආදී ගුණධර්ම ඒවාගේම ධුතාංග - ඒවා තුළින් ඇතිකර ගන්න සල්ලෙඛ කියන කෙලෙස් කැපීමේ ප්‍රතිපදාව මෙන්න මේවා ආරක්ෂා කරගන්න දියුණු කරගන්න උපකාර වෙනවා. ඒ ප්‍රතික්ෂේපය'. බුදුපියාණන් වහන්සේ ධම්මදායාද සූත්‍රය නමින් හැඳින්වෙන මේ දේශනාව තුළින් දක්වූ කාරණය ආනන්ද ස්වාමීන් වහන්සේ තමාගේ ජීවිතය තුළින් ජීවිතාදර්ශයක් දුන්නා කියල අපට හිතාගන්න පුළුවන්. මා භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරනවා, භාග්‍යවතුන් වහන්සේ මට තමන්වහන්සේට ලැබෙන සිවුරු පිරිකර පිණ්ඩපාත ආදිය මට දෙන්නේ නැත්නම්. ඒවගේම භාග්‍යවතුන් වහන්සේගේ ගන්ධකුටියේ මට එකට වාසය කරන්න අවස්ථාව දෙන්නේ නැත්නම් එතකොටයි මම උපස්ථාන කරන්නේ. ඒ තුළින් අපට ලොකු ආදර්ශයක් ගන්න පුළුවන් වෙනවා. ආනන්ද ස්වාමීන් වහන්සේගේ අල්පෙච්ඡතා ආදී ගුණ සම්භාරය ගැනත් ඒ වගේම නිහතමානිත්වය බොහෝ තැන්වල සඳහන් වෙනවා.

ආනන්ද ස්වාමීන් වහන්සේට ප්‍රශංසා පමණක් නොවෙයි, ඇතැම් විට විවේචන - නොයෙකුත් විදියේ දෝෂාරෝපණ - ලැබුණා. ඒ හැම අවස්ථාවකම උන්වහන්සේ ඉතාම නිහතමානීව තමාගේ වරද පිළිගත්තා මිසක් කෝපයක් ද්වේෂයක් දක්වූයේත් නැහැ. බුදුපියාණන් වහන්සේ ඇසුරෙහි වාසය කළ පමණින්ම ඒ පිළිබඳව අනියම් අන්දමින් බුදුපියාණන් වහන්සේට ගතු කීම් ආදී එවැනි කටයුත්තක් කෙරුවේ නෑ. ඉතාමත්ම පුදුම අන්දමින් සුවචව නිහතමානීව බුදුපියාණන් වහන්සේට උපස්ථාන කළ බව දක්වෙනවා. කොයිතරම්ද

කියතොත් හිතා ගන්න තියෙන්නෙ බුදුපියාණන් වහන්සේ සමග දීර්ඝ ඥාති සම්බන්ධයක් තිබිල තියෙනවා.

මෙලොව වශයෙන් මේ ජීවිතය වශයෙන් බලන කොට ආනන්ද ස්වාමීන් වහන්සේගේ ජීවිත පසුබිම හැටියට සඳහන් වෙන්නේ බුදුපියාණන් වහන්සේට සුළු පියා වන අමිතෝදන කියන ශාක්‍යයාගේ පුත්‍රයෙක්. ඒවගේම අනුරුද්ධ, භද්දිය, භගු. කිම්බිල, දේවදත්ත කියන ශාක්‍ය කුමාරවරුන් එක්ක ඇවිල්ලයි පැවිදි වුනේ. නමුත් ඊටත් වඩා ඈතට යන සම්බන්ධතාවක් බුදුපියාණන් වහන්සේ හා සමග තිබුණු බව ජාතක කථා ආදියෙන් හෙළි වෙනවා. අන්න ඒ ඇල්ම, ඒ ලැදිකම පුදුම අන්දමේ ස්නේහය නිසා තමයි බුදුපියාණන් වහන්සේට අර කිව්ව විදියට දෙහිතකින් තොරව හිතසුව පතමින් මෛත්‍රීමය කාය කර්ම, වාග් කර්ම, මනෝ කර්ම පවත්වමින් ඉහළම මට්ටමින් උපස්ථාන කළේ. අපට හිතන්න තියෙන්නේ බුදුපියාණන් වහන්සේගේ බුද්ධ ලෝකාර්ථ චර්යාවට පිටුපසින් සිටින සෙවණැල්ල වගේ ආනන්ද ස්වාමීන් වහන්සේගේ ඒ උපස්ථානය අපි සිහිපත් කරන්න ඕන. ඒ වගේම අනිත් පැත්තට තියෙන්නේ ඒ උන්වහන්සේගේ ගුණ ස්කන්ධය ගැන. අර කියාපු බහුශ්‍රැත ගුණයත් සෝවාන් තත්ත්වය ලබාගෙන සිටිය නමුත් එවකට රහත් නොවූ නමුත් බුදුපියාණන් වහන්සේ ඇතුළු අනෙකුත් සාරිපුත්තාදී මහ ස්වාමීන් වහන්සේලා ආනන්ද ස්වාමීන් වහන්සේ හැඳින්වූයේ පණ්ඩිත, මහාප්‍රාඥ කියන වචන වලින්. උන්වහන්සේගේ බහුශ්‍රැත - බව උන්වහන්සේ බොහෝ අවස්ථාවල අනෙකුත් සංඝයා වහන්සේලාට, තීර්ථකයන්ට, ගිහියන්ට, උපාසක උපාසිකාවන්ට නොයෙකුත් විදියට දීර්ඝ දේශනාවන් පැවැත් වූ බව සඳහන් වෙනවා. ඒ එක්කම අර ධර්මය හිතේ දරාගෙන ධර්ම භාණ්ඩාගාරික වශයෙන්.

ආනන්ද ස්වාමීන් වහන්සේ සම්බන්ධව අපි මේ ප්‍රකාශ කළ කාරණා අනුව ආනන්ද ස්වාමීන් වහන්සේට ගරු කිරීම් වශයෙන් අපට හිතාගන්න තියෙන්නෙ දැන් මේ පින්වතුන් බුද්ධ පූජා කියල දෙයක් කරනවා. චෛත්‍ය වන්දනා, ප්‍රතිමා පූජා, මල් පූජා ආදිය කරනවා. මේ කරන අවස්ථාවේ හිතන්න තියෙන්නේ ආනන්ද ස්වාමීන් වහන්සේ ජීවමාන බුදුරජාණන් වහන්සේට කළ උපස්ථානයේ සංකේතයක්. ඒක ආදර්ශයට ගනිමින් කරන බුද්ධ උපස්ථානයක්ය අපි කරන්නේ කියලා.

ඒකත් ශ්‍රද්ධාව වඩා ගන්න හේතු වෙනවා. ඒවගේම අපට ඒක හෙළිවෙනවා බුද්ධ කාලයේ පවා දඹදිව ආනන්ද බෝධීන් වහන්සේ පිළිබඳ ප්‍රවෘත්තියෙන්. එයින් කියවෙන්නේ බුදුපියාණන් වහන්සේ චාරිකාවේ වැඩම කළ අවස්ථාවල කොසොල් රජතුමා, අනේපිඬු සිටුතුමා, සැදැහැවත් විසාකා ආදී අයට බුදුපියාණන් වහන්සේට දැක්විය හැකි ගරු සත්කාර ආදිය දැක්වීමට ක්‍රමයක් නැතිවෙන කොට ඉල්ලා සිටියා පූජනීය යම්කිසි වස්තුවක්. එහි ප්‍රතිඵලයක් හැටියට ආනන්ද ස්වාමීන් වහන්සේ, එතන කියවෙන හැටියට, බුදුපියාණන් වහන්සේගෙන් අවසර ලබාගෙන ගයාවේ පිහිටි ඒ බෝධීන් වහන්සේගෙන් බෝධි බීජයක් ලබාගෙන ඒ ආනන්ද බෝධීන් වහන්සේ සිටවූ බව. ඒ ආනන්ද බෝධි කියන නමින්ම අපට පෙනෙන්නේ ආනන්ද ස්වාමීන් වහන්සේට උපහාර වශයෙන් උන්වහන්සේ බුදුපියාණන් වහන්සේට කළ උපස්ථානයම ඉදිරියට ගෙන යාමයි. ඒ තුළින් තමන්ගේ සිත ප්‍රසාදයට පත්කර ගැනීමයි, අපි බලාපොරොත්තු වෙන්නේ. 'මහද ගඳකිළියක් කර ගනිමි' කිවුවා වගේ මේ සිදුකරන උපස්ථාන තුළින් භාග්‍යවතුන් වහන්සේගේ බුදු ගුණයට තමන්ගේ හද ගඳ කිළිය කර ගැනීමයි, මේ බෞද්ධ පින්වතුන්ගේ පරමාර්ථය විය යුත්තේ. ඒකට ආදර්ශයක් ආනන්ද ස්වාමීන් වහන්සේ විසින් සැපයෙනවා.

ඒ වගේම මහා පරිනිර්වාණ සූත්‍රයේ කියවෙනවා ආනන්ද ස්වාමීන් වහන්සේගේ මෙහෙයවීම පිටයි, උන්වහන්සේගේ ප්‍රශ්න වලට පිළිතුරු වශයෙනුයි බුදුපියාණන් වහන්සේ ඔය තථාගත ශරීරයට කළ යුතු සත්කාර සම්මාන, ථූප ගොඩනැගීම ආදිය පිළිබඳව විස්තර ප්‍රකාශ කළේ. ආනන්ද ස්වාමීන් වහන්සේ නැවත නැවතත් ඉදිරිපත් කළ ප්‍රශ්න භාග්‍යවතුන් වහන්සේ පරිනිර්වාණයට පත්වුණාට පස්සෙ කොහොමද අපි තථාගත ශරීරයට උපස්ථාන කරන්නේ, ගෞරව කරන්නේ කියල. ඊට පිළිතුරු වශයෙනුයි බුදුපියාණන් වහන්සේ සක්විති රජකුගේ ශරීරයට කරන උපස්ථාන කරන්න කියලා ථූප තැනීම පිළිබඳව ඒ විදියෙ විස්තර ප්‍රකාශ කළා. ඒ උපදෙස් අනුවයි සම්බුද්ධ පරිනිර්වාණයෙන් පස්සෙ ඒ ධාතු නිදන් කරල චෛත්‍ය තැනීම පවා ආරම්භ කළේ. ඒ නිසා අපි බුද්ධෝපසථාන කරන හැම අවස්ථාවකම හිතන්න තියෙන්නෙ අර ආනන්ද ස්වාමීන් වහන්සේ ජීවමාන බුදුපියාණන් වහන්සේට කළ බුද්ධෝපසථානය සිහියට නඟාගෙන ඒ

වගේමයි ඒ වත පිළිවෙතමයි අපි කරන්නේ කියල විහාර වත, බෝධි වත ආදිය කරන අවස්ථාවේ පවා, මේවා නිකම්ම තමන්ට කරදරයක් හැටියට සලකන දේවල් නොවේ, මේවා තුළින් අර බුදුපියාණන් වහන්සේ තමන්ගේ හද තුළ ජීවත් කර ගැනීමයි බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා අපට ඒ බුදුපියාණන් වහන්සේට යමක් අයත් නොවුණත් අපි බලාපොරොත්තු වන්නේ මොකක්ද? සිතේ ශ්‍රද්ධාවත් එක්ක යන ගුණයක් තමයි ප්‍රසාදය කියන එක. ශ්‍රද්ධාව තුණුරුවන් කෙරෙහි තියෙන ශාස්තෘ ගෞරවය කියන එක අත්‍යවශ්‍ය දෙයක්. දැන් විශේෂයෙන්ම මේ කාලයේ බුදුපියාණන් වහන්සේ වෙනුවට වෙන වෙන ශාස්තෘන් ඔස්සේ මේ අපේ බෞද්ධයන් පවා දුවගෙන ගියා. සමහර විට වෙන වෙන බුදුවරු පවා පහල වෙලා කියල ආරංචියි. ඔය විදියට නොයෙකුත් විදියේ ශ්‍රද්ධාව දූෂණය වෙන තත්ත්වයකුයි තිබෙන්නේ. ඉතින් අපි හිතාගන්නට ඕනෑ අර **බුදුපියාණන් වහන්සේ කෙරෙහි නියම ශාස්තෘ ගෞරවය ඇතිකර ගැනීමට නම් වත පිළිවෙතත් සමහර විට අපට උපකාර වෙනවා**. ඒ තුළින් අර ආනන්ද ස්වාමීන් වහන්සේ කළා වගේ - ඒ දුර්ලභ භාග්‍ය සම්පන්න අවස්ථාව ආනන්ද ස්වාමීන් වහන්සේටයි හිමිවුනේ. අපිත් ඒක අනුගමනය කරමින් බුදුපියාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකර ගැනීමට ඒ චෛත්‍ය වන්දනා ආදී කටයුතු වත පිළිවෙත අර්ථවත්ව කරන්න ඕනෑ. ශ්‍රද්ධාව ඇති කරගෙන, අපේ හද තුළ ප්‍රසාදය ඇතිකර ගැනීමයි, පරමාර්ථය.

බුදුපියාණන් වහන්සේ මහා පරිනිර්වාණ සූත්‍රයේ ප්‍රකාශ කරලා තියෙනවා ඒ විදියෙ චෛත්‍ය වන්දනාව ආදිය තුළින් යම් කෙනකුගේ සිත පහදවා ගත්තා නම් ඒ පහදවා ගැනීම දෙව්ලොව උත්පත්තිය ලබා ගැනීමට පවා උපකාර වෙනවා. ඒ පරලොව පිළිබඳව. නමුත් මෙලොව ගැන කල්පනා කරලා බලනවා නම් ඒ ශ්‍රද්ධාව එක්ක යන ප්‍රසාදයම තමයි අපේ සිත් තුළ සමාධිය ඇති කරගන්න උපකාර වෙන්නෙ. බුද්ධ දේශනාවක් අහන් ඉන්න කෙනකු තුළ ඒ සමාධිය ඇති වීමට පූර්වභාග වන්නේ හිතේ ඇතිවන ප්‍රසාදයයි. ඒ ප්‍රසාදය තුළින් නීවරණ ධර්ම ඉවත් වුනාට පස්සෙ. පැරණි උපමාවක් තියෙනවා උදකප්‍රසාදක මාණික්‍යය කියල. ඒ කාලයේ බොර දියට එක්තරා මැණිකක් දැම්මහම ඉක්මනින්ම ඒ බොර ඉවත් වී යටට බැහැලා වතුර පැදෙනවා. අන්න

ඒ විදියට උදකප්‍රසාද මාණික්‍යයක් හැටියට දක්වනවා මේ ශ්‍රද්ධාව කියන එක. ඒක ඇතිකර ගැනීමටයි මේ වත පිළිවෙත ආදිය කරන්නේ.

බුද්ධෝපස්ථානය තුළින් ආනන්ද ස්වාමීන් වහන්සේගේ බුද්ධෝපස්ථානය සංකේතවත් වනවා වගේම ඊළඟට අපට හිතන්න තියෙන්නේ ධර්ම භාණ්ඩාගාරික වශයෙන් උන්වහන්සේ කළ ශාසනික සේවයත් අපට සිහියට නඟාගන්න උපකාර වෙනවා. දැන් අපි මේ සජ්ඣායනා කරන පිරිත් සූත්‍රයක ධර්ම කොට්ඨාසයක බොහෝ විට දකින්ට ලැබෙන දෙයක් තමයි 'එවං මෙ සුතං' කියල. මේ 'එවං මෙ සුතං' කියල කියන්නේ 'පින්වතුනි මා විසින් මෙසේ අසන ලදී' කියන එකයි. කවුද මේ 'මම?' මේ 'මම' තමයි ආනන්ද. ඒ මොකද සංගායනා අවස්ථාවේදී ආනන්ද ස්වාමීන් වහන්සේ 'මා විසින් මෙසේ අසන ලදී' කියල අසා ඇති ස්ථානයේ තබාගෙන ඒ ධර්ම කොට්ඨාස ධර්ම සංගායනාවේදී ප්‍රකාශ කළා. උන්වහන්සේට උපහාර වශයෙන් සංගීතිකාරක භික්ෂූන් වහන්සේලා ඒ වචන ටිකත් ඇතුල් කළා. ඒකයි අපි මේ 'එවං මෙ සුතං' කියලා සූත්‍ර පටන් ගන්නේ. ඇතැම් කෙනෙක් මේකට හේතුව වත් දන්නෙ නැහැ. ඒක තුළින් ආනන්ද ස්වාමීන් වහන්සේට නැවතත් උපහාරය දක්වනවා. උන්වහන්සේගේ ධර්ම භාණ්ඩාගාරිකත්වයට.

ඉතින් මේ ශ්‍රාවක චරිත අපි නැවත මතු කරලා ගන්නේ මොකද? මේ ශ්‍රාවක චරිත එක ජීවිතයකදී හැඩ ගැසුන දේවල් නෙවෙයි. අපි පිළිගන්නවා නම් මේ සාංසාරික තත්ත්වය - දීර්ඝ කාලයක් අපි මේ සංසාරයේ යන බව. බුදුපියාණන් වහන්සේ ගැන කියපුවහම අපි හිතන්නෙ නැහැ මේ එක ජීවිතයක බුද්ධත්වයට ආධාර වූ ගුණ සම්භාරය ඇතිකර ගත්තා කියල. හය අවුරුද්දක් උත්සාහ කිරීමෙන්වත්, එක ගහක් යට ඉඳගත්තු පමණින් වත් හිටි ගමන් පහළ වුනා කියල. දීර්ඝ කාලයක් මේ සංසාරේ පාරමී ධර්ම පුරලයි, හිතාගන්න බැරි තරම් කල්ප ගණනක් පාරමී ධර්ම පුරලයි බුදු කෙනෙක් මෙලොව පහල වෙන්නේ. ඒ වගේම තමයි ධර්මතා හැටියට බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළේ විශේෂ තනතුරු, අග්‍රශ්‍රාවක තනතුරු, උපස්ථායක තනතුරු ආදී ඒ හැම එකක්ම දීර්ඝ කාලයක් ඊට අදාළ අන්දමින් පින් දහම් කරමින් ප්‍රාර්ථනා වශයෙන් ප්‍රණිධි වශයෙන් පුරන ලද ඒ පාරමී ශක්තීන් වල ප්‍රතිඵලයක් හැටියටයි ඒ විදියෙ මහා

ශ්‍රාවකයින් වහන්සේලා ලෝකයට බිහිවන්නෙ. **උන්වහන්සේලා පිරිනිවන් පෑව නමුත් උන්වහන්සේලා දැනට ජීවත්ව නැති නමුත්, අපි ඒ උන්වහන්සේලාගේ චරිතාදර්ශ පෙරමුණේ තබාගෙන ඒ අනුව තමයි මේ ශාසනය ඉදිරියට පවත්වා ගෙන යන්න තියෙන්නෙ.** අද දවසේ අපි මේ උපහාර පූජාවක් හැටියට ආනන්ද ස්වාමීන් වහන්සේගේ චරිතයයි ඉදිරියට ගත්තේ. උන්වහන්සේගේ කියාපු උපස්ථාන ගුණයත්, ධර්ම භාණ්ඩාගාරික හැටියට ශාසනයට කළ සේවාවත් අපි මේ ශාසනය පවත්වා ගැනීමට උපකාර වන අන්දමට අපගේ ජීවිත වලටත් එකතු කරගන්න වටිනවා.

ඊළඟට මේ ශ්‍රද්ධාවේ ඇති වටිනාකම ගැන බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙනවා ඉන්ද්‍රිය ධර්ම පහක් සහ බල ධර්ම පහක්, සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤ කියල. මේවායේ ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාව හොඳට කල්පනා කරල බලන්න ඕනෑ. මේ ශ්‍රද්ධාව කියන එක ඇතැම් කෙනෙක් මේක මෝඩකමක් හැටියට හිතනවා. නමුත් ඇත්ත වශයෙන්ම යම්කිසි විශේෂ වැඩකට යොමුවීමට කලින් ඒ පිළිබඳව ගැඹුරු විශ්වාසයක්, යම්කිසි ප්‍රමාණයක ශ්‍රද්ධාවක් තිබෙන්ට ඕන. මොකද ශ්‍රද්ධාව නැතිව වීයර්‍ය මතුවන්නෙ නැහැ. එතකොට ලෝකයේ යම්තාක් අරමුණු තිබෙනවා නම් ශ්‍රද්ධාව ඇතිකර ගත යුතු, ඒ හැම අරමුණකටම වඩා ශ්‍රේෂ්ඨයි තථාගත සම්මා සම්බුදුරජාණන්වහන්සේ. එතකොට බුද්ධානුස්සතිය හැටියට අපි හිතන්නෙ, බුදුරජාණන් වහන්සේ සිහියට නඟා ගන්නවා කියල කියන්නෙ, ඒක තුළින් ශ්‍රද්ධාව ඇතිකර ගැන්මයි. ආනන්ද ස්වාමීන් වහන්සේට මෙය නිරායාසයෙන්ම ලැබුණා. ඒක කොයිතරම් ද කියතොත් ඒ බුද්ධානුස්සති බලයෙන් - උන්වහන්සේ තමන් වහන්සේගේ ජීවිත ප්‍රවෘත්තිය ප්‍රකාශ කරන අවස්ථාවේදී කියනවා, සෝවාන්ව සිටියත් උන්වහන්සේට කාම විතර්ක ආදී කෙලෙස් මතුවූයේ නැතෙයි කියල. මොකද උන්වහන්සේ නිරන්තරයෙන්ම බුදුගුණෙහි බුදුරජාණන් වහන්සේ ගැනම හිතමින්ම කාලය ගත කළ නිසා.

**ශ්‍රද්ධාව තුළින් අර නීවරණ ධර්ම ඉවත් වන බව අපට පේනවා.** ශ්‍රද්ධාව කියන්නෙ ප්‍රසාදය. ඊළඟට ඒවගේම ඒ ශ්‍රද්ධාව, ඇතෙකුට හොඬවැල වගේ, ඒ ශ්‍රද්ධාව උපකාර කරගෙන තමයි මේ ශාසනික

ගුණ ධර්ම පිරීමට පුළුවන් වනුයේ. ශ්‍රද්ධාව බීජය හැටියටයි දක්වල තියෙන්නෙ. **ශ්‍රද්ධාව බීජයක් කරගෙනයි අනෙකුත් ගුණ ධර්ම වැඩෙන්නෙ.** ශ්‍රද්ධාව පිහිට කරගෙන ඊළඟට වීර්‍ය්‍ය වඩනවා. වීර්‍ය්‍ය වැඩීම තුළින් කරන්නේ මොකක්ද? වීර්‍ය්‍ය වඩනවා කියල කියන්නේ තමන්ගේ චිත්ත සන්තානයට ගලාගෙන එන අකුසල ධර්ම ඉවත් කිරීමටත්, කුසල ධර්ම ළංකර ගැනීමටත් සතර ආකාර වීර්‍ය්‍යයක් යොදනවා. අන්න ඒ විදියට වීර්‍ය්‍ය දරනවා. ඒ වීර්‍ය්‍ය දැරීමෙන් නූපන් අකුසල් වලට ඉඩ නැතිවෙන කොට, උපන් අකුසල් නෙරපා හරින කොට, නූපන් කුසල් ඇතිකර ගන්න කොට, උපන් කුසල් තහවුරු කරගන්න කොට, ඒ තුළින් මතු වෙන්නෙ සතියයි. සිහියයි. ස්මෘති ශක්තියයි. එතකොට ශ්‍රද්ධා, විරිය, සති - ඒ ස්මෘති ශක්තියයි. ඒ සතිය සෑහෙන කාලයක් අධිෂ්ඨානය අනුව පවත්වාගෙන යන්න පුළුවන් තත්ත්වයයි සමාධිය කියල කියන්නෙ. ඒ සමාධිය තුළ තිබෙනවා අපේ එදිනෙදා ජීවිතයේදී මේ විසිරෙන වික්ෂිප්ත හිත තුළ අපරාදෙ විනාශයට යන ශක්ති සමූහය එකතු කරල ගන්න බලයක්. මේ සමාධියයි, ඊළඟට සමාධිමත් සිත අන්තිමට අර ලෝකයේ යථා තත්ත්වය, ශරීරයේ යථා තත්ත්වය, පටිච්චසමුප්පාද ධර්මයේ තිබෙන ආකාරයට ලෝකයේ ඇතිවීම් නැතිවීම් පක්ෂය පිළිබඳ ගැඹුරු අවබෝධය ඇතිකර ගැනීමට උපකාරී වෙනවා. ඒකයි ප්‍රඥාව කියල කියන්නෙ.

මේ සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා ඉන්ද්‍රිය ධර්ම හැටියට දක්වන්නේ කෙනකුට මේවා උත්සාහයෙන් දියුණු කරගත යුතු දේවල් නිසයි. අපි දන්නවා කෙනෙක් උපදින කොට පංච ඉන්ද්‍රියයන් කියල ඒ ඇස්, කන්, නාසා ආදිය මතු වෙනවා. ඒවා තිබෙනවා, නමුත් ඒවායින් බැහැ නිවන් දකින්න. මෙන්න මේ කියාපු ආධ්‍යාත්මික සද්ධා ආදි ඉන්ද්‍රිය පහ සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන මේවා ඉන්ද්‍රිය තත්ත්වයට පමුණුවා ගන්න ඕන. ඉන්ද්‍ර කියල කියන්නෙ රජ. තමන්ට යම්කිසි විශේෂ කාර්යයක් කරන්න පුළුවන් ශක්තියක් ඇති දෙයක් බවට පත් කරගන්නවා ශ්‍රද්ධාව. මොකක්ද ඒ විශේෂ කාරණය. ඒ ශ්‍රද්ධාව තුළින් අශ්‍රද්ධාව කියල කියන දෙගිඩියාව, සැකය ඉවත් කරනවා. සැකය, දෙගිඩියාව තියාගෙන බැහැ මේ ගමන යන්න. තෙරුවන් කෙරෙහි හොඳ පිරිසිදු ශ්‍රද්ධාව ඇතිවයි, ඊළඟට තමන්ට සියයට සියයක්ම ඒ සඳහා වීර්යය යොදන්ට පුළුවන් වෙන්නෙ. අඩාල සිතකින්, දෙගිඩියාව ඇති සිතකින් නියම ආකාරයෙන් තමන්ට ආත්ම

පරිත්‍යාගයෙන් වීර්යයක් යොදන්ට බැහැ. ඒකයි බුදුපියාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව අවශ්‍ය වන්නේ. ඒ විදියට ශ්‍රද්ධාව තුළ තියෙනවා - ඒකට කියනවා අධිමොක්ඛ කියල. අධිමොක්ඛ කියන්නේ මුද්‍ර හැරීමයි. ශ්‍රද්ධාව මුද්‍ර හරින්වා කියල බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරන්නෙ. මේ ශ්‍රද්ධා ශක්තිය තථාගතයන් වහන්සේ කෙරෙහි මුද්‍රහැරියා නම් එතකොට කිසිදු පැකිළීමක් නැතිව වීර්ය දරන්න යොමු වෙනවා. ඒ වීර්යය තමයි - අන්න අර කියාපු ආකාරයට ඒ වීර්යය තුළින් සතිය ආදී ගුණධර්ම මතු වෙනවා.

ඒ නිසා අපි කල්පනා කර ගනිමු මෙන්න මේ ශ්‍රද්ධාදී ගුණ ධර්ම සමූහය වඩා ගැනීමටත් මේ ආනන්ද චරිතය අපට උපකාර වෙනවා. උන්වහන්සේ බුදුපියාණන් වහන්සේට සෙවණැල්ල වගේ නිරන්තරයෙන් පසු පසින් යමින් මේ උපස්ථාන කිරීම තුළින් බුදුරජාණන් වහන්සේගේ එදිනෙදා ජීවිතයේ අනෙකුත් කටයුතු සඳහා කාලය ලබා දුන්නා පමණක් නොවෙයි උන්වහන්සේ ඊළඟට ඒ එක්කම තමන් වහන්සේත් බුදුපියාණන් වහන්සේගේ ඇසුරින් නියම ප්‍රයෝජන ගනිමින් අර ධර්ම කොට්ඨාස, නොයෙකුත් අවස්ථා වල තමන්ට පැමිණෙන ගැටළු ඉදිරිපත් කරලා, ඊට ලබාගත්තු පිළිතුරුයි අද දවසේ අපට මේ ත්‍රිපිටකයේ සූත්‍ර කොටස් හැටියට දකින්ට ලැබෙන්නෙ. ආනන්ද ස්වාමීන් වහන්සේට යම්කිසි විතර්කයක් සිතිවිල්ලක් ආවහම බුදුරජාණන් වහන්සේ හමුවන්ට ගිහිල්ලා "මේක කොහොමද?" කියල බුදුපියාණන් වහන්සේ ගෙන් අහනවා. ඊට දෙන පිළිතුරුයි මේ ධර්ම කොට්ඨාස රාශිය. ඒ විදියට එකතු වූ ධර්ම කොට්ඨාස රාශියකුයි අපි මේ සූත්‍ර දේශනා හැටියට පරිහරණය කරන්නෙ. අපි මේ හැම එකක් තුළින්ම කල්පනා කරන්න ඕන - මේ ධර්ම දේශනා තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද මේ සංසාර දුකින් එතෙර වීමයි, සංසාර දුකින් එතෙර වීම සඳහා යායුතු මාර්ගය බුදුපියාණන් වහන්සේ දක්වා තිබෙනවා, සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි කියල.

මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ එන සම්‍යක් දෘෂ්ටිය මේක තුළත් තිබෙනවා මේ බුදුපියාණන් වහන්සේගේ වචනය පිළිබඳව එක්තරා ප්‍රමාණයක ශ්‍රද්ධාවක්. ඒ ශ්‍රද්ධාව ඇති කරගෙන අර

බුදුපියාණන් වහන්සේ ඇතාගේ උපමාවෙන් චූලහත්ථිපදෝපම සූත්‍රයේ ප්‍රකාශ කළා වගේ බුදුපියාණන් වහන්සේගේ සම්බෝධිය පිළිබඳව යම්කිසි ප්‍රමාණයක ශ්‍රද්ධාවක් ඇති කරගන්නවා. ඒ විශ්වාසය එක්තරා ප්‍රමාණයකට නැත්නම් කෙනකුට බැහැ මේ ධර්ම මාර්ගයේ යන්න. තමන්ගේ ශාස්තෘන් වහන්සේ කවුද කියල තෝරාගන්න බැරි වෙනවා. බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇතිකරගත් ශ්‍රද්ධාව පිහිට කරගෙන ඒ හරි දර්ශනය, හරි දැක්ම ඇතිකර ගත්තා නම් එතන ඉඳල ඊළඟට ඇතිවන සංකල්ප මාර්ගීය සංකල්ප ධාරාවයි සම්මා සංකප්ප හැටියට තියෙන්නෙ. ඒක තුළින් ඒ වචනය, ක්‍රියාව, ජීවිකාව ආදිය සකස් වෙලා අවසානයේ චිත්ත සමාධිය මතුකර ගැනීමෙනුයි මේ ලෝකයේ යථා තත්ත්වය අවබෝධ කරගන්න පුළුවන් වනුයේ. **මේ ධර්ම මාර්ගයේ යාමට අත්‍යවශ්‍ය දේවල් තමයි බුදුපියාණන් වහන්සේ දක්වල තිබෙන සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා. මේවා ඉන්ද්‍රිය ධර්ම වගේම බල ධර්මත් වෙනවා.** අර ඊට ප්‍රතිවිරුද්ධ කාරණා මතු වූ අවස්ථාවේ ශ්‍රද්ධාව සිහිපත් කරගෙන ඒ සැකය දෙගිඩියාව විචිකිච්ඡාව ජයගන්න පුළුවන් වෙනවා. වීර්යය ඉදිරිපත් කරගෙන සිතේ හැකිලෙන ගතිය, නිදිමත ගතිය ජයගන්න පුළුවන් වෙනවා. සතිය ඇතිකර ගැනීම වික්ෂිප්ත භාවය නැතිකර ගැනීමට උපකාර වෙනවා. සමාධිය, එකඟභාවය, ඊළඟට ප්‍රඥාව.

මෙන්න මේ කාරණා සම්පූර්ණ කර ගෙනයි යමෙකුට මේ ධර්ම මාර්ගයේ ඉහළම ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් වෙන්නෙ. ඒ නිසා අපි කල්පනා කරන්න ඕන මේ ශ්‍රාවක චරිත තුළ තිබෙන ගුණධර්ම සමූහය. අපිත් ඒවා ගැන කල්පනා කරලා උන්වහන්සේලාට කෘතඥතා වශයෙන්, උපහාර වශයෙන් ඒවා සිහිපත් කරන අතරම ඒවායෙන් අපට ගතහැකි ආදර්ශය අරගෙන මේ ශාසනික ගුණධර්ම අප තුළ වගා දියා කරගන්න ඕන. ඒ තුළින් තමයි අපට යම්කිසි විමුක්තියක් ලබා ගන්න පුළුවන් වෙන්නෙ අනෙක් අයටත් ආදර්යක් දෙන්න. අපි සාමාන්‍යයෙන් පුදපූජා ආදිය නිරර්ථක දේ හැටියට සැලකුවත් ඒවා තුළ තිබෙන්නෙ මේ බුද්ධ උපස්ථානයට අදාළ දේවල්.

ඊළඟට මේ ධර්ම කොට්ඨාස ආනන්ද ස්වාමීන් වහන්සේ කළා වගේ මේවා ධාරණය කර ගැනීම තුළින්, මේවා ගැන නිරන්තරයෙන් ධර්ම කොට්ඨාස වල හිත පැතිරවීම, ඒවා දේශනා කිරීම ආදී හැම

කටයුත්තක්ම තමන්ගේ විමුක්තියට උපකාර වෙන ආකාරයට පාවිච්චි කරන්න ඕන. ඒවා තුළින් තමයි අර බහුශ්‍රැත භාවය පවා මේ ශාසනයේ පැවැත්මට උපකාර වෙන්නෙ. බහුශ්‍රැත භාවය තුළින් බොහෝ දෙනා ඒවායෙන් ප්‍රතිඵල ලබනවා. ඒ ධර්මය අසන්ට අවස්ථාව ලැබෙනවා. විශේෂයෙන්ම පොත පත නැති යුගයක ඒවා භාණක වශයෙන් පරම්පරා වශයෙන් සංඝයා වහන්සේලා ධාරණය කරගෙන පවත්වාගෙන ආව නිසා තමයි අපට මේ ධර්මය අද ලැබිල තිබෙන්නෙ. ඒ ධර්මය පවා අප පොත පතට සීමා කරල මුද්‍රණ පහසුකම් තිබෙන නිසා පොත් පත්වල මුද්‍රණය කරල පමණක් තැබුවොත් තව ටික කලක් යන විට මේවා තේරෙන්නෙ නැති තත්ත්‍වයකට පත් වෙනවා. ඒ නිසා **මේ ධර්මය තමන්ගේ සිතේ, චිත්ත සන්තානයේ, හදවතේ ධාරණය කරගෙන ඒවා නැවත නැවත මතු කරගෙන ඒවායේ අර්ථය පිරික්සා බලමින් ඒ ධර්මය තමන්ගේ චිත්ත සන්තානයේ ආරක්‍ෂා කර ගන්න උනන්දු වෙන්න ඕන.**

ඒ එක්කම තමන්ගේ ජීවිතයත් ඉබේට හැඩ ගැහෙනවා. තමන් නිරන්තරයෙන් යම්කිසි දෙයක යෙදෙනවා නම් තමන්ගේ සිතුම් පැතුම් හැම එකක්ම ඊට අනුරූපව පවතිනවා. වැරදි සිතිවිලි වල, මිථ්‍යා දෘෂ්ටි වල සිත යොදගෙන සිටින කෙනාගේ අනෙක් පැවතුම් සියල්ලක්ම ඊට අනුරූප වෙනවා. නමුත් ධර්ම කොට්ඨාස නිරන්තරයෙන් සිතේ මතුකර ගෙන ඒවා සිතමින් ඒවාට සිත යොමුකර ගනිමින් ජීවත් වන විට ඒ ධර්ම කොට්ඨාස වල තිබෙන ගුණ ධර්ම තමා තුළත් දියුණු කර ගැනීමට ඉබේම පෙළඹෙනවා. මෙන්න මේ කාරණා සිහිපත් කරගෙන අද දවසේ මේ පින්වතුන් බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළ ආකාරයට ඒ ආනන්ද ස්වාමීන් වහන්සේ ආමිෂ දයාද නොවී ඒ ධර්ම දයාද වශයෙන් මේ ශාසන දායාදය අපට මේ විදියට ගෙනැවිත් දීල තිබෙනවා.

උන්වහන්සේ වගේම ධර්ම සේනාපති හැටියට සඳහන් වන්නේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේයි. ධර්ම භාණ්ඩාගාරික හැටියට සඳහන් වන්නේ ආනන්ද ස්වාමීන් වහන්සේ. ඒ වගේම ඒ ඒ ස්වාමීන් වහන්සේලාට අග්‍රස්ථානය බුදුපියාණන් වහන්සේ දී වදළේ මේ ශාසනයේ ඉදිරි ගමන සඳහායි. එතකොට සංඝයා වහන්සේලා දන්නවා මෙන්න මේ මේ අංශයෙන් මේ මේ සංඝයා වහන්සේලා

විශේෂයි. ඒ නිසා ඒවාට අදාළ කාරණා ඒ ඒ සංඝයා වහන්සේලාගෙන් ලබාගන්න පුළුවන්. ඒ විදියට බුදුපියාණන් වහන්සේ එක්තරා උපාය මාර්ගයකින් තමන්ගේ ශ්‍රාවකයන් වහන්සේලාට ඒ විශේෂ දක්‍ෂතා, කුසලතා ලෝකයාට ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දුන්නා.

දැන් අර සේඛ සූත්‍රයේ කිව්වා වගේ, සේඛ ප්‍රතිපදාවෙ කිව්වා වගේ, බුදුපියාණන් වහන්සේ ඇත්ත වශයෙන් අර සයනය කිරීමට තරම් සෑහෙන පිට රිදීමක් තිබෙන්න නැතිව ඇති. නමුත් උන්වහන්සේ ඒ අවස්ථාව යොදා ගත්තා ආනන්ද ස්වාමීන් වහන්සේට දීර්ඝ දේශනයක් පැවැත්වීම සඳහා. උන්වහන්සේ විවේක ගත්තා, ආනන්ද මේ ශාක්‍ය කුමාරවරුන්ට ධර්මය දේශනා කරන්න කියල. ඒ විදියට නොයෙකුත් අවස්ථාවල කෙටියෙන් ධර්මය දේශනා කරලා උන්වහන්සේ විහාරයෙන් නැගිටල ගියේ ශ්‍රාවකයින් වහන්සේලාටත් ඒ කුසලතා ප්‍රගුණ කිරීමට අවස්ථාව ලබාදීමට. මේ විදියට අපි හැම දෙනෙක්ම උත්සාහවත් වෙන්න ඕන මේ බුදුපියාණන් වහන්සේගේ ධර්මය 'සාත්‍ථං සබ්‍යඤ්ජනං' කියපු ආකාරයට අර්ථයත් එහි ව්‍යංජන පක්‍ෂයත්, එහි අර්ථය සහ එහි පද පිළිවෙල ආදිය හරියාකාරව ධාරණය කරලා, ඒවා අනෙක් අයට දේශනා කිරීම් කියාදීම්, ඒවා තුළ හිත පැවැත්වීම්, තමන්ට නොතේරෙන, තමන්ට නො පැහැදිලි තැන් අසා දැනගෙන ආදී වශයෙන් ඒ ධර්මය චිත්ත සන්තානයේ තැන්පත් කරගෙන ඒ ධර්මානුකූලව ජීවත්වීම තුළින් තමයි අපට මේ ශාසනය ආරක්‍ෂා කරගන්න පුළුවන් වන්නේ. මොකද නොයෙකුත් ආකාරයේ මිථ්‍යාදෘෂ්ටි මතු වනුයේ ධර්මය පිළිබඳ හරි අවබෝධයක් නැති කමෙනුයි. නමුත් මේ අද ඒ බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කර තිබෙන යම් ධර්ම කොට්ඨාසයක ව්‍යංජන පක්‍ෂය එහෙම නැත්නම් අකුරු ආදිය පද පිළිවෙල ආදිය වෙනස් වන විට ඒවායෙ අර්ථයත් වෙනස් වෙනවා. ධර්මය විකෘත කර ගත්තොත් ධර්මයේ පාඨ ආදිය වැරදි ආකාරයට උච්චාරණය කරමින්, ඒවා වැරදි ආකාරයට ධාරණය කරගතහොත් ඒවායේ අර්ථයත් ක්‍රම ක්‍රමයෙන් විකෘත භාවයට පත්වෙනවා. එලෙසයි ශාසන අන්තර්ධානයක් සැලසෙනුයේ. ඒ නිසා තම තමන්ගේ යුතුකමක් හැටියට සලකලා ශාසනයේ පැවැත්ම සඳහාත්, තමන්ගේ ආධ්‍යාත්මික ගුණ ධර්ම දියුණුව සඳහාත්, ධර්ම කොට්ඨාස හරියාකාරව ධාරණය කර ගැනීම්, සජ්ඣායනා කිරීම්, ඒවා අනෙක් අයට කියාදීම් ආදි කටයුතු නියම ශ්‍රද්ධාවෙන් යුක්තව

'යථාසුතං යථා පරියත්තං' තමන් ඇසූ හැටියට තමන් හැදෑරූ හැටියට අනෙක් අයට කියා දීමේ යුතුකමත් කරන්න ඕන.

මේ හැම දෙයටම ආනන්ද චරිතය ආදර්ශය හැටියට ගතහොත් - බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙනවා පූජාව, ප්‍රශංසාව ලැබිය යුත්තාට පූජාව ප්‍රශංසාව නො කිරීමත් අඩුපාඩුවක්. මේ ආකාරයට අපි හිතල බලන කොට ඒ මහරහතුන් වහන්සේලාගේ ගුණස්කන්ධය අපි නිරන්තරයෙන් සිහිපත් කරගෙන, ඒවා අපේ ජීවිත වලටත් ආදර්ශ හැටියට අරගෙන, ඒ ගුණ ධර්ම තුළින් අපේ ඒ සංසාර ගමන කෙළවර කර ගැනීමට මේ බුදුපියාණන් වහන්සේ දක්වා වදාළ ඒ අමා මහ නිවන, අර කියාපු සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා ආදී ගුණ ධර්ම ඉන්ද්‍රිය තත්ත්වයට, බල තත්ත්වයට අපේ චිත්ත සන්තානය තුළට පමුණුවා ගැනීමෙන් හැකිතාක් ඉක්මනින්ම මේ ශාසන පරිහානියට කලින් කල්‍යාණ මිත්‍ර ආශ්‍රය පිහිට කරගෙන තම තමන්ගේ බණ භාවනා සාර්ථක කරගැනීමට මේ අද දින අප කළ ධර්ම දේශනාවත් තමන් ලබාගත් ධර්ම ශ්‍රවණමය කුසල ආනිසංසත් ඊට හේතු වාසනා වේවා! ඒ පිනෙන් හැකිතාක් ඉක්මනින් මේ ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදී සියලු සංසාර දුකින් අත්මිදී උතුම් අමා මහ නිවනින් සැනසිල්ලට ඒකාන්තයෙන්ම හේතුවාසනා වේවා! අද දින රකින ලද ශීලය, අසන ලද ධර්මය ඒකාන්තයෙන්ම අපගේ ලෝකෝත්තර අභිවෘද්ධිය සිද්ධ කරගැනීමට හේතුවාසනා වේවා!යි ප්‍රාර්ථනා කරගෙන මේ විදියට ගාථා කියන්න.

'එත්තාවතා ච අම්හෙහි...'

# 58 වන දේශනය

## 58 වන දේශනය

(පහන් කණුව ධර්ම දේශනා අංක 141)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

නත්ථි කො චි භවො නිච්චො
සංඛාරා වා පි සස්සතා
උප්පජ්ජන්ති ච තෙ ඛන්ධා
චවන්ති අපරාපරං

එතමාදීනවං ඤත්වා
භවෙනම්හි අනත්ථිකො
නිස්සටො සබ්බකාමෙහි
පත්තො මෙ ආසවක්ඛයො ති.

සැදැහැවත් පින්වතුනි,

පැවැත්ම තුළ ඇති අනිච්චතාව හරියාකාර තේරුම් නොගැනීම නිසා, ලෝක සත්ත්වයා දීර්ඝ කාලයක් සංසාරයේ සැරිසරන බව, තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලෝකයාට හෙළි කර වදළා. අනිත්‍ය දේ නිත්‍ය වශයෙන් සලකන විපරීත දෘෂ්ටිය නිසා, සත්ත්වයා තුළ භව තණ්හාව ඉතාමත්ම සියුම් අන්දමින් තැන්පත් වෙලා තියෙනවා. මේ භව තණ්හාව නැතිකර ගැනීමට උපකාර වන අන්දමේ උපදේශ ගාථා දෙකක් තමයි අද අපි මාතෘකා කරගත්තේ. මේ ගාථා දෙක වදළ උත්තර මහා රහතන්වහන්සේ රහත් බව ලබාගත්තේ වේදනානුපස්සනා භාවනාව තුළිනුයි. අමූලික චෝදනාවක් පිට දිවස් උල හිටවන්න දඬුවම නියම කරලා තියෙන අවස්ථාවේ, ඒ දිවස් උල උඩ ඉඳගෙනම, ඒ වේදනාව - වේදනානුපස්සනා භාවනාව තුළින් ජය අරගෙන රහත් බව ලබා ගත්තා. ඒ උත්තර තෙරුන් වහන්සේගේ ඒ කතා ප්‍රවෘත්තිය මේ විදියටයි දැක්වෙන්නේ.

මගධ රටේ එක්තරා ධනවත් බ්‍රාහ්මණ පවුලක උපන්න දරුවෙකුට උත්තර කියන නම, ඒ මව්පියො තැබුවා. මේ පින්වත් උත්තර දරුවා වැඩෙන කොට ගුණානුවණින්, දැනුමෙන්, රූප සම්පත්තියෙන් එහෙම වැඩෙනවා දකලා, මගධ රටේ වස්සකාර කියන

මහාමාත්‍යයා තමන්ගේ තරුණ දුව සරණ පාවා දෙන්න යෝජනාවක් ඉදිරිපත් කළා. නමුත් මේ වෙනකොටම සාංසාරික බුද්ධිය මුහුකුරා ගිහින් තිබුණු නිසා, මේ උත්තර මානවකයා ඒ විවාහ යෝජනාව ප්‍රතික්ෂේප කරලා, සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ ඇසුරට වැටුනා. සාරිපුත්ත මහරහතන් වහන්සේට උපස්ථාන කරමින්, බණ අසමින්, ඉක්මනින්ම පැවිද්ද ලබාගත්තා. පැවිද්ද ලබාගෙන සමීප උපස්ථායකයකු හැටියට උන්වහන්සේට උපස්ථාන කළා.

එක් අවස්ථාවක සාරිපුත්ත මහරහතන් වහන්සේ අසනීප වුනහම බෙහෙත් පිණ්ඩපාතය සොයන්න මේ උත්තර සාමණේරයන් වහන්සේ උදෑසනම පිටත් වෙලා ගිහිල්ලා, පොකුණක් ළඟ පාත්‍රය තියලා, පොකුණට බැහැලා මුහුණ කට සෝදලා එන අතර, එද රෑ උමඟකින් ගෙයක් බිඳලා බඩු පැහැරගත් හොරෙක්, නගරයේ ප්‍රධාන දොරටුවෙන් පිටවෙලා, රාජපුරුෂයන් එලවාගෙන එනකොට, ඒ පොකුණ ළඟට ඇවිල්ලා, පාත්‍රය ඇතුළට අර ඒ මැණික් මල්ල දමලා දිව්වා. පලාගියා. ඉතින් අර රාජපුරුෂයො ඇවිත් බලනකොට මේ පාත්‍රයේ මැණික් මල්ල දැකලා මේ සාමණේරයන් වහන්සේ අල්ලාගත්තා හොරෙක් කියලා. අල්ලාගෙන ගිහිල්ලා පෙන්නුවේ කාටද, අර වස්සකාර අමාත්‍යයාට තමයි. ඒ අවස්ථාවේ විනිශ්චයකාරයා හැටියට හිටිය වස්සකාර මහාමාත්‍යයාට ද්වේශයක් ඇතිවෙලා තිබුණා තමන්ගේ යෝජනාව ප්‍රතික්ෂේප කිරීම ගැන. තමන්ගේ යෝජනාව ප්‍රතික්ෂේප කරලා තවුසන් අතර පැවිදි වුණා කියලා ද්වෙශය නිසාම නඩු අහන්නේම නැතිව උල හිටුවන්න නියම කළා. ඉතින් ඒ වධකයන් ගෙනිහිල්ලා උත්තර සාමණේරයන් වහන්සේ උල හිටවන අවස්ථාව වෙනකොට බුදුරජාණන් වහන්සේට මේක පෙනිලා එතනට වැඩම කරලා, උල හිටෙව්වාට පස්සෙ, හිසට අත තියලා ප්‍රකාශ කළා 'උත්තර, මේ ඔබගේ අතීත කර්මයක් විපාක දෙන්නේ. ඒ නිසා ප්‍රත්‍යවේක්ෂා බලයෙන් ඒ වේදනාව විඳ දරාගන්න කියලා. ඒකට ගැලපෙන යම්කිසි උපදේශයකුත් ධර්මාවවාදයකුත් බුදුරජාණන් වහන්සේ කළා. මේක අහලා උත්තර සාමණේරයන් වහන්සේ වේදනාව විෂ්කම්භනය කරගෙන, ඒ භාවනාව තුළින්ම අභිඥා සහිත අර්හත්වය ලබාගෙන එතන සඳහන් වන හැටියට ඒ උලෙන් අහසට නැගීසිට ප්‍රාතිහාර්ය පවා දැක්වූවා. ඒ එක්කම ඒ වණය - තුවාල වෙලා තිබුණු එක - සුව වුනා කියනවා.

සංඝයා වහන්සේලා ඇහැව්වා 'කොහොමද ආයුෂ්මතුන් මේ තරම් වේදනාවක් තියෙද්දී විදර්ශනා භාවනාවෙන් ප්‍රයෝජනය ලබා ගත්තේ' කියලා. එතකොට උත්තර රහතන්වහන්සේ කියනවා 'මම දීඝී කාලයක් තිස්සේ භවයේ ආදීනව දැකලයි තිබුණේ. සංස්කාරයන්ගේ ස්වභාවයන් මම වටහාගෙන තිබුණා. ඒ නිසා මට පුළුවන් වුණා වේදනානුපස්සනා භාවනාවෙන් රහත් බව ලබාගන්න' කියලා. ඒ අදහස ප්‍රකාශ කරමින් මෙන්න මේ ගාථා දෙක වදාළ බවයි කියවෙන්නේ.

නත්‍ථි කොචි භවො නිච්චො - නිත්‍ය වූ කිසිදු පැවැත්මක් නැත.

සංඛාරා වා පි සසසතා - ශාස්වත වූ - සදාකාලික වූ සංස්කාරයෝ ද නැත.

උප්පජ්ජන්ති ච තෙ ඛන්‍ධා - ඒ ඒ ස්කන්‍ධයෝ පැන නගිත්.

චවන්ති අපරාපරං - වෙන වෙන ස්කන්‍ධයන් හැටියට ඒවා ගෙවී යෙත්. පැන නගින ස්කන්‍ධයන්ම නොවෙයි වෙනස් වෙලා ගෙවී යන්නේ කියන එක.

එතමාදීනවං ඤත්‍වා - මේ භවය - මේ පැවැත්ම පිළිබඳ ආදීනව දැක,

භවෙනම්හි අනත්‍ථිකො - මට තවත් මේ භවයෙන් නම් වැඩක් නැත යන ස්ථාවරයට මම පැමිණ සිටිනවා.

නිසසටො සබ්බකාමෙහි - සියලු කාමයන්ගෙන් ඉවත් වෙලා

පත්තො මෙ ආසවක්ඛයො'ති - ආශ්‍රවක්ෂයට අර්හත්වයට මම පත්වුණා කියලා උත්තර ස්වාමීන් වහන්සේ, ස්වාමීන් වහන්සේලාට පිළිතුරු දුන්නයි කියලා කියනවා.

මේ කතාව මහා ආශ්චර්යවත්. මේ විධියේ ආශ්චර්යවත් දේවල් ධර්මයේ සඳහන් වෙනවා. මීටත් වඩා ආශ්චර්යවත් දේවල් සමහර විට සඳහන් වෙනවා. අතීතයේ මහා පුණ්‍යවන්ත අයට සමහර විට යම් යම්

කර්මවේග නිසා අර විදියේ උපද්‍රව ඉදිරිපත් උනත්, ඒ උපද්‍රව තුළින්ම, මේ චතුරාර්ය සත්‍යය, බුදුරජාණන් වහන්සේ දේශනා කළ දුක පිළිබඳ සත්‍යතාව අවබෝධ කරගෙන අර්හත්වය ලබාගන්න පුළුවන් වුණු බව නොයෙකුත් ධර්ම කථා වල සඳහන් වෙනවා.

දැන් මෙතන මේ කියවෙන විශෙෂ කාරණා ගැන අපි හිත යෙදෙව්වොත්, 'නිත්‍ය වූ කිසිදු පැවැත්මක් නැත.' මොකක්ද මේ පැවැත්ම කියන්නේ? දැන් මේ පින්වතුන් පටිච්චසමුප්පාද ධර්මය ගැන යම් අවබෝධයක් ඇති අය දන්නවා ඇති, 'උපාදාන පච්චයා භවො' කියලා සඳහන් වෙනවා. උපාදානය අල්ලාගත්තු තැනයි පැවැත්ම තියෙන්නෙ. මේ පැවැත්ම කියන එක උපාදානයත් එක්කම යන එකක්.

බෞද්ධයන් හැටියට අපි කවුරුත් දන්නවා පුද්ගලයා හැටියට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරලා තියෙන්නේ ආත්මයක් නොවෙයි. මෙතන තියෙන්නේ රූප ගොඩක්, වේදනා ගොඩක්, සඤ්ඤා ගොඩක්, සංඛාර ගොඩක්, විඤ්ඤාණ ගොඩක්. මේවා උපාදාන වශයෙන් අල්ලාගෙන ඉන්නවා. **අල්ලා ගැනීම තුළින්, අල්ලගෙන ඉඳීම තුළින් තමයි මේ පැවැත්මක් කියන අදහස මතු වන්නේ. ඉතින් ඒ අල්ලාගැනීම නිසාම ඒක සංඛත දෙයක් වෙනවා.** දැන් සංස්කාර කියන වචනය කියවුනා.

සංස්කාර කියන වචනය බෞද්ධයන් හැටියට අපි කවුරුත් අහලා තියෙනවා. නමුත් මේක තේරුම් ගන්න අමාරු වචනයක් බව කියන්න වෙනවා. සාමාන්‍ය මට්ටමකින් අපි කල්පනා කර බැලුවොත්, මූලික අර්ථය සකස් කිරීම. සංස්කාර කියල කියන්නේ 'සකස් කිරීම'. ඒ බව ධර්මයෙහිත් සඳහන් වෙනවා. මේ එක එක ස්කන්ධ හඳුන්වන අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා 'කිංච භික්ඛවෙ සංඛාරා ති වදමි' මොනවාද මේ සංස්කාර කියන්නේ? 'සංඛතං අභිසංඛරොන්ති සංඛාරා' සකස් වූවක් සකස් වූ බවට පත් කරනවා. සකස් වූවක් සකස් වූ බවට පත් කරන්නේ සංස්කාර මගිනුයි. ඊළඟට මොනවාද සකස් වූ දෙය හැටියට කියන්නේ?

'රූපං රූපත්තාය සංඛතං අභිසංඛරොන්ති' රූපය රූපයක් හැටියට සකස් වූවක් කර දක්වන්නේ මේ සංස්කාරයි.

සිත තුළ ඇතිවෙන සිතිවිලි, අවිද්‍යාව නිසා සිත තුළ ඇතිවෙන සිතිවිලි සමූහයක් තුළින්, මෙය මාගේය කියා ගැන්මක් තියෙනවා. ඒ තුළින් රූපය 'මගේ රූපය' කියා අල්ලා ගත්තා. අන්න එතකොට සීමාවක් එනවා. සංඛතයක් සකස් කරගත්ත දෙයක්.

වේදනාවත් එහෙමයි. මේ මගේ වේදනාව කියා අල්ලා ගත්ත තැන, ඒ ග්‍රහණය තුළින්ම ඒවා සකස් වූ දෙයක් බවට පත්වෙනවා. සඤ්ඤාවත් එහෙමයි. සංඛාර අන්තිමට සංස්කාරත් සංස්කාර තත්ත්වයට පත්කරන්නේ සංස්කාර තුළින්. හරි අමාරුයි ඒක තේරුම් ගන්න. තර්කානුකූලව හිතලා තේරුම් ගන්න හරි අමාරුයි. සංස්කාර සංස්කාර තත්ත්වයට පත්කරන්නේ සංස්කාර. මොකද එහෙම කියන්නේ? පුද්ගලයෙක් මගේ සංස්කාර කියලා ගන්නේත් අන්න අර ඒකත් සංඛතයක්. ඒකත් අල්ලාගැනීම තුළින්, උපාදානය තුළින්. විඤ්ඤාණයත් එහෙමයි. විඤ්ඤාණයත් සංඛත තත්ත්වයට සකස් වුවක් බවට පත්කරන්නේ සංස්කාර මගින්. ඒ නිසා තමයි කියන්නේ අවිජ්ජා නිසා සංඛාරා, සංඛාරා නිසා විඤ්ඤාණ. පංචඋපාදාන ස්කන්ධය පිළිබඳ, අල්ලාගැනීම පිළිබඳ කතන්දරය ඔතන තියනවා.

තවත් ඕක ලස්සනට හෙළිවෙන අවස්ථාවක් ආනන්ද ස්වාමීන්වහන්සේ තමන්ගේ හිතවත් සංඝයාවහන්සේලාට ප්‍රකාශ කරනවා. 'ඇවැත්නි, අපි මහණ වුණු ළඟදි අපට පුණ්ණ මන්තානිපුත්ත ආයුෂ්මතුන් වහන්සේ නිතර අවවාද දුන්නා, ධර්මාවවාද දුන්නා.' පුණ්ණ මන්තානිපුත්ත ස්වාමීන්වහන්සේ තමයි එතදග්ග තනතුර ලබලා තියෙන්නේ ධර්ම කථිකයන් අතර. බුද්ධ කාලයේ ධර්ම කථිකයන් අතර. ඉතින් උන්වහන්සේ තමාට හිතවත් ස්වාමීන්වහන්සේලාට බොහොම අවස්ථාවල මහ ගැඹුරු ධර්මදේශනා පවත්වපු කෙනෙක්. ඉතින් ආනන්ද ස්වාමීන්වහන්සේ මතක් කර දෙනවා තමන්ට ඒ මහණ වුණු ළඟදී කළ සිහිකටයුතු දේශනාවක්. මොකක්ද? 'පුණ්ණ මන්තානිපුත්ත මට මෙහෙම කිව්වා. ඇවැත්නි ආනන්ද, අල්ලාගැනීම තුළිනුයි 'අස්මි' කියන 'වෙමි' කියන අදහස ඇතිවෙන්නේ.' 'උපාදය අස්මී'ති හොති නො අනුපාදය' අල්ලාගැනීම තුළිනුයි කෙනකුට 'වෙමි' කියන අදහස එන්නේ. අල්ලා ගැනීමක් නැතිව නොවෙයි. එතන යම්කිසි ගැඹුරු කාරණයක් කියවෙනවා.

අල්ලාගත්තු තැනයි 'වෙමි' කියන්න පුළුවන්. එතකොට ඒකට උපමාවකුත් දෙනවා.

බොහෝවිට උපමාවක් ඇසුරෙන් අපට යමක් තේරුම්ගන්න පුළුවන්. ඔය ධර්මකාරණයේ වාක්‍යය එක පාරට තේරුණේ නැතත්, ඊළඟට ලස්සන උපමාවක් පුණ්ණ මන්තානිපුත්ත ස්වාමීන්වහන්සේ තමාට ප්‍රකාශ කළ බව මේ අනිත් ස්වාමීන්වහන්සේලාට, ආනන්ද ස්වාමීන්වහන්සේ ප්‍රකාශ කරනවා. මේ ආනන්ද ස්වාමීන්වහන්සේට කියනවා පුණ්ණ මන්තානිපුත්ත ස්වාමීන්වහන්සේ 'ඇවැත්නි, හැඩවැඩ ඇතිව ඉන්න කැමති යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ පැහැදිලි කැඩපතක - කණ්ණාඩියක හෝ පිරිසිදු දිය බඳුනක දිය තලියක, තමන්ගේ මුහුණ දකින අවස්ථාවේ, 'වෙමි' කියන අදහස ගන්නේ යමක් අල්ලාගෙනයි. යමක් උපකාර කරගෙනයි.' දැන් මේ කාලයේ හැටියට කියනවා නම් යමකට සාපේක්ෂව.

මෙතන කියන කතන්දරය උපමාව ආශ්‍රයෙන් ගත්තොත්, කෙනකුට තමන්ගේ රූපය සිහිවෙන්නේ කණ්ණාඩියක් දිහා බැලුවාම. මේ මමය කියන්න පුළුවන් අවස්ථාවේ. මොකද? කණ්ණාඩියේ තියෙනවා පිළිබිඹු කරන ගතියක්. පිළිබිඹු කරනවා කියන්නේ නැවත පෙන්නුම් කරනවා. මවා පානවා වගේ.

ඉතින් මේ පිළිබිඹු කිරීමේ ගතිය මේ විඤ්ඤාණයේ තියෙනවා. මනුෂ්‍යයාගේ සිත තුළ තියෙනවා, **විඤ්ඤාණය තුළ තියෙනවා මේ ප්‍රත්‍යවේක්ෂාව.** ආපසු හැරී බලනකොට යමක් අහුවෙනවා, හිතට යමක් අහුවෙනවා. අන්න ඒ අහුවෙන ටික තමයි මේ මගේ රූපයයි කියලා අල්ලාගන්නේ. දැන් අර කණ්ණාඩිය දිහා බලන්නේ තමන්ගේ රූපය හරිගස්සාගන්න. සකස් කර ගන්න. මේ මගේ රූපයයි කියලා. එතකොට ඔය උපමාව ආශ්‍රයෙන් අර උපාදානය අල්ලාගැනීම තුළ පැවැත්ම ඇතිවෙන බව පෙන්නුම් කරනවා.

තවත් අවස්ථාවක බුද්ධ දේශනාවක් වශයෙන්ම දක්වෙනවා යම් කෙනෙක් රූපය ආත්මය වශයෙන් දකිනවා. රූපය ආත්මය වශයෙන් සලකනවා. අන්න ඒ සැලකීමම සංස්කාරයක්. ඔන්න සංස්කාර කියන වචනයටත් යම් ඉඟියක් ලැබෙනවා. මේක මගේ රූපයයි කියාගැනීමම සංස්කාරයක්. සංස්කාරයක් කියන්නේ සකස්

කරගත් දෙයක්. සකස් කරගත් දේවල තියෙන්නේ කෘත්‍රිම ස්වභාවයක්. අසත්‍ය ස්වභාවයක්. ස්වාභාවික තත්ත්වයෙන් ඉවත්වීමක් වගේ දෙයක් තියෙනවා සංස්කාර කියන වචනය තුළ. ඉතින් මේක මගේ රූපය කියලා අල්ලාගන්නවා. ඉතින් ඒකෙන් පෙන්නුම් කරනවා **රූප වේදනා ආදිය මමය මාගේය කියාගැන්මම සංස්කාරයක්.**

**ඔය විදියට සංස්කාර උඩයි මේ සංඛතය ගොඩනැගෙන්නේ.** ඊළඟට මේ සංඛතය ගැන බුදුරජාණන් වහන්සේ දේශනා කළ වටිනා දේශනාවක් තියෙනවා. 'මහණෙනි, මේ සංඛතයේ ලක්‍ෂණ තුනක් තියෙනවා. යමක් සකස් කරගත්තා නම්, ඒ සකස් කරගත් හැම දෙයකම මේ ලක්‍ෂණ තුනක් තියෙනවා. මොනවාද ඒ තුන? 'උප්පාදෙ පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති'. සකස් කරගත් ඕනෑම දෙයක හටගැන්මක් දක්වන්න පුළුවන්. වයො කියන්නේ ගෙවීයාමක් දක්වන්න පුළුවන්. ඨිතස්ස අඤ්ඤථත්තං කියන්නේ ඒ හටගැනීමත් ගෙවීයාමත් අතර ඒ ටිකට තමයි අපි පැවැත්ම කියන්නේ. අන්න ඒ පැවැත්ම තුළත් පැවැත්මට මෙතන කියන්නෙ ඨිති, පවතින බව. ඒ ස්ථිතිභාවය තුළින් ඨිතස්ස අඤ්ඤථත්තං. අන්න එතනයි විශෙෂ දේ. එහි වෙනස් වීමක් දකින්න ලැබෙනවා. ඔය ටිකයි ලෝකයාට මතක් කර දෙන්න සිද්ධ වුනේ, බුදුරජාණන් වහන්සේට.

දැන් තමතමන් ගැන හිතලා බලන්න. තමතමන්ගේ ජීවිතය ගැන හිතන කොට එක කෙළවරක් උපත. අනිත් කෙළවර, දැන් මේ කාලයේ විපත කියන මරණය. ඔය දෙක අතරතුර කාලය තුළ කවුද මරණය ගැන හිතන්නෙ? කීයෙන් කීදෙනාද? මේ අනිත්‍යතාව ගැන හිතන්නෙ කවුද? මමය මාගේය යන මානය උඩ, මේක නිත්‍ය හැටියට පවතින බව, තව ඕනනම් මේක ජරාව පෙන්නුම් කරන්න යනවා නම්, ඒ ටිකත් වහගන්නවා මොනවා හරි සායම් ටිකක් ගාලා ඒ ටිකත් වහගන්නවා. මේවාට දැන් ඔය වාහනවල දන්නවානෙ එකම නොම්මර තහඩුව තියෙනවා නමුත් විටින් විට අලුත් වාගෙ කැලි පුරුද්දලා මේක ගෙනියනවා. පිළිගන්න කැමති නැහැ. ඉතින් එතකල් පවතිනවා අන්න ඒකයි.

බුදුරජාණන් වහන්සේ පෙන්නනවා 'ඨිතස්ස අඤ්ඤථත්තං' සථිති කියලා මේ අල්ලාගත්තු ටික නිත්‍ය නෑ. ඒ තුළ තියෙන්නෙ

අසෑදෑදථා භාවයක්. ඉතින් අසෑදෑදථාභාවය තියෙනකොට අපට සමාජයේ තියෙන නොයෙකුත් අවශ්‍යතාවන් නිසා සමහර විට අනන්‍යතාව ඔප්පු කරන්නත් වෙනවා. නැති අනන්‍යතාවක් ඔප්පු කරන්නත් වෙනවා. ඔය නොයෙකුත් රාජකාරි කටයුතු වලදී.

නමුත් ලෝකයේ ස්වභාවය අසෑදෑදථාභාවයමයි. වෙනස්වීමමයි. මේකේ අනන්‍ය දෙයක් නැහැ. අනන්‍ය වීමක් නැහැ. ඔන්න ඔය ටිකම තමයි අනිත්‍යතාව කියලා ගන්න තියෙන්නෙ. ඉතින් මේ වර්තමානයේ අනිත්‍යතාව දැකීමයි අමාරු.

අතීත දේ ඉවර වුනා කියා සිතාගන්න එක පහසුයි. අනාගතයත් සමහරවිට මේක නැතිවෙලා යනවා කියලා හිතාගන්න එක පහසුයි. නමුත් වර්තමානයේ එතන එතනම අනිත්‍යතාව දැකීම ඉතාම අපහසුයි. අන්න ඒ ටික තමයි විපස්සනාවෙහිදීත්, ගැඹුරු විපස්සනාවෙහිදීත් සංස්කාරයන්ගේ අනිත්‍යතාව වශයෙන් මෙනෙහි වෙන්නෙ. ඔය උදයව්‍යය ඥාන ආදී වශයෙන් සඳහන් වෙන්නෙ විපස්සනාවෙදි ඇතිවීම් නැතිවීම් දෙක ශීඝ්‍ර අන්දමින් පෙනෙන්න පටන් ගන්නේ අර තමන්ගේ මනසිකාරය එතනට යොමු වූ අවස්ථාවේදී. මේකට අපි තවත් උපමාවක් කිට්ටු කරමු. අර කණ්ණාඩිය පිළිබඳ උපමාවට ආසන්නව, නමුත් පොතක පතක ඇති දෙයක් නොවෙයි. අපි මේ යම් යම් ධර්ම කාරණා තේරුම් කරන්න යොදා ගන්න උපමාවක්. ඒක එහෙම පිටින්ම අපෙයි කියන්නත් බැහැ. දැන් මේ පින්වතුන් කොතෙකුත් අහලා ඇති අර හිවලෙක් ඒදණ්ඩක් උඩින් යන අතරේ මස් කෑල්ලක් අරගෙන වෙන හිවලෙක් යයි හිතලා, ඒකට පැනලා ඒ මස් කෑල්ල ගන්න ගිහිල්ලා ඒ මෝඩකමක් කළායි කියලා.

ඒ ආශ්‍රයෙන් අපි තවදුරටත් හිතනවා නම් ඒදණ්ඩක් උඩ යනවා යම්කිසි බල්ලෙක්. යන අතරේ ඒ තමන්ගේ ඡායාව දකිනවා. සමහරවිට හිතාගන්න පුළුවන් යාලු බල්ලෙක් කියලා. වලිගය වනනවා. තරහකාරයෙක් කියලා, ගොරවනවා. එහෙම නැත්නම් කුතුහලෙන් බලනවා මේ බල්ලා කොහෙන් ආ එකෙක්ද කියා. මේ ඔක්කොම බලන්න හේතුව මොකක්ද? අර වතුරේ පිළිබිඹු කරන ස්වභාවයක් ඇති බව ඒ බල්ලාට අමතක වීමයි. ප්‍රත්‍යවේක්ෂාවක්, නියම ප්‍රත්‍යවේක්ෂාවක් තියෙනවා නම් - ප්‍රත්‍යවේක්ෂාව කියන්නේ හිත තුළින් ප්‍රත්‍යවේක්ෂා

කිරීම, අවබෝධයක් කරගැනීම. මේ බලන්නේ කණ්ණාඩියක තියෙන දෙයක්ය කියලා හිතාගෙන බලනකොට, ඒකේ කෘත්‍රිම ස්වභාවයත් අපේ හිතට වැදිලා ඉවරයි. දැන් අර බල්ලා වතුර දිහා බලන්නේ, වතුරේ තියෙන පිළිබිඹු කිරීමේ ස්වභාවය අමතක කරලයි. ඒකයි ඒකට රැවටෙන්නෙ. නමුත් ඒ මුළාව දුරු කරන්න නම් ඒ ටිකයි බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කළේ යෝනිසෝමනසිකාරය නමින්. එතකොට අයෝනිසෝමනසිකාරය තුළින්, වැරදි විදියට සිහිකිරීම තුළින්, බල්ලා රැවටිලා පැය ගණනක් වුනත් එතන නැවතිලා ඉන්න පුළුවන්. නමුත් යෝනිසෝමනසිකාරය අවදි කරගත් අවස්ථාවේදී තේරෙනවා මේ වතුරෙ තියෙන පිළිබිඹු කරන ස්වභාවය නිසා, මගේම මේ ඡායාවයි පෙනෙන්නෙ කියලා. අන්න ඒ විදියට විදර්ශනාවෙ ඉදිරියට යනකොට උපකාර වෙන්නේ යෝනිසෝමනසිකාරය.

යෝනිසෝමනසිකාරය අවදි කරගත්ත තැන, තමන්ට පෙනෙනවා මේ ලෝකයා දෙයක් - දෙයක් කියලා ගන්න එක තුළ තියෙනවා - ඒකට කියන ධර්මානුකූල පදයක් තියෙනවා 'නාමරූප' කියලා. අපි මේ ක්‍රමානුකූලව යන්නේ, භාවනා කරන පින්වතුන්ට මෙයින් යමක් ඉගෙනීමට උපකාර වෙන විදියට. නැතුව බණක් ඇහුවයි කියලා නැගිටලා යන්න නොවෙයි. **'නාමරූප' කියන්නේ විදර්ශකයා ඒ තමන්ට පෙනෙන අරමුණ දකින්නෙ මෙතන නාම ධර්ම ටිකකුත් රූප ධර්ම ටිකකුත් එකිනෙකට උපකාර වෙමින් තියෙන අවස්ථාවක් හැටියටයි.** නාම ධර්ම කියලා එතන දැක්වෙන්නේ ඉස්සෙල්ලාම අපේ අවධානය යොමුවෙන්නේ මොකකටද? හිතලා බලන්න. දැන් මේ ඉන්න අවස්ථාවේ පවා හදිසියේ යම් තැනක උලක් අනින තරම ලොකු වේදනාවක් නොවුණත් යම්කිසි පොඩි වේදනාවක් දැනුනයි සිතමු. ඉස්සෙල්ලාම දැනෙන්නෙ, වේදනාව නේද? වේදනාව තුළ නේද යම් ක්‍රියාකාරිත්වයකට අප පොළඹවන්නෙ? කොයි තරම්ද කිව්වොත් බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්වාමීන්වහන්සේගෙන් එක්තරා අවස්ථාවක අහනවා, 'ආනන්ද යම් තැනක වේදනාවක් නැත්නම් එතන ආත්ම කියා සංඥාවක් ඇතිවිය හැකිද?' 'නැත ස්වාමීනි'යි පිළිතුරු දෙනවා. එයින්ම පෙනෙනවා **වේදනාව තුළිනුයි ආත්ම හැඟීම අවදිවෙන්නේ.** අනුසය වශයෙන් තිබුණත් වේදනා අවස්ථාවෙදි ඔන්න ඒක අවදි වෙනවා. ඉතින් ඒ වේදනාවයි ඉස්සෙල්ලාම අපට අහු වෙන්නෙ. ඊළඟට ඒ වේදනාව ඔස්සේ අපි

සංඥාව - හඳුනාගන්න උත්සාහ කරවා. ඒ වේදනාව මොකක් හරි අපි හිතමු සතෙක් කෑවා කියලා, පත්තෑයෙක් කෑවා කියලා, හදිසියෙන් මෙතන ඉඳගෙන ඉන්න අතරෙ. ඉතින් සංඥාව එතන. ඊළඟට ඒ සංඥාව අනුසාරයෙන් මේකෙන් මිදෙන්නත්, අත්මිදෙන්නත් ක්‍රමයක් යොදන්නත් එපායැ. චේතනාව යෙදෙනවා. චේතනාව යෙදෙන කොට ස්පර්ශය. ස්පර්ශයට එතන පාළි ඵස්ස කියන වචනය යෙදෙනවා. ස්පර්ශ වෙන තැන පස්ස වෙන්නත් බැරි නෑ. කොතන හෝ වේවා, අන්න ස්පර්ශ වෙන තැනටත් හිත යෙදෙනවා. ඉතින් මේ ටිකට කෙළවරෙන් තියෙන්නෙ මොකක්ද? මනසිකාරය, මෙනෙහි කිරීම. **ඔන්න ඔය ධර්ම ටික තමයි නාම ධර්ම හැටියට දක්වෙන්නේ. වෙදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර.** ඒ නාමධර්ම තුළින් තමයි අපි මූලිකව යමක් හඳුනාගන්නේ අර මොකා කෑවාද අපි දන්නෙ නැ. එය හඳුනාගන්න අපට උපකාර වුනේ අර වේදනාවත්, ඒ අනුව ගිය සංඥාවත්, ඒ අනුව යෙදූ චේතනාවත්, එතනදි ඊට අදාළ ස්පර්ශයත්, ඊට උපකාර උන මනසිකාරයත්. එතකොට ඒ නාමධර්මයි.

ඊළඟට රූපධර්ම හැටියට දක්වන්නේ මොනවාද? රූපය හැටියට සතර මහා භූත ධර්මයන් බුදුරජාණන් වහන්සේ දක්වලා තියෙන **පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියා අපි හතරකින් කිව්වත්, ඒවා හඳුනා ගන්නේත් අර නාමධර්ම ආශ්‍රයෙනුයි.** තද ගති, බුරුල් ගති, උණුසුම් ගති, සිසිල් ගති ආදී වශයෙන් මේ පින්වතුන් අසා ඇති, සතර මහා භූතයින්ට අදාළ ලක්‍ෂණ. අපි ඒවා හඳුනාගන්නේත් අර නාමධර්ම තුළින්. ඔන්න ඕක තමයි නාමධර්මයි රූපධර්මයි අතර නිරන්තර අන්‍යෝන්‍ය සම්බන්ධයක් තියෙනවා කියන්නේ.

කොහොම හරි ඔය නාමරූප ධර්මයන් තුළින් තමයි, නාම රූප හඳුනා ගැනීමෙන් තමයි අපි අර විඤ්ඤාණයේ ප්‍රත්‍යවේක්‍ෂා ස්වභාවය හඳුනා ගන්නේ. **විඤ්ඤාණය කෙරෙහි අපේ අවධානය යොමු කරන්නේ නාමරූප ධර්මයි.** නාමරූප ධර්මයන් නිසා විඤ්ඤාණය පවතිනවා. ඔය ආශ්‍රයෙන් තමයි ඉදිරියට යන්න වෙන්නේ. ඉතින් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා, නාමරූප ධර්මයන් තුළ හිර වෙලා ඉන්න ලෝකයා යම් අවස්ථාවක මේවායේ අනිත්‍යතාව වටහා ගන්නවා නම් - මෙතෙක් ගත්තු සක්කාය දිට්ඨිය හැටියට ගැනෙන්නේ මේ ගොඩවල්. රූප ගොඩවල්, වේදනා ගොඩවල්. මේ ඔක්කොම මමය, මාගේය කියා

ගැනීමයි. ඒ ගැන්මට අහුවෙනවා පංචස්කන්ධ ගොඩ. ගොඩ කියන්නේ මොකක්ද කියලත් බුදුරජාණන් වහන්සේ දක්වනවා. ඛන්ධ කියන්නේ ගොඩ. මේ රූප ගොඩ හඳුන්වන්නේ එකොළොස් ආකාරයකට. අතීත, අනාගත, වර්තමාන. දැන් තමන්ගේ රූපය ගැන හිතනකොට 'මේ මගේ රූපය, අතීත ළමා කාලය ගත්තොත්, තරුණ කාලය ගත්තොත් - පින්තූරයක් වෙන්න පුළුවන්. ඒත් 'මේ මගේ රූපය' ඉතින් ඒ විදියට ඉතින් අතීත, අනාගත, වර්තමාන. ඊළඟට රළු හෝ ගොරෝසු වෙන්න පුළුවන්. තමාගේ ඇතුළත හෝ පිටත හෝ ඒ කියන්නේ තමාගේ රූපයක් වෙන්න පුළුවන්, බාහිර රූපයක් වෙන්න පුළුවන්, අනුන් පිළිබඳ. එහෙම නැත්නම් ගොරෝසු එකක් වෙන්න පුළුවන්, රළු එකක් වෙන්න පුළුවන්. පහත් එකක් වෙන්න පුළුවන්, උසස් එකක් වෙන්න පුළුවන්. ඈත තියෙන එකක් වෙන්න පුළුවන්, ළඟ තියෙන එකක් වෙන්න පුළුවන්. මෙන්න මේ ඔක්කොම රූප ගොඩවල්. මේ ඔක්කොම මමය, මාගේය කියා ගන්නවා. වේදනා පිළිබඳවත් එහෙමයි. දැන් වේදනාවක් යන්තම් දැනෙන කොට, ඒක තුළ අවදි වෙලා ඉවරයි. ඊළඟට ඒක හිතින් මවාගන්නවා.

**වේදනානුපස්සනාව ඇත්ත වශයෙන් කියනවා නම්, නිවනට ඉතාම කෙටි මඟක් වගේ.** කෙටි වුනාට දුර්ග මාර්ගයක් වගේ. හැම දෙනාටම ඒකට මුහුණ දෙන්න අමාරු තරම් ප්‍රබල එකක්. ඒකයි මේ ආශ්චර්යය කියන්නේ. උල උඩ ඉඳගෙන කොහොමද මේ භාවනාව කරන්නෙ? අපි භාවනා කරන්නත් හොඳ සැප ආසනයක් සොය සොයා යනවා. නමුත් උත්තර ස්වාමීන්වහන්සේ භවය - පැවැත්ම පිළිබඳ අර අවබෝධය තිබුණු නිසා, සංස්කාරයන් පිළිබඳ අර අවබෝධය තිබුණු නිසා, අන්න අර වේදනාවම උපකාර කරගත්තා. ඒක වෙස් වලාගත්ත ආශීර්වාදයක් බවට පත් කරගත්තා. දුක පිළිබඳ චතුරාර්යසත්‍යය අවබෝධ කරගත්තා. බුදුරජාණන් වහන්සේ දේශනා කළ පැවැත්ම පිළිබඳ දුක.

අපි අපේ තරමින් මේ හැම පින්වතෙකුටම, මේ භාවනා කරන පින්වතුන්ට භාවනාවෙදි එන ගැටළු මොනවද කියලා හිතලා බලමු. පළමුවෙන්ම තිබෙන්නේ ගුරුවරයා යම්කිසි කමටහනක් දුන්නා නම් ඒ කමටහනට සිත නංවා ගන්න. අමාරුයි. මොකද? පළපුරුදු සිතිවිලි වලටයි සිත දුවන්නේ. ඒවට තමයි නීවරණ ධර්ම කියන්නේ. නානාවිධ

දේවල් වලට, අතීතයට, අනාගතයට, වැදගැම්මකට නැති දේවල් හිතට කඩාගෙන එනවා සිතිවිලි. එතකොට එතනදී තියෙන්නේ විතර්ක එක්ක සටනක්. විතර්ක එක්ක සටන කරන කොට, තමන් ඉන්නේ මෙතන නොවෙයි. සමහරවිට ගෙදර, සමහරවිට තවත් කොහේ හරි. ඒ නිසා මේ ශරීරය තියෙන බවවත් දන්නෙ නෑ. වේදනාවලුත් දැනෙන්නෙ නෑ. ඒ වෙලාවේ සිත රවුම් ගහන නිසා. නමුත් යම් අවස්ථාවක විතර්ක මර්දනය කර ගත්තා කියලා හිතමු. කමටහනට සිත නංවන්න උත්සාහ කරනවා. ඕකට කියන්නේ විතර්ක විජය.

භාවනාවෙ විවිධ අවස්ථා තියෙනවා. දියුණුව පිළිබඳව කියනවා නම්, මුල් අවස්ථාවෙදි විතර්ක විජය. විතර්ක තමයි පළමුවෙන් ඉදිරිපත් වෙන්නේ, මාරයා හැටියට. විතර්ක මාරයා ටිකක් දමනය කරනකොට, යම්කිසි ප්‍රමාණයකට, විතර්ක විජය හැටියට සලකන්න පුළුවන්. ඊළඟට එන එක තමයි වේදනාව. එක ඉරියව්වක ඉන්න එපායැ හිත තැන්පත් කරගන්න. සමාධිමත් කරගන්න. නමුත් ඒකට ඉඩ දෙන්නෙ නැහැ. මොකද ශරීරයේ ස්වභාවය බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කර තියෙනවා මේක තනිකර දුක් ගොඩක් කියා. ඒක දුක් ගොඩක්, ලෙඩ ගොඩක්. **කොටින්ම පැවැත්ම එහෙම පිටින්ම උලක් කියලා හිතුවට කමක් නැහැ.** බුද්ධ වචනයේ තියෙනවා රූප ස්කන්ධය පමණක් නොවෙයි වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාණ කියන ස්කන්ධ පහ දිහාම විදර්ශනාත්මක ඇසින් බලන්න බුදුරජාණන් වහන්සේ ඒවාත් එකොළොස් ආකාරයකින් දක්වලා තියෙනවා. මේ පින්වතුන් අහලා ඇති. අනිච්චතො-අනිත්‍ය වශයෙන්, දුක්ඛතො-දුකක් වශයෙන්, රොගතො-රෝගයක් වශයෙන්, ගඩක් හැටියට, ලෙඩක් හැටියට, උලක් හැටියට, ව්‍යසනයක් හැටියට, ආබාධයක් හැටියට, අනාත්ම හැටියට, තමන්ගේ දෙයක් නොවන හැටියට, ශූන්‍ය හැටියට බලන්න කිව්වේ, බුදුරජාණන් වහන්සේ මේකට අමුතුවෙන් ආරූඪ කිරීමක් නොවෙයි. මේකෙ යථා ස්වභාවයයි. එතකොට අර රූප ගැන කිව්වා වගේ, වේදනාවත් තනිකරම උලක්. සැප වේදනාව හෝ වේවා, දුක් වේදනාව හෝ වේවා, නොදුක්නොසුව වේදනාව හෝ වේවා, මේ හැම එකක් තුළම අන්න අර කියපු අනිත්‍යතාව බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා. තවත් දේශනාවක බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා, සැප වේදනාව දුක් හැටියටත්, දුක් වේදනාව උලක් හැටියටත් නොදුක්නොසුව වේදනාව ශාන්ත නමුත් ඒකත් අනිත්‍ය හැටියටත්

දකින්න කියලා. ඒ විදියට වේදනාව පිළිබඳ අවබෝධය තුළිනුයි යමෙක් රහත් වෙන්නෙ. ඒ පැත්තෙන් බැලුවොත්.

මේ රහත් වීම කියන්නෙ නිවන් දැකීම කියන එක. කීප පැත්තකින් ඒකට කිට්ටු වෙන්න පුළුවන්. වේදනානුපස්සනා භාවනාවෙදි අන්න වේදනා ගැන කලකිරීම, සම්පූර්ණ වශයෙන් කලකිරීම. ඒ කලකිරීමට උපකාර වෙනවා අන්න අර වේදනාව. වේදනානුපස්සනාවෙදි කරන්නේ, මේක මගේ දෙයක් හැටියට බැලීම නොවෙයි, වේදනාව වේදනාව හැටියට බැලීම. වේදනාව වේදනාව හැටියට බලන්න පුරුදු වෙනකොට, දැන් ඔන්න අපි කිව්වා විතර්ක විජය කරලා, ඊළඟට ශරීරයේ යම් තැනෙක වේදනාවක් තියෙනවා, ඉඳගත්ත ඉරියව්වෙදි. බොහෝ අවස්ථා වලදී අපි ඉරියව් මාරු කිරීමෙන්, ඒ වේදනාව, ශරීරයේ දුක් ස්වභාවය වහ ගන්නවා. ශරීරය අපට මතක් කර දෙනවා, මේක දුක් ගොඩක් කියලා. අපි ඒක වහගන්නෙ කොහොමද? ඉරියව් මාරු කිරීමෙන්. නමුත් යම් අවස්ථාවක ඉරියව් මාරු නොකර වේදනාව හඳුනාගන්න උත්සාහ කරනවා නම් විදර්ශනාත්මකව, ඒක බොහොම අමාරු දෙයක්. එක සැරේට කරන්න අමාරුයි. නමුත් අධිෂ්ඨාන ශක්තියක් තිබෙනවා නම්, කැඩිලා ගියත් කමක් නෑ කියලා ඒ වෙලාවේ, අන්න විදර්ශකයා කරන්නේ අතෙන්ට හිත යොදනවා. **ඒක මගේ වේදනාවක් හැටියට බලන්නෙ නැහැ. ඒක අනිත්‍ය වශයෙන් දකිනවා. වේදනාව කියන්නේ මේ අනිත්‍ය වූ කය තුළින් එන එකක්. ඒ ඒ ස්පර්ශය නිසයි ඒ ඒ වේදනා ඇතිවෙන්නෙ.** ඒකත් ඒ ධර්මයේ දක්වලා තියෙනවා ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් හටගැනීම පිළිබඳ පාඨයක් තියනවා භාවනාවට උපකාරවෙන.

තජ්ජං තජ්ජං පච්චයං පටිච්ච තජ්ජා තජ්ජා වෙදනා උප්පජ්ජන්ති

තජ්ජස්ස තජ්ජස්ස පච්චයස්ස නිරොධා තජ්ජා තජ්ජා වෙදනා නිරුජ්ඣන්ති.

ඒ ඒ ප්‍රත්‍යයන් නිසා ඒ ඒ වේදනා හටගන්නවා. ඒ ඒ ප්‍රත්‍යයන් නැතිවීම නිසා ඒ ඒ වේදනා නැතිවෙලා යනවා. එතකොට මමය මාගේය කියලා ගන්නේ නැතිව, අන්න හේතුප්‍රත්‍යයන් අනුව

මෙනෙහි කිරීම. ඒක තුළදී වේදනාවත් හඳුනගන්න පුළුවන් වෙනවා අනිත්‍ය හැටියට. ඒකයි වේදනානුපස්සනා භාවනාව.

එතකොට ඒ අවස්ථාවෙදි යෝගාවචරයා කරන්නේ කමටහනෙහි හිත රඳවාගන්න බැරිනම් අන්න අර වේදනානුපස්සනා වශයෙන්, අර වේදනාව දෙන තැනට හිත යොමු කරනවා. ඒ තුළින් හුඟක් දේවල් ඉගෙනගන්න පුළුවන් වෙනවා. ඇතැම් විට ඒ වේදනාව ජයගන්න, පර්යංක වේලාව, ඉඳගත්ත වේලාව දික්කරගන්නත් පුළුවන්. ඒක සමථයට උපකාර වෙනවා. ඒ මොකද, ඒ තුළ අධිෂ්ඨාන ශක්තිය, දැන් මොකද වේදනාවට අපි කවුරුත් බයයි. ඒක කිට්ටු වෙනකොටම බයයි. අල්පෙනෙත්තක් කිට්ටු කරනකොට, ඉඳිකට්ටක් කිට්ටු කරනකොට බයයි. ඒවාගේ වේදනාව යන්තම් දැනෙන කොට බයයි. නමුත් ඒක දරාගන්න පුළුවන් මට්ටමකුත් තියෙනවා. ඒක නිසා යෝගාවචරයා ඒ අවස්ථාවේ වේදනාවට මුහුණ දුන්නහම, තමන්ට ඊට වඩා ඈතට යන්න පුළුවන් බව තේරුම් ගන්නවා. ඒකෙන් සමථ පැත්ත වැඩෙනවා. ඊළඟට **වේදනාව දිහා කෙලින්ම බලනකොට ඒකත් කර්මස්ථානයක් කරගෙන, අන්න අර සංස්කාර වල ස්වභාවය වැටහෙනවා.** මේවා ඔක්කොම රැලි ගොඩක්, සංස්කාර ගොඩක්. වේදනාව කියන්නේ එකක් නොවෙයි.

ඒකයි බුදුරජාණන් වහන්සේ දක්වලා තියෙන්නේ මේ පින්වතුන් කොතෙකුත් අහලා තියෙන 'වෙදනා බුබ්බුලූපමා.' දිය බුබුළු - ඇත්ත වශයෙන් තමන්ට ප්‍රත්‍යක්ෂ වන අවස්ථා මේ අර රූපය පෙණ පිඬක් කිව්වා වගේ වේදනාව මේ වගේ වැහි වෙලාවක වැටෙන දිය බිංදු වාගෙයි. ඒවා බොහෝ වේලා පවතින්නෙ නැහැ. ඒ වතුර වැටෙනකොට වහලෙන් එහෙම, දිය බිංදු ඇති වෙනවා, නැතිවෙලා යනවා. ඇතිවෙනවා, නැතිවෙලා යනවා. අන්න ඒ අවබෝධය තුළින් තමයි වේදනානුපස්සනාවෙදි අනිත්‍යතාව වැටහෙන්නේ. මේ හැම එකක්ම අනිත්‍යයයි කියලා ප්‍රත්‍යක්ෂ වුණු අවස්ථාවේදීයි හරියාකාර සිත තුළ අර විදර්ශනා ඥාන පරම්පරාව මතුවෙන්නෙ. මොකද ඇතිවීම් නැතිවීම් දෙකයි අපි සාමාන්‍යයෙන් සලකන්නෙ. ඇතිවීම් නැතිවීම් දෙකොන මැද තියෙනවා අර කියාපු අඤ්ඤථාභාවය. වෙනස්වීමක්. ඒ වෙනස්වීම අන්න අහුවෙනවා ඊළඟට. රැළි රැළි වගේ නොයෙකුත් ආකාරයෙන්. ඒක එකක්. අහුවෙන්නෙ කොහොමද? අන්න අර

නාමරූප වශයෙන්. අවධානය යොමු වෙනවා, මනසිකාරය යොමු වෙනවා, මනසිකාරයට අහු වෙනවා මෙතන තියෙන පොඩි පොඩි වේදනා සඤ්ඤා චේතනා ස්පර්ශ, මනසිකාර. මේ නාමරූප ධර්මයන් ඇතිවෙමින් නැතිවෙමින් යනවා. මමෙක් නෑ කියන අවබෝධය ඒ තුළින් එනවා. ඔන්න ඔය විදියට තමයි විදර්ශනාවෙදි ඉදිරියට ගමන් කරන්නෙ වේදනානුපස්සනාව.

මේ උත්තර ස්වාමීන් වහන්සේ කොහොම කළාද කියා අපට හිතාගන්න බැහැ, අර විදියට උලක් උඩ ඉඳලා. නමුත් වේදනානුපස්සනා මාර්ගය මේ විදියටයි ක්‍රියාත්මක කළ යුත්තේ. ඉතින් අපට ඇත්ත වශයෙන් ජීවිතය තුළ ආරාධනා කර වේදනා ගෙන්න වන්න ඕනැ නැහැ. මේ එන වේදනා ටිකම ඇති අපට භාවනාවට දන්න. එදිනෙදා ජීවිතය තුළ අපට නොයෙකුත් වේදනා විඳින්න සිදුවෙනවා. නමුත් ඒවායේ ඇති භාවනාමය අගය අපි දන්නේ නැහැ.

අන්න ඒක නිසා තමයි බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක වටිනා දේශනාවක් කළා 'මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජනයා සැප වේදනාත් විඳිනවා, දුක් වේදනාත් විඳිනවා. නොදුක්නොසුව කියන මධ්‍යස්ථ වේදනාත් විඳිනවා. ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයාත්, සැප වේදනාත් විඳිනවා, දුක් වේදනාත් විඳිනවා. නොදුක්නොසුව කියන මධ්‍යස්ථ වේදනාත් විඳිනවා. මොකක්ද මහණෙනි මේ දෙගොල්ල අතර වෙනස? සංඝයාවහන්සේලාගෙන් ප්‍රශ්නයක් මේ අහන්නෙ. සංඝයාවහන්සේලා කියනවා, 'ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එබඳු අවස්ථා වල - විශේෂ වාක්‍යයක් කියනවා 'භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේගෙන් තමයි අපි ධර්මය ලබාගන්නෙ. භාග්‍යවතුන් වහන්සේ තමයි අපේ ගුරුවරයා. අපට සමාවෙලා භාග්‍යවතුන් වහන්සේ කාරණය පැහැදිලි කරලා දෙන්න. භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කර දුන්නාට පසුව, අපි සංඝයාවහන්සේලා දරාගන්නවා' කියලා. කොටින්ම කියතොත් උත්තර දුන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේගෙන්ම උත්තරයක් බලාපොරොත්තු වුනා. මේක ගැඹුරු ප්‍රශ්නයක් නිසා වෙන්න ඇති. ඔන්න ඉතින් බුදුරජාණන් වහන්සේම ඊළඟට ප්‍රකාශ කරනවා, 'මෙන්න මේකයි හේතුව' කියලා. බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරනවා අර අශ්‍රැතවත් පෘථග්ජනයා කියන, ධර්මය නොදත් සාමාන්‍ය පුද්ගලයා දුක් වේදනා ඇති වුනහම

හඬනවා වැළපෙනවා. පපුවේ අත් ගසා ගන්නවා. ක්ලාන්ත වෙලා වැටෙනවා. දුක් වෙනවා. ඒ තුළින් අශ්‍රැතවත් පෘථග්ජනයා තවත් වේදනාවක් හදගන්නවා.' ඒකට බුදුරජාණන් වහන්සේ උපමාවක් දෙනවා 'ඔන්න යම්කිසි කෙනකුට ඊතල පහරක් වදිනවා. ඊතල පහරක් වැදිලා තියෙන කොට, තවත් ඊතලයක් ඇවිල්ලා වදිනවා.' අන්න ඒ වගේ මේ අශ්‍රැතවත් පෘථග්ජනයා කායික දුක්ඛයට චෛතසික දුක්ඛයක් එකතු කරගන්නවා. එතකොට ඊ පහර දෙකක් විඳිනවා. අර අශ්‍රැතවත් පෘථග්ජනයා අර දුක් වේදනාව නිසා, අර කියාපු ප්‍රතිචාරයෙන්. ඒකට දක්වූ ප්‍රතිචාරයෙන්.

ඒ වගේම, අශ්‍රැතවත් පෘථග්ජනයා පිළිබඳ තවත් දුර්වලකමක් හැටියට දක්වන්නේ, ඒ පුද්ගලයා දුක් වේදනාවක් ඇති වුනහම 'පටිඝවා' පටිඝයක් ඇති කරගන්නවා. ගැටීමක් ඇති කරගන්නවා. දෙව්ෂයක් ඇති කරගන්නවා, පුද්ගලයෙක් පිළිබඳව හෝ වේදනාවක් පිළිබඳව. දැන් අපි හිතමු, 'කොහෙද මට භාවනා කරන්න දෙන්නෙ නෑ මේ වේදනාව' කියලා ශරීරය එක්කත් කිපෙනවා. එතකොට මෙතනදී අපට හිතාගන්න පුළුවන් අර උත්තර සාමණේරයන් වහන්සේට 'උත්තර, ඔය අතීත කර්ම වේගයක්. එය දරාගන්න, ප්‍රත්‍යවේක්ෂා කරන්න, අධිවාසනය කරන්න කියලා බුදුරජාණන් වහන්සේගේ වචනයෙන් කර්මය ගැන මතක් කර දුන්න නිසා ඒක උපකාර වෙන්න ඇති උන්වහන්සේට. නැත්නම් අපි හිතමු අපි ඒ තත්ත්වයේ හිටියා කියලා ඒ අවස්ථාවෙ. අර අමූලික චෝදනාවට උල හිටවනකොට කෙනකුට ලොකු පටිඝයක් ඇතිවෙනවා පළමුවෙන්ම වස්සකාර බ්‍රාහ්මණයා ගැන. නිර්දෝෂී මට මේ විදියේ දඬුවමක් දුන්නා නේද? අන්න ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ කර්මයට සම්බන්ධ කර කිව්ව නිසා 'මේක දරාගන්න සිදුවෙන දෙයක්. අතීත කර්මයක්' අන්න ඒකත් උපකාර වෙන්න ඇති උත්තර ස්වාමීන්වහන්සේට අර අවස්ථාවේ වේදනානුපස්සනාවට හිත යොමු කරන්න. නමුත් සාමාන්‍ය පුද්ගලයා තුළ තියෙන්නෙ එයින් පටිඝයක් ඇතිකර ගන්නවා. කර්මවේගයකින් ආවා කියලා හිතෙන්නෙ නෑ. ඒ වෙනුවට පටිඝයක් ඇතිකර ගන්නවා. එතකොට ඒ අනිත් එක.

ඊළඟට ඔන්න තවත් දුර්වලකමක් තියෙනවා. අශ්‍රැතවත් පෘථග්ජනයා දුක් වේදනාවක් ආවහම සැප වේදනාවක් ප්‍රාර්ථනා

කරනවා. මොකද ඊට හේතුව? අශ්‍රැතවත් පෘථග්ජනයාට දුක් වේදනාවෙන් මිදීමේ මගක් හැටියට පෙනෙන්නේ සැප වේදනාවක්. ඒ ඇර වෙන විමුක්ති මාර්ගයක් පෙනෙන්නේ නැහැ. සාමාන්‍ය පුද්ගලයා දුක් වේදනාවක් දැනෙනකොට ප්‍රතිකර්මයක් හැටියට ඒක ඔස්සේ - සැප වේදනා ඔස්සේ යනවා. ඒකයි අපි කියන්නේ මේ සාමාන්‍ය පෘථග්ජන පුද්ගලයා දුකත් සැපත් අතර සීසෝ පැදිල්ලකයි යෙදිලා ඉන්නේ. දුක එන එන තරමට සැප බලාපොරොත්තු වෙනවා. නමුත් මේක විසඳුමක් නොවෙයි. අන්න එතකොට ඒ පෘථග්ජන පුද්ගලයා පිළිබඳව බුදුරජාණන් වහන්සේ දක්වන එක දුර්වලකමක් තමයි අර එක ඊතලයට තව ඊතලයක් එකතු කරගන්නවා. අර වේදනාව ගැන අඬලා වැළපිලා පපුවේ අත් ගසාගෙන දුක්වීම තුළින් කායික වේදනාවට අමතරව. දෙවැනි කාරණය තමයි මේ පුද්ගලයා තුළ වේදනාව ගැන පටිඝයක් ඇති වෙනවා. ඒකෙ ප්‍රතිඵලයක් ලෙස බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මේ පුද්ගලයා තුළ පටිඝ අනුසය සිතේ තැන්පත් වෙනවා. පටිඝය, ද්වේෂය. ඒකත් නරක දෙයක්. ඊළඟට ඒ වෙනුවට දුක් වේදනාවෙන් මිදීමේ මඟක් හැටියට, සැප වේදනා ඔස්සේ දිවීම තුළින් රාගානුසයක් ලැබෙනවා. එතකොට අශ්‍රැතවත් පුද්ගලයා තුළින් ඒ අඩුපාඩුකම් බුදුරජාණන් වහන්සේ ඉස්සෙල්ලා පෙන්නුම් කරනවා.

ඊළඟට දක්වනවා ශ්‍රැතවත් - ධර්මය ඇසූ - ආර්යශ්‍රාවකයා කොහොමද ක්‍රියා කරන්නෙ කියලා. ධර්මඥනය ලත් ශ්‍රාවකයා වේදනාවක් ආවහම අර විදියට අඬන්න, වැළපෙන්න, පපුවේ අත් ගසාගන්න යන්නෙ නෑ. ඒ විදියට කායික වේදනාවට චෛතසික වේදනාවක් එකතු කරගන්නෙ නෑ. ඊළඟට ආර්යශ්‍රාවකයා ඒ පිළිබඳ පටිඝයක් ඇති කරගන්නෙත් නැහැ. මේ වේදනාව පිළිබඳ ගැටීමක් නැහැ. වේදනාව කියන එක මේ ශරීරයට අදාළ දෙයක්. ඒ පිළිබඳව පුදුම විදියේ වාක්‍යයක් ප්‍රකාශ කරනවා සාරිපුත්ත මහරහතන් වහන්සේ - ඉවසීම පිළිබඳව. මහා පුදුම ආදර්ශයක් දීපු ස්වාමීන්වහන්සේ නමක් තමයි සාරිපුත්ත මහරහතන් වහන්සේ. ඒවගේම පඨවි ආපො තෙජො වායො කියන ධාතු කර්මස්ථාන පිළිබඳව, වටිනා දේශනා පවත්වපු ස්වාමීන්වහන්සේ නමක් සාරිපුත්ත මහරහතන් වහන්සේ.

එක් අවස්ථාවක උන්වහන්සේ වදාරනවා දැන් ඔන්න කවුරුන් හෝ තම ශරීරයට පහරක් ගැහුවොත්, අපි හිතමු පොල්ලකින් ගැහුවා

කියලා. එතකොට ඒ පොල්ලෙන් ගහපු තැනැත්තා දිහා නොවෙයි සාරිපුත්ත මහරහතන් වහන්සේ බලන්නේ. බලන්නේ තමන්ගේ ශරීරය දිහා. මොකද? මේ ශරීරය කොයි විදියටද හැදිලා තියෙන්නෙ කියතොත්, පොල්ලෙන් ගැහුවහම රිදෙනවා. පොල්ලෙන් ගැහුවහම රිදෙනවා. කෙනකුට හිනා යන්න පුළුවන් මේ හාස්‍යජනක දෙයක් කියලා. නමුත් අපි ටිකකට හිතමු, මේ ශරීරය යකඩ වලින් හැදිලා තියෙනවා කියලා. එහෙනම් අර පොල්ල පොලා පැන අර මනුස්සයාටම නෙ වදින්නෙ. නමුත් **මේ ශරීරය තමන්ගෙ දෝසෙ.** ටිකකට හිතලා බලමු. අපේ තුවාලයක් තියෙනවා. අපි ඕකට වෙළුමක් දගෙන යනවා රැස්වීමකට. හැපෙන හැපෙන එක්කෙනා එක්ක අපි ගැටෙනවා. අපේ තුවාලෙ.

බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා මේ ශරීරය සම්පූර්ණ තුවාලයක්, ගඩක්, ලෙඩක්, ආබාධයක්. එතකොට අර පොල්ල එක්කවත්, පොල්ල එව්ව තැනැත්තා එක්කවත් නොවෙයි ගැටෙන්න තියෙන්නෙ. මේ ශරීරයේ ස්වභාවය. අන්න සාරිපුත්ත මහරහතන් වහන්සේගේ ආකල්පය. අපට ඕක අහනකොට විහිළුවක් වගේ. එතකොට විදර්ශකයාටත් ඒ විදියටයි හිතන්න වෙන්නේ. අර වේදනාවත් එක්ක අපි ගැටෙන්න නරකයි. ඇතැම්විට අපට නොපෙනෙන අතීත කර්ම වේගයක් වෙන්න ඇති. නිරපරාදේ සමහර විට අපට පීඩාවක් එන්න පුළුවන්. අල්ලාගෙන ගිහිල්ලා මොකක් හරි බරපතල සතුරකුගේ පීඩාවක් වෙන්න පුළුවන්. නමුත් ඒක යට යම්කිසි කර්ම වේගයක් තියෙන්න පුළුවන්. අපි ඒක ගැන අවබෝධයක් නැතිව, ඒකත් එක්ක ක්‍රියා කරන්න යාමෙන් තවත් කර්ම ගොඩ ගහගන්නවා. නමුත් විදර්ශකයා ඒක අවස්ථාවක් කරගන්නවා - මේ වේදනාව කමටහනක් කරගන්නවා. දෙකම කමටහනක් කරගන්නවා. නිවනට කෙටි මගක්. දුර්ග මාර්ගයක්. නමුත් කෙටි මගක්.

මොකද ආත්ම සංඥාව බැඳිලා තියෙන්නේ වේදනාවත් එක්කයි. කඩන්න තියෙන්නෙත් එතනයි. 'වෙමි' කියලා ගන්න මේ ගැම්ම, 'මම'ය කියලා. දැන් 'වෙමි' කියන එකම තමයි සක්කාය දිට්ඨියට තියෙන්නෙත් 'වෙමි' - කියලා මූලික වෙන අස්මිමානය. 'වෙමි' කියන ප්‍රස්තුතය. සාමාන්‍යයෙන් පැවැත්ම පිළිබඳ මූලික ප්‍රස්තුතය තමයි වෙමි කියන්නෙ. නමුත් 'වෙමි' කියන එක තව ටිකක් විස්තර කරන්න

වෙනවා කෙනකුට. 'මම වෙමි' කියන්න වෙනවා. එහෙම නැත්නම් 'මේ මම වෙමි' කියලත් කියනවා. දැන් ඔය රූප වේදනා ආදීන්ගෙන් එක එකක් අරගෙන 'මෙය මම වෙමි' කියලත් කියනවා. අන්න අර කොතෙකුත් පැවැත්ම උපුටලා දක්වන, මතුකරල දක්වන අවස්ථාවකදී කෙලින්ම කියන්න වෙනවා, 'මේ මම වෙමි' කියලා. නමුත් මේක ආරම්භයේ අන්න අර වේදනාව ආශ්‍රයෙන් එන්නේ, මමය මාගේය යන හැඟීම. මොකද? මෙතන දී වේදනාව අර විදියට හේතුප්‍රත්‍යයන්ගෙන් හටගත් දෙයක්.

අර සාරිපුත්ත හාමුදුරුවන් වෙත පොල්ලෙන් ගැහුවා. ශරීරය කියන එක - ඒ පොලු පාර වැදුනාම ඉදිමෙන එකක්. එහෙම නැත්නම් රිදෙන එකක්. ඉතින් එච්චරයි තියෙන්නෙ එතන කතාව. ශරීරය අර විදියේ යකඩ දෙයක් නම් ඒ මොකක් වත් වෙන්නෙ නෑ. ඔන්න ඒ විදියටයි එතකොට හිතන්න වෙන්නෙ ඒ පැත්තෙන් බලනවා නම්. මේ ආර්ය ශ්‍රාවකයා ඒ විදියට පටිසයට යන්නෙ නෑ. ආර්ය ශ්‍රාවකයා දුක් වේදනාව ආවහම ඒකට විසඳුම් වශයෙන් සැප වේදනාව ඔස්සේ යන්නෙ නෑ. මොකද අර ශ්‍රාවකයා දන්නවා, දුක් වේදනාවෙන් මිදෙන වෙන මාර්ගයක්, නිවන් මගක් තියෙන බව. ඒ පොඩි දුක් වේදනාව අරමුණු කරගෙන සමහර විට සම්පූර්ණ සංසාර දුක කෙළවර කරගන්නත් පුළුවන් බව. මේ වේදනාවන්ගේ අවබෝධය තුළින් කර ගන්න එකක්. ඒකට උපකාර වෙන්න තමයි බුදුරජාණන් වහන්සේ දක්වලා තියෙන්නේ මේ වේදනාවන් දැකීමේ අනේක ක්‍රම. ඇතිවීමක්, නැතිවීමක් හැටියට, මේවායේ ආස්වාද පක්‍ෂය, මේවායේ ආදීනව පක්‍ෂය, මේවායින් නික්මීම - මිදීම හැම එකක් පිළිබඳවම යථා අවබෝධය ලබාගන්න අවස්ථාවක් හැටියට සැලකීමෙන් ඒක කර්මස්ථානයක් කරගැනීම. ඔන්න එතකොට ඒ විදියටයි බුදුරජාණන් වහන්සේ මෙතන අශ්‍රැතවත් පෘථග්ජනයාත් ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයාත් අතර වෙනස දක්වන්නේ වේදනාව පිළිබඳ ප්‍රශ්නයේදී.

ඉතින් ඔය විදියට කොතෙකුත් ධර්මයේ සඳහන් වෙනවා. අපි කල්පනා කරන්න ඕනෑ බුදුරජාණන් වහන්සේගේ වචනයට අනුව සැප වේදනාව - දැන් සැප වේදනාව තමයි කවුරුත් ප්‍රාර්ථනා කරන්නේ. බුදුරජාණන් වහන්සේ දක්වලා තියෙනවා ඒකත් දුකක් හැටියට දකින්න කියලා. ඇයි ඒ? ධර්මයෙහි සඳහන් වෙනවා මේ සැප දුක සහ

නොදුක්නොසුව කියන වේදනා වර්ග කරලා තියෙනවා මේ විදියට. සැප වේදනාව පිළිබඳව කියවෙන්නේ 'ඨිතිසුඛා විපරිණාම දුක්ඛා' සැප වේදනාව තිබෙන තාක් සැපයි. වෙනස් වෙනකොට දුකයි. වෙනස් වෙනකොට දුකයි.

එතකොට අපි මේ සැප වේදනාවට ආරාධනා කරනකොට ඒ එක්කම සූදානම් වෙන්න ඕනෑ, මේක වෙනස් වීමෙන් ලැබෙන දුකත් පිළිගන්න. අන්න ඒකයි බුදුරජාණන් වහන්සේ ආර්ය ශ්‍රාවකයාට නියම ආකාරයෙන් වේදනාව ගැන සැලකීමේදී මෙන්න මේ විදියට බලන්න කියන්නෙ. **'යො සුඛං දුක්ඛතොද්දක්ඛි' සැප වේදනාව දුකක් හැටියට දකින්න කියලා.** මේ දුක අරගෙන එන නිසා සැප වේදනාවට අපි ආරාධනා කළාට මොකද ඒකත් එක්ක එන්නේ ඒක ඉවර වෙනකොට එන හිස් බව, දුක. ඉතින් දූන් කුඩා දරුවෙක් අපි දන්නවා සබන් බෝල පුම්බලා, ඒකෙ අර ලස්සනට තියෙන නිසා ඒක පිටිපස්සේ දුවනවා. කොච්චර දුර දුවන්න පුළුවන්ද, අන්තිමට කොහේ ගියාද කියලා නැහැ. අන්න එතකොට ඒ විදියයි සැප වේදනාව පිළිබඳ. ඒක නිසා තමයි ඒක දුකක් හැටියට දකින්නේ.

ඊළඟට **දුක් වේදනාව - කෙලින්ම කියනවා ඒක උලක් හැටියට දකින්න.** දුක් වේදනාව උලක්ම තමයි. ඉතින් උල උල හැටියටම තේරුම්ගන්න ඕනැ. ඊළඟට නොදුක්නොසුව, **මධ්‍යස්ථ වේදනාව. ඒක ශාන්තයි. ඒක ශාන්තයි.** නමුත් ඒකත් අනිත්‍යයි. මොකද අර සැපත් දුකත් අතර සීසෝ පැදිල්ල මැදින් තියෙන්නෙ ඔය නොදුක්නොසුව වේදනාවයි. එයත් නිත්‍ය නෑ. එතනත් කෙලෙස් තියෙන්නේ. ඒක නිසා තමයි ඔය නොදුක්නොසුව වේදනාව උපකාරී කරගෙන යන ධ්‍යාන මට්ටම් පවා බුදුරජාණන් වහන්සේ ඒවාත් ප්‍රතික්ෂේප කරලා, ඊටත් එහා ගියේ. මේ වේදනාව පිළිබඳ සීසෝ පැදිල්ලෙන්, සම්පූර්ණයෙන් ඉවත්වෙන තත්වය. මේ සීසෝ පැදිල්ල සම්පූර්ණයෙන්ම තියෙන්නේ 'වෙමි' කියන මානය උඩයි. එතකොට **වේදනාව වේදනාව හැටියට දකිනවා. වේදනානුපස්සනා කියන්නෙ ඒකටයි.**

බුදුරජාණන් වහන්සේ පෙන්නුවේ යථාභූත ඥානයට ළංවෙන හැටි. මමය මාගේය කියන ගැන්ම, සක්කාය දිට්ඨි ප්‍රහානය අවස්ථාවේදී ගොරෝසු මට්ටම කඩලා, ඊළඟට ක්‍රමක්‍රමයෙන් ඒ ටික තමයි සතිපට්ඨාන සූත්‍රයේ තියෙන්නෙ. 'කායෙ කායානුපස්සී' කය,

කය හැටියට බලන්න. 'වෙදනාසු වෙදනානුපස්සී' වේදනාව, වේදනාව හැටියට බලන්න. මොකද ඒ හැටියට බලන්න කියන්නෙ? අනුපස්සනා කියන්නෙ? අනුපස්සනා කියන්නේ ඒවායේ යථාතත්ත්වය වටහාගන්න. මමය, මාගේය කියන හැඟීමෙන් ඉවත් කරලා මේ මගේය, මේ අනුන්ගේය කියලා. තමන්ගේ වේදනාව හෝ අනුන්ගේ වේදනාව හෝ වේදනාව වේදනාවමයි. අන්න ඒ හැටියට දකින්නයි සතිපට්ඨාන සූත්‍රයේ අපට පුරුදු කරන්නේ. මේ පින්වතුන් අහලා තියෙනවා 'අජ්ඣත්තං බහිද්ධා' කියන යෙදුම. බුදුරජාණන් වහන්සේට කියන්න තිබුණා මේක තමන්ගේ අනුන්ගේ කියලා. තමන්ගේ අනුන්ගේ කතා නෑ මෙතන. තියෙන්නේ ඇතුළතයි පිටතයි. ඇතුළතයි පිටතයි කතාව. ඇතුළත එක තමන්ගේ කියනවා. පිටත එක අනුන්ගේ කියනවා. නමුත් ඒ දෙකේම තියෙන්නේ එකම ධර්මතාවක්. කය පිළිබඳ, සිත පිළිබඳ, වේදනා පිළිබඳ, ධම්ම පිළිබඳ, සතිපට්ඨාන සූත්‍රයේ තියෙනවා. ඒවා ආශ්‍රයෙන්ම තමයි විදර්ශනාවෙන් ඉදිරියට යන්න වෙන්නෙ. ප්‍රධාන දේ තමයි සිහිය - සතිසම්පජඤ්ඤය. ඊළඟට යෝනිසෝමනසිකාරය. එතන තමයි වැදගත්ම දේ. ප්‍රඥාවේ මූල බීජය අප කා තුළත් තියෙනවා. ඒක අවදි කරගන්න එකයි තියෙන්නෙ. යෝනිසෝමනසිකාරය කියන්නෙ ඒකයි. ඒ ටික බුදුරජාණන් වහන්සේ මතුකරලා දුන්නා ලෝකය දිහා බලන ආකාරය. ඒ ටික තමයි ධර්මයේ සඳහන් වෙන්නේ. විපල්ලාස කියන්නේ. ලෝකයා තුළ අපි අර කිව්වේ විපරීත දෘෂ්ටියක් තියෙනවා කියලා. එකක් නොවෙයි විපරීත දෘෂ්ටි හතරක්ම බුදුරජාණන් වහන්සේ දක්වනවා.

අනිත්‍ය දේ නිත්‍ය හැටියට සලකනවා.

දුක් සහිත දේ සැප හැටියට සලකනවා.

අනාත්ම දේ ආත්ම හැටියට සලකනවා.

අසුභ දේ සුභ හැටියට සලකනවා.

ඔන්න ඔය සඤ්ඤා හතර තමයි විපල්ලාස ධර්ම හැටියට දක්වෙන්නෙ. මේ විපරීත බව තුන් මට්ටමකින් සත්ත්වයා තුළ තියෙන බව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. සඤ්ඤා විපල්ලාස, චිත්ත විපල්ලාස, දිට්ඨි විපල්ලාස කියලා. අනිත්‍ය දේ නිත්‍ය හැටියට ගන්න

සඤ්ඤා විපල්ලාසයක් තියෙනවා. සඤ්ඤා කියන්නෙ හඳුනාගැනීම. දැක්ක හැටියෙ ඒක නිත්‍යයි කියලා සඤ්ඤාවක් ඇති කරගන්නවා. ඒ සඤ්ඤාව පිට සිතිවිලි ධාරාවක් ඇතිකර ගන්නවා. සිතුම් පැතුම් ඇතිකර ගන්නවා. ඔන්න චිත්ත විපල්ලාස. එතකොට අර විපරීත සංඥාවෙන් පටන්ගන්න එක විපරීත සිතුම් පැතුම් කරා යනවා. ඒ සිතුම් පැතුම් හරියට පැලපදියම් වුනාට පස්සෙ, ඒක දෘෂ්ටියක් වෙනවා. ආයෙත් හොල්ලන්න බැරි දෘෂ්ටියක් වෙනවා. ඒක තමයි දිට්ඨි විපල්ලාස කියන්නෙ.

එතකොට මේ විපල්ලාස ධර්ම තුන් ආකාරයකින් ලෝකයා වෙත බලපාන බව බුදුරජාණන් වහන්සේ දේශනා කළා. සඤ්ඤා විපල්ලාස, චිත්ත විපල්ලාස, දිට්ඨි විපල්ලාස. අර හතර පිළිබඳවත් එහෙමයි. අනිච්චෙ නිච්චසඤ්ඤී - අනිත්‍ය දේ නිත්‍ය හැටියට සැලකීම හෝ වේවා දුක් සහිත දේ සැප හැටියට සැලකීම හෝ වේවා, අනාත්ම දේ ආත්ම හැටියට සැලකීම හෝ වේවා, අසුභ දේ සුභ හැටියට සැලකීම හෝ වේවා, ඒවා සඤ්ඤා මට්ටමින් ඇතිවෙලා, ඒවා තුළ විචිත්‍ර විසිතුරු සිතුම් පැතුම් හැටියට තහවුරු වෙලා, අන්තිමට දෘෂ්ටියක් හැටියට ඇති වෙනවා. ඔන්න ඔය විපරීත තත්ත්වය තුළයි ලෝකයා සිටින්නේ.

නමුත් බුදුරජාණන් වහන්සේ ඔය ටික ලෝකයාට මතුකර දුන්නේ මොකද? අන්න ආරම්භයක් කරන්න. හරි දැක්ම ඇති කරගන්න අර අයෝනිසෝමනසිකාර තත්ත්වයෙන්, යෝනිසෝමනසිකාර තත්ත්වයට බුදුරජාණන් වහන්සේ අපව පත්කර තියෙනවා ඒ ධර්මාවබෝධය තුළ. අන්න එතන ඉඳලා අපටයි අයිති වැඩේ. එතන ඉඳලා යන ගමනයි විදර්ශනාව. සමථ භාවනාවෙන් යම්කිසි සමාධි මට්ටමක් ඇති කරගෙන, සතිසම්පජඤ්ඤය වඩාත් දියුණු අන්දමින් ක්‍රියාත්මක කරන්න පුළුවන් ශක්තියක් ඇති කරගෙන, ක්‍රමක්‍රමයෙන් - ඒක අමුතු දෙයක් නොවෙයි. මේ පංචඋපාදාන ස්කන්ධය තුළම අපට පෙනෙනවා - අන්න අර බුද්ධ වචනය නැවතත් අපට මතුකර ගන්න වෙනවා 'ඉමස්මිං යෙව බ්‍යාමමත්තෙ කලෙබරෙ සසඤ්ඤිම්හි සමනකෙ ලොකං ච පඤ්ඤපෙමි, ලොකසමුදයං ච ලොක නිරොධං ච ලොක නිරොධගාමිනී පටිපදං ච' ඒ ශ්‍රේෂ්ඨ බුද්ධ වචනය. ඒක තමයි අපට සමාලෝචන වශයෙන් හිතුවොත් ගන්න තියෙන්නෙ. එතනදී

බුදුරජාණන් වහන්සේ මේ ප්‍රකාශ කරන්නේ මොකක්ද? 'මහණෙනි, මම කියනවා 'ඉමස්මිං යෙව බ්‍යාමමත්තෙ කලෙබරෙ සසඤ්ඤිම්හි සමනකෙ' මේ බඹයක් පමණ වූ කලේබරයේ කියන්නේ මෘත කලේබරය, මළකඳ. නමුත් මෙතන කලේබරය කියන වචනය යෙදිලා තියෙන්නේ 'සසඤ්ඤිම්හි සමනකෙ' සංඥවත් මනසත් ඇති මේ කලේබරය තුළ. මෘත කලේබරය කියන්න බැහැ එතන සංඥවත් මනසත් තියෙන නිසා. නමුත් කලේබරය කියා යොදලා තියෙන්නේ අපට හිතන්නයි. මේ සංඥවත් මනසත් නැත්නම් මේක මළකඳක් වාගේ තමයි. ගහක් කොලක් වගේ දෙයක් තමයි. නමුත් බුදුරජාණන් වහන්සේ කියනවා සඤ්ඤවත් මනසත් ඇති මේ බඹයක් පමණ ශරීර කූඩුව තුළම මම පෙන්වා දෙනවා ලෝකයත්, ලෝකය හටගැන්මත්, ලෝක නිරෝධයත්, ලෝකනිරොධගාමිනී මාර්ගයත්.

මේ කියාපු සඤ්ඤ, මනස යන වචන දෙකත් මෙතෙක් අපි කළ විග්‍රහය තුළින් තව අර්ථවත් කරන්න පුළුවන්. ඇයි බුදුරජාණන් වහන්සේ සඤ්ඤවකුත්, මනසකුත් එකතු කළේ මෙතෙන්ට? ඒවා අපට උපකාරී වෙනවා. විපරීත සඤ්ඤ හැටියට, විපල්ලාස ධර්ම හැටියට, සඤ්ඤව ගැන අපි එක පැත්තකින් දෙස් කිව්වාට මොකද, ඒකමයි අපි උපයෝගී කරගන්නේ විදර්ශනාවට. නිච්ච සඤ්ඤ හොඳ නැහැ, ඒ වෙනුවට අනිච්ච සඤ්ඤ. දැන් මේ පින්වතුන් දන්නවා ගිරිමානන්ද වාගේ සූත්‍ර කියවපු මේ පින්වතුන් දන්නවා බුදුරජාණන් වහන්සේ ආර්ය ශ්‍රාවකයින් දියුණු කළ යුතු සඤ්ඤ පෙළකුත් හඳුන්වා දීලා තියෙනව. අනිච්ච සඤ්ඤ, අසුභ සඤ්ඤ, අනත්ත සඤ්ඤ, ආදීනව සඤ්ඤ, පහාන සඤ්ඤ, විරාග සඤ්ඤ, නිරෝධ සඤ්ඤ - ඒ ඔක්කෝම සඤ්ඤ තමයි. අන්න දියුණු කරගත යුතු සඤ්ඤ. එතකොට ලෝකයේ තියෙන, සසර වඩන සඤ්ඤ වෙනුවට, විපරීත සඤ්ඤ වෙනුවට, අවිපරීත සඤ්ඤ බුදුරජාණන් වහන්සේගේ ධර්මය අනුව පුරුදු කරනවා. ඒක තමයි මාර්ගය.

දැන් මෙතන කිව්වා බඹයක් පමණ ශරීරය තුළ චතුරාර්යසත්‍යයම තියෙනවා. එතන ලෝකය කිව්වේ මේ දුක පිළිබඳ කතාන්දරයමයි. දුකත්, දුක හටගැනීමත්, දුක්ඛ නිරෝධයත්, දුක්ඛ නිරෝධගාමී මාර්ගයත් ගැන කිව්වා වාගෙ තමයි ලෝකයත්, ලෝක සමුදයත් කිව්වෙ. ඇතැම් විට ලෝකයම දුකක් හැටියට අදහස් කළා.

**'දුක්ඛ ලොකො පතිට්ඨිතො, දුක්ඛං ලොකෙ පතිට්ඨිතං'** ලෝකයත් දුකත් එකක් හැටියට, පියන්පත් දෙකක් හැටියට සඳහන් කරලා තියෙනවා. මේ ලෝකය ගැන කියපු කතන්දරේමයි දුක පිළිබඳවත් කියන්නේ. බුද්ධ වචනය අනුව බඹයක් පමණ ශරීරය තුළ දුකත් තියෙනවා, දුක්ඛ සමුදයත් තියෙනවා, දුක්ඛ නිරෝධයත් තියෙනවා, දුක්ඛ නිරෝධගාමී මාර්ගයත් තියෙනවා. මාර්ගය කිව්වාම අපි මේ දැන් කතා කරන විදර්ශනා මාර්ගය. ඒ මාර්ගයට අයිතියි මේ සඤ්ඤා කතාවත්, අනිච්ච, අසුභ, ආදීනව ආදී සඤ්ඤා මිරිඟුවක් පමණයි. නමුත් ඒ මිරිඟුවෙන් මිදීමට යම්කිසි සඤ්ඤා මට්ටමක්, ධර්මානුකූල සඤ්ඤා මට්ටමක් තුළින් තමයි අපි අවබෝධය කරා යන්නෙ.

ඊළඟට මනස ගැන කියනවා. මනසිකාරය. අයෝනිසෝමනසිකාරය. මෙච්චර කල් සංසාරයේ අපි අරගෙන ඇවිත් තියෙන්නේ මාරයා අයෝනිසෝමනසිකාරය තුළින්. වැරදි මෙනෙහි කිරීම තුළින්. අර ඒදණ්ඩ උඩ ඉන්න බල්ලාගේ මෙනෙහි කිරීමයි, මෙතෙක් කාලයක් අපි සංසාරෙ අරගෙන ඇවිත් තියෙන්නෙ. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කර දීලා තියෙනවා හරියාකාර ප්‍රත්‍යවේක්ෂා කිරීම තුළින් මේ යථා තත්ත්වය අවබෝධ කරගැනීමට උපකාර වන යෝනිසෝමනසිකාරය අවදි වන බව. අයෝනිසෝමනසිකාරය කියන්නේ යමක් හටගත් තැන අමතක කරලා මුවා මිරිඟුව කරා දුවන්නා වාගේ දිවිල්ලයි. යෝනිසෝමනසිකාරය කියන්නේ යමක් හටගන්න තැනට එල්ල කරලා ඒ පැත්තට හැරිලා එන එකයි. ආපහු ගෙදර එන්න වාගෙ ගමනක් ඒක. එතකොට අර මුවා මිරිඟුව ඔස්සේ දුවලා දුවලා හති වැටිලා මැරෙනවා මිසක් කවදාවත් එතනට පැමිණෙන්නේ නැතිවා වාගේ, ලෝකයා දීඝ කාලයක් සංසාරයේ දුකේ කෙළවර සොයමින් දුවනවා. නමුත් දුකමයි හමුවන්නේ. අන්න බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළා යෝනිසෝමනසිකාරය - මේවා හටගන්න තැනට එන්න. වේදනාව - එය පටන්ගන්නේ ස්පර්ශයෙන්. අන්න ඒ ධර්ම හඳුනාගන්න, නාමරූප ධර්ම. අන්න එතන යෝනිසෝ පටන්ගන්න තැන. විඤ්ඤාණය නිසා නාමරූප ධර්ම පවතිනවා. නාමරූප ධර්ම නිසා විඤ්ඤාණය පවතිනවා. ඔතෙන්ටයි අපි එන්නෙ අන්තිමට. යම් අවස්ථාවක විඤ්ඤාණය තේරුම් ගත්තා නම්, නාමරූප තේරුම් ගත්තා වෙනවා. යම්

ආකාරයකින් නාමරූප තේරුම් ගත්තා නම්, විඤ්ඤාණය තේරුම් ගත්තා වෙනවා. එතනම සංසාර විමුක්තියයි. ඕක බුද්ධ වචනයයි.

මේ වටිනා පෝය දවසෙ වටිනා සීලයක් සමාදන් වෙලා, මේ අවස්ථාවේ ධර්මශ්‍රවණය කිරීමෙන් තම තමන්ගේ භාවනාවට ආධාර වෙන අන්දමින්, විදර්ශනාවට උපකාර වෙන විශෙෂයෙන්ම වේදනානුපස්සනාවට අදාළ ධර්ම කොට්ඨාස එකතු කරගන්න ඇතැයි කියලා හිතනවා.

මෙතෙක් මේ ධර්මශ්‍රවණානිසංසය වගේම තමන්ගේ බණ භාවනාවට අදාළ වන අන්දමේ මේ චින්තනය තුළින් නිවනට ළංවෙන්න උපකාර උනා නම් ඒ කුසල ශක්තියත් පිහිට කරගෙන හැකිතාක් ඉක්මනින් මේ ජීවිතය තුළදීම, සෝවාන්, සකදාගාමී, අනාගාමී, අර්හත් කියන මාර්ග ඵල වලට පැමිණීමෙන්, මේ ජාති ජරා ව්‍යාධි මරණ ආදි සංසාර දුකින් අත්මිදී ලැබිය යුතු අමාමහ නිවන ලැබීමෙන් සැනසීමට මේ කුසල ශක්තිය හේතුවාසනා වේවා කියා කල්පනා කරන්න.

එසේම අවීචියේ සිට අකනිට්ඨාව දක්වා ඇති යම්තාක් සත්ත්ව කෙනෙක් මේ ධර්ම දේශනාවෙන් හා ධර්ම ශ්‍රවණයෙන් ලැබුණු කුසලයන් අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් තම තමන් ප්‍රාර්ථනා කරන බෝධියකින් අමාමහ නිවනට පත්වී සැනසීමට හේතු වාසනා වේවා කියා ප්‍රාර්ථනා කර ගන්න.

'එත්තාවතා ච අම්හෙහි...'

# 59 වන දේශනය

# 59 වන දේශනය

(පහන් කණුව ධර්ම දේශනා අංක 172)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

ඛීණං පුරාණං නවං නත්‍ථි සම්භවං
විරත්ත චිත්තා ආයතිකෙ භවස්මිං
තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථා'යං පදීපො
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්‍ථි හොතු

සැදැහැවත් පින්වතුනි,

තෙරුවන් සරණ යාම මහානුභාව සම්පන්න රත්නත්‍රයක පිහිට සෙවීමක්. බුද්ධ ධම්ම සංඝ යන ඒ ත්‍රිවිධ රත්නයේ අපරිමිත ගුණ මහිමය සත්‍යක්‍රියාවකට පදනම් කර ගැනීමට තරම් ප්‍රබලයි. ඒ බව මේ පින්වතුන් නිතර භාවිතා කරන රතන සූත්‍රයෙන් හොඳට පැහැදිලි වෙනවා. සැදැහැවත් බෞද්ධයින් බොහෝවිට උපද්‍රව අවස්ථාවල ආරක්ෂක මන්ත්‍රයක් පිහිටක් හැටියට සජ්ඣායනා කරන රතන සූත්‍රයේ අග හරියේ එන ගාථාවක් තමයි අපි අද මාතෘකාව හැටියට ඉදිරිපත් කළේ. මේ රතන සූත්‍රයේ නිදාන කථාව හැටියට අටුවාවල දැක්වෙන්නේ විසාලා මහ නුවර ඇතිවුණ දුර්භික්ෂ භය, අමනුෂ්‍ය භය, රෝග භය කියන ත්‍රිවිධ භයක් දුරු කරලා සෙත ශාන්තිය සලසන්න තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ සූත්‍රය දේශනා කළ බවයි. විසාලා මහ නුවර, බුදුරජාණන් වහන්සේ පහළවන කාලයේදී ඒ දඹදිව තිබුණු ඉතාමත්ම සමෘද්ධිමත් රාජ්‍යයක්. බොහොම ධාර්මිකව, ඉතාමත්ම ක්‍රමානුකූලව සමූහාණ්ඩු ක්‍රමයකට පැවැත් වුණු රාජ්‍යයක් හැටියට පොතපතේ සඳහන් වෙනවා. නමුත් යම් කිසි අවස්ථාවක නියං සායක් ඇතිවෙලා දුර්භික්ෂයක් ඇතිවුණා.

පළමුවෙන් දුගී දිළිඳු මනුෂ්‍යයින් මැරෙන්න පටන් ගත්තා. නගර වාසීන් ඒ මළ සිරුරු නගරයෙන් පිටට දැම්මා. ඒවා කුණු වෙලා අන්තිමට ඒක නිසා අමනුෂ්‍යයින් ක්‍රම ක්‍රමයෙන් ඇවිල්ලා නගරයට ඇතුළු වුණා. තව තවත් මිනිසුන් මැරෙන්න පටන් ගත්තා. ඒ එක්කම එතන සඳහන් වෙනවා අහිවාතක රෝගය කියලා. දැන් මේ කාලයේ හැටියට නම් - මහාමාරිය රෝගය කියන වසංගතයකුත් ඇති වුණා.

ඔය විදියට දුර්භික්ෂ භය, අමනුෂ්‍ය භය, රෝග භය කියන ත්‍රිවිධ භයක් ඇතිවුණ අවස්ථාවේ ඒ විසාලා මහනුවර වැසියන් ඇවිත් රජවරුන්ට පැමිණිලි කළා. එතකොට ඒ පිරිස සන්ථාගාරයේ රැස්වීම් ශාලාවේ රැස්වෙලා කළ යුත්ත ගැන සාකච්ඡා කරන අතරේ මහා ඍද්ධිමත්, මහානුභාව සම්පන්න තිලෝගුරු බුදුරජාණන් වහන්සේ කෙනෙක් පහළවෙලා තිබෙනවා - තථාගතයන් වහන්සේ. උන්වහන්සේට අපට පිහිට වෙන්න පුළුවන් කියන ඒ නිගමනයට ඇවිල්ලා ලිච්ඡවි රජවරුන්ගෙන් දෙදෙනෙක් පඬුරුත් සහිතව රජගහ නුවර බිම්බිසාර රජු වෙත යැව්වා. මොකද ඒ අවස්ථාවේ වේළුවනාරාමයේ බුදුරජාණන් වහන්සේ වැඩ සිටියේ. එතකොට එතන කියවෙන හැටියට රජතුමා මේ ගැන උපේක්ෂා වෙලා, තමන්ම ඒක දැනගන්න කියල කිව්ව නිසා ඒ පිරිස ගිහිල්ලා බුදුරජාණන් වහන්සේට ආයාචනයක් කළා. බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් මේක පිළිඅරගෙන, පොත පතේ ඒ ආකාරයට මහා විස්තරයක් සඳහන් වෙනවා. ඒවා කියන්න ගියොත් අපට වඩා වැදගත් දේවල් කියන්න බැරි වෙනවා. කොහොම නමුත් බුදුරජාණන් වහන්සේ විසාලා මහනුවරට වැඩම කළා. විසාලා මහනුවර සීමාව හරියට එනකොටම මහා මේඝ ගර්ජනාවක් වැහැලා ඒ මිනී කුණප ආදිය ගඟට ගසාගන ගියා කියලා තියනවා. ඊළඟට බුදුරජාණන් වහන්සේ නගර දොරටුවේ ඉඳගෙන රතන සූත්‍රය දේශනා කරලා, ආනන්ද ස්වාමීන් වහන්සේට කිව්වා "මේ සූත්‍රයෙන් පිරිත් කරමින් නගරයේ ප්‍රාකාර තුළ හැසිරෙන්න ලිච්ඡවී කුමාරයන් එක්ක" කියලා. ඒක අනුව ආනන්ද ස්වාමීන් වහන්සේ මේ සූත්‍රය පිරිතක් හැටියට සජ්ඣායනා කරමින් වැඩම කරලා අර කියාපු ත්‍රිවිධ භය දුරුකල බව කියනවා. ඕක තමයි කෙටියෙන් කිව්වොත් රතන සූත්‍රයේ නිදාන කථාව.

දැන් මේ රතන සූත්‍රය මේ පින්වතුන් කවුරුත් පරිත්‍රාණයක්, පිරිතක් හැටියට භාවිතා කරනවා. රතන සූත්‍රයේ - අපි විග්‍රහ කරනකොට තේරුම් ගන්න පුළුවන් වෙයි - බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයේ ගැඹුරු ගුණ පිළිබඳව සත්‍යක්‍රියා ස්වරූපී ගාථා මාලාවක් ඇතුළත් වෙන්නේ. එතකොට සත්‍යක්‍රියාවක් නම් සත්‍යය මොකක්ද කියල දැනගන්න සිද්ධ වෙනවා. අර්ථය සත්‍යය හරියට තේරුම් ගන්නේ නැතිව කරන සත්‍යක්‍රියාව ඒ තරම්ම ආනිසංස සම්පන්න නැහැ. ඒක නිසා අපි මේ ඉදිරියට කරන්න බලාපොරොත්තු වන විවරණයේදී ශබ්ද රසයට වඩා අර්ථ රසය ගැන සැලකිලිමත් වෙන්න බලාපොරොත්තු වෙනවා. මේ පින්වතුන් බොහෝ විට පරිවර්තන ආදියෙන් මේවා දැනගෙනත් ඇති. ඒ නමුත් හැකිතාක් දුරට

හැම කෙනකුටම තේරුම් යන ආකාරයට අපි පළමුවෙන්ම මාතෘකාවට කරන ලද ගාථාවට එන්න කලින් රතන සූත්‍රයේ පිළිවෙලින් ගාථා වල අර්ථය කාල වේලා හැටියට විග්‍රහ කරන්න බලමු.

පළමුවෙනි ගාථාව මේ පින්වතුන් කවුරුත් දන්නවා

'යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ
සබ්බෙව භූතා සුමනා භවන්තු
අථොපි සක්කච්ච සුණන්තු භාසිතං'

එතනදී භූතයින් පිළිබඳ ආරාධනාවක් කියවෙන්නේ 'යානීධ භූතානි සමාගතානි භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ' යම් භූමාටු නැත්නම් පොළව ආශ්‍රිත හෝ අහසේ වාසය කරන හෝ භූතයින් මෙතන රැස්වෙලා ඉන්නවා නම් 'සබ්බෙව භූතා සුමනා භවන්තු' ඒ සියලු භූතයෝ සොම්නස් වෙත්වා 'අථොපි සක්කච්ච සුණන්තු භාසිතං' මේ කියන වචනයට මේ භාෂිතයට හොඳට සවන් දෙත්වා.

තස්මා හි භූතා නිසාමෙථ සබ්බෙ
මෙත්තං කරොථ මානුසියා පජාය
දිවා ච රත්තො ච හරන්ති යෙ බලිං
තස්මා හි නෙ රක්ඛථ අප්පමත්තා

'තස්මාහි භූතා' එම නිසා 'නිසාමෙථ සබ්බෙ' හැමදෙනාම කන් දෙන්න 'මෙත්තං කරොථ මානුසියා පජාය' මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි මෛත්‍රී කරන්න. 'දිවා ච රත්තො ච හරන්ති යෙ බලිං තස්මා හි නෙ රක්ඛථ අප්පමත්තා' රෑ දවල් දෙකේ බිලිපූජා ගෙනියනවා නම් යම් මනුෂ්‍යයින්, ඔවුන්ව එම නිසා අප්‍රමාදීව ආරක්ෂා කරන්න. අන්න එතන ඉඳලයි නියම සත්‍යක්‍රියාව ආරම්භ වන්නේ.

යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගෙසු වා යං රතනං පණීතං
න නො සමං අත්ථි තථාගතෙන
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

'යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා සග්ගෙසු වා යං රතනං පණීතං'. මේ ලෝකයේ හෝ අනික් ලෝකවල හෝ දිව්‍ය ලෝක වල හෝ යම් වස්තුවක් යම් උතුම් රත්නයක් වෙයිද, 'න නො සමං අත්ථි තථාගතෙන' ඒ කිසිම රත්නයක් තථාගත රත්නය හා තථාගතයන් වහන්සේ හා සම නැත. 'ඉදම්පි බුද්ධෙ රතනං පණීතං' බුදුරජාණන් වහන්සේ පිළිබඳ රත්න ස්වභාවය මෙයයි. 'එතෙන සච්චෙන සුවත්ථි හොතු' ඒ සත්‍ය බලයෙන් යහපතක්ම වේවා. ඒ බුදු ගුණ අළලා කළ සත්‍යක්‍රියාවයි.

ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො
න තෙන ධම්මෙන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

'ඛයං විරාගං අමතං පණීතං' මේ ඔක්කොම නිවනට යෙදෙන නම් - තණ්හක්ඛයො කියල කියනව නිවනට 'තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං' කියනව. ඒක මේ පින්වතුන් අහල ඇති. ඛයං - ඒ තෘෂ්ණාව ක්ෂය කිරීමේ ස්වරූප ඇති, 'විරාගං' විරාග කියන එක නිවනටම නමක්, 'අමතං පණීතං' උතුම් වූ අමෘත තත්ත්වය 'යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො' ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ. ඒ යම් අර කියාපු තණ්හා ක්ෂය කිරීමක්, විරාගයක්, උතුම් අමෘත තත්ත්වයක් සමාධිමත්ව ලබා ගත් සේක්ද, 'න තෙන ධම්මෙන සමත්ථි කිඤ්චි' ඒ උතුම් නිර්වාණ ධර්මය හා සමාන කිසිවක් නැත. 'ඉදම්පි ධම්මෙ රතනං පණීතං' මෙයද ධර්මයේ රත්න ස්වභාවයකි. 'එතෙන සච්චෙන සුවත්ථි හොතු'. මේ සත්‍යයෙන් යහපතක්ම වේවා!

'යං බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං'
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තෙන සමො න විජ්ජති
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු'.

'යං බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං සමාධිමානන්තරික-ඤ්ඤමාහු' බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ යම් සමාධියක් නිරන්තරයෙන්ම

වර්ණනා කළ සේක්ද, යම් සමාධියක් නුවණැත්තෝ ආනනතරික යයි කියත්ද 'සමාධිනා තෙන සමො න විජ්ජති' ඒ සමාධිය හා සමාන සමාධියක් නැත. 'ඉදම්පි ධම්මෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු'. මෙයද ධර්මයේ උතුම් වූ රත්න ස්වභාවයකි. ඒ සත්‍යයෙන් යහපතක්ම වේවා!

දැන් මෙතන කියන කාරණය ටිකක් විස්තර කරන්න වෙනවා. මෙතන මේ කියන්නේ මාර්ග සමාධිය ගැන. 'යං බුද්ධ සෙට්ඨො පරිවණ්ණයී සුචිං' යම් පිරිසිදු වූ සමාධියක් බුදුරජාණන් වහන්සේ නිරන්තරයෙන් වර්ණනා කළ සේක්ද, බුද්ධාදී රහතන් වහන්සේලා එය හඳුන්වන්නේ ආනනතරික සමාධිය කියලා. 'ආනනතරිකං යං ආහු' එය ආනනතරික නමින් හැඳින්වෙනවා. ඒ සමාධියට කිසිම සමාධියක් සම වෙන්නේ නැහැ කියල ප්‍රකාශ කරල තියනවා. ඒ කියන්නේ ලෝකෝත්තර වශයෙන්. ලෝකෝත්තර මාර්ග සමාධිය පිළිබඳව සඳහන් වෙන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ - මේ පින්වතුන් දන්නවා - මේ මාර්ග අංග අටම එක සිතක ඉතාම ප්‍රබල අන්දමින් පහළ වන අවස්ථාවක් තමයි ඒ ලෝකෝත්තර මාර්ගය. ඒ මාර්ගයට අනතුරුවම ඵලයට වැටෙනවා. ඒකයි ඒකට ආනනතරික සමාධිය කියලා කියන්නේ. ඒ මාර්ගය හා සමගම ඊට අනතුරුවම ඵලයට වැටෙනවා. ඒ සමාධිය ලෞකික වෙනත් කිසිම සමාධියකට සමවන්නේ නැහැ. ඒකයි මෙතන අදහස 'සමාධිනා තෙන සමො න විජ්ජති' මේ මාර්ග සමාධියයි. ධර්මයේ මාර්ග පැත්තයි මේ ප්‍රකාශ කරන්නේ.

'යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි එතානි යුගානි හොන්ති
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
එතෙසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු'

'යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා' යම් පුද්ගලයින් අටදෙනෙක් සත්පුරුෂයින් විසින් ප්‍රශංසා කරල ලදද 'චත්තාරි එතානි යුගානි හොන්ති' ඒ අටදෙනා යුග හතරක් බවට පත්වෙනවා. මෙතන යුගල හතරක් තිබෙනවා. 'තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා' සුගතයන් වහන්සේගේ දක්ෂිණාර්හ වූ පුද පඬුරු ලැබීමට සුදුසු වූ ශ්‍රාවකයෝ

වෙත්ද, 'එතෙසු දින්නානි' මේ සංඝයා වහන්සේලා කෙරෙහි දෙන ලද්ද - දෙන ලද දනය 'මහප්ඵලානි' මහත් ඵල වෙනවා. 'ඉදම්පි සංඝෙ රතනං පණීතං' මෙයද සංඝයා වහන්සේලා පිළිබඳ උතුම් වූ රත්න ස්වභාවයකි. 'එතෙන සච්චෙන සුවත්ථි හොතු'. මේ සත්‍යයෙන් යහපතක්ම වේවා.

'යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන
නික්කාමිනො ගොතම සාසනම්හි
තෙ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු'

'යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන නික්කාමිනො ගොතම සාසනම්හි' - ඒ සංඝයා වහන්සේලා පිළිබඳවයි කියන්නේ යම් කෙනෙක් ගෞතම ශාසනයෙහි 'මනසා දළ්හෙන' දැඩි මනසකින් දැඩි අධිෂ්ඨානයකින් 'නික්කාමිනො' කාය ජීවිත නිරපේක්ෂකව 'සුප්පයුත්තා' වීර්‍ය කිරීම් වශයෙන් මැනවින් යෙදෙද්ද 'තෙ පත්තිපත්තා අමතං විගය්හ' ඔවුහු අරහත් ඵලය නමැති ඒ ප්‍රාප්තියට, ඒ තැනට පැමිණිලා 'අමතං' විගය්හ අමෘත නමින් හැඳින්වෙන ඒ නිවනට බැහැගෙන 'ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා' මුධා කියන්නේ වියදමක් නැතිව නොමිලයේම ලැබගත් ඒ නිවීම භුක්ති විඳින්නාහුය. 'ඉදම්පි සංඝෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු' මෙයද සංඝයා වහන්සේලා පිළිබඳ වූ උතුම් රත්න ස්වභාවයකි. මේ සත්‍යයෙන් යහපතක්ම වේවා!

මෙතන ප්‍රකාශ කරන්නේ දැඩි වීර්යයෙන් මේ ශාසනයේ යෙදෙන අය 'යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන - නික්කාමිනො ගොතම සාසනම්හි තෙ පත්තිපත්තා' - ඔවුන් ඒ අර්හත් තත්ත්වයට පැමිණිලා ලද්ධා මුධා නිබ්බුතිං ඔවුන් ලබන්නේ නිවීමක්. ඒ නිවීම කිසිම වියදමක් නැතිව ලැබුණු එකක්. දැන් ලෝකයේ අනෙකුත් තෘෂ්ණා ආදී ආශාවන් - ඒ දැවීම් - යම් යම් දේවල් ලබා ගැනීමට තිබෙන ඒ දැවීම් ඒවා නිවෙන්නේ කීයක් හරි වියදම් කරලා ඒවා ලබාගත්තහම. නමුත් **මේ කියන නිවීම ලැබෙන්නේ හැම දෙයක්ම අත හැරීමෙන්. ඉබේම ලැබෙන නිවීමක්** 'මුධා' කියන්නේ ඒකයි. නොමිලේම ලැබෙන නිවීම

ලබාගෙන ඒක පරිභෝග කරනවා අරහත් ඵල සමාපත්තියෙන්. එයත් සංඝයා වහන්සේලා පිළිබඳ ගුණයක් හැටියට දක්වන්නේ.

'යථින්දඛීලො පඨවිං සිතො සියා
චතුබ්භි වාතෙහි අසම්පකම්පියො
තථූපමං සප්පුරිසං වදමි
යො අරිය සච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු'

'යථින්දඛීලො පඨවිං සිතො සියා - චතුබ්භි වාතෙහි අසම්පකම්පියො' යම්සේ, ඉන්ද්‍රඛීල කියන්නේ අතීතයේ නගර දොරටු වල සිටුවන ලද දැඩි කණුවක්, ටැඹක්. යථා ඉන්දඛීලො - යථින්දඛීලො පඨවිං සිතො සියා - පොළවේ හොඳට බහින හැටියට සිටවපු ටැඹක් 'චතුබ්භි වාතෙහි අසම්පකම්පියො' සතර දිසාවෙන් එන කුණාටු වලින් කම්පාවෙන්නේ නැහැ 'තථූපමං සප්පුරිසං වදමි යො අරිය සච්චානි අවෙච්ච පස්සති' ඒ සත් පුරුෂයා-සෝවාන් ආර්ය පුද්ගලයා, අවබෝධයෙන් ප්‍රඥාවෙන් ආර්ය සත්‍යයන් අවබෝධ කර ගනීද, ඒ පුද්ගලයා අන්න අර ඉන්ද්‍රඛීලයට සමකොට කියමි. 'තථූපමං සප්පුරිසං වදමි, යො අරිය සච්චානි අවෙච්ච පස්සති. ඉදම්පි සංඝෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු' මෙයද සංඝයා වහන්සේලා පිළිබඳ උතුම් රත්න ස්වභාවයයි. මේ සත්‍යයෙන් යහපතක්ම වේවා!

'යෙ අරියසච්චානි විභාවයන්ති
ගම්භීරපඤ්ඤෙන සුදෙසිතානි
කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා
න තෙ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු'

'යෙ අරියසච්චානි විභාවයන්ති ගම්භීරපඤ්ඤෙන සුදෙසිතානි' ගම්භීර ප්‍රාඥ වූ බුදුරජාණන් වහන්සේ විසින් මනාකොට දේශනා කරන ලද ආර්ය සත්‍යයන් යම් කෙනෙක් අවබෝධ කර ගනිත්ද, කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා - ඉදින් ඔවුහු බොහෝසේ ප්‍රමාද වූවාහු නමුත් 'න තෙ භවං අට්ඨමං ආදියන්ති' අටවන භවයක් ඔවුන් ගන්නේ

නැහැ. 'ඉදම්පි සංඝෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු'. මෙයද සංඝයා පිළිබඳ උතුම් වූ රත්න ස්වභාවයකි. ඒ සත්‍යයෙන් යහපතක්ම වේවා. මේ කිව්වෙ සෝවාන් පුද්ගලයා පිළිබඳවයි. ඒ ආර්ය සත්‍යයන් - චතුරාර්ය සත්‍යයන් පළමුවෙනි වරට අවබෝධ කර ගත්තු එහෙම නැත්නම් ඒ නිවන ඇතින්ම දුටුව, ඒ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද චතුරාර්‍ය සත්‍යය ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ කර ගත්තු අය, 'කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා'.

මෙතන විග්‍රහ කළ යුතු යමක් තියනවා. ඉදින් ඔවුහු බොහෝ සෙයින් ප්‍රමාදයට වැටුණේ වී නමුත් අටවෙනි භවයක් ගන්නේ නැහැ. සෝවාන් පුද්ගලයා පිළිබඳව තිබෙනවා විග්‍රහයක්. ඇතැම් කෙනෙක් සෝවාන් වෙලා ඒ භවය තුළ ඊට ඈතට යන්නේ නැහැ. මේ පින්වතුන් දන්නවා නේ විශාඛා ආදී ඒ අයට කියන්නේ 'පමාද සේඛ' කියලා. ඒ අය සෝවාන් වුණා ඊට එහා සකදාගාමී ආදී තත්ත්ව වලට යන්නෙ නැහැ.

එබඳු අය මිය පරලොව ගියාට පස්සේ පන්ති තුනකට වැටෙනවා. අපි එහෙම කියමු. පන්ති තුනකට වැටෙනවා. ඒ සෝවාන් පුද්ගලයාගේ කෙළවර තියෙන්නේ අන්තිමට වැඩිම උනොත් හත් වරයි. ඒකයි මෙතන කියල තියෙන්නේ. නැවතත් අටවෙනි භවයකට යන්නෙ නැහැ. ඒ කියන්නේ පමාද සේඛ කෙනෙක්, මේ ජීවිතයේදී ඉහළ මාර්ගඵල වලට ගියේ නැහැ. මිය ගියාට පස්සේ බුදුරජාණන් වහන්සේ දක්වනවා, ගණ තුනකට අයිති වෙනවා '**එකබීජී, කොලංකොලො, සත්තක්ඛත්තුපරම**' කියලා. එකබීජී කියලා කියන්නේ ඇතැම් සෝවාන් කෙනෙක් නැවත එක භවයයි ගන්නේ. හුඟක් ඔය සද්ධා ආදී ඉන්ද්‍රියයන් දියුණු කළ අය වෙන්න ඇති එකබීජී. කොලංකොලො කියන සෝතාපන්න පුද්ගලයා කුල දෙකක් තුනක් ඒ කියන්නේ නැවත භව උත්පත්ති දෙකක් තුනක් අරගෙන සසර දුක් කෙළවර කරනවා රහත් වෙනවා. සත්තක්ඛත්තුපරම කියන්නේ ඊටත් වඩා ප්‍රමාද වූ කෙනා වැඩිම උනොත් හත්සැරයයි. අන්න ඒ ධර්මතාව අනුවයි මෙතන කියන්නේ. 'න තෙ භවං අට්ඨමං ආදියන්ති' අටවෙනි භවයක් ගන්නෙ නැහැ. ඒකත් සත්‍යයක්. ඒක නිසයි ඒක සත්‍ය ක්‍රියාවක් උනේ. එතෙන සච්චෙන සුවත්ථි හොතු'. ඒ සත්‍යයෙන් යහපතක්ම වේවා!

'සභාවසස දසසන සමපදය
තයසසු ධමමා ජහිතා භවනති
සකකායදිටඨි විචිකිචඡිතං ච
සීලබබතං වා'පි යදත්ථි කිඤචි

චතූහපායෙහි ච විපපමුතෙතා
ඡ චාභිඨානානි අභබබො කාතුං
ඉදමපි සංඝෙ රතනං පණීතං
එතෙන සචෙචන සුවතථි හොතු'

'සභාවසස දසසන සමපදය තයසසු ධමමා ජහිතා භවනති', සහ එම අසස දසසන සමපදය - ඒ සෝවාන් පුද්ගලයාගේ දර්ශන සම්පත්තිය හා සමඟම, 'තයසසු ධමමා ජහිතා භවනති' 'තයො ධමමා' ධර්ම තුනක් අතහැරියා වෙනවා. ඒවා නැති වෙනවා ප්‍රහීන කළා වෙනවා. මොනවද ඒ 'සකකාය දිටඨි විචිකිචඡිතං ච සීලබබතං වා'පි යදත්ථි කිඤචි' - සකකාය දිට්ඨිය, විචිකිචඡාව, සීලබබත පරාමාස. මේ පින්වතුන් අහල තියනවා ඔය සංයෝජන තුනක් සෝවාන් පුද්ගලයා නැති කරන බව. අන්න ඒකයි මේ කියන්නේ 'චතූහපායෙහි ච විපපමුතෙතා'. ඒ වගේම ඒ පුද්ගලයා සතර අපායෙන් මිදෙනවා. 'ඡ චාභිඨානානි අභබබො කාතුං' ඡ ච අභිඨානානි අභබබො කාතුං - අභිඨාන කියන්නේ පින්වතුනි, මේ ධර්මයේ තියනවා සෝවාන් පුද්ගලයාට කළ නොහැකි දැඩි පාප කර්ම හයක්. ඒවා හඳුන්වන්නේ අභිඨාන නමින්. ඡ කියන්නේ හය. ඒ අභිඨාන නමින් හැඳින්වෙන දැඩි පාප කර්ම සෝවාන් පුද්ගලයා විසින් නොකළ හැකිය කියන එක තමයි ඡ චාභිඨානානි අභබබො කාතුං. අභව්‍ය - ඒ පිළිබඳ අභව්‍යතාව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියනවා.

මොනවද ඒ හය? මව මැරීම, පියා මැරීම, රහතන් වහන්සේ කෙනකුගේ දිවි තොර කිරීම, බුද්ධ ශරීරයෙන් ද්වේශ සහගතව ලේ සෙල්වීම, සංඝ භේදය, අවසානයට කියන්නේ අනෙකුත් ශාස්තෘවරයෙකුගේ සරණ යාම මේ මගේ ශාස්තෘන් වහන්සේය කියලා බුදුරජාණන් වහන්සේ හැර වෙනත් කෙනෙක් දැක්වීම. එබඳු ඒ හය කරන්න අභව්‍යයි, කළ නොහැකියි සෝවාන් පුද්ගලයාට. ඒකත් සත්‍යයක්. ඉදමපි සංඝෙ රතනං පණීතං එතෙන සචෙචන සුවතථි

හොතු. මෙයද සංඝයා වහන්සේලා පිළිබඳ උතුම් රත්න ස්වභාවයක්. ඒ සත්‍යයෙන් යහපතක්ම වේවා!

'කිඤ්චාපි සො කම්මං කරොති පාපකං
කායෙන වාචා උද චෙතසාවා
අභබ්බො සො තස්ස පටිච්ඡාදය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු'

'කිඤ්චාපි සො කම්මං කරොති පාපකං' ඒ සෝවාන් පුද්ගලයා ඉදින් පාප කර්මයක් කළේ වී නමුත් 'කායෙන වාචා උද චෙතසාවා', කයින්, වචනයෙන් හෝ සිතින් යම් පාප කර්මයක් කළේ වී නමුත් 'අභබ්බො සො තස්ස පටිච්ඡාදය අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා'. ඒ සෝවාන් පුද්ගලයා එය වසන් කිරීමට නොහැක්කේ වෙයි. දිට්ඨපද කියල කියන්නේ නිවන. නිවන දුටුවා වූ ඒ සෝවාන් පුද්ගලයා පිළිබඳව අභව්‍යතාව - නොකළ හැකි බව කියන ලද්දේමය. බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද්දේමය. 'ඉදම්පි සංඝෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු' මෙයත් සංඝයා වහන්සේලා පිළිබඳ උතුම් රත්න ස්වභාවයක්. ඒ සත්‍යයෙන් යහපතක්ම වේවා!

'වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ
ගිම්හාන මාසෙ පඨමස්මිං ගිම්හෙ
තථූපමං ධම්මවරං අදෙසයි
නිබ්බානගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු'

ලස්සන උපමාවක් එතන බුදුරජාණන් වහන්සේ දෙන්නේ 'වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ ගිම්හාන මාසෙ පඨමස්මිං ගිම්හෙ' - යම්සේ ග්‍රීෂ්ම ඍතුවෙහි ප්‍රථම මාසයෙහි වන ලැහැබෙක අතු අග මල් පිපිල තියෙනවද 'තථූපමං ධම්මවරං අදෙසයි'. අන්න එබඳු වූ ඒ උපමාව බුදුරජාණන් වහන්සේ දීල තියෙන්නේ උන්වහන්සේ දේශනා කළ පර්යාප්ති ධර්මයටයි. අන්න එබඳු වූ ධර්මයක් බුදුරජාණන් වහන්සේ

දේශනා කරල තියනවා. 'ඉදම්පි බුද්ධෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු'. මෙයද බුදුරජාණන් වහන්සේ පිළිබඳ උතුම් රත්න ස්වභාවයයි. ඒ සත්‍යයෙන් යහපතක්ම වේවා!

'වරො වරඤ්ඤූ වරදෙ වරාහරො
අනුත්තරො ධම්මවරං අදෙසයි
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු'

'වරො' කියන්නේ උතුම් වූ. එතන බුදුරජාණන් වහන්සේට විශේෂණයක් හැටියටයි ඒ වචනය යෙදෙන්නේ. උතුම් වූ 'වරඤ්ඤූ' උතුම් වූ නිවන දන්නා වූ, 'වරදෙ' උතුම් වූ නිවන දෙන්නා වූ, 'වරාහරො' උතුම් වූ නිවන ගෙන එන්නා වූ, 'අනුත්තරො ධම්මවරං අදෙසයි'. අනුත්තර උත්තරීතර බුදුරජාණන් වහන්සේ, උතුම් වූ ධර්මයක් දේශනා කළ සේක. 'ඉදම්පි බුද්ධෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු'. මෙයද බුදුරජාණන් වහන්සේ පිළිබඳ උතුම් රත්න ස්වභාවයකි. මේ සත්‍යයෙන් යහපතක්ම වේවා!

ඊළඟට අපි මාතෘකා කළ ගාථාවට එනම්;

'ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං
තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථා'යං පදීපො
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු'

'ඛීණං පුරාණං' පැරණි යමක් තිබුණා නම් එය ක්ෂය වුණා. 'නවං නත්ථි සම්භවං' අලුතින් හට ගැනීමක්ද නැත. 'විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං' මේ රහතන් වහන්සේලා ගැන කියන්නේ. උන්වහන්සේලා 'ආයතිකෙ භවස්මිං' අනාගත භවයක් පිළිබඳව නොඇලුණු සිත් ඇත්තාහු. 'තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා' ඒ ඛීණ බීජ වූ. ඒවා පසුවෙලා තේරුම් කරනවා. ඒ බීජය ක්ෂය කළා වූ 'අවිරූළ්හිච්ඡන්දා' ඡන්දය, ආශාව නැවත නොවැඩෙන ස්වභාවයක් ඇත්තා වූ 'නිබ්බන්ති ධීරා යථා'යං පදීපො', ඒ රහතන් වහන්සේලා, ඒ

ධීරයන් වහන්සේලා, ඒ ප්‍රාඥයෝ මේ පහන මෙන් නිවී යෙත්. 'ඉදමපි සංඝෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු'. මෙයද සංඝයා වහන්සේලා පිළිබඳ උතුම් රත්න ස්වභාවයයි. මේ සත්‍යයෙන් යහපතක්ම වේවා!

ඊළඟට තිබෙන ගාථා තුන සාමාන්‍යයෙන් නමස්කාර ගාථා තුනක්. අටුවා වල තිබෙන හැටියට මේ සජ්ඣායනා වෙන් පස්සේ ශක්‍ර දේවේන්ද්‍රයාත් ඒ භූතයනුත් එකතු වෙලා තුණුරුවන් නැමදීමට පාවිච්චි කළ ගාථා තුනක් හැටියටයි කියවෙන්නේ.

'යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාගතං දෙව මනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හොතු'

අර කලින් කිව්ව ආකාරයට භූමියේ වසන්නාවූත්, අහසේ වසන්නාවූත් යම් භූතයින් මෙතන රැස් වූවාහුද 'තථාගතං දෙව මනුස්ස පූජිතං' දෙවියන් හා මනුෂ්‍යයින් විසින් පුදනා ලද තථාගතයන් වහන්සේට, ඒ බුදුරජාණන් වහන්සේට නමස්කාර කරමු.

'යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාගතං දෙව මනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හොතු'

ඉස්සෙල්ල විදියටමයි යම් භූමියේවූ හෝ අහසේ සිටිනා වූ භූතයින් මෙතන රැස්වී සිටිනවාද අපි සැවොම, ඒ කියන පුද්ගලයාත් මේ පිරිසට එකතු වෙලා. ඒකයි අර ශක්‍ර දේවේන්ද්‍රයාත් එකතු වුනා කියල කියන්නේ. තථාගතං දෙව මනුස්ස පූජිතං ධම්මං නමස්සාම සුවත්ථි හොතු - තථාගතයන් වහන්සේගේ දෙව් මිනිසුන් විසින් පුදන ලද්ද වූ ධර්මයට නමස්කාර කරමු. යහපතක්ම වේවා!

තුන්වෙනුව කියන්නේ;

'යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාගතං දෙව මනුස්ස පූජිතං
සංඝං නමස්සාම සුවත්ථි හොතු'

යම්තාක් බූමාටු හෝ අහසේ වසන්නා වූ හෝ භූතයෝ මෙහි රැස්ව ගත්තාහුද, 'තථාගතං දෙව මනුස්ස පූජිතං සංඝං නමස්සාම සුවත්ථි හොතු' දෙවි මිනිසුන් විසින් පුදනා ලද තථාගත සංඝයා වහන්සේලාට නමස්කාර කරමු. සංඝ රත්නයට නමස්කාර කරමු.

ඔය අපි කිව්වේ රතන සූත්‍රයයි. අපි කලින් ප්‍රකාශ කළ ආකාරයට **මේක සත්‍යක්‍රියාව පදනම් කරගත්තු ආරක්‍ෂක මන්ත්‍රයක්.** එබඳු දේවල් වලට මේ ශාසනයේ ඉඩ තිබෙන බව ඇතැම් කෙනෙක් මේවා ප්‍රශ්න කරන නිසා කියන්න වෙනවා. **බුදුරජාණන් වහන්සේ බොහෝ අවස්ථා වල මේ බුදු ගුණ වල මහිමය ප්‍රකාශ කරල තියනවා.** 'අග්ගප්පසාද' ආදී සූත්‍රවල. යම්තාක් සත්ත්වයින් සිටිනවා නම් අපා, දෙපා, සිවුපා, බුහුපා, රූපී, අරූපී, සඤ්ඤී, අසඤ්ඤී, නෙවසඤ්ඤී, නාසඤ්ඤී වශයෙන්, ඒ සියලු සත්ත්වයන් අතර තථාගතයන් වහන්සේ, තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ අග්‍රයි. යම් කෙනෙක් ඒ තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව, ප්‍රසාදය ඇතිකර ගන්නවා නම් ඒ ඇතිකර ගත්තේ අග්‍ර වූ පුද්ගලයා පිළිබඳ ශ්‍රද්ධාවයි. ප්‍රසාදයයි. 'අග්ගෙ බො පන පසන්නානං අග්ගො විපාකො හොති' අග්‍ර වූ තථාගතයන් වහන්සේ - බුදුරජාණන් වහන්සේ පිළිබඳ ප්‍රසාදය ඇතිකර ගත්තොත් ඒකෙ විපාකත් ඒ වගේම අග්‍රයි. ඒ විදියටම ප්‍රකාශ කරනවා 'යාවතා භික්ඛවෙ ධම්මා සංඛතා අරියො අට්ඨඞ්ගිකො මග්ගො තෙසං අග්ගමක්ඛායති'. යම්තාක් සංඛත ධර්මයන් තිබේ නම් ඒ සංඛත ධර්ම අතර ආර්ය අෂ්ටාංගික මාර්ගය ශ්‍රේෂ්ඨයි. අග්‍රයි. යම් කෙනෙක් ආර්ය අෂ්ටාංගික මාර්ගය කෙරෙහි ප්‍රසාදයක් ඇතිකර ගන්නවා නම් ඒ ඇතිකර ගත්තේ උතුම්ම වස්තුවක් කෙරෙහි ප්‍රසාදයයි. එහි ආනිසංසත් විපාකත් ඒ වගේමයි.

ඒ වගේම ප්‍රකාශ කරනවා හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් හා හේතු ප්‍රත්‍යයන්ගෙන් හට නොගත් - සංඛත - අසංඛත ධර්මයන් වේ නම් ඒවා අතර අසංඛත වූ විරාගය නම් වූ නිර්වාණයම ශ්‍රේෂ්ඨයි.

උතුම් වූ ඒ නිර්වාණය කෙරෙහි ප්‍රසාදය ඇතිකර ගත්තොත් එහි ආනිසංසත් ඒ වගේමයි.

ඊළඟට කියනවා යම්තාක් ලෝකයේ සමූහයන් ගණයන් - පිරිස් සිටිනවා නම් ඒ පිරිස් අතර තථාගත සංඝයා වහන්සේලා අග්‍රයි. යම් කෙනෙක් ඒ අග්‍ර වූ සංඝයා වහන්සේලා ගැන ප්‍රසාදයක් ඇතිකර ගන්නවා නම් එහි විපාකත් අග්‍රයි. ඔන්න එතකොට **ත්‍රිවිධ රත්නය වගේම මාර්ග සත්‍යය හා නිර්වාණ සත්‍යය පිළිබඳව විශ්වාස කිරීම, ප්‍රසාදය ඇතිකර ගැනීම පවා ආනිසංස සම්පන්න බව ප්‍රකාශ වෙනවා.**

ඒ වගේම ඇතැම් විට මේ පින්වතුන් පිරිත් පොත් වල තිබෙන නිසා දන්නවත් ඇති **ධජග්ග පරිත්‍රාණය** කියලා පරිත්‍රාණයක් පිරිතක් තියනවා. ඒ පිරිත් දේශනය බුදුරජාණන් වහන්සේ විශේෂයෙන් දේශනා කළේ නඩුහබ වලින් මිදෙන්න වාගේ දේවල් වලට නොවෙයි. නිවන සඳහා උත්සාහ කරමින්, 'අරඤ්ඤගතො වා, රුක්ඛමූලගතො වා, සුඤ්ඤාගාරගතො වා' ආදී වශයෙන්, ආරණ්‍යගතව, රුක්ඛමූලගතව, සුඤ්ඤාගාරගතව ඉන්න සංඝයා වහන්සේලාට බණ භාවනා කරන අවස්ථාවේදී යම්කිසි හේතුවක් නිසා 'භයං වා, ඡම්භිතත්තං වා, ලොමහංසො වා' බියක්, තැති ගැනීමක්, ලොමුඩැහැගැනීමක් ඇතිවන අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මා මෙනෙහි කරන්න, මා සිහි කරන්න කියලා. 'මමෙව තස්මිං සමයෙ අනුස්සරෙය්‍යාථ'. මා ගැන සිහිය යොදන්න. කොහොමද සිහි කරන්නෙ? මේ පින්වතුන් දන්නවා 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො' ආදී වශයෙන්. එතකොට ඒ කැලේ වෘක්ෂමූලගතව සුඤ්ඤාගාරගතව ඒ විදියට ඉන්න සංඝයා වහන්සේලාට භාවනාවේදී යම් උපද්‍රවයක් බියක් තැතිගැන්මක් ඇති උනොත් බුදුරජාණන් වහන්සේ අවසර දීල තියනවා ඒ විදියට බුදුරජාණන් වහන්සේ මෙනෙහි කරන්නය. ඒ මෙනෙහි කිරීම තුළින්, සිහිපත් කිරීම තුළින් ඒ භය තැති ගැන්ම ලොමුඩැහැ ගැනීම නැතිවෙලා යනවා කියලා.

ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා යම් හෙයකින් මා මෙනෙහි කරන්න බැරිනම්, මා සිහිපත් කරන්න බැරිනම් මේ සද්ධර්මය - ධර්මය සිහිකරන්න. ඉස්සෙල්ලා නව ගුණය, දැන් හය ගුණයකින් යුතු ධර්මය මෙනෙහි කරන්න 'ස්වාක්ඛාතො' ආදී පාඨයයි සඳහන් වෙන්නේ. ඒ මෙනෙහි කිරීම තුළිනුත් අර බිය තැති ගැන්ම

ලොමුඩැහැ ගැනීම නැතිවෙනවා. ඒත් බැරිනම් මාගේ සංඝයා වහන්සේලා - තථාගත සංඝයා වහන්සේලා මෙනෙහි කරන්න 'සුපටිපන්න' ආදී වශයෙන්. එතකොටත් අර විදියේ තැති ගැනීම් නැති වෙනවා. එයිනුත් අපට පේනවා ඔය ධජග්ග පරිත්තයත් ආරක්ෂාව සඳහා සිහිකළ හැකි එකක්.

මේ පින්වතුන් **පරිත්ත** යන වචනය භාවිතා කළත් සමහර විට නිරුක්තිය දන්නෙ නැතිව ඇති. පරිත්‍රාණ කියල කියනවා 'පරි' කියල කියන්නේ අවටින් හාත්පසින් කියන අර්ථයෙන්. 'ත්‍රාණ' කියල කියන්නේ ආරක්ෂාව, **හාත් පසින් ආරක්ෂාව සලසන.** දැන් අර විසාලා මහ නුවරට හාත්පසින් ආරක්ෂාව සැලසුවා. හාත්පස කියන කොට පෙනෙන නොපෙනෙන නා නා විධ දේවල් වෙන්න පුළුවන්. විසාලා මහ නුවර රෝග පීඩා ආදිය මෙන්ම අමනුෂ්‍ය භය ආදිය තිබුණු නිසා. ඒක නිසා භාවනා යෝගීව සිටින සංඝයා වහන්සේලාට ඒ විදියේ අනියම් දේවල් ඇති වෙන්න පුළුවන්. පරිත්‍රාණ - අර විදියේ හාත් පසින් ආරක්ෂාව සලසන විදියට බුදුරජාණන් වහන්සේ මේ පිරිත් දේශනාව අනුමත කරල තියනවා.

ඒ වගේම **අපේ ආරක්ෂාවට බුදුරජාණන් වහන්සේ දේශනා කළ මේ පිරිත ආරක්ෂා කර ගැනීම අපෙත් යුතුකමක්.** මොකද එහෙම කියන්නේ ශත වර්ෂ ගණනක් තිස්සේ බොහොම දුකසේ ඒ භාණක පරම්පරාව කට පාඩමින් ප්‍රවේසමින් ආරක්ෂා කරන ලද මේ පිරිත් දේශනා දැන් නා නා විධ බලපෑම් නිසා සමහර විට නොයෙකුත් සංගීත රැළි වලට අහුවෙලා - අර පිරිත් දේශනා දියවෙලා යනවා. අර්ථ රසය වෙනුවට ශබ්ද රසය කුළු ගැන්වෙනවා. ඒ විදියේ දෙයක් සමාජයේ වෙනවා. බොහෝ විට මේ පින්වතුන් වැඩිය ඇදිල යන්නේ ඒවටයි. සංගීතයට කොහොමටත් ඇදෙන එක පොඩි නිදහසට කරුණක් තියනවා අපි පිරිත් අහනවා කියලා. ඒත් සංගීතයක්. ඒක පසුබිම් සංගීතයක්. එතකොට මොකක්ද වෙන්නේ, අර්ථය දන්නෙම නැතුව ගිලිහිලා යනවා. අර්ථ රසය නැතිවෙලා යනවා. අර තරම් අමාරුවෙන් රැක ගෙන ආපු අල්පප්‍රාණ මහප්‍රාණ භේද ඇතිව බොහොම දුකසේ සංඝයා වහන්සේලා නිදි වරාගෙන දුර්භික්ෂ, නියං සායවල් මැද කට පාඩමින් රැකගත ආපු එක, දැන් මේ තරම් යන්ත්‍ර

සූත්‍ර තියන යුගයක, අපි ඒක දූෂණය කරනවා නම් කොහොමද ඒ වැඩේ.

ඔන්න ඔය නිසා තමයි පින්වතුනි, විශේෂයෙන්ම රතන සූත්‍රයේ තියෙන්නේ සත්‍යක්‍රියාවක්. **බුදු ගුණ මෙනෙහි කරන්න නම් බුදු ගුණ පිළිබඳ ශ්‍රද්ධාවත් ඇතිකර ගන්න ඕන.** නිකම් මන්ත්‍ර නොවේ. ඇතැම් ආගම් වල මේ පින්වතුන් දන්නවා ඔය හින්දූන්ගේ හෙම, ඔවුන්ගේ තියනවා මන්ත්‍ර ඔය අථර්ව වේද ආදියේ. බලනකොට කිසිම අර්ථයක් නැහැ. නිකම් ශබ්ද මාලාවක් විතරයි. ඒකෙ යම්කිසි ගුප්ත ගූඪ බලයක් තියනවා කියලා විශ්වාස කරනවා. ඒවා බුදුරජාණන් වහන්සේ බොහෝ විට ප්‍රතික්ෂේප කරනවා. ඒ වෙනුවට අර්ථවත් යමක් ඉදිරිපත් කරනවා. අපි මේ පින්වතුන්ට කලින්ම කියල ඇති මෛත්‍රී භාවනාවේ ඒ අර්ථ රාශිය.

ඒ වගේම කියල ඇති **මහා මංගල සූත්‍රය** අර්ථවත් කළ හැටි. අර දිට්ඨ මංගල, සුත මංගල, මුත මංගල කියල ඒ කාලයේ තිබුණු මිථ්‍යාමත ඉවත් කරලා අර්ථවත් මංගල කරුණු සමූහයක් බුදුරජාණන් වහන්සේ, තමන්ම තමන්ගේ යහපත හදගන්න ආකාරය, ආත්මාරක්ෂාව සකස් කර ගන්නා ආකාරය එතන දක්වූවා. මේ රතන සූත්‍රයේ තමන්ට නොපෙනෙන නොයෙකුත් බලවේග පවා අර ත්‍රිවිධ රත්නයේ බලයෙන් අපරිමිත ගුණ මහිමයෙන් මට්ටු කිරීමේ ශක්තියක් මෙහි තිබෙන්නේ. විශේෂයෙන්ම මෙතන කියවෙන්නේ සත්‍යයේ බලයයි. බුද්ධ කාලයේ පමණක් නොවේ බුද්ධෝත්පාද කාල වල පමණක් නොවේ, අපට ජාතක කථාවල දනගන්න ලැබෙන හැටියට මේ සත්‍යක්‍රියාව කියන එක අබුද්ධෝත්පාද කාල වල පවා විශ්වයේ පවතින යම්කිසි ශක්තියක්. සත්‍යය ශක්තියක්. ශක්තියක් නැති ක්‍රියාවක් නැහැනෙ. සත්‍යය මොකක්ද වත් දන්නෙ නැතිව සජ්ඣායනා කරනවා නම් එතන සත්‍යක්‍රියාවක් නැහැනෙ. අන්න ඒක නිසා තමයි අපි මෙච්චර වෙහෙස වුණේ මේ පින්වතුන් කාටත් සමහර විට කටපාඩම් හොඳට සජ්ඣායනා කරන මේ ගාථාවල අර්ථය මතු කරලා දෙන්න.

අර කියාපු කාරණය නිසා මේ ශබ්ද රසය ඉස්මතු වෙනවා. සමහර විට පිරිත් සජ්ඣායනාවේදී ඒ වචන වල අර්ථය මැකිල යන ආකාරයට එහෙමත් සජ්ඣායනා වෙනවා දන්. අපි මේව කියන්නේ

ශාසනයේ කාටවත් පහර ගහන්න නොවෙයි. මේ ශාසනය රැක ගැනීමේ ආශාවෙන්.

ඉතින් මේ පින්වතුනුත් ඒවාට ධෛර්යය දුන්නොත් ඒවායේ තියන අර්ථ රසය, ගම්භීර අර්ථය යටපත් වෙනවා. **කොයි තරම් ගැඹුරු අර්ථ සමුදායක්ද මේ රතන සූත්‍රය තුළ තියෙන්නේ කියන එක දැන් මේ පින්වතුන්ට පැහැදිලි වෙන්න ඇති.** දැන් ඒ ටික කිව්වේ තවත් අමතර විස්තර වශයෙන්.

දැන් අපි මාතෘකා වශයෙන් මතුකළ ගාථාවේ තව විස්තර ටිකක් විශේෂයෙන් කිව්වොත්, 'ඛීණං පුරාණං නවං නත්‍ථි සම්භවං' - මේ පුරාණ කියන එක, අපට කියන්න පුළුවන් පැරණි කර්ම කියලා. එතකොට පැරණි කර්ම ක්ෂය කළා නම් බුදු, රහතුන් වහන්සේලාට කර්ම විපාක දෙන්නේ කොහොමද කියලත් ඇතැම් කෙනෙක් අහන්නත් පුළුවන්. ඇතැම් කෙනෙක් කියනවා බුදු, රහතුන් වහන්සේලාට කර්ම විපාක දෙන්නේ නැහැ කියලා. නමුත් මෙන්න මෙතන යම්කිසි ගැඹුරු කාරණයක් තියනවා. බුදුරජාණන් වහන්සේම එක් අවස්ථාවක සංඝයා වහන්සේලාට දේශනා කළ සූත්‍රයක් 'නව පුරාණානි භික්ඛවෙ කම්මානි දෙසිස්සාමි'. මහණෙනි, මම නුඹලාට දේශනා කරනවා නව, පුරාණ කර්ම. ඒ කියන්නේ නව කර්මයි, පුරාණ කර්මයි.

නමුත් උන්වහන්සේ පළමුවෙන්ම ඉදිරිපත් කරන්නේ විග්‍රහයේදී පුරාණ කර්ම. මොකක්ද මහණෙනි, පුරාණ කර්ම කියල කියන්නේ. ඔන්න එක එකක් දක්වනවා. '**චක්ඛුං භික්ඛවෙ පුරාණං කම්මං අභිසංඛතං, අභිසංචෙතයිතං වෙදනීයං දට්ඨබ්බං**'. මහණෙනි, ඇස කියන්නේ පැරණි කර්මයක්. 'අභිසංඛතං, අභිසංචෙතයිතං' කර්මය තුළින් අපි ඇති කරගත්තු චේතනා ශක්තිය තුළින් ඇති කරගත්තු ඒවගේම 'වෙදනීයං දට්ඨබ්බං' විඳින්න දීපු එකක්.

ඒක දැන් මේ පින්වතුන් හිතල බලන්න ඕන. දැන් මේ පින්වතුන් සමහර විට අහල ඇති චක්ඛුපාල ස්වාමීන් වහන්සේ ගැන. උන්වහන්සේ රහත් වෙනවත් එක්කම ඇස් නැති වුණා. අතීත කර්මයක් නිසා අන්ධ වුණා. ඊළඟට ඊටත් වඩා පැහැදිලි කාරණයක් නේද, මේ කවුරුත් දන්නවානේ බුද්ධ ශාසනයෙහි සිටි ඍද්ධිමතුන් අතර අග්‍ර වූ ඒ මහා මොග්ගල්ලාන මහ රහතන් වහන්සේ ඉතාමත්ම ඈත අතීතයේ,

කියන්නත් බැරි තරම් ඈත අතීතයේ තමන්ගේ මවුපියන් ගහල කුඩු කරල මැරූ ඒ පාප කර්මයට හොරු පන්සියයක් දෙනා ඇවිල්ල ඒ ශරීරය කුඩු කළා. ඇහැ ගැන කියාපුව වගේම අනිත් ඉන්ද්‍රියන් ගැනත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. අපි දැන් කිව්වනේ 'චක්ඛුං භික්ඛවෙ පුරාණං කම්මං අභිසංඛතං, අභිසංචෙතයිතං වෙදනීයං දට්ඨබ්බං'. වෙදනීයං - විඳින්න දීපු එකක්. මේ පින්වතුන් දන්නවා චක්ඛු, සොත, ඝාන, ජිව්හා, කාය, මන - ඇස, කණ, නාසය, දිව, කය, මන. ඔය කියාපු ඉන්ද්‍රිය හයම අපටත් බුදුරජාණන් වහන්සේටත්, රහතන් වහන්සේලාත් ඇතුළුව, ලැබිල තියෙන්නේ 'අභිසංඛතං අභිසංචෙතයිතං' අතීත කර්ම ශක්තීන් නිසා. ඒ වගේම 'වෙදනීයං දට්ඨබ්බං' ඒවා අපිට විඳින්න වෙනවා. **ඒ විඳීම බුදු රහතුන්ටත් සමානයි. එතකොට ඒ විඳීම ඉවරවෙන්නේ කොයි අවස්ථාවෙද? රහතන් වහන්සේලාගේ 'අනුපාදිසෙසා නිබ්බාන ධාතු' කියන අවස්ථාවේදි.** ඒකයි මෙතන කියන්නේ.

ඇතැම් රහතන් වහන්සේලා අර්හත්වය ලබා ගන්නවාත් එක්කම ජීවිතය නැති වෙනවා. ඒ අයට කියන්නේ 'සමසීසී'. එහෙම නැත්නම් ජීවත් වෙන්න වෙනවා. බුදුරජාණන් වහන්සේටත් එය කොච්චර කල්පයක් ඉන්නය කිව්වත් ඒත් බැරිඋනානෙ. ඒ අතීත කර්ම නිසා මේ ශරීරයේ අර තරම් කායික වේදනා ආදිය විඳින්න සිද්ධ වුණේ. ඒවා සවිස්තරව පොත්වල නැතත් යම්කිසි කර්මයක් නිසා. මොකද මේ ඇසත්, කණත්, නහයත්, දිවත්, කයත්, මනත් අපට දීල තියෙන්නේ විඳපන් කියලා. අපි මාරයාගෙන් ඉල්ලුවානේ තණ්හාවත් අවිද්‍යාවත් නිසා. මාරයා දුන්නා විඳපන් කියලා. ඉතින් විඳින්න ඕන. හොඳ පැත්තත් එහෙමයි. දැන් මේ අපටත් කණ්ණාඩි පළඳින්න සිද්ධවෙලා තියෙන්නෙ ඒක නිසානෙ. විඳපන් කියලා ඒකත් දුන්නා. මේ පින්වතුන්ට ටිකක් තේරෙන්නයි ඒ කිව්වෙ. අන්න එහෙමයි තේරුම් ගන්න තියෙන්නේ 'ඛීණං පුරාණං'. ඒ අවස්ථාවෙදි තමයි පැරණි කර්ම ගෙවිල ඉවරයි ඔක්කොම.

'නවං නත්ථි සම්භවං' අන්න එතන කියන්නේ නැවතත් භවයක් හටගන්න කර්ම, ඒව නැහැ රහතන් වහන්සේලාට. අන්න ඒ ටික උන්වහන්සේලා අවිද්‍යාව ක්ෂය කිරීමේදී, සංස්කාර සංසිඳීම දුටුවා. ඒ වගේම තෘෂ්ණාව ක්ෂය කිරීමෙන් - තණ්හාව කිව්වහම කාම තණ්හා,

භව තණ්හා, විභව තණ්හා. එතකොට භව තණ්හාවත් ක්‍ෂය කළා. ඒක නිසා 'භවෙ න රජ්ජති සම්භවෙ න රජ්ජති'. නැවත භවයක් පතන්නේ නැහැ. ඇල්මක් නැහැ. ඒකයි 'නවං නත්ථි සම්භවං' නැවත භවයක් නැහැ. 'විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං' - 'ආයතිකෙ භවස්මිං' කියන්නේ අනාගත භවයක් පිළිබඳ ආශාවකුත් නැහැ. 'විරත්තචිත්තා' ඒ පිළිබඳ ආශාවක් නැහැ.

දැන් ඇතැම් කෙනෙක් අපි ධර්මය විග්‍රහ කරන ආකාරයට අකැමැති වෙන්නේ රහතන් වහන්සේලා උච්ඡේද වෙනවනෙ. ඊට පස්සෙ නැහැනෙ. තණ්හාව නැත්නම් මොකටද අපි රහතන් වහන්සේලාට තව ජීවිතයක් දෙන්නේ. බඩගින්න නැති කෙනාට කවන්න යන්නේ මොකටද? පිපාසය නැති කෙනාට පොවන්න යන්නේ මොකටද? තෘෂ්ණාව නැති රහතන් වහන්සේලා නැවතත් භවයේ හිටවන්න යන්නේ - අර කියාපු සියදෝරිස් නිවන ඉදිරිපත් කරන්නේ මොකටද? 'විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං' තවත් භවයක් පිළිබඳ විරත්ත සිතේ ඇලීමක් නැහැ.

'තෙ ඛීණබීජා' අන්න එතන තවත් ගැඹුරු කාරණයක් කියනවා. මොකක්ද මේ 'ඛීණබීජා' කියල කියන්නේ. බීජය කියල ධර්මයේ හඳුන්වන්නේ - බුදුරජාණන් වහන්සේගේ එක් දේශනාවක තියනවා '**කම්මං ඛෙත්තං විඤ්ඤාණං බීජං තණ්හා සිනෙහො**'. නැවත උපත ගැන කථා කරන කොට දැන් ඕවා බොහෝවිට උගතුන් දන්නෙත් නැතිව ඇති. 'කම්මං ඛෙත්තං' කර්මය කෙතක්. 'විඤ්ඤාණං බීජං' විඤ්ඤාණය බීජය. 'තණ්හා සිනෙහො' තණ්හාව දිය සීරාව. එතකොට බීජයක් වැඩෙන්න නම් දිය සීරාවක් ඕන. ඒ වගේම බිමකුත් ඕනෙ. එතකොට අන්න බිමත් නැති කරල රහතන් වහන්සේලා.

අර දේශනාවෙන් තව ටිකක් එකතු කරනවා නම්, දැන් අපි කිවුවනෙ 'පුරාණං කම්මං' කියල. ඒ දේශනාවෙම තියනවා 'නවං කම්මං' කියලා. ඒ කියන්නේ මේ ජීවිතය තුළ කයින්, වචනයෙන්, මනසින් කරන කර්ම. කෙනකුට කියන්න පුළුවන් ඇයි රහතන් වහන්සේලා නිකම් ඉන්නවද? බුද්ධ පූජා ආදී නා නා විධ දේවල් කරනවා නේද. ඒවායින් කර්ම රැස්වෙන්නේ නැහැ. නැවත භවයක් හටගන්න ඕන කර්ම රැස්වෙන්නේ නැහැ එතන. දැන් එතකොට අපි මේ කියන්න ගියේ 'කම්මං ඛෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනෙහො'

කර්ම නමැති කෙතේ සාමාන්‍ය පුද්ගලයාගේ විඤ්ඤාණය නම් පැලවෙනවා. පැලවෙන්නේ මොකද, තණ්හා තෙතමනයත් තිබෙන නිසා.

ඊළඟට ඔන්න ගැඹුරු කාරණයක් තියනවා. 'ඛීණබීජා' කියල කියන්නේ මොකද, රහතන් වහන්සේලාගේ විඤ්ඤාණ බීජය පැලවෙන්නේ නැත්තේ ඒකේ මදය නැහැ. ඒ බීජයේ තියන මදය ගලවල දල. මොකක්ද ඒ මදය? **නාමරූපය.** මේ උපමාව ඒ විදියටම නැහැ මේ සූත්‍ර දේශනාවේ. අපි මේ පින්වතුන්ට තේරුම් ගන්න කියන්නේ. එතකොට ඒ ටික තමයි ධර්මය ඇසුරෙන් කියනවා නම් එබඳු **ඒ රහතන් වහන්සේලාගේ විඤ්ඤාණය හඳුන්වන්නේ අනිදස්සන විඤ්ඤාණය නමින්.** අනිදස්සන විඤ්ඤාණය - මේක බොහෝ උගතුන්ට මේ කාලයේ හැටියට නොපැහැදිලි තැනක්. අනිදස්සන විඤ්ඤාණය කියල කියන්නේ ඒ විඤ්ඤාණයේ නාම රූපයක් පෙන්නුම් කරන්නේ නැහැ. ඒ කියන්නේ **නාමරූපය විනිවිද යන ප්‍රඥාවක් රහතන් වහන්සේලා ලබාගන තිබෙන නිසා. නාම රූපයේ ඇලෙන්නෙ, ගැලෙන්නෙ, පැටලෙන්නෙ නැහැ.**

ඒ නිසා ඒ විඤ්ඤාණය ඇත්ත වශයෙන් කියනවා නම් **නිරුද්ධ විඤ්ඤාණයක්,** නිරෝධ වෙලා. විඤ්ඤාණ නිරෝධය රහතන් වහන්සේලා අරහත් ඵල සමාපත්තියේදී අත් විඳිනවා. ඒ ඵල සමාපත්ති සිතමයි රහතන් වහන්සේලාගේ අවසන් අවස්ථාවේදී ඉදිරිපත් වෙන්නේ. ඒ නිසා තමයි නැවත භවයකට යන්නෙ නැත්තෙ. 'තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා'. ඒක නිසා අර ඡන්දය තමයි තණ්හාවේ ගිරිය කියල කියමු. පැලෑටියක් පැලවෙනකොට ගිරියක් ඇදෙනවනෙ. ඒ වගේ තණ්හාවේ ඇහැට නොපෙනෙන පැත්ත තමයි ඡන්දය නමින් හැඳින්වෙන්නේ. දැන් මේ කාලයේ තියන ඡන්දය නොවෙයි. යමකට කැමැත්ත ඇති වුණාට පස්සෙ තමයි ඔක්කොම. ඡන්ද කියන එකේ තියනවා ඕනෑකම, කැමැත්ත පිළිබඳ යම්කිසි සියුම් තත්ත්වයක්. සියුම් විදියටයි ඒක ඇති වෙන්නේ. අවිරූළ්හිච්ඡන්දා කියන්නේ ඡන්දය පැන නඟින්නේ නැහැ. කර්ම ක්ෂය කළා. ඒ වගේම නාම රූපයත් අවබෝධ කර ගත්තම නාම රූපයෙන් මිදුණා. 'තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා, නිබ්බන්ති ධීරා යථායං පදීපො'.

අන්න එතකොට තමයි රහතන් වහන්සේලාගේ ඒ පරිනිර්වාණ අවස්ථාව. පහනක් නිවුණා වගේ වෙච්ච කාරණය සම්පූර්ණ වෙන්නේ. පහනේ තෙලුත් ඉවරයි, වැටියත් ඉවරයි, ඒක තමයි නිවන කියල කියන්නේ ඒ නිවීමයි. ඒ නිවනේ තත්ත්වය අමෘතය කියල කියන්නේ මොකද, ඒ මරණ භයත් නැහැ ඒ අවබෝධය තියන කෙනාට වෙන එකක් තබා සෝවාන් පුද්ගලයාට පවා යන්තමින් නිවන දුටු පුද්ගලයාට පවා ප්‍රත්‍යක්ෂ වෙනවා. මොකද මොහොතකට විදර්ශනාඥාන ශක්තිය තුළින් මේ පඤ්ච උපාදානස්කන්ධය අතහැරෙනවා. ඒ අතහැරීම තුළ අමුතුම, පුදුම විදියේ ලෝකයා හිතන්නෙ නැති විදියේ ලෝකෝත්තර සැනසීමක් ශාන්තියක් අත් දකිනවා. ඒකම තමයි වඩාත් ප්‍රකට වෙන්නේ. ඉහළම මට්ටමින් ප්‍රකට වෙන්නේ සියලු සංයෝජන ඉවත් කළ අවස්ථාවේදී රහතන් වහන්සේට.

උන්වහන්සේලා අරහත් ඵල සමාපත්තියේදී අර අමෘතත්වය පරිභෝග කරනවා, භුක්ති විඳිනවා. ඒ භුක්ති විඳීම නිසා එතන තියෙන්නේ මරණය නැති බව පිළිබඳ සුවයයි. මරණ භයනෙ කාටත් තියෙන්නෙ. ඒ අමෘතත්වය පිළිබඳ ඒ සුවය සවභාවිකයි. කය අතහරින්නේ නැතිව සිතෙන් උපාදානය අතහැරීම් පමණකින් ඒක ප්‍රත්‍යක්ෂ කර ගත්ත නම් 'දිට්ඨෙව ධම්මෙ' මෙලොවම කය අතහරින වෙලාවට ඉදිරිපත් වෙන්නේ ඒකයි.

ඒක නිසා තමයි 'තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා නිබ්බන්ති ධීරා යථා'යං පදීපො' ඒ පහනට තවත් තෙල් වැක්කෙරෙන්නෙ නැහැ. තවත් වැටි දමන්නෙ නැහැ. පහන නිවුනා වගේ.

මේ පින්වතුන්ට අපි මේ ශක්ති ප්‍රමාණයෙන් රතන සූත්‍රයේ අර කියපු අර්ථ රසය මතුකර දෙන්න උත්සාහ කළා. අපට වඩා හොඳ මිහිරි කට හඬ ඇති ගායකයින් ඉන්නවා. සමහර විට මේ පින්වතුන් මේවා අපි තැටිගත කළත් මේවාට සවන් දෙන්නත් වැඩි කැමැත්තක් නැති වෙන්න පුළුවන්. කෙසේ හෝ වේවා අපි මේ මාතෘකාව ඉදිරිපත් කරන්න කල්පනා කළේ දැන් එන්න එන්නම මේ වටිනා රතන සූත්‍රය අභාවයට යන්න ඉඩ තියන නිසයි. මේ නුවණැති පින්වතුන් ඒක නිසා මේවායේ අර්ථ රසය සැලකිල්ලට අරගෙන - සත්‍ය ක්‍රියාවක් හැටියටම - සතිය ගිලිහීම නිසා සමහර විට අර්ථ රසය අමතක වෙන්න පුළුවන්. උත්සාහ කරන්න ඕන. සජ්ඣායනා කරන අවස්ථාවේදී පවා

සත්‍යක්‍රියාවක් හැටියටම කරන්න. බුදු ගුණ, දහම් ගුණ, සඟ ගුණ. එහෙම නැත්නම් අපට බොහොම ලේසියි ලක්ෂ වාරයක් පිරිත් සජ්ඣායනා කරන්න මේ වගේ යන්ත්‍රයක් උපකාර කරගන්න පුළුවන්. මහන්සි වෙන්න ඕන නැහැ ලක්ෂ වාරයක් සජ්ඣායනා කරන්න. දැන් තියන යන්ත්‍රයක් යොදා ගන්න පුළුවන්. අන්න එතකොට සත්‍යක්‍රියාවක් වෙන්නෙ නැහැ.

මේ ටික අපි කියන්නේ මේ පින්වතුන්ට දැන් බොහෝ දෙනා ඇදිල යනව ඔය වගේ දේවල් වලට. ඒ තුළින් ගිහි පැවිදි දෙකොටසම පරිහානියට පත් වෙනවා. ඒ එක්කම ඊටත් වඩා භයානකයි ඉදිරි පරම්පරාවට මේ ශත වර්ෂ ගණනක් ආරක්ෂා කරගන ආපු වටිනා සූත්‍ර වලින් ඉතිරි වෙන්නේ ශබ්දය විතරයි. බොල් හඬක් විතරයි. අන්න ඒ නිසා ඇත්තටම අද දවසේ මේ පින්වතුන් කවුරුත් බොහොම ප්‍රිය කරන හැම දෙනාම අහන මතක් කරන අද උදයේ පවා මතක් කළා පිරිත් ගැන. හැම දෙනාම අහන්න කැමති පිරිතක්, අපි අර කිව්ව විදියට මේ පින්වතුන්ට අර්ථවත්ව ඉදිරිපත් කිරීමට උත්සාහ කළා. මෙයින් ප්‍රයෝජන ගන්න. මේ පින්වතුන්ගේ එදිනෙදා ජීවිතයටත් භාවනාවටත් හාත්පස ආරක්ෂාවක් පරිත්‍රාණයක් හැටියට පාවිච්චි කරන අතර ත්‍රිවිධ රත්නයේ ගුණ තුළට වඩ වඩාත් කිට්ටු වෙලා, අප කවුරුත් බලාපොරොත්තු වෙන මේ රතන සූත්‍රයේත් කියවුණු ඒ උතුම් බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයෙන් අපට ලබාගන්න පුළුවන් අපගේ විමුක්තිය, සෝවාන්, සකදාගාමී, අනාගාමී, අර්හත් යන මාර්ග ඵල සාධනය තුළින් අපට ලබාගැනීමට මේ දේශනාවත් උපකාර වේවා! කියා අපි ප්‍රාර්ථනා කරනවා.

අවීචියේ සිට අකනිටා දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් මේ ධර්ම දේශනාවත්, ධර්ම ශ්‍රවණයත් මගින් ජනිත පින් අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් වූ අමා මහ නිවනින් සැනසෙත්වා! කියල මේ ගාථා කියල පින් දෙන්න.

'එත්තාවතා ච අම්හෙහි...'

# 60 වන දේශනය

## 60 වන දේශනය
(පහන් කණුව ධර්ම දේශනා අංක 177)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

මනුජස්ස පමත්තචාරිනො - තණ්හා වඩ්ඪති මාලුවා විය
සො පලවති හුරා හුරං - ඵලමිච්ඡං ව වනස්මිං වානරො

යං එසා සහතී ජම්මී - තණ්හා ලොකෙ විසත්තිකා
සොකා තස්ස පවඩ්ඪන්ති - අභිවට්ඨං ව බීරණං

යො චෙතං සහතී ජම්මිං - තණ්හං ලොකෙ දුරච්චයං
සොකා තම්හා පපතන්ති - උදබින්දූව පොක්ඛරා

තං වො වදාමි භද්දං වො - යාවන්තෙත්ථ සමාගතා
තණ්හාය මූලං ඛණථ - උසීරත්ථොව බීරණං
මා වො නළංව සොතොව - මාරො භඤ්ජි පුනප්පුනං

කරොථ බුද්ධවචනං - ඛණො වො මා උපච්චගා
ඛණාතීතා හි සොචන්ති - නිරයම්හි සමප්පිතා

පමාදො රජො - පමාදානුපතිතො රජො
අප්පමාදෙන විජ්ජාය - අබ්බහෙ සල්ලමත්තනො'ති

– මාලුඞ්ක්‍යපුත්ත ථෙරගාථා සු.නි. ථෙරගාථා

සැදැහැවත් පින්වතුනි,

ඉපදෙමින් මැරෙමින් අපි යන මේ සංසාර ගමන යන්නේ තණ්හාව නිසා බව තිලෝගුරු බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළා. පුනර්භවයට මූලික හේතුව වන නිසාම තණ්හාව 'පොනොභවිකා' නමින් හඳුන්වලා තිබෙනවා. තණ්හාව මුලිනුපුටා දමන තුරු සත්ත්වයා මේ සංසාරයේ හතිලලා දුවනවා. අද මේ මාතෘකා කර ගත්තු ගාථා පෙළෙන් දැක්වෙන්නේත් තණ්හාවේ ස්වභාවයයි. තණ්හාවේ ආදීනව පක්ෂයයි.

ථේරගාථා පාළියේ මාලුඞ්ක්‍යපුත්ත ථේර ගාථාවට අදාළ නිදාන කථාව පිළිබඳව අටුවාවේ දැක්වෙන හැටියට මේ ගාථා දේශනා කළේ මාලුඞ්ක්‍යපුත්ත මහ රහතන් වහන්සේ. උන්වහන්සේ පිළිබඳව දැක්වෙන ප්‍රවෘත්තිය මේකයි. මේ මාලුඞ්ක්‍යපුත්ත හාමුදුරුවෝ සැවැත් නුවර උසස් කුලයක, පවුලක ඉපදුන කෙනෙක්. මාලුඞ්ක්‍යා කියන මවගේ නම ඇසුරෙන් මාලුඞ්ක්‍යපුත්ත නමින් හැඳින්උනා. ගිහිගෙයි කාලයක් වාසය කරලා ගිහිගේ ගැන කලකිරිලා ගිහිගෙයින් නික්මිලා ප්‍රවෘජ්‍යාව ලැබුවේ පරිබ්‍රාජකයින් අතරෙයි. එතකොට පරිබ්‍රාජකයින් අතර කාලයක් ඉඳලා යම් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ හමුවෙලා ධර්මය අහලා පැවිදිවෙලා විදර්ශනා වඩලා රහත්උනා. රහත්උනාට පස්සේ ඥාතීන්ට අනුග්‍රහ වශයෙන් තමන්ගේ උපන් ගමට නැත්නම් ගිහි ගෙදරට වැඩම කළ අවස්ථාවේදී ඥාතීන් ප්‍රණීත ආහාර පාන වලින් සංග්‍රහ කරලා දානය පූජා කළා. ඒ එක්කම මේ ස්වාමීන් වහන්සේ පොළඹවලා නැවත ගිහිගෙට ගන්න බලාපොරොත්තුවෙන් ඒ සන්තක ධනය ඉදිරිපිට රැස්කරලා එකතු කරලා ආරාධනා කළා. මේ සියල්ල හාමුදුරුවන් වහන්සේගේයි. ස්වාමීන් වහන්සේ නැවත ගිහි ගෙට ඇවිල්ලා ගිහියෙක් වෙලා අඹුදරුවන් පෝෂණය කරන්න මේ ධනයෙන් කියලා. ඒ අවස්ථාවේ උන්වහන්සේ අහසට පැන නැඟිලා මේ ගාථා වලින් මේ තණ්හාවේ ආදීනව පක්ෂය ප්‍රකාශ කළ බවයි අටුවාවේ තියෙන්නේ. ඇත්ත වශයෙන් මේ සමහර ගාථා බුද්ධ වචන වශයෙන් 'ධම්මපදයේ'ත් සඳහන් වෙනවා. මේ ගාථා කීපයේ අර්ථය ඉතාම ගැඹුරුයි. අපි ඒක සාමාන්‍යයෙන් තේරුම් ගන්න බලමු.

'මනුජස්ස පමත්තචාරිනො - තණ්හා වඩ්ඪති මාලුවා විය' - ප්‍රමාදයට වැටී හැසිරෙන මනුෂ්‍යයාගේ තණ්හාව මාලුවා වැල වගේ වැඩෙනවා.

'සො පලවති හුරා හුරං - ඵලමිච්ඡං ව වනස්මිං වානරො' - ඒ තැනැත්තා පලතුරු බලාපොරොත්තුවෙන් වනයේ හැසිරෙන වඳුරෙක් වගේ ඔබිනොබ එහාට මෙහාට පැන පැන යනවා සංසාරයේ

'යං එසා සහතී ජම්මී - තණ්හා ලොකෙ විසත්තිකා' - ලෝකයෙහි ඉතාමත්ම ලාමක වූ ඇලෙන සුලු ස්වභාවය ඇත්තාවූ 'විසත්තිකා' නමැති තණ්හාව විසින් යමෙකු මැඩපවත්වයිද

'සොකා තසස පවඩ්ඪනති - අභිවට්ටං ව බීරණං' - ඒ තැනැත්තාගේ ශෝකයන් වැඩෙනවා හරියට වැහි දිය වැටුනු බීරණ පඳුරක් වගේ.

'යො චෙතං සහතී ජම්මිං - තණ්හං ලොකෙ දුරච්චයං' - යම් කෙනෙක් ලෝකයේ ඉක්මවීමට අපහසු මේ ලාමක තණ්හාව මැඩ පවත්වයිද,

'සොකා තමහා පපතනති - උදබින්දූව පොක්ඛරා' - ඔහුගේ ශෝකයෝ ඔහු කෙරෙන් ගිලිහී වැටෙනවා. හරියට නෙළුම් පතෙන් දිය බින්දු වැටෙන්නා වගේ.

'තං වො වදමි භදදං වො - යාවනෙතථ සමාගතා' - මෙතන රැස්වූ ඔබ සැමට මම කියනවා, ඔබ සැමට යහපතක්ම වේවා!

'තණ්හාය මූලං ඛණථ - උසීරත්ථොව බීරණං' - බීරණ පඳුරේ 'උසීර' කියන බීරණ අල බලාපොරොත්තුවෙන් මුල හාරන්නා වගේ තණ්හාවේ මුල හාරන්න.

'මා වො නළංව සොතොව - මාරො භඤ්ජි පුනප්පුනං' - මහ සැඩවතුරකට බටගස් සිඳිලා යන්නා වගේ තමන්ව ඒ තණ්හා සැඩවතුරට ගසාගෙන යන්න ඉඩ තියන්න එපා. එහෙම නැත්නම් නැවත ඉපදීම් මරණ ආදිය තුළින් මාරයාට නැවත නැවත විනාශ කරන්න ඉඩ තියන්න එපා.

එහෙම ප්‍රකාශ කරලා ඊළඟට කියනවා 'කරොථ බුදධවචනං - ඛණො වො මා උපච්චගා - ඛණාතීතා හි සොචනති - නිරයම්හි සමප්පිතා' - බුද්ධ වචනය අනුව ක්‍රියාකරන්න, උතුම් මොහොත ඉක්මයන්න නොදෙන්න. උතුම් මොහොත ඉක්මවා ගිය අය නිරයෙහි වැටිලා දුක් විඳිනවා.

'පමාදෙ රජො - පමාදනුපතිතො රජො' - 'රජො' කියන්නේ දූවිල්ලක්. ප්‍රමාදය අනුව කෙලෙස් දූවිල්ල ඇතිවෙනවා වැඩෙනවා. ඒක නිසා 'අප්පමාදෙන විජ්ජාය' අප්‍රමාදයෙනුත් 'විජ්ජාය' කියන්නේ

අවබෝධයෙනුත් නුවණිනුත් තණ්හාව කියන ඒ උල උපුටා දමන්න ' අබ්බහෙ සල්ලමත්තනො'ති.

මෙයයි ඒ ගාථාවල අදහස. ඒ ගාථාවල සාමාන්‍ය අර්ථයයි මේ කිව්වේ. මේ ගාථාවල තියන උපමා ටික උනත් ඉතාමත්ම වටිනවා.

අර 'මාලුවා' වැල කියන්නේ ගස්වල පිළිල හැටියට වැඩෙන පැලෑටියක්. මාලුවා වැලක් තිබෙනවා බොහෝ විට දකින්න ලැබෙනවා ගස්වල. ඒ වැල පොඩියෙන් ආරම්භ වෙලා අන්තිමට ගහ වහගෙන ගහ විනාශ කරනවා. අන්න ඒ උපමාවයි මෙතන තියෙන්නේ. ප්‍රමාද වූ මනුෂ්‍යයාගේ තණ්හාව වැඩෙනවා.

ඊළඟට 'සො පලවති හුරා හුරං - ඵලමිච්ඡං ව වනස්මිං වානරො' ගෙඩි කන්න කැමති වඳුරෙක් කැලේ ගහින් ගහට පැන පැන යන්නා වගේ භවයෙන් භවයට ඒ තැනැත්තා ගෙන යනවා කියන එකයි.

ඊළඟට කියන උපමාව 'යං එසා සහතී ජම්මී - තණ්හා ලොකෙ විසත්තිකා'- ලෝකයේ ඉතාමත්ම ලාමක වූ ඇලෙන සුලු මේ තණ්හාව විසින් යම් කෙනකු යටපත් කරගනු ලැබේද ඒ තැනැත්තාගේ ශෝක වැඩෙනවා හරියට වැස්ස වැටුනු බීරණ පඳුරක් වගේ. නමුත් අනිත් අතට යම් කෙනෙක් ඒ තණ්හාව මැඩ පවත්වනවා නම් ඒ තැනැත්තාගේ ශෝකයන් පෙරලිලා යනවා හරියට නෙළුම් පතේ දිය බින්දු වගේ. ඉතින් ඔන්න ඔය විධියට ඒ නොයෙකුත් උපමා වලින් දැක්වෙනවා.

ඊළඟට කියන්නේ ඒ තණ්හාව නැති කිරීමට ආරාධනාවක් වශයෙන් 'තං වො වදාමි භද්දං වො - යාවන්තෙත්ථ සමාගතා, තණ්හාය මූලං ඛණථ උසීරත්ථොව බීරණං'. මේ බීරණ කියන පැලෑටියේ අල හඳුන්වන්නේ 'උසීර' කියලයි. සමහරු මේ පැලෑටිය 'බීර' කියලා හඳුන්වනවා. සමහර පලාත්වල සේර කියලා හඳුන්වනවා. මේ පැලෑටිය 'උසීර' කියන අල සඳහා හාරන්න වගේ තණ්හාවේ මුල හාරන්න. ඒ වාගේ නොයෙකුත් උපමාවලින් කියන්නේ. මේ ධර්ම කාරණාවලට අදාළ තවත් කරුණු ඉදිරියේදී කියන්න පුලුවන්.

ඊට කලින් මාලුඞ්ක්‍යපුත්ත මහරහතන් වහන්සේ ගැන සූත්‍ර දේශනාවල ප්‍රවෘත්ති රාශියක් සඳහන් වෙනවා. අපි ටිකක් කියමු. උන්වහන්සේ ගැන සංයුත් සඟියේ මෙහෙම සඳහන් වෙනවා. මාලුඞ්ක්‍යපුත්ත තෙරුන් වහන්සේ යම් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ළඟට ඇවිත් මෙහෙම ආයාචනයක් කළා. භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් ධර්මය දේශනා කරන්න. ඒ දේශනාව උපකාර කරගෙන මම විවේකයට ගිහිල්ලා හුදකලාවම වීර්‍යය කරලා රහත් භාවයට පත්වෙනවාය කියලා. එහෙම කිව්වාම බුදුරජාණන් වහන්සේ කියනවා 'මාලුඞ්ක්‍යපුත්ත, මම බාල - තරුණ භික්ෂූන්ට මොනවා කියන්නද? මහළු වූ ඔබ ඇවිත් මෙහෙම කෙටි දේශනා අහනකොට කියලා. එක්තරා විධියක දෙස් පැවරීමක් වගේ දෙයක් බුදුරජාණන් වහන්සේ කිව්වේ. එතකොට මාලුඞ්ක්‍යපුත්ත ස්වාමීන් වහන්සේ කියනවා, 'භාග්‍යවතුන් වහන්ස, මට කෙටියෙන් දේශනාවක් කරන්න. මම ඒ අයුරින් භාග්‍යවතුන් වහන්සේගේ ධර්මයට දයාද කරුවෙක් වෙනවා.

ඊළඟට බුදුරජාණන් වහන්සේ ඒ කෙටි දේශනාව කරන්නට කලින් සුදුසුකම් බලන්න වගේ මාලුඞ්ක්‍යපුත්ත හාමුදුරුවන්ගෙන් අහනවා, 'මොකද මාලුඞ්ක්‍යපුත්ත හිතන්නේ ඔබට මෙතෙක් නොදුටු රූපයන් - ඇසින් දැකිය යුතු රූප දැකීමට ආශාවක් ඇල්මක් ප්‍රේමයක් ඇතිවෙනවද? ඒ වාගේම අනිත් ඒවා හිතාගන්න පුලුවන්. රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම කියලා කියන මේ සදෙරට හමුවන අරමුණු පිළිබඳව. ඒවා දැකීමට රාගයක් ප්‍රේමයක් ඡන්දයක් තිබෙනවාද ඔබ තුළ'? 'නැත' කියලා හැම එකටම පිළිතුරු දුන්නා. ඔන්න එතකොට තමයි බුදුරජාණන් වහන්සේ අර කිව්ව කෙටි දේශනාව වදාළේ.

මෙන්න මෙහෙම අපි සිංහලයෙන් කියනවා නම් "එහෙනම් මාලුඞ්ක්‍යපුත්ත, යම් අවස්ථාවක දුටු, ඇසූ, දැනුන, සිතුන කියන ඒ ධර්මයන් එනම් දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත කියන ඒ ධර්මයන් පිළිබඳව - දුටුවෙහි දුටු මාත්‍රයම වන්නේද, ඇසුනෙහි ඇසුණු මාත්‍රයම වන්නේද, දැනුනෙහි දැනුන මාත්‍රයම වන්නේද, සිතුනෙහි සිතුන මාත්‍රයම වන්නේද, එවිට මාලුඞ්ක්‍යපුත්ත ඔබ එයින් නොවන්නේය. යම් විටක මාලුඞ්ක්‍යපුත්ත ඔබ එයින් නොවන්නේද, එවිට මාලුඞ්ක්‍යපුත්ත ඔබ

මෙතනත් නැත. එතැනත් නැත. දෙතැන අතරත් නැත. එයම දුකෙහි කෙළවරයි'' කියන මේ දේශනාව ප්‍රහේලිකාවක් බඳු දේශනාව කළා. මීට කලින් අපේ බණ අහපු පින්වතුන් දන්නවා ඇති අර 'බාහිය දරුචීරිය' තාපස තුමාට දේශනා කළ කෙටි දේශනාවමයි මෙතනදී බුදුරජාණන් වහන්සේ මාලුඞ්ක්‍යපුත්ත තෙරුන් වහන්සේට දේශනා කළේ.

ඉතින් මෙන්න මේ කෙටි දේශනාවේ අදහස අපි සලකා බැලුවොත්, දැන් අර දුටුව, ඇසුන, දැනුන, සිතුන කියන පද හතරට පාලියෙන් කියනවා නම් දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත. ඒ හතරට අහුවෙලා තියෙන්නේ අපේ ආයතන හය. ඒ කියන්නේ ඇස, කණ, නාසය, දිව, කය, මනස කියන ඒ ඉන්ද්‍රියයන් හයට ගොදුරු වන දේවල්මයි. ඒවා අපි සාමාන්‍යයෙන් පුරුදුවෙලා තියෙන්නේ දුටුදේ ඇසුන දේ ආදි වශයෙන්. මෙතනදී බුදුරජාණන් වහන්සේ කියනවා මේ ආයතන තුළින් එන හැම දෙයක්ම ඒ ඉන්ද්‍රිය අරමුණු සමූහයම මේ වචන හතරට දනවා. දුටුව, ඇසුන, දැනුන, සිතුන කියන වචන හතරට අහුවෙනවා. දිවෙන්, කයෙන්, නැහැයෙන් දැනෙන ටිකයි දැනුන කියන්නේ. එතකොට දුටුව කියන එක හිතාගන්න පුළුවන් ඇහැට එන අරමුණු. කණට එන අරමුණු ඇසුන කියලා කියන්නේ. නැහැයට, දිවට, කයට දැනෙන ඒ දැනීමයි දැනුන කියන්නේ. ඊළඟට සිතුන කියන්නේ මනසට එන දැනීම.

එතකොට ඒවා පිළිබඳව මෙතන මේ කියන්නේ මහ පුදුම විදියේ කෙටි දේශනාවක්. ඉතින් එහි තේරුම දුටුවෙහි දුටු පමණින් නතර වෙනවා. ඇසුනෙහි ඇසුන පමණින්. ඒ විධියට එහෙම නතරවීම තුළින් අවසානයේ වන දේ - ඒක ඉතාමත්ම ගැඹුරුයි. එවිට වෙන්නේ මොකක්ද? බුදුරජාණන් වහන්සේ කියන හැටියට එවිට ඔබ එයින් නොවන්නේය. **ඒ කියන්නේ දුටුවෙන්, ඇසුනෙන්, දැනුනෙන්, සිතුනෙන් ආදී වශයෙන් ඒවා පිළිබඳව උපකල්පනය කරන්නේ - 'මඤ්ඤනා' කරන්නේ නෑ කියන එකයි.** ඒ කියන්නේ අපි ඒක තේරුම් යන ආකාරයෙන් කියතොත් දැන් අපි සාමාන්‍යයෙන් දුටු යමක් ඇසට ගැටුනාම අපි එය දුටු දෙයක් කියලා ගන්නවා. නමුත් ඇත්ත වශයෙන් **මෙතන තියෙන්නේ දුටු බවක් පමණයි. ඇසුණු බවක් පමණයි. දැනුන බවක් පමණයි. සිතුන බවක් පමණයි.** නමුත් ඒක අපට තේරෙන්නෙ

නෑ. ඉතා ශීඝ්‍රයෙන් සිත ක්‍රියා කරලා අර ඒ දුටු දේ කියලා ගත්තු දේ අපි 'තණ්හා, මාන, දිට්ඨි' වශයෙන් එහි පැළපදියම් වෙනවා. තණ්හාවෙන් මේ මගේ කියලා ගන්නවා. මානයෙන් මේ මම තමයි කියලා ගන්නවා. දෘෂ්ටියෙන් මේක ආත්මයක් හැටියට ගන්නවා. අන්න ඒ ගැනීම තුළින් තමයි - පැළපදියම් වීම තුළින්, අන්න දැන් හිතාගන්න පුළුවන් එයින් වෙනවා කියන්නේ ඒකයි. 'දුටුවෙන්' **ඒක තමාගේ දෙයක් හැටියට පත්කර ගත්තාට පස්සෙ ඊළඟට එයින් කියල ගැනීම තුළින් එහි වෙනවා. ඒක තුළට, ඒකට ඇතුළු වෙනවා.** මීට කලින් අපි නොයෙකුත් විදියට විග්‍රහ කරලා දීල තියෙනවා මේ ගැන යම්තමින් හිතාගන්න. ඒ බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ ඇත්ත වශයෙන් අපේ ආයතන හයට මේ ඇස, කණ, නාසය ආදියට හමුවන අරමුණු ඒ හැටියටම ගන්නේ නැතිව අපි කෙලෙස් තුළින් තණ්හාවෙන් මානයෙන් දෘෂ්ටියෙන් එහි පැළපදියම් වෙනවා. එහෙම පැළපදියම් වීමෙන් තමයි ඔබ එහි 'වෙනවයි' කිව්වේ. ඒකෙ ඇතුළට උනාට පස්සෙ ඔන්න 'මෙතනක්' හැදෙනවා. මෙතනක් හැදෙන කොට මෙතනත් එක්කම එතනකුත් එනවා. මේක තමයි අපි ද්වයතාව කියන්නේ. එතකොට යමක් මෙතනක් කියලා ගත්තාම ඒකට විරුද්ධව එතනක් කියලා දෙයක්ද හැදෙනවා. අන්න ඒ දෙකක් හදගත්ත හැටියේ ඒ අතර මැදකුත් තියනවා. මෙතන දී බුදුරජාණන් වහන්සේ පෙන්වන්නේ විමුක්තිය, සම්පූර්ණ සංසාර විමුක්තිය මේ පද කීපය තුළ තියෙනවා. මේ අනුව දුටුව, ඇසුන, දැනුන, සිතුන ආදිය තුළ අපි තණ්හා මාන දිට්ඨි වශයෙන් පැළපදියම් වෙන්නේ නැත්නම් ඒවා මමය මාගේය කියලා අල්ලාගන්නේ නැත්නම් අපට මෙතනක් නැහැ. මෙතනක් නැතිවෙන කොට එතනක් නැහැ. ඒ දෙකත් නැතිවෙන කොට මැදකුත් නැහැ. ඇත්ත වශයෙන් මෙතනත් එතෙනත් සහ මැදත් පිළිබඳ කථාන්තරය තුළින් තමයි මේ සංසාරය දිගට දිගට යන්නේ. එතකොට ඒක නිසාම තමයි එයින්ම දුක කෙළවර වෙනවා කිව්වේ.

ඉතින් මේ අවවාදය අහලා මාලුඞ්ක්‍යපුත්ත ස්වාමීන් වහන්සේ විවේකයට ගිහිල්ලා ඉතාමත්ම ඉක්මනින් අර්හත්වය ප්‍රත්‍යක්ෂ කරගත් බව සඳහන් වෙනවා. එතකොට ඔන්න මාලුඞ්ක්‍යපුත්ත මහ රහතන් වහන්සේ පිළිබඳ මේ දේශනාව අපි පටන් ගත්තේ රහත් උනාට පස්සෙ සිද්ධියෙන්.

නමුත් ඊළඟට අර තණ්හාවටම අදාළ කාරණා නිසා උන්වහන්සේගේ අර්හත්වයට උපකාර වූ මේ පාඨයත් සඳහන් කළා. නමුත් මෙතනින් මේ විස්තරය ඉවර වෙන්නේ නෑ. මේත් සූත්‍රයේම සඳහන් වන කාරණයක්. මේ කෙටි දේශනාව බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළාට පස්සේ මාලුඞ්ක්‍යපුත්ත ස්වාමීන් වහන්සේ කියනවා භාග්‍යවතුන් වහන්ස, මට ඔබ වහන්සේ කෙටියෙන් දේශනා කළ මේ දේශනාව මම සවිස්තරව තේරුම් ගන්නේ මෙහෙමයි කියලා. මෙතන පොඩි අටුවාවක් වගේ විවරණයක් මාලුඞ්ක්‍යපුත්ත මහ රහතන් වහන්සේ ඉදිරිපත් කරනවා. උන්වහන්සේ කොහොමද තේරුම් කරන්නේ. ගාථා පෙළකින් ඒක පෙන්නුම් කරනවා, ඉන්ද්‍රිය හයට අදාළව. එක ඉන්ද්‍රියක් ගැන කිව්වාම අනික් ඒවට ගලපල මේ පින්වතුන්ට හිතා ගන්න පුලුවන්.

මෙන්න මාලුඞ්ක්‍යපුත්ත ස්වාමීන් වහන්සේ කියනවා ඇසින් රූපයක් දැකලා ඒ පිළිබඳව ප්‍රිය නිමිත්තක් ගැනීම තුළින් 'සතිය' මුළාවෙලා ඊළඟට රාගී සිතුවිලි ඇතිකර ගන්නවා. වේදනා වින්දනය කරනවා. ඒ වින්දනය කිරීම තුළින් අභිජ්ඣා කියන්නේ - දැඩි ලෝභය. ඊළඟට වෙහෙස ආදී දේවල් වලින් සිත කිලිටි වෙනවා. ඒ තුළින් ඊළඟට දුක රැස්වෙනවා. ඒ කියන්නේ පඤ්ච උපාදානසක්‍කන්ධයක් රැස්වෙනවා. ඒ කියන්නේ ඒවා ග්‍රහණය කිරීම තුළින් ඒවා ගිහිල්ලා එකතු වෙනවා උපාදානස්කන්ධයට. අන්න එහෙම ඒ එකතුකර ගැනීම තුළින් වෙන්නේ නිවනින් ඈත් වීමයි 'ආරා නිබ්බානා' නිවනින් ඈත්වීම.

ඒ ගාථාවෙන් මාලුඞ්ක්‍යපුත්ත ස්වාමීන් වහන්සේ පෙන්නුම් කරනවා අන්න අර ඇලීම් පැත්ත. ඉතින් ඇස පිළිබඳ කිව්වා වගේම, ඇසට එන අරමුණු ගැන කිව්වා වගේම හිතාගන්න මේ පින්වතුන් කෙටියෙන් කණට එන අරමුණු, නැහැයට එන අරමුණු, දිවට එන අරමුණු, කයට එන අරමුණු. ඊළඟට ගැඹුරුම එකයි මනසට එන අරමුණු පිළිබඳවත්. අර විධියට ප්‍රිය වශයෙන් ගැනීමෙන් ඒවා ග්‍රහණය කර ගැනීමෙන් සංසාරය වඩන උපාදානස්කන්ධ රැස් වෙනවා.

ඊළඟට අනිත් පැත්ත කියනවා. නමුත් යම් කෙනෙක් ඒ ඇහැට එන අරමුණු පිළිබඳව සතිය පිහිටුවාගෙන, ඒ පිළිබඳව ඇලීමක්, රාගයක් ඇතිකර ගන්නේ නැත්නම් ඒ තැනැත්තා අර කියාපු දුක්

වලින් මිදෙනව. ඇතැම් විට ඒක උපාදනස්කන්ධ අඩු වීමට හේතු වෙනවා. ගෙවීමට හේතු වෙනවා. 'රැස් කිරීම'යි පළමුවෙන් කිව්වේ - කෙලෙස් තුළින් උපාදනස්කන්ධ රැස්වෙනවා. ඊළඟට මේ පිළිබඳව විරාගය ඇති කර ගැනීම තුළින් ඒවා අස්වෙනවා. අඩුවෙනවා. ඒකට පාලියෙන් යෙදෙන්නේ 'ආචිනාති-අපචිනාති' කියලයි. ඒ වගේ වචන යොදනවා 'උපචය-අපචය' කියලත් යෙදෙනවා. උපාදනස්කන්ධ රැස්වෙන්නේ තමන් ඒවා ග්‍රහණය කර ගැනීම තුළින් ඒ ඉන්ද්‍රිය තුළින් එන වින්දනයට ඇලීම නිසා. ඒවා එතන එතනම දැකලා දුටුවෙහි දුටුමතින්, ඇසුනෙහි ඇසුණුමතින් වෙන්නේ ඒවා ගෙවිලා යාමයි. මේ කරුණු කිව්වාට පස්සේ බුදුරජාණන් වහන්සේ "සාධු සාධු" කියලා මාලුඞ්ක්‍යපුත්ත හාමුදුරුවෝ කියපු ඒවා අනුමත කළ බවත් සඳහන් වෙනවා. ඊට පස්සේ තමයි උන්වහන්සේ ගිහිල්ලා ඒ අනුව භාවනා කරලා ඉක්මනින්ම රහත් උනයි කියන්නේ.

දැන් මේකට අදාළව අපි කිව්වානේ තණ්හාවේ 'පොනොභවික' ස්වභාවය අර වඳුරා ගහෙන් ගහට පැනලා යන්නා වගේ කියලා. අන්න ඒවායේ තියනවා වැදගත් කාරණා රාශියක්. දැන් අපි කියනවා නම් මේ තණ්හාවේ ස්වභාවය එකකට එකක් ගලපන එකයි. ඉතින් මේක පෙන්නුම් කරන්න ඉතාමත්ම හොඳ සූත්‍රයක් තිබෙනවා. එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතන මිගදායේ වැඩවාසය කරන අවස්ථාවක තෙරුන්වහන්සේලා පිණ්ඩපාතයෙන් පස්සේ ඒ මණ්ඩල මාලයේ රැස්වෙලා බුදුරජාණන් වහන්සේගෙන් 'පාරායනේ මෙත්තෙය්‍ය සූත්‍රයේ' දේශනා කළ ගාථාවක් ඉදිරියට අරගෙන එහි අර්ථය මොකක්ද කියන එක සම්මන්ත්‍රණයක් වගේ ඉදිරිපත් කරගෙන විමසුවා. ඔන්න ඒ ගාථාව

'යො උභන්තෙ විදිත්වාන - මජ්ඣෙ මන්තා න ලිප්පති
තං බ්‍රෑමි මහා පුරිසොති - සොධ සිබ්බනිමච්චගා'

බුදුරජාණන් වහන්සේ දේශනා කළ එක්තරා ගැඹුරු ගාථාවක් දැනට පාරායන වග්ගයේ දක්නට ලැබෙන්නේ. ප්‍රහේලිකාවක් වගේ. 'යො උභන්තෙ විදිත්වාන' යමෙක් කොන් දෙක හරියට තේරුම් අරගෙන 'මජ්ඣෙ මන්තා න ලිප්පති' මැද ප්‍රඥාවෙන් නොඇලෙයිද, 'තං බ්‍රෑමි මහා පුරිසොති' එවැන්නාට මම මහා පුරුෂයා යැයි කියමි. 'සොධ සිබ්බනිමච්චගා' අන්න ඒ තැනැත්තා 'සිබ්බනී' කියන්නේ

තණ්හාවට නමක්. 'සිබ්බනී' කියන්නේ මැහුම්කාරිය. තණ්හාව නමැති මැහුම්කාරිය ඉක්මවලා යනවාය කියලා.

ඉතින් ඒ ගාථාවේ අර්ථය මොකක්ද කියලා, සංඝයාවහන්සේලා හය නමක් විවරණ හයක් දුන්නා. නමුත් ඒ හය මෙතනදි කියන්න යන්නේ නෑ. මේ අවස්ථාවේ පළමුවැනිම විවරණයයි මෙතනට අදාළ වන්නේ. ඇත්ත වශයෙන් ඒ විවරණ හයම බුදුරජාණන් වහන්සේ ළඟට ගිහිල්ලා ඉදිරිපත් කළාම මෙන්න මෙහෙම අපේ සම්මන්ත්‍රණය තුළ හය දෙනෙකුගෙන් මේ විධියේ මතිමතාන්තර ඇති උනා කියලා බුදුරජාණන් වහන්සේ ඒ හයම හරිය කියලා කිව්වා. එහෙම කිව්වට මොකද තමන් වහන්සේ ඒ ගාථාවෙන් අදහස් කළේ පළමුවෙන්ම ඉදිරිපත් කළ විවරණයයි කියලා වදාළා. අන්න ඒ විවරණයයි මේ අවස්ථාවේදී අපි ඉදිරිපත් කරන්නේ. සම්මන්ත්‍රණයේදී තෙරුන් වහන්සේලා අතර ප්‍රශ්නය ඇති උනේ බුදුරජාණන් වහන්සේ මේ ගාථාවෙන් කියන කොන් දෙක මොකක්ද? මැද මොකක්ද? 'සිබ්බනී' කියන මැහුම්කාරිය කවුද? ඉතින් ඕකට තමයි අර මත හයක්ම ඉදිරිපත් උනේ.

පළමුවැනිම මතය විතරයි අපට මෙතනට අදාළ වන්නේ. ඒ පළමු තෙරුන් වහන්සේ ප්‍රකාශ කළේ මට නම් වැටහෙන හැටියට මේ කොන් දෙක කියන්නේ ස්පර්ශයයි, ස්පර්ශ සමුදයයි, ස්පර්ශය අමුතුවෙන් තෝරන්න දෙයක් නැහැනේ. ස්පර්ශ සමුදය කියන්නේ ස්පර්ශය ඇතිවීමයි ස්පර්ශය එක් කොනක්, ස්පර්ශයේ හටගැන්ම තව කොනක්. මැද ස්පර්ශ නිරෝධය. ස්පර්ශය නිරුද්ධවීම. මෙතනත් ප්‍රහේලිකාවක් වගේ බැලුවාම. ස්පර්ශය එක කොනක්, ස්පර්ශයේ හටගැන්ම - සමුදය දෙවැනි කොන. මැද ඵස්සනිරොධය - ස්පර්ශ නිරෝධයයි.

ඊළඟට සිබ්බනී, ඒ කියන්නේ මැහුම්කාරිය තණ්හාවයි. ඔන්න ඕක ගැන හිතන්න වටිනවා. තනිකර කමටහනක් වගේ. ඉතින් බුදුරජාණන් වහන්සේ අනිත් දුන්න විවරණත් හරිය කියලා කිව්ව නමුත් තමන් වහන්සේ අදහස් කළේ පළමුවැනි විවරණයයි කිව්ව නිසා අපි ඒකට වැඩියෙන් අවධානය යොමු කළ යුතුව තිබෙනවා. ඉතින් අන්න එයින් පෙන්වනවා තණ්හාවේ යම්කිසි ලක්ෂණයක්. **මේ කියන ස්පර්ශයත්, ස්පර්ශය ඇතිවනවත් එක්කම ඉතාමත් ශීඝ්‍රයෙන් ඒකේ නිරෝධයකුත් තිබෙනවා. නමුත් ඒක අපට පේන්නේ නැහැ.** නිරෝධය

මැදින් තියෙන්නේ. ඒ නිරෝධය අමතක කරන ගතියක් මේ සාංසාරික සත්ත්වයා තුළ තිබෙනවා. ඒකයි සාමාන්‍යයෙන් කියන්නේ සාංසාරික සත්ත්වයා ඉන්නේ සමුදය පක්ෂයේය කියලා. එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා රූප ලෝකවල ඉන්න අයත් අරූප ලෝකවල ඉන්න අයත් මේ හැම සත්ත්වයින්ම නිරෝධය තේරුම් නොගැනීම නිසා නැවත නැවත සංසාරයට, භවයට යනවා කියලා. එයින් පෙන්නුම් කරනවා මේ නිරෝධය කියන බිඳී යාමත් නැතිවී යාමත් අපට නොපෙනෙන බව. අපි ඒ වෙනුවට එක එකක් සම්බන්ධ කරනවා තණ්හාවෙන්. තණ්හාව තුළින් එක එක ස්පර්ශයක් හා ස්පර්ශයේ හට ගැන්ම පමණයි අපට පෙනෙන්නේ. ස්පර්ශ නිරෝධය පෙනෙන්නේ නැහැ. අන්න ඒ නිරෝධයයි ඒකෙ මැද. ඇත්ත වශයෙන් මුළු මහත් මේ සද්ධර්මයේම තිබෙන හරය නිවනයි. නිවනට කියන්නේ නිරෝධයයි 'නිරොධො නිබ්බානං'. එතකොට සාමාන්‍ය ලෝකයාට නොපෙනෙන්නේ මේ නිරෝධයයි. ඉතින් අර ස්පර්ශයත්, ස්පර්ශයේ හටගැන්මත් එකිනෙක ගැටලනවා. මැහුම් කාරියක් උනාම රෙදි දෙපොටක් එකතු කරලා මහනවා. ඒ වගේ ස්පර්ශයත්, ඊළඟට ස්පර්ශය නැතිවෙන එක අමතක කරලා ඊළඟ ස්පර්ශයේ හටගැන්ම ඒකට එකතු කරනවා නිරෝධය අමතක කරමින්. අන්න ඒක තුළින් තණ්හාවට යට වෙනවා.

දැන් මෙතන මාලුඞ්ක්‍යපුත්ත රහතන් වහන්සේට දුන්න ඒ අවවාද තුළින් මෙන්ම කලින් බාහිය දරුචීරිය තුමාට දුන් අවවාද තුළින්ද පෙනෙන්නේ දුටුවෙහි දුටුමතින් නතර වෙනවා. ඊට එහාට යන්න දෙන්නේ නෑ. දුටුව පමණකින්ම නතර වෙනවා. ඊළඟට ඒකෙ ස්පර්ශය තුළින් වේදනා තණ්හා ආදී වශයෙන් දිගට යන්න දෙන්නේ නෑ. ඉතින් ඔය පැත්ත තමයි 'තණ්හා පොනොභවිකා' කියලා කිව්වේ. තණ්හාවේම තියනවා ශක්තියක් නැවත භවයක් මවන.

තවත් අවස්ථාවක ඉතාමත්ම විවාදයට භාජනවූ සූත්‍ර කොටසක් තියනවා. අපි එයත් මතක් කරමු. එක් අවස්ථාවක් 'වච්ඡගොත්ත' කියන පරිබ්‍රාජකයා බුදුරජාණන් වහන්සේට උපමාවකින් පෙන්නුම් කරමින් නැවත උපත පිළිබඳ කථාන්තරයේදී 'හරියට ගිනිසිලක් සුළඟින් වීසි කරලා පැතිරෙන්න වගේ කෙනෙක් මැරෙන කොට මොකක්ද උපාදන හැටියට සිටින්නේ? මොකක්ද අල්ලා ගන්නේ? කියලා අහනවා.

කෙනෙක් මැරෙන කොට මේ ජීවිතය මෙතනින් කෙළවර වෙනවා. යනවා අපට පෙනෙන්නේ නෑ. ඉතින් ඕකම තමයි මුළු ලෝකයේම ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ. මොකක්ද මෙතනින් යන්නේ කියන එක. එතනදී බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා හුළඟින් වීසි කරලා හුළඟින් තල්ලුවෙලා තමයි ගිනිසිල තවත් ගහක් අල්ලගන්නේ. ඒ වගේ මේ තණ්හාව තුළ තියනවා උපාදන ස්වභාවයක්. ඒ නිසා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා, එක සත්ත්වයෙක් කයක් අතහැරලා තවත් කයකට යාමේදී එයට උපකාර වන්නේ තණ්හාවමයි. 'තණ්හාවම උපාදනය හැටියට සිටිනවා' කියලා. එතකොට තණ්හාව ඇති තාක් උපාදනයත් තිබෙන බවයි අපට පෙනෙන්නේ. තණ්හාව තුළින් මවා දෙනවා අල්ලා ගන්න දෙයක්.

මෙහෙම හිතන්න පුලුවන්. අපි අර මිරිඟුව ආදිය ගැන කියන කොට මුවෙකුට පෙනෙන ඒ දර්ශනය මුවාට බීම සඳහා උපකාර වන දෙයක් ලෙස පෙනෙන ස්වභාවය වගේ තණ්හාව නැවත නැවතත් ගලපනවා. අන්න එතකොට ඒක එක පැත්තක්. අර 'පොනොභවිකා' කියපු එක නැවත නැවත භවයක් මවන. ඉතින් ඒ නිසාම තමයි තවත් කියන්නේ 'තත්‍රතත්‍රාභිනන්‍දනී' ඒ ඒ තැන සතුටු වෙන ස්වභාවය - තැන තැන පැන පැන යන්නා වගේ. ඒ නිසාම දැන් සත්ත්වයෙක් මැරෙන අවස්ථාවේදී සෑහීමකට පත්වෙන්නේ නැති නිසාම, තණ්හාව ඇති නිසාම තව භවයක් පතනවා. සියුම් අන්දමින් භවයක් පතනවා. ඉතින් ඒක කොයි තරම් සියුම්ද කියතොත් බුදුරජාණන් වහන්සේගේ ප්‍රකාශයක් ධම්මපද ගාථාවක තියෙන්නේ -

'යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තතී දුක්ඛමිදං පුනප්පුනං'

යම්සේ ගහක මුල සිඳින්නේ නැතිව අතු විතරක් කපලා දැම්මත්, ඒ ගහ නැවත නැවත වැඩෙන්නා වගේ, තණ්හා අනුසය තිබෙන තාක් නැවත නැවත මේ සංසාරයේ උපත ලබනවා කියලා ඒ විධියටත් දක්වලා තියෙනවා.

එතකොට තණ්හාවේ භයානක පැත්තක් පෙන්නුම් කරනවා. අපි මේ විග්‍රහ කරන්නේ ගාථාවේ සඳහන් වචනමයි. තවදුරටත් උපමා ධර්මයේ සඳහන් වෙනවා. 'විසත්තිකා' කියන්නේ තණ්හාවේ ඇලෙන ස්වභාවයයි. 'ලේප' කියලත් කියනවා. 'ලේප' සිංහලටත් කියනවානේ ආලේප කරනවා කියලා. 'ලේප' කියන්නේ අලවන ස්වභාවය. ඒකටත් බුදුරජාණන් වහන්සේ මහ පුදුම උපමාවක් එක් අවස්ථාවක දුන්නා. පැරණි කථාවක් කියන්නා වගේ. සංඝයා වහන්සේලාට ප්‍රකාශ කළා විශේෂයෙන් මෙය සංඝයා වහන්සේලාට අදාළ හැටියටයි. එයින් ලෝකයාට යමක් ගන්නත් පුළුවන්. ඔන්න හිමාල වනයේ සම භූමිභාග තියෙනවා. ඒවායේ මනුෂ්‍යයොත් යනවා, වඳුරොත් හැසිරෙනවා. එතකොට එවැනි ප්‍රදේශ වල වඳුරන් අල්ලන වැද්දෙක් වඳුරන් ඇල්ලීමේ උපක්‍රමයක් හැටියට වඳුරන් යන එන මාර්ගයේ ගහක ලාටු වගයක් එල්ලනවා. ඒකට කියන්නේ 'ලේප'. ඉතින් අර ලොල් ස්වභාවය ඇති වඳුරෝ - ඔය රිලවු ඒ ස්වභාවය නේ! අර ලාටුව එක අතකින් අල්ලනවා. ඇල්លුවාම ඒක ඇලෙනවා. ඊළඟට අනිත් අත කිට්ටු කරලා ඒක ගලවගන්න හදන කොට ඒ අතත් ඇලෙනවා. බුදුරජාණන් වහන්සේ ඒ විධියටයි කියන්නේ. ඊළඟට මේ අත්දෙක බේරගන්න එක කකුලක් ඒකට කිට්ටු කරනවා. මේ ලාටුවේ ඒකත් ඇලෙනවා. ඊළඟට අත් දෙකයි කකුලයි බේරගන්න අනික් කකුලත් කිට්ටු කරනවා. ඒකත් ඇලුනා. ඔන්න ඉතින් අත් දෙකයි, කකුල් දෙකයි ඇලිලා මේ ලාටු ගොඩේ. මේක එක්තරා වඳුරන් අල්ලන උපක්‍රමයක්, උගුලක් වගේ දෙයක්. ඉතින් ඊට පස්සෙ මේ වඳුරා හොම්බ-කට කිට්ටු කරනවා අර ටික බේර ගන්න. ඒකත් ඇලෙනවා. අන්තිමට මේකෙ ඇලිලා ඉන්න වඳුරා අර වඳුරන් අල්ලන වැද්දා ඇවිල්ලා විදලා අරගෙන යනවා.

ඒ උපමාව දීලා තියෙන්නේ මේ පඤ්ච කාමයන් පිළිබඳව ඇස, කණ, නාසය, දිව, කය කියන පඤ්ච කාමයන්ගෙන් ඇතිවන තණ්හාවේ අර ලේප ස්වභාවය පෙන්නුම් කරන්න. අන්න ඒ විධියට බුදුරජාණන් වහන්සේ නොයෙකුත් අවස්ථාවල ඒ තණ්හාවේ තියන ඒ ලාටු ස්වභාවය - ලෝකයා ඇලෙන ස්වභාවය - 'රාග' කියලත් කියනවා. ඒවායේ ඇති ආදීනව පක්ෂය ඒ අන්දමට දේශනා කොට වදාළා.

තවත් ඒ විදියට නොයෙකුත් අවස්ථාවල බුදුරජාණන් වහන්සේ තණ්හාව නැවත නැවතත් භවයක් මවන ආකාරය - මොකද ඒ තණ්හාවේ කවදාවත් සෑහීමකට පත්වෙන්නේ නැති ස්වභාවයක්මයි තියෙන්නේ. මහා සාගරයක් පිරෙන්නේ නැතිව වගේ. තණ්හාවේ සීමාවක් නැති නිසාම නැවත නැවත ඒක ඊළඟ භවයකට ඇලවෙලයි තියෙන්නේ. 'නති' කියලත් කියනවා. කිසියම් කඳුවැටියක් එක පැත්තකට ඇලවෙලා තියනවා නම් ඒ පැත්තට වැටෙනවාමයි. තණ්හාව තුළ තියනවා ලෝක සත්ත්වයා නැවත නැවත භවයකට ගෙනයන ස්වභාවය.

ඉතින් ඊළඟට මේ තණ්හාවේ මුල ගැනත් ප්‍රකාශ වෙලා තියනවා. තණ්හාවේ මුල හාරන්නය කියලා අර 'බීරණ' පඳුර හාරන්නා වාගේ. මොකක්ද තණ්හාවේ මුල? තණ්හාවේ මුල වශයෙන් දක්වන්නේ 'අවිජ්ජාව'මයි. ඒක නිසා තමයි අර විද්‍යාව උපකාර කරගෙන මේ මුල ගලවන්න කියලා කියන්නේ. ඉතින් **මේ තණ්හාවේ මුල හැටියට තියන ඒ අවිද්‍යාව ඇතැම් අවස්ථාවල දක්වලා තියනවා මේ කියාපු ඇසත්, එන අරමුණුත් ඒ පිළිබඳ ඇතිවෙන හැම ධර්මයකම ඇති අනිත්‍ය ස්වභාවයත් නොදැකීමයි කියලා මේ අවිද්‍යාව.** ඉතින් ඇතැම් අවස්ථාවල දක්වනවා මේ ආයතනයන්ගේ ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරන හැටි. ලෝකයා මේ ආයතන ඇතුළේ ජීවත්වන ආකාරය පෙන්වන්න බුදුරජාණන් වහන්සේ යථා තත්ත්වය දක්වන්නේ මෙහෙමයි. "මහණෙනි, ඇස අනිත්‍යයි වෙනස්වන සුලුයි, අන් ආකාරයකට පත්වෙන සුළුයි. රූපයත් අනිත්‍යයි, වෙනස්වන සුලුයි. අන් ආකාරයට පත්වන සුලුයි. 'චලං' චලනය වෙනවා. අන්‍ය ආකාරයට පත්වන ස්වභාවයක් ඇසේ තියනවා. ඒ වාගේම රූපයනුත් එහෙමයි."

ඊළඟට ඒ අනිත්‍ය ස්වභාවය තේරුම් නොගැනීම නිසා, ඒ දෙක නිසා විඤ්ඤාණය ඇතිවෙනවා. නමුත් බුදුරජාණන් වහන්සේ කියනවා විඤ්ඤාණයත් අනිත්‍යයි. එතකොට ඇසත් අනිත්‍යයි, රූපයනුත් අනිත්‍යයි. **ඒ අනිත්‍ය වූ දේ නිත්‍ය හැටියට ගැනීම නිසා ඒ දෙක එකතුවීම නිසා චක්ඛුවිඤ්ඤාණය කියන මායාවක් ඇතිවෙනවා.** විඤ්ඤාණය මායාවක් කියන්නේ ඒකයි. ගස් කොළන්වලට ඒක නැහැනේ. ඉතින් මේ අවිද්‍යා තණ්හා ආදී කෙලෙස් සහිත සත්ත්වයා ඇස නිත්‍ය

හැටියට ගත්තා. එතන ස්ථාවරයක් ගත්තා. ඊළඟට රූපයත් ඒක මිරිඟුවක් ලෙස හිතන්නේ නැතිව ඒකෙත් ස්ථාවරයක් ගත්තා. ඒ දෙක එකතු වෙලා විඤ්ඤාණයක් හටගත්තා. නමුත් බුදුරජාණන් වහන්සේ කියනවා ඒ විඤ්ඤාණයත් අනිත්‍යයි. නමුත් ඒකත් තේරුම් නොගැනීම නිසා ඒ තුනම එකතු කරලා ස්පර්ශයක් කියල එකක් හද ගත්තා. අන්න අර 'ඵස්ස' කථාවට එනවා. 'චක්ඛුසම්ඵස්සය'. නමුත් බුදුරජාණන් වහන්සේ කියනවා ඒ චක්ඛු සම්ඵස්සයත් අනිත්‍යයි. ලෝකයාට පෙනෙන්නේ නැහැ. ඒකත් නිත්‍ය හැටියට ගැනීම තුළින් වේදයිතයක් ඇතිකර ගන්නවා. වේදනා වශයෙන් ඇතිකර ගන්නවා. ඒවාත් අනිත්‍යයි. ඔය අනිත්‍යතාව නොදැකීමයි අපි මේ තණ්හාවට යටවීමට හේතුව. ඇත්ත වශයෙන් ඔය පටිච්චසමුප්පාදයේ අංග දෙළහ කෙනෙක් තේරුම් ගන්නවා නම් අපට පේනවා. තණ්හාවට කලින් අංග රාශියක් තියෙනවා. මුලට තියෙන්නේ අවිද්‍යාවයි. එයින් පෙන්නුම් කරන්නේ **ලෝකයා තණ්හාවට යටවෙන්නේ චතුරාර්‍ය සත්‍යය නොදැනීම නිසයි. ඒ කියන්නේ අවිද්‍යාව නිසයි. දුක් ගොඩක් ඇතිවන බවක් නොදන අපි ඒවා නිත්‍ය හැටියට සලකනවා.** ඔන්න එතකොට ඒකෙන් අපට පෙන්නුම් කරනවා යථා ස්වභාවය දැන ගැනීම අනිත්‍ය සංඥාව තුළ තිබෙනවා කියලා.

ඇසත් අනිත්‍ය බව, රූපයනුත් අනිත්‍ය බව, ඒ නිසා තියන විඤ්ඤාණයත් අනිත්‍ය බව, ඒ තුන එකතුවීමෙන් වන ස්පර්ශයත් අනිත්‍ය බව, ඉන් ඇතිවන වේදනාවත් අනිත්‍ය බව නිරන්තරයෙන් සිහිපත් කරනවා නම් අනිත්‍ය සංඥා වඩන කොට අර විදියේ තණ්හා ආදිය එකතු වෙන්න බැහැ. ඒකයි අර්ථය.

බුදුරජාණන් වහන්සේ එක අවස්ථාවක ප්‍රකාශ කරනවා මහණෙනි, 'අනිච්චසඤ්ඤා භික්ඛවෙ භාවිතා බහුලීකතා'. අනිත්‍ය සංඥාව හොඳට වැඩුවොත් කාමරාග, භවරාග, රූපරාග, ඔක්කොම විනාශ කරලා දනවා කියලා අනිත්‍ය සංඥාවෙන්. ඔන්න ඊළඟට මේ කියාපු අවිද්‍යාවටත්, තණ්හාවටත් අවසාන ගාථාවේ කියාපු 'උල' කියන කථාවටත් අදාළ යම්කිසි සූත්‍ර දේශනාවක් තියනවා.

බුදුරජාණන් වහන්සේ එක අවස්ථාවක 'සුනක්ඛත්ත' ලිච්ඡවි පුත්‍රයාට පවත්වපු දේශනාවක අපට අදාළ කොටස ගත්තොත්; පුදුම උපමාවක් එතනත් දෙන්නේ. ඔන්න බුදුරජාණන් වහන්සේ කියනවා -

යම් පුරුෂයකුට විෂ පෙවූ ඊයක් වැදුනා. වැදුනාම ඒ පුරුෂයාගේ නෑයන් එතනට වෛද්‍යවරයෙක් ගෙන්වනවා. එතන දක්වන්නේ 'භිසක්කො සල්ලකත්තො' කියලයි. 'සල්ලකත්තො' කියන්නේ ශල්‍ය වෛද්‍යවරයා. 'භිසක්කො' කියන්නේ විෂ වෛද්‍යවරයා. කායික වෛද්‍යවරයා කියලයි. එතකොට ඒ දෙකම සම්බන්ධයි. කායික වෛද්‍ය විද්‍යාවත්, ශල්‍ය වෛද්‍ය විද්‍යාවත් දැනගත්තු වෛද්‍යවරයෙක් ගෙන්වනවා. වෛද්‍යවරයා යම්කිසි ශල්‍ය වෛද්‍යවරුන් පාවිච්චි කරන ආයුධයකින් ඒ ඊතලය වැදුන තැන වණ මුඛය පාදලා, ඊළඟට ඊතලයේ කොටසක් ශරීරයේ තිබේ නම් ඒක සොයාගන්න - එතන පාලි වචනයක් යෙදිලා තියනවා 'එසනී'. ඒ කියන්නේ ශල්‍ය වෛද්‍යවරුන් උලක් ඇද දැමීමට පාවිච්චි කරන උපකරණයක්. 'එසනී'. ඒ උපකරණයෙන් ඒ උල ඇදලා දනවා. ඇදලා දලා ඒකට බෙහෙත් බැඳලා තමයි සුවපත් කරන්නේ.

ඔන්න ඊළඟට ඒ උපමාවට උපමේය සංසන්දනය කරමින් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා, අර විෂ ඊය ඇනිච්ච මනුෂ්‍යයා තමයි මේ ලෝක සත්ත්වයා, තණ්හා උල ඇනිච්ච. එතකොට මේ තණ්හා උල - මේකේ තියන විෂ මොකක්ද? අවිද්‍යාවයි. 'අවිජ්ජා විස දෙසො' කියනවා. එතකොට 'තණ්හා සල්ල' මේ වචනය බොහෝ තැන්වල සඳහන් වෙනවා. බුදුරජාණන් වහන්සේට කියනවා 'තණ්හා සල්ලස්ස හන්තාරො' කියලා. මේක විෂ ඊයක් උනේ අන්න අර අවිද්‍යා විෂදෝස නිසයි.

ඊළඟට අර වණ මුඛය පාදගන්න උපකාර කරගන්න ආයුධය හඳුන්වන්නේ 'ආර්ය ප්‍රඥාව' කියලයි. ඊළඟට 'එසනී' කියල කියාපු උල තියන තැන සොයාගන්න උපකාර කරගන්න දේ මොකක්ද? සති - සිහිය. ඒක නේ සතිපට්ඨානය තුළ ඔක්කෝම තියනවා කියන්නේ. එතකොට සති නමැති ආර්ය ප්‍රඥාව' තුළින් අර වණ මුඛය පාදලා 'එසනී' නමැති සතියෙන් තමයි අර උල සොයාගෙන ඇදලා දමන්නේ.

ඊළඟට කවුද මේ ශෛල්‍ය වෛද්‍යවරයා, කායික වෛද්‍යවරයා? තථාගතයන් වහන්සේයි. එතකොට බුදුරජාණන් වහන්සේ ඒ දීපු උපමාව ආශ්‍රයෙන් තම තමනුත් තමන්ට වෙදකම් කරගන්න එකයි කියන්නේ. ඒකයි අර ගාථාව අවසාන කළේ 'අබ්බහෙ සල්ලමත්තනො' තමන්ගේ තියන උල ඇද දන්න කියන එකයි. ඒ ඇද

දන්නේ අර බුදුරජාණන් වහන්සේ දීපු ශෛල්‍ය වෛද්‍ය න්‍යායට අනුව, කායික වෛද්‍ය න්‍යායට අනුව දක්වපු උපකරණ මාධ්‍යයෙන්. ඒකෙන් තේරුම් ගන්න පුලුවන් ඒ තණ්හාව නමැති උල සත්ත්වයාට ඇනිලා තියනවා. ඒ විෂ පෙවූ ඊයක්. ඒ විෂ තමයි අවිද්‍යාව. එතකොට ඒක ඇදලා දන්න උපකාර කරගන්නේ 'ආර්‍ය ප්‍රඥාව' නමැති ආයුධය. ඒ වණ මුඛය පාදගෙන 'සතිය' තුළින් ඇනුන තැන තියන ඒ ඊතලය ඇදලා දනවා. අන්න ඒකට තමයි අනිත්‍ය සංඥාව උපකාර වන්නේ.

ඉතින් ඒ ප්‍රඥාව එක පැත්තකින්. බුදුරජාණන් වහන්සේ දීල තියෙන්නේ අර උල ඇද දන්න මූලික වන අවබෝධය ලෝකයාට දීල තියෙනවා. ඇත්ත වශයෙන්ම 'උදයව්‍යය' කියන ලෝකයේ හැමදෙයක් තුළම තියන ඇතිවීම් නැතිවීම් කියන ස්වභාවයක් තියන එක බුදුරජාණන් වහන්සේ මතු කරල දුන්නේ. 'අනිත්‍ය සංඥාව' කියන එක. වචන දෙකකින් කියනවා නම් 'උදයබ්බය' ඇතිවීම් හා නැතිවීම් තුළින්. ඉතින් ඒක තමයි විදර්ශනාවේ මූලික පාඩම. ඉස්සරවෙලාම මේ අනිත්‍ය සංඥාව තුළ දකිනවා හැම දේකම ඇතිවන බවක් සහ නැතිවන බවක්. ඒක පවා අවබෝධ කර ගැනීම දුෂ්කරයි - සාමාන්‍ය ලෝකයාට, මොකද අර කියාපු මැහුම්කාරියගේ වැඩය නිසා නැතිවන පැත්ත අමතක කරනවා. මේ අමතක වීමට ලෝකයා බොහොම කැමතියි.

මේ පින්වතුන්ට එදිනෙද ජීවිතයේ සිද්ධියක් කිව්වොත් - දැන් ඔය විලාසිතා ලෝකෙ තමන් පාවිච්චිකරන ඇඳුම් ආදී දේවල් තියනවා. ඔය සාප්පු වල ඊට වඩා වටිනා නවීන මෝස්තරයක් කීයක් හරි දීලා අරගෙන ආවාට පස්සේ අරක කොහේ දැම්මද කියල නෑ. කුණුගොඩේ ඒක ඉවරයි. එතකොට ඒ නැතිවීම් පැත්ත අමතක කරලා අලුත් කිරීමයි. ලෝකයා නිරන්තරයෙන්ම අලුත් කරමින් යනවා. තණ්හාව ඒකට උපකාරී වෙනවා. තණ්හා මැහුම්කාරී ගැට දනවා. ඒ ගැටේ මොකක්ද? නිරෝධය අමතක කිරීම. මේක බිඳී යන බව අමතක කරන්න. එතකොට විදර්ශකයා මොකද කරන්නේ? බුදුරජාණන් වහන්සේ දීපු අර මූලික සිද්ධාන්තය උපකාර කරගෙන - හැමදෙයකම ක්ෂණිකව ඉතාමත් ඉක්මනින් ඇතිවන නැතිවන ස්වභාවයක් තියනවා. ඒක පෙන්වන්න තමයි කිව්වේ මේ ඇස තියනවා කියලා. මේ දේශනාව ආරම්භ කළ අවස්ථාවේ ඉඳලාම මේ මගේ ඇස තියනවා. එහෙමම රූපය තියනවා. මේ පින්වතුන් මා ඉදිරියේ ඉන්නවා. ඒක

නැහැ කියන්නේ නැහැ නේ අපි. නමුත් අන්න බුදුරජාණන් වහන්සේ කියනවා ඇසත් අනිත්‍යයි, මොහොතක් පාසා වෙනස් වෙනවා 'චලං' චලනය වෙනවා. ඒ විදියට එතැන වචන රාශියක් යෙදෙනවා අඤ්ඤථාභාවී අන්‍යාකාරයකට පත් වෙනවා 'අනිච්චං, චලං, වයං, විපරිනාමී, අඤ්ඤථාභාවී ආදී පද රාශියක් යොදනවා හිතට කාවද්දන්න. මේ හැම එකක්ම පියවි ඇස කියාපු සාමාන්‍ය ලෝකය දන්න මේ 'මසැසට' නොපෙනෙන නමුත් ඉතාම ශීඝ්‍රයෙන් මේ ඇසත් වෙනස් වෙනවා. ඊළඟට අපි රූපය කියලා ගත්තු දෙයත්, ඒකත් එහෙමම වෙනස් වෙනවා. නමුත් ඒක අපට වැටහෙන්නේ නෑ. අර කියාපු තණ්හාව ගැටලනව. විඤ්ඤාණයත් අනිත්‍යයි කිව්වට අපට ඒකත් වැටහෙන්නෙ නැහැ. අන්න එතන තමයි ඇත්ත වශයෙන්ම ගැඹුරුම තැන. සාමාන්‍යයෙන් අපි කිව්වා දුටුව, ඇසුන, දැනුන, සිතුන කියන හතරම ගතහොත් ආපස්සට හැරිලා කලින් කියලා දුන්නේ මේ හයම තමයි. දුටුව, ඇසුන, දැනුන, සිතුන කියලා ගත්තේ. එතකොට අර දුටුව කියන එක බොහොම ඕලාරිකයි. ගොරෝසුයි. මොකද අපි යමක් දිහා බලලා අනික් පැත්ත බැලුවත් ඒක තාම තියනවා වගේ නේද? ඒක තාම තියෙන්නේ. කොහොමද නැතෙයි කියන්නේ? බුදුරජාණන් වහන්සේ නැතෙයි කිව්වට ඒක තියනවා අපේ මසැසට පේනවා. ඒක ඒ ආකාරයෙන්ම තියනවා කියලා. එතකොට 'දුටුව' අපට කියන්න පුළුවන් කිව්වට මොකද දුටුව එක සැරයක් බලලා අනිත් පැත්ත බැලුවම ඒක එහෙමම තියනවා. ඉතින් කොහොමද ඒක වෙනස් වෙනවා කියන්නේ. එතකොට දුටුව ඒ හැටියට බැලුවට තවම ගොරහැඩියි. ඕලාරිකයි.

ඔන්න ඊළඟට ඇසුන එක කොහොමද? දැන් මම මේ කථාකරන වචන වල දෝංකාරයක් තියන තුරු මේ පින්වතුන්ට ඒක ඇහේවි. සමහරවිට අපි අහලා තිබෙනවා දෝංකාරයක් එන්න හැටියක් නැති මහා කාන්තාරවල කෙනෙක් කථාකරන විට වචන එතැන එතැනම නැතිවෙලා යනවා කියලා. දැන් මේ අවට තියන කඳුවලින් එන දෝංකාරය පින්වතුන් හොඳට දන්නවා නේ. දෙන්නෙක් කථා කරනවා වාගේ. ඒ වාගේම මේ පරිසරය තුළ මේ අපි කථා කරන ශබ්දය ආවර්තනය වෙලා ආපසු එනවා නින්නාද වෙලා. ඒක තුළින් අපට ඇසීමට තව උපකාර වෙනවා. ඒක අර දුටුව දේ පමණටම ගොරෝසු නැතත් ඇසුන දේත් තරමක් ගොරෝසුයි. ඔන්න ඊළඟට

වඩාත් පෞද්ගලික තමයි. අරටත් වැඩිය සියුම්දේ තමයි දැනුන කියන එකේ තියෙන්නේ. දැනුන කියන එක. අපි කිව්වා දිවට, නැහැයට, කයට දැනෙන දේ. දැන් අපි කිසියම් දෙයක් අර අන්දරේ කළා වගේ කෙනෙක් මේක රසයි කියලා අනිත් එක්කෙනාට ඒ රසය පෙන්නුම් කරන්න ඒක කවන්න ඕන. එහෙම නැතිව දැනෙන්නේ නෑනේ. ඒක පෞද්ගලිකයි. එතන ඉතාමත්ම සියුම්. නැහැයට, දිවට, කයට දැනෙන එක ඉතාමත්ම සියුම්. ඔන්න එතකොට ඒවායේ අනිත්‍යතාව සොයන්න අනිත්වාට වැඩිය අමාරුයි.

ඔන්න ඊළඟට තියනවා සිතුන කියන එක ඊටත් වඩා අමාරුයි, සියුම්. සිතුන සිත, ඒ හිත පිළිබඳව කථාන්තරය තමයි විකාර මායාවක් කියලා කියන්නේ. එතෙන්දි මේ හිතට එන අරමුණු මොනවාද 'ධම්ම' ධර්මය කියන අදහස නොවෙයි. ඇසට රූපය වගේ අපි අරමුණු හැටියට කථා කරනවා නම් ඇසට රූපය, කණට ශබ්දය, නැහැයට ගඳ සුවඳ, දිවට රසය, කයට ස්පර්ශය, මනසට ධම්ම කියලා යොදනවා. ධම්ම කියන එක අපි සිංහල කරලා කිව්වොත් 'හිතට එන දේ'. හිත වෙනමයි, හිතට එන දේ වෙනමයි කියලා අපි හිතාගන්නෙ. ඒ දෙක එපායැ ගැටෙන්න. එතනම අපි අහුවෙලා ඉවරයි. බුදුරජාණන් වහන්සේ දෙසා වදාළේ ඒක තමයි. 'මනො පුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා'. එතන 'ධම්ම' කියන්නේ හිතට එන දේවල්. එතකොට ලෝකයා හිතන්නේ හිතට එන දේවල් වෙනම තියනවා කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ කියනවා මනසයි පූර්වාංගම පෙරටු වන්නේ. මේවා මනෝමයයි. හිතෙන් හදගත්තු දේවල්. එතනම තමයි අර මැජික් කාරයාගේ වැඩය තියෙන්නේ 'මායාව'. නමුත් ලෝකයාට වැටහෙන්නේ නැහැ. **හිතට එන සිතිවිල්ල වෙනම අරගෙන. අපි අපේ දෙයක් කරගෙන ඒක තුළයි පැටලෙන්නේ. ඇලීම්, වෙලීම්, පැටලීම්, ප්‍රපංච ආදී වශයෙන් යොදන්නේ.** එතන තමයි ඉතාමත්ම සියුම් තැන. එතනයි විදර්ශකයා මතුකර ගන්නේ හෙමින් හෙමින් අර දුටුවෙහි අනිත්‍යතාව. ඒකෙන් පටන්ගෙන ඊළඟට ඇසුනෙහි අනිත්‍යතාව මෙනෙහි කරනවා. ඊටත් වඩා ගැඹුරට යනකොට ඔන්න පෞද්ගලිකව දැනෙන, අර දිවට දැනෙන දේ. ඒක නේ ඇත්ත වශයෙන්ම කියන්නේ මේ ආයතන හයේ එක එක ආයතනයක් මුල් කරගෙන නිවන් දකින්න පුළුවන් කියලා. නිවන දිව අගෙහියි කියන්න පුළුවන් ඒ පැත්තෙන් බලන කොට.

ඒක තමයි අතීතයේ සමහර සංඝයා වහන්සේලා ආහාර වළඳන අතරෙහි රහත් උනාය කියන්නේ. ඒ දිවට දැනෙන ස්පර්ශය ගැන මෙනෙහි කරලා. ඉතින් ඒ ඇඟට දැනෙන ස්පර්ශය ගැන මෙනෙහි කරලා නාටිකාංගනාවකගේ රූපය දැකලත් රහත් උනාය කියන්නේ ඒ අවස්ථාවේ අනිත්‍ය සංඥාව ඇති කරගෙන. අන්න ඒ වගේ කණට ඇසෙන ශබ්දය තුළිනුත් පුළුවන් නිවන් දකින්න. නැහැයට දැනෙන සුවඳිනුත් පුළුවන්. නමුත් ලෝකයා ඒ පැත්තට යොමු වන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ දීපු අර ඇතිවීම් නැතිවීම් දෙක නිරන්තරයෙන් මෙනෙහි කරන කෙනාට යම් අවස්ථාවක ඇතිවීම් නැතිවීම් කියන අවබෝධයේ ගැඹුරට යන්න යන්න විදර්ශකයාට වඩා පැහැදිලිව පේනවා අර බිඳීම් පක්ෂය. මෙතෙක් නොදුටු බිඳීම් පක්ෂය. මොකද අර තණ්හාව කියන ආශාව ඉවත්වෙන්න ඉවත්වෙන්න ඔන්න යථා ස්වභාවය මතු වෙනවා. ඇතිවීම් නැතිවීම් කියන බුද්ධ වචනය පේනවා. ඇතිවීම් නැතිවීම් දෙකෙන් අර බිඳෙන පැත්ත වැඩියෙන් පේනකොට එතනදී තමයි අර 'භංග ඥානය' වශයෙන් විදර්ශනාවේදී දක්වන්නේ. ඒ තැනැත්තාට හැමදෙයක්ම බිඳෙනවා පේනවා. සිතිවිලිලත් බිඳෙනවා පේනවා. එතකොට ඒ බිඳීම් තුළින් තමයි ආදීනව ආදිය ඇතිවන්නේ. එතන තියෙන්නේ 'මනො සම්ඵස්සය'. මනසට එන සිතිවිල්ල මනසට ඇවිල්ලා හිතිවිල්ල වදින එකත් තේරුම් ගන්නවා කියන එකත් ඉතාම සියුම් දෙයක්. නමුත් යම් අවස්ථාවක ඉඩක් පේනවා සිතයි සිතිවිල්ලයි වදිනවා. එහෙම වදිනවයි කියලා තේරුම් ගත්ත අවස්ථාවකයි 'විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං' කියලා කියන්නේ. බාහිය දරුචීරිය තාපස තුමා ඒක කියනවත් එක්කම රහත් උනාය කියලා කියනවා. ඉතාම ශීඝ්‍රයෙන්.

මේ මාලුඞ්ක්‍යපුත්ත රහතන් වහන්සේත් කෙටි උපදේශය උපකාර කරගෙන තමයි ඉක්මනින්ම රහත් උනේ. එයින් අපට පේනවා දුටුවෙහි දුටු මතින් නතරවීමටත් වඩා ඊළඟට ඇසුනෙහි ඇසුන මතින්, දැනුනෙහි දැනුන මතින්, අවසානයේ සිතුනෙහි සිතුන මතින්. අපට හිතාගන්න බැරි තරම් පුදුම දෙයක් ඒක. අර විදර්ශකයා භාවනාවේදී යම් අවස්ථාවක තේරුම් ගන්නවා බුද්ධ වචනය අනුව අර හිතත් හිතිවිල්ලත් අනිත්‍යයි, වෙනස්වන සුලුයි. හිත නොකියා අපි කියමු මනසත් අනිත්‍යයි, මනසට එන ධර්මයත් වෙනස්වන සුලුයි. එතකොට ඒ විදියට වෙනස් වන දේවල් එකට එකතුවන අවස්ථාවේයි මනෝ

විඤ්ඤාණය කියලා කියන්නේ. ඒකයි බුදුරජාණන් වහන්සේ අදහස් කරන්නේ. මේ ලෝක සත්ත්වයා අර කිව්ව රූප අරූප ලෝකවල ඉන්න සත්ත්වයන් පවා නිරෝධය නොදැකීම නිසයි නැවත නැවතත් භවයක් මවන්නේ. නිරෝධය දුටුව නම් හරියට අර 'සිබබනී' කථාවේ කියවෙන්නේ 'යො උභනෙත විදිත්වාන' මේ අන්ත දෙක දැනගත්තා. ස්පර්ශය අවබෝධ කරගත්තා. ස්පර්ශයේ හටගැන්ම අවබෝධ කරගත්තා.

ඊළඟට ස්පර්ශ නිරෝධය - ඒ නිරෝධයේ හිත පිහිටුවා ගත්ත අවස්ථාවේ තමයි විමුක්ත වන්නේ. ලෝකයෙන් විමුක්ත වෙනවා, ලෝකයෙන් මිදෙනවයි කියන එකයි. ඉතින් ඔතනයි දූක කෙළවර කළයි කියන්නේ. අපි කලින් ගිනිසිලේ කථාව කිව්වා. ඉතින් මේ 'තණ්හාව'. තණ්හාව කියන්නේ නොපිරුනු ආශාව - සම්පූර්ණ නොවූ ආශාව තියනතාක් සත්ත්වයාගේ සිත නිරන්තරයෙන් බැහැරට විහිදෙනවා. මේ කයින් බැහැරට විහිදෙනවා. මොකක් හරි කර්මයෙන් ඉදිරිපත් වන දෙයක් අල්ලාගන්නවා. මව් කුසක් හෝ වේවා, සතෙකුගෙ කුසක් හෝ වේවා, අපායේ ගිනිදැල්ලක් හෝ වේවා කර්මානුරූපව ඉදිරිපත්වෙන නිමිත්ත මරණ අවස්ථාවේ තණ්හාව තුළින් අල්ලා ගන්නවා. තණ්හා අනුසය තියනතාක් නැවත උපදිනවා කියන එක ගැන අමුතු දෙයක් කියන්න ඕන නෑ. මේ ලෝකයා හිතනවා වාගේ අමුතු ජීවයක් ගිහිල්ලා අතන පැලපදියම් වීමක් උවමනා නෑ. තණ්හාව ප්‍රමාණවත්. ඒකයි කිව්වේ අර ගිනිසිල හුළඟින් විසිකරලා පැතිරෙන්නා වාගේ තණ්හාව ඇතිතාක් ලෝක සත්ත්වයා නැවත භවයක් මවා ගන්නවා. අපි අර පොනොභවිකා කියලා කිව්වේ. දැන් මෙතනදී තේරෙනවා පුනර්භවයක් මවා දෙන්නේ තණ්හාවයි. ඒකේ ක්‍රියාකාරිත්වය තේරුම් ගන්න නම් අර කියාපු අවිද්‍යාව නැති කරලා ආර්ය ප්‍රඥාව මතුකර ගන්න ඕන.

දැන් අර ගාථාවල කෙටි දේශනාවල අර්ථය අපි නානා විධියට ඉදිරිපත් කළා. ඔයිටත් වැඩිය විස්තර කරන්න හැකියාව තියනවා. නමුත් යටත් පිරිසෙයින් බුදුරජාණන් වහන්සේ දීපු උපමා තුළ සිත යොදවනවා නම් මේ පින්වතුන්ට හුඟක් කාරණා අවබෝධ කරගන්න පුළුවන්. අපි අපේ මට්ටමින් එදිනෙදා ජීවිතයේදී මේ විදර්ශනා මාර්ගයේ යාමට මේ දේශනාව උපකාරී වේවායි ප්‍රාර්ථනා කරනවා. එතකොට මේ පින්වතුන් සංසාරයේ බියජනක බව තේරුම් අරගෙන තමයි

මෙවැනි අවස්ථාවක සිල්සමාදන් වෙලා බණ භාවනා කරන්නේ. ඉතින් එන්න එන්නම මේ සංසාරයේ බියකරු ස්වභාවය බුදුරජාණන් වහන්සේගේ දේශනා අනුව තම තමාටත් ප්‍රත්‍යක්ෂ වන වේලාවක්.

ඒක නිසා අර කියාපු තණ්හාව නැති නොකරනතාක් අපි කොච්චර කිව්වත් තවත් උපදින්නේ නෑ කියලා, අර ඉපදීම අපට අයිතියි. අර කියාපු නැඹුරුව නිසා. අන්න ඒක නිසා නැවත නැවතත් උත්සාහ වන්න ඕන තම තමන් රකින ශීලය උපකාර කරගෙන සමථ විදර්ශනාදී භාවනා තුළින් බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ආර්‍ය්‍ය ප්‍රඥාව සෝවාන්, සකදාගාමී, අනාගාමි, අර්හත් යන මාර්ග ඵල ප්‍රතිවේධය තුළින් - ඒ වාගේම සතිපට්ඨානය - සතිය උපකාර කරගෙන තමන් මේ බලාපොරොත්තුවන උත්තම අවස්ථාව, මේ ජීවිතය තුළින් ප්‍රත්‍යක්ෂ කර ගැනීමට මේ දේශනාවත් උපකාර වේවායි ප්‍රාර්ථනා කරගන්න. එතකොට අවීචියේ පටන් අකනිටාව දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් මේ ධර්ම දේශනාව හා ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට කැමති නම් අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවන සාක්ෂාත් කර ගනිත්වා කියලා ප්‍රාර්ථනා කරන්න.

'එත්තාවතා ච අමෙහහි...'

# කතු හිමියන්ගේ සිංහල කෘති

<u>සැ.යු.</u>: මෙම කෘති ලේඛනය සරලත්වයට මුල් තැන දුන් අංක අනුපිළිවෙලක් සහිතව සකස්වී ඇති බවත්, ලේඛනයේ අගහරියේ එන කෘති බොහෝ දුරට ගැඹුරු විය හැකි බවත්, පාඨකයින් දැනුවත් කිරීම් වශයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

- සම්පාදක

1. තිසරණ මහිම
2. හිතක මහිම – 1
3. හිතක මහිම – 2
4. හිතක මහිම – 3
5. හිතක මහිම (1-3 වෙළුම්)
6. දිවි කතරේ සැඳෑ අඳුර
7. කය අනුව ගිය සිහිය
8. හිත තැනීම
9. පින් රුකෙක මහිම
10. අබිනික්මන
11. පිළිවෙතින් පිළිවෙතට
12. කයේ කතාව
13. මා-පිය උවැටන
14. ප්‍රතිපත්ති පූජාව
15. පැවැත්ම හා නැවැත්ම
16. කර්ම චක්‍රයෙන් ධර්ම චක්‍රයට
17. මෙත් සිතේ විමුක්තිය
18. ඇති හැටි දැක්ම
19. තපෝ ගුණ මහිම
20. සක්මනේ නිවන
21. පහන් කණුව ධර්ම දේශනා – 1 වෙළුම
22. පහන් කණුව ධර්ම දේශනා – 2 වෙළුම
23. පහන් කණුව ධර්ම දේශනා – 3 වෙළුම
24. පහන් කණුව ධර්ම දේශනා – 4 වෙළුම
25. පහන් කණුව ධර්ම දේශනා – 5 වෙළුම
26. පහන් කණුව ධර්ම දේශනා – 6 වෙළුම
27. පහන් කණුව ධර්ම දේශනා – 7 වෙළුම
28. පහන් කණුව ධර්ම දේශනා – 8 වෙළුම
29. පහන් කණුව ධර්ම දේශනා – 9 වෙළුම

30. පහන් කණුව ධර්ම දේශනා – 10 වෙළුම
31. පහන් කණුව ධර්ම දේශනා – 11 වෙළුම
32. සබ්බාසව සූත්‍රයේ මැදුම් මග
33. විදසුන් උපදෙස්
34. භාවනා මාර්ගය
35. උත්තරීතර හුදකලාව
36. සසුන් පිළිවෙත
37. චලන චිත්‍රය
38. දිය සුළිය
39. බුදු සමය පුද්ගලයා හා සමාජය
40. නිවනේ නිවීම – පළමු වෙළුම
41. නිවනේ නිවීම – දෙවන වෙළුම
42. නිවනේ නිවීම – තෙවන වෙළුම
43. නිවනේ නිවීම – සිවුවන වෙළුම
44. නිවනේ නිවීම – පස්වන වෙළුම
45. නිවනේ නිවීම – සයවන වෙළුම
46. නිවනේ නිවීම – සත්වන වෙළුම
47. නිවනේ නිවීම – අටවන වෙළුම
48. නිවනේ නිවීම – නවවන වෙළුම
49. නිවනේ නිවීම – දසවන වෙළුම
50. නිවනේ නිවීම – එකොළොස්වන වෙළුම
51. නිවනේ නිවීම – පුස්තකාල මුද්‍රණය (1-11 වෙළුම්)
52. පටිච්ච සමුප්පාද ධර්මය – 1 වෙළුම
53. පටිච්ච සමුප්පාද ධර්මය – 2 වෙළුම
54. පටිච්ච සමුප්පාද ධර්මය – 3 වෙළුම
55. පටිච්ච සමුප්පාද ධර්මය – 4 වෙළුම
56. පටිච්ච සමුප්පාද ධර්මය – පුස්තකාල මුද්‍රණය (1-4 වෙළුම්)
57. ස්පර්ශයේ ආශ්චර්යය
58. මනසේ මායාව
59. පැරණි බෞද්ධ චින්තාවේ සංකල්පය සහ යථාර්ථය

---

නැවත මුද්‍රණය කරවීම පිළිබඳ විමසීම්:
කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
කිරිල්ලවලවත්ත, දම්මුල්ල, කරඳන
දුරකථනය: 0777127454
knssb@seeingthroughthenet.net

# By The Same Author

1. Concept and Reality in Early Buddhist Thought
2. Saṁyutta Nikāya – An Anthology
3. Ideal Solitude
4. The Magic of the Mind
5. Towards Calm and Insight
6. From Topsy-turvydom to Wisdom, Volume I
7. From Topsy-turvydom to Wisdom, Volume II
8. Seeing Through
9. Towards A Better World
10. Nibbāna – The Mind Stilled, Volume I
11. Nibbāna – The Mind Stilled, Volume II
12. Nibbāna – The Mind Stilled, Volume III
13. Nibbāna – The Mind Stilled, Volume IV
14. Nibbāna – The Mind Stilled, Volume V
15. Nibbāna – The Mind Stilled, Volume VI
16. Nibbāna – The Mind Stilled, Volume VII
17. Nibbāna – The Mind Stilled, Library Edition
18. Nibbāna and The Fire Simile
19. A Majestic Tree of Merit
20. The End of the World in Buddhist Perspective
21. The Law of Dependent Arising, Volume I
22. The Law of Dependent Arising, Volume II
23. The Law of Dependent Arising, Volume III
24. The Law of Dependent Arising, Volume IV
25. The Law of Dependent Arising, Library Edition
26. Walk to Nibbāna
27. Deliverance of the Heart through Universal Love
28. Questions and Answers on Dhamma
29. The Miracle of Contact
30. From The Wheel of Kamma To The Wheel of Dhamma

---

All enquiries should be addressed to:
Kaṭukurunde Ñāṇananda Sadaham Senasun Bhāraya
Kirillawala Watta, Dammulla, Karandana
Phone: 0777127454
knssb@seeingthroughthenet.net